# සබරගමුව විශ්වවිද්‍යාලයීය
# ශාස්ත්‍රීය සංග්‍රහය


දොළොස්වන කලාපය - 2021 දෙසැම්බර්

**ISSN 1800-1459**
**eISSN 2673-1177**

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
## දොළොස්වන කලාපය - 2021 දෙසැම්බර්

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයකි

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දොළොස්වන කලාපය 2021 දෙසැම්බර්
ISSN 1800-1459
eISSN 2673-1177
ප්‍රථම මුද්‍රණය: 2021 දෙසැම්බර්

**සංස්කාරක** : ආචාර්ය චම්පා එස්. ද සිල්වා

**<u>සියලු ම විමසීම්</u>**
සංස්කාරක
සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
තැ.පෙ. 02
බෙලිහුල්ඔය
දුරකථන/ෆැක්ස් - 045 22 80013
විද්‍යුත් තැපැල - sjseditor@crkd.sab.ac.lk

පරිගණක පිටු සැකසුම : යූ. ඒ. පී. කේ. රූපසිංහ
සම්බන්ධීකරණය සහ සංස්කරණ සහයක : එස්. එම්. එෆ්. ෂෆ්නාස් සහ
කේ. පී. ජී. ඩී. එම්. පොල්වත්ත

ප්‍රකාශනය : ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
බෙලිහුල්ඔය

## සංස්කරණ ප්‍රතිපත්තිය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය වූ කලී අඛණ්ඩ ව වාර්ෂික ව පළ වන විමර්ශිත සඟරාවකි. ඕනෑ ම විෂය ක්ෂේත්‍රයකට අදාළ ව සිංහල භාෂාවෙන් රචිත, පුරෝගාමී ඥානයක් සම්පාදනය කෙරෙන, උසස් ප්‍රමිතියෙන් යුතු ලිපි මෙහි පළ කෙරේ. සියලු ම ලිපි ප්‍රවීණ විමර්ශන මඬුල්ලකට යොමු කෙරෙන අතර ආරාධිත ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්ගේ ලිපි සංස්කාරක මණ්ඩලයේ විමර්ශනයට පමණක් යොමු කෙරේ. සඟරාවේ පළ කෙරෙන ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු ය.

## සංස්කාරක මණ්ඩලය


මහාචාර්ය ආර්. එම්. ඩබ්ලිව්. රාජපක්ෂ

මහාචාර්ය මනෝජ් ආරියරත්න

මහාචාර්ය කේ. වී. දීපානි එදිරිසූරිය මැණිකේ

මහාචාර්ය ඒ. සරත් ආනන්ද

මහාචාර්ය ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර

ආචාර්ය ජී. කේ. චම්පා එස්. ද සිල්වා

සම්බන්ධීකරණ සංස්කාරක : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්. සී. පල්ලියගුරුගේ

ඉංග්‍රීසි භාෂා සංස්කාරක : ආචාර්ය මහේෂ් හපුගොඩ

# සංස්කාරක සටහන

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි 12 වන කලාපය මෙසේ ඔබ අතට සමර්පණය කිරීමට ලැබීම අපගේ සතුටට හේතුවකි. අතීතයට සාපේක්ෂ ව සිංහල භාෂාවෙන් ඥාන සම්ප්‍රදානය කෙරෙන විමර්ශිත සඟරා දුර්ලභ මෙම වකවානුවෙහි අප විශ්වවිද්‍යාලය මගින් කෙරෙන මෙම සත්කාර්යය ශාස්ත්‍රවන්ත, ඥානගවේෂී විද්‍යාර්ථීන්ට අතහිත දීමක් වශයෙන් ද දැක්විය හැකි ය. පසුගිය කාල වකවානුවෙහි අපි මුහුණ දුන් බැරෑරුම් ගැටලු සහගත තත්ත්වයන් යටතේ මෙම සඟරාවෙහි අඛණ්ඩ සහ කාර්යක්ෂම පැවැත්ම සඳහා විවිධාකාර බාධක පැමිණි බැවින් යම් තරමක ප්‍රමාදයක් පැවතිය ද එය අභියෝගයක් සේ සලකමින් කටයුතු කිරීමට හැකි සෑම ප්‍රයත්නයක් ම දැරුවෙමු.

විවිධ විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි විවිධත්වයෙන් යුත් ශාස්ත්‍රීය ලිපි මෙම සඟරාවෙහි අන්තර්ගත ව ඇති අතර එම ලිපි විද්වත් මණ්ඩලයක් වෙත යොමු කර විමර්ශනයට බඳුන් කොට ඇත. එනිසා ගුණාත්මකභාවයෙන් පරිපූර්ණ වූ විමර්ශිත සඟරාවක් බවට මෙය පත් ව ඇති බව දැක්විය හැකි ය. ස්වකීය පර්යේෂණ පත්‍රිකා අප වෙත යොමු කළ ශාස්ත්‍ර ගවේෂී විද්‍යාර්ථීන් වෙත අපගේ හෘදයංගම ස්තුතිය පළ කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. එසේ ම එම විද්‍යාර්ථීන්ට අපගේ ශුභාශිංසන පිරිනැමේ.

පර්යේෂණ සිදු කිරීම හා එම පර්යේෂණ ප්‍රකාශනයට පත් කිරීම දැනුම බෙදා හැරීමෙහි මූලික පදනම සේ සැලකිය හැකි ය. එවන් මහඟු කර්තව්‍යයක නිමග්න වී සිටින ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය මෙම ප්‍රදේශයට පමණක් නොව මුළු ශ්‍රී ලාංකේය විද්‍යාර්ථීන්ට ද මහාර්ඝ වූ මාණික්‍යයකි. එහි උද්දීප්තිය උදෙසා මනා නායකත්වයක් ලබා දෙන වත්මන් උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදය රත්නායක මැතිඳුන්ට ප්‍රථමයෙන් ම ස්තුතිය පුද කළ යුතු ය. එසේ ම පර්යේෂණ හා දැනුම බෙදා හැරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය චන්ද්‍රිකා දිසානායක මැතිනිය මෙම සද්කාර්ය සඳහා ඇයගේ උපරිම දායකත්වය අප වෙත ලබා දෙමින් දක්වන සහයෝගය සැබවින් ම අගය කළ යුතු ය. මේ වන විට අප ආයතනයෙහි සේවය නොකළ ද මෙම ශාස්ත්‍රීය සඟරාවෙහි සම්බන්ධීකරණ කටයුතුවල කාර්යක්ෂම ලෙස නියැලුණු එස්. එම්. එෆ්. ෂෆ්නාස් මෙනවිය ද වත්මනෙහි එම කර්තව්‍යයෙහි නිමග්න කේ. පී. ජී. ඩී. එම්. පොල්වත්ත මෙනවිය ද සමස්ත සඟරාවෙහි ම පරිගණක පිටු සැකසුම සහ මුල් කවරය නිර්මාණය කරමින් විශාල වගකීම් සම්භාරයක් උසුලමින් මනා කැපවීමකින් කටයුතු කළ ශූ. ඒ. පී. කේ. රූපසිංහ මහත්මිය ද විශේෂයෙන් ම ඇගයිය යුතු ය. තව ද මෙම සඟරාවෙහි අන්තර්ගත ඉංග්‍රීසි බසින් රචිත සාරසංක්ෂේප ඉතා කෙටි කලකින් සංස්කරණය කොට දුන් භාෂා අධ්‍යයනාංශයේ ආචාර්ය මහේෂ් හපුගොඩ මහතා ද මේ අවස්ථාවේ දී ගෞරවයෙන් සිහිපත් කළ යුතු ම ය. එසේ ම මෙම සඟරාවෙහි අභිවෘද්ධිය උදෙසා ඉතාමත් කාරුණික ව සහයෝගය දැක් වූ තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයෙහි අධ්‍යක්ෂ මහාචාර්ය එච්. ඒ. ඩී. රුවන්දීපිකා මැතිනියව ද කෘතවේදී ව සිහිපත් කරමි.

**ආචාර්ය චම්පා එස්. ද සිල්වා**
**ප්‍රධාන සංස්කාරක**
**සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය.**

# ලිපි සම්පාදකයෝ

**ඩී. එච්. ඒ. එස්. සෝමරත්න**
දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**ඩබ්ලිව්. එම්. ඩී. පී. කුමාරි සහ එම්. එස්. එම්. එල්. කරුණාරත්න**
භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

**ඩබ්ලිව්. ඕ. තිලකරත්න**
උසස් පෙළ සිංහල භාෂා දේශක, ර/ඇඹි/චන්ද්‍රිකාවැව ජයන්ති විද්‍යාලය

**තුෂාණි සංදීපනී මාටින් සහ ලක්මිණී ගමගේ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය

**ආචාර්ය ප්‍රභා මනුරත්න**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**රවීන්ද්‍ර ගුණසේකර**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ආචාර්ය ලතා ගුරුසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

# පටුන


පිටු අංකය

1. ශ්‍රී ලංකාවේ පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ දී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුහුණ දෙන ගැටලු හා අභියෝග පිළිබඳ කරනු ලබන අධ්‍යයනයක් 1-15
**ඩී. එච්. ඒ. එස්. සෝමරත්න**

2. ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා අතරමැදි කලාපයේ සාම්ප්‍රදායික ගෙවතුවල භූමිකාව: බෙලිහුල්ඔය ප්‍රදේශය ආශ්‍රයෙන් 16-27
**ඩබ්ලිව්. එම්. ඩී. පී. කුමාරි සහ එම්. එස්. එම්. එල්. කරුණාරත්න**

3. ලේඛන හා භාෂණ සිංහලයෙහි භාවිත ක්‍රියා අනුසර්ගක පිළිබඳ ප්‍රතිරෝධාත්මක අධ්‍යයනයක් 28-37
**ඩබ්ලිව්. ඕ. තිලකරත්න සහ ආචාර්ය මොරකන්දේ අරියවංස හිමි**

4. ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි, විශ්වාස හා වත්පිළිවෙත් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (රත්නපුර දිස්ත්‍රික්කය ඇසුරිනි) 38-48
**තුෂාණි සංදීපනී මාටින් සහ ලක්මිණී ගමගේ**

5. 'තුන්දෙනෙක්' චිත්‍රපටයෙහි නිරූපිත සංහිඳියාව සහ ජාතික සමගිය යන සංකල්ප පිළිබඳ සිනමා න්‍යායාත්මක අධ්‍යයනයක් 49-63
**ආචාර්ය ප්‍රභා මනුරත්න**

6. ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය සහ ව්‍යවස්ථා වර්ධනය: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය 64-71
**රවින්ද්‍ර ගුණසේකර**

7. සපත්නීරෝෂය: ජාතක කතා කිහිපයක් ඇසුරෙන් බෞද්ධ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක් 72-83
**ආචාර්ය ලතා ගුරුසිංහ**

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දොළොස්වන කලාපය 2021 දෙසැම්බර්
පිටු 1-15
ISSN 1800-1459 eISSN 2386-2041
© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ දී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුහුණ දෙන ගැටලු හා අභියෝග පිළිබඳ කරනු ලබන අධ්‍යයනයක්

# (A Study on Challenges Faced by Consumer Affairs Authority in Protection Consumer Rights in Sri Lanka)

ඩී. එච්. ඒ. එස්. සෝමරත්න

දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය¸ පේරාදෙණිය විශ්වවිද්‍යාලය
**arunasrisampath193@gmail.com**

**සාරසංක්ෂේපය**

මානව ජීවියෙක් වන නිසා ම මානවයා කෙරෙහි අදාළ වන සියලු අයිතිවාසිකම් පාරිභෝගිකයා වෙත ද හිමිවිය යුතු ය. ඒ අනුව පාරිභෝගික අයිතිවාසිකම් පුරවැසියන්ට හිමිකර දියයුතු නීතිමය හිමිකමක් ලෙස නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් විසින් පිළිගෙන තිබේ. ශ්‍රී ලංකාව තුළ ද පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ විවිධ අණ පනත් හා නීති රෙගුලාසි අන්තර්ගත යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ. මෙම පර්යේෂණයේ ප්‍රමුඛ අරමුණ වන්නේ පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ දී ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුහුණ දෙන ප්‍රශ්න, අභියෝග සහ අවශ්‍යතා මොනවා දැයි අධ්‍යයනය කිරීම ය. ගුණාත්මක පර්යේෂණ සැලසුම යටතේ කොළඹ පිහිටි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරා ගනු ලැබී ය. සරල සසම්භාවීය නියැඳි ක්‍රමය යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය තුළ පාරිභෝගික අයිතිවාසිකම් සම්බන්ධ ව ක්‍රියාත්මක වන නිලධාරීන් 10 දෙනෙකු ද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කොළඹ කේන්ද්‍ර කරගෙන පිහිටුවන ලද පාරිභෝගික සංවිධාන දෙකක සාමාජිකයන් අතරින් 20 දෙනෙක් ද විවිධ වෘත්තීන්ට අයත් පාරිභෝගිකයන් 10 දෙනෙක් ද, ප්‍රදේශයේ වෙළඳ ව්‍යාපාරිකයන් 10 දෙනෙක් ද, වශයෙන් සමස්ත නියැඳිය 50 දෙනෙකුගෙන් සමන්විත ය. ප්‍රාථමික දත්ත රැස් කිරීමේ දී, ප්‍රශ්නමාලා ක්‍රමය සහ සම්මුඛ සාකච්ජා ක්‍රමය යන ක්‍රමවේද භාවිත කළ අතර ද්විතීයික දත්ත ලබා ගැනීම සඳහා ලිපි, වාර්තා, ලේඛන මෙන් ම අන්තර්ජාලය ද භාවිත කරන ලදී. සමස්ත දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදාගනු ලැබී ය . අධ්‍යයනය මගින් හඳුනාගත හැකි වූයේ සම්පත් හිඟය, ජනතාව තුළ පවතින නොදැනුවත් බව, අනිසි දේශපාලන මැදිහත් වීම්, ව්‍යාපාරික බලපෑම, ශක්තිමත් පාරිභෝගික සංවිධාන නොමැති වීම හා ආරක්ෂාව පිළිබඳ මතු වී ඇති ගැටලු හේතුවෙන් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමය සාර්ථක කර ගැනීමට පාරිභෝගික අධිකාරියට නොහැකි වී ඇති බව යි. එකී දුර්වලතාවයන් මගහරවා ගැනීම සඳහා පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට පියවර ගැනීම, පාසල් විෂය මාලාවට පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ ක්‍රමවේදයන් අන්තර්ගත කිරීම, පාරිභෝගික ආරක්ෂණ සන්නිවේදන ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම, දේශීය පාරිභෝගික සංවිධාන ශක්තිමත් කිරීම, පාරිභෝගික උපදේශන මධ්‍යස්ථාන ආරම්භ කිරීමට පියවර ගැනීම, වැනි ක්‍රියාමාර්ග කාලීන වශයෙන් වැදගත් වේ.

**කේන්ද්‍රීය වචනඃ** පාරිභෝගිකයා, මානව අයිතිවාසිකම්, පාරිභෝහික අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, ප්‍රතිපත්ති

It is a human being who becomes a consumer and hence all rights related to a human being should apply to a consumer as well. Accordingly, modern democratic states have accepted that consumer rights should be treated as a legal right. Even in Sri Lanka, there is a mechanism including laws acts and regulations working towards this end. The main objective of this research is to study the problems, challenges and requirements faced by the Consumer Affairs Authority in protecting consumer rights. Under the quality research plans, head office of the Consumer Affairs Authority in Colombo was selected as the field of the study. Under the simple and probable model system, 10 officers engaged in various jobs who work in the Consumer Affairs and who are specialized regarding consumer rights were selected. 20 persons out of members of two Consumer Organizations Centered on Consumer Authority in Colombo and 10 businessman from the area totaling 50 persons were selected for the entire model. In collecting data, questionnaire system and the interview system were chosen and to obtain secondary data analyzing, letters, reports and documents as well as the internet were used. For the overall data analysis, well descriptive system was used. The study revealed that due to the dearth of resources, ignorance on the part of the public, unnecessary political interference, lack of strong Consumer Organizations and problems of Security, it has become difficult for the Consumer Authority to Safeguard Consumer protection. In order to avoid those short comings, steps must be taken such as to create a consumer protection policy, inclusion of consumer protection policies in the school curriculum and methodologies to include a policy of creating advisory centers as a timely requirement.

**Key Words**: Consumer, Consumer rights, Human rights, Democracy, Policy

## හැඳින්වීම

මානව අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය සර්ව භෞමික වන අතර ලොව සෑම රාජ්‍යයක් විසින් ම එක් එක් රටවල සමාජ, ආර්ථික, දේශපාලන වෙනස්කම් නොතකා එය පිළිගෙන තිබේ. "විවිධ රටවල, විවිධ භූගෝලීය කලාපවල විවිධ සංස්කෘතීන්ට අයත් ව මිනිසා බේදී වෙන් ව ජීවත් වුව ද ඔවුන්ගේ මූලික ස්වභාවය, චර්යාවන් සහ අවශ්‍යතාවන් එක හා සමාන බව මානව අයිතිවාසිකම් පිළිබඳ මතවාදයෙන් ප්‍රකාශ වේ" (Heywood 1999: 195). මිනිසා කුමන ජාතියකට, වර්ණයකට අයත් වුව ද, කුමන ආගමක් ඇදහුව ද, ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු වුව ද මේ සියලු බේදීම් යටපත් කරන පොදු මනුෂ්‍යත්වය නම් බැඳීම සියලු මිනිස් වර්ගයා විෂයෙහි එක සමාන අයුරින් බලපානු ලැබේ. "මානව අයිතිවාසිකම් පිළිගැනීම හා ක්‍රියාත්මක කිරීම සමාජයක ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහාත්, පුරවැසියන්ගේ සුබ සිද්ධිය වැඩිදියුණු කිරීම සඳහාත්, සමාජයක යුක්තිය සහ සාධාරණත්වය වර්ධනය කිරීම සඳහාත් එකසේ වැදගත් වන්නකි" (ප්‍රනාන්දු 2000: 10). මානව අයිතිවාසිකම් සෑම රාජ්‍යයකට ම පුරවැසි යහපත උදා කිරීම උදෙසා අත්‍යවශ්‍යය අංගයක් බවට පත්ව ඇත.

"සියලු මිනිසුන් නිදහස් ව උපත ලබා ඇත. ගරුත්වයෙන් අයිතිවාසිකම් සමාන වේ. යුක්තිය අයුක්තිය පිළිබඳ හැඟීමෙන් හා හෘද සාක්ෂියෙන් යුතු ඔවුන් ඔවුනොවුන්ට සැලකිය යුත්තේ සහෝදරත්වය පිළිබඳ හැඟීමෙනි" (Universal declaration of Human Rights Article:7).

මානව හිමිකම් පිළිබඳ මොරිස් ක්‍රැන්ස්ටන් නැමති ලේඛකයා නිර්වචනය කරන්නේ මානව අයිතිවාසිකම් යනු විශ්වීය සදාචාරාත්මක අයිතියකි. එය සෑම ස්ත්‍රියකට ම හා පුරුෂයෙකුට ම සෑම ස්ථානයක දී ම හිමිවිය යුතු සාධාරණත්වය බරපතළ ලෙස කඩකිරීමකින් මිස කිසිවෙකුට අහිමි කළ නොහැකි සෑම මනුෂ්‍යයෙකුට ම ඔහු මනුෂ්‍යයෙකු වීම නිසා ම හිමිවන දෙයක් වශයෙනි. මෙම නිර්වචනයන් මගින් ගම්‍ය වන්නේ සෑම මනුෂ්‍යයෙකුට ම විශ්වීය වශයෙන් හිමිවය යුතු පැවැත්ම, ගරුත්වය, නිදහස, සමානාත්මතාව, හා අනන්‍යතාව මානව හිමිකම්හි පදනම් මූලධර්ම වන බවයි. මානව හිමිකම් සම්බන්ධ ව සාකච්ඡා කිරීමේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය වැදගත් වේ. නිදහස හා මානව ගරුත්වය සොයා යන ගමනේ වැදගත් සන්ධිස්ථානයක් විශ්ව ප්‍රකාශනය මඟින් සනිටුහන් වන අතර සියලු මිනිස් වර්ගයාගේ නෛසර්ගික අයිතිවාසිකම් හා නිදහස ඉතා අර්ථාන්විත අයුරින් නිරූපණය කර තිබේ. තවදුරටත් විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය මගින් මනුෂ්‍යත්වය පවත්වාගෙන යාමට අවශ්‍ය සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් ඉතා සැකෙවින් පැවැත්ම, ගරුත්වය, නිදහස හා අනන්‍යතාව යන මානව හිමිකම්හි පදනම් සංකල්ප නිරූපණය වන අයුරින් ඉදිරිපත් කර තිබේ.

මානව අයිතිවාසිකම් පිළිබඳ කතිකාව දෙවන ලෝක යුද්ධයට පෙර අන්තර්ජාතික නීතිය තුළ හෝ දේශපාලන දර්ශනය තුළ හඳුනාගත නොහැකි වූ අතර ආරම්භක අවධියේ දී එය අර්ථ නිරූපණය කරන ලද්දේ ස්වාභාවික අයිතිවාසිකම් ලෙසිනි. ලෝක යුද්ධ දෙකකට මුහුණදීම, පැසිස්ට්වාදයේ බිහිවීම ආදී තත්ත්වයන් පදනම් කරගෙන මානව අයිතිවාසිකම් කතිකාව කෙරෙහි ලෝක අවධානය යොමු වන්නට විය. මෙසේ ආරම්භ වූ මානව අයිතිවාසිකම් කතිකාවත නූතන යුගය වන විට පරම්පරා තුනක් දක්වා විකාශනය වී තිබේ. පළමු පරම්පරාවේ දී අවධානය යොමු කර ඇත්තේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ව ය. ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ දෙවන පරම්පරාවේ දී අවධානය යොමු වූ අතර කණ්ඩායම් අයිතිවාසිකම් පිළිබඳ තෙවන පරපුරේ දී අවධානය යොමු කර තිබේ. සමාජය තුළ සුවිශේෂ කණ්ඩායමක් නියෝජනය කරන පිරිසක් ලෙස පාරිභෝගිකයා හඳුනාගත හැකි ය. සමාජයේ සෑම පුද්ගලයෙක් ම එක් අවස්ථාවක පාරිභෝගිකයෙකු බවට මෙන් ම තවත් අවස්ථාවක ව්‍යාපාරිකයෙකු බවට ද පත්විය හැකි ය. එම නිසා පාරිභෝගික සංකල්පය සමාජයට ආගන්තුක වූවක් නොවන්නේ ය. පාරිභෝගිකයකු බවට පත් වන්නේ ද මානව ජීවියෙක් වන නිසා ම මානවයා කෙරෙහි අදාළ වන සියලු අයිතිවාසිකම් පාරිභෝගිකයා වෙත ද හිමිවිය යුතු ය. මානව අයිතිවාසිකම් හා පාරිභෝගික අයිතිවාසිකම් අතර අන්තර් සබඳතාවක් මෙම තත්ත්වය මත ගොඩනැගේ. දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලය පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන ලද කාල පරිච්ඡේදයකි. "කාර්මික විප්ලවය සමඟ ඇති වූ පෙරළිය තුළ තාක්ෂණික ඉංජිනේරු සංකල්පය දුරු වී 1940 ගණන්වලින් පසු ව ලෝකයේ ප්‍රධානතම සංකල්පයක් බවට පත් වූයේ පාරිභෝගිකයන් සුරක්ෂිත කිරීමයි" (රාමනායක සහ සහීඩ් 2004: 61).

සමාජයේ සෑම පුද්ගලයෙකුට ම ස්වකීය පැවැත්ම හා සංවර්ධනය උදෙසා භාණ්ඩ හා සේවාවන් පරිභෝජනය කිරීමට සිදු වේ. ඇතැම් අවස්ථාවල වෙළඳපළෙහි පවතින භාණ්ඩ හා සේවාවන් පිළිබඳ පාරිභෝගිකයන්ට නිවැරදි අවබෝධයක් නොමැත. සාක්ෂරතාවයෙන් ඉහළ පාරිභෝගිකයන් පවා අයිතිවාසිකම් පිළිබඳ නූගත් බවෙන් පෙළෙන බව ලංකාව ආශ්‍රයෙන් සිදු කරන ලද අධ්‍යයනයන් මගින් අනාවරණය වී තිබේ. මෙම තත්ත්වය වාසිදායක වන්නේ ව්‍යාපාරිකයාට වන අතර පාරිභෝගිකයා අයිතිවාසිකම් පිළිබඳ නොදන්නා තරමට ලාභය අපේක්ෂාවෙන් ක්‍රියා කරන වෙළෙන්දාගේ ග්‍රහණයට නතුවන්නේ නිරායාසයෙනි. වෙළඳපොළෙහි සැරිසරන පාරිභෝගිකයාට අයිතිවාසිකම් මගින් රැකවරණයක් හිමි වේ. පාරිභෝගික අයිතිවාසිකම්, කණ්ඩායම් අයිතිවාසිකම් කාණ්ඩයක් ලෙස හඳුනා ගෙන තිබුණත්, තවමත් අන්තර්ජාතික මානව හිමිකම් නීතියට ඇතුළත් වී නොමැත. තෙවන පරම්පරාවේ අයිතිවාසිකම් කාණ්ඩයක් ලෙස මානව හිමිකම් නීතියට ඇතුළත් කළ යුතු බවට කතිකාවක් නූතනයේ ආරම්භ වී තිබේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය, ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය තුළ අන්තර්ගත ඇතැම් වගන්ති පාරිභෝගික අයිතිවාසිකම් විෂයෙහි අදාළ කරගත හැකි ය. 1966 ආර්ථික, සමාජ හා සංස්කෘතික


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 12 වන වගන්තිය මගින් සෑම දෙනාට ම කුසගින්නෙන් මිදී සිටීමේ මූලික අයිතිය ද උසස් වශයෙන් ලබා ගත හැකි ශාරීරික සහ මානසික සෞඛ්‍ය භුක්ති විඳීමට සියලු දෙනාට ම ඇති අයිතිය පිළිගෙන තිබේ. මානව අයිතිවාසිකම් සහ පාරිභෝගික අයිතිවාසිකම් අතර සබඳතාව වටහා ගැනීම සඳහා මෙම ප්‍රඥප්ති තුළ අන්තර්ගත කරුණු සෘජු ව හෝ වක්‍ර ව බලපා තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් මඟපෙන්වීමේ මූලධර්ම මාලාවක් ප්‍රථම වරට ඉදිරිපත් කරනු ලබන්නේ 1985 වසරේ දී ය. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් විසින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ දී අවධානය යොමු කළ යුතු අංශ දෙකක් මෙම මූලධර්ම තුළ දැක්නට ලැබේ. එනම්,

- ආර්ථික ක්ෂේත්‍රයේ දී, අධ්‍යාපන මට්ටම්වල දී සහ කේවල් කිරීමේ හැකියාවන් අනුව පාරිභෝගිකයන් නිරතුරු ව ම අසමතුලිතතාවන්ට මුහුණ දී සිටීම.
- යුක්තිගරුකභාවය හා සාධාරණත්වය සහිත ආර්ථිකයක් ප්‍රවර්ධනය කරලීම හා සමාජ සංවර්ධනය කරා යොමු වීම.

පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ එක්සත්ජාතීන්ගේ මූලධර්ම මඟින් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්ට පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට අවශ්‍ය පදනම සකසා දෙනු ලැබේ.

.

පාරිභෝගික අයිතිවාසිකම්හි තවත් ඉදිරි පියවරක් වශයෙන් අන්තර්ජාතික පාරිභෝගික සංවිධානය නිර්මාණය කිරීම පෙන්වාදිය හැකි ය. පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම උදෙසා අන්තර්ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන පාරිභෝගික සංවිධානයක් ලෙස අන්තර්ජාතික පාරිභෝගික සංවිධානය **International Organization for Consumer Unions-IOCU** සැලකේ. පාරිභෝගිකයා විෂයෙහි වැදගත් වන අයිතිවාසිකම් අටක් මෙම සංවිධානය විසින් ඉදිරිපත් කර තිබෙන අතර වර්තමානයේ ලෝක රාජ්‍යයන් 115ක් නියෝජනය කරමින් සංවිධාන 220ක් මෙහි සාමාජිකත්වය හිමිකර ගෙන තිබේ.

පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ මෙවැනි ජාත්‍යන්තර පසුබිමක් පැවතියත්, මානව හිමිකම් ලෙස තවමත් අන්තර්ජාතික නීතියට ඇතුළත් වී නොමැති අතර පාරිභෝගිකයකු වන්නේත් මානව ජීවියෙක් වන නිසා ම මානවයෙකුට විශ්වීය වශයෙන් හිමිවිය යුතු පැවැත්ම, ගරුත්වය, නිදහස, අනන්‍යතාව හා සමානාත්මතාව පාරිභෝගිකයාට ද හිමිවිය යුතු ය. අන්තර් ජාතික මානව හිමිකම් නීතියට අන්තර්ගත නොවූවත්, බොහෝ රාජ්‍යයන් පුරවැසියන්ට හිමිකර දියයුතු නීතිමය හිමිකමක් ලෙස පාරිභෝගික අයිතීන් පිළිගෙන තිබේ. මෙම තත්ත්වය මගින් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කර දීමට රාජ්‍යයන් විසින් ජාතික මට්ටමින් නීතිරීති හා ආයතන පද්ධතීන් නිර්මාණය කර තිබේ.

මහා බ්‍රිතාන්‍යයෙහි පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ වෙළඳාම පිළිබඳ අධ්‍යක්ෂ නම් තනතුරක් ස්ථාපිත කර තිබෙන අතර සාධාරණ වෙළඳ කටයුතු කාර්යාලය නමින් ආයතනයක් ද පවතී. ඕස්ට්‍රේලියානු පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා නිර්මාණය කරණ ලද අණ පනත් ලෙස වෙළඳ කටයුතු පනත (1993) සහ පාරිභෝගික කොමිසමේ වාර්තා පෙන්වා දිය හැකි ය. ඉන්දියාවේ පාරිභෝගික අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා මධ්‍යම රජයේ පාරිභෝගික කටයුතු සහ පොදු බෙදාහැරීමේ දෙපාර්තමේන්තුව ස්ථාපිත කර තිබේ. පාරිභෝගිකයන්ට තමාට වන අසාධාරණ වෙනුවෙන් අධිකරණය හමුවේ පැමිණිලි ගොනු කිරීමේ අවස්ථාව ඉන්දියානු පුරවැසියන්ට හිමිවීම විශේෂත්වයකි (Economic Review, 2002Nov/Dec).

ශ්‍රී ලංකාවේ පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය කෙරෙහි අවධානය යොමු කරන්නේ නම් එය යටත් විජිත යුගයටත් පෙර දිවයන දිගු ඉතිහාසයක් සහිත ක්‍රියාවලියකි. ලක්දිව රජ කළ සිවුවන උදය රජු විසින් මෙරට පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ බදුලු ටැම් ලිපියේ දැක්වේ. අනතුරු ව එළඹෙන යටත් විජිත යුගය ආරම්භයේ දී පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් විධිමත් නීතිරීති නොපැවතීම හේතුවෙන් වෙළඳාම හා කර්මාන්ත ක්ෂේත්‍රයන් තුළ අසාධාරණ අයුරින් පාරිභෝගිකයින්ට පීඩනයන්ට මුහුණ පෑමට සිදු විය. මෙවැනි අසාධාරණයන්ගෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් 1939 වසරේ දී මෙරට පරිපාලනය භාර ව සිටි යටත්විජිත ලේකම්වරයා විසින් මිල පාලන රෙගුලාසි වෙළඳ හා කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා හඳුන්වා දෙනු ලැබී ය. යටත් විජිත පාලන සමය තුළ දී මෙන් ම නිදහස දිනා ගැනීමෙන් පසු කාලය තුළ ද පත් වූ අනුප්‍රාප්තික රජයන් විසින් ද පාරිභෝගික ආරක්ෂණය සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබුණි.

පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ පෙර යුගයන්ට සාපේක්ෂ ව දැඩි අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාව පැන නගින්නේ 1977 වසරේ සිට ය. විවෘත වෙළඳපොළ ආර්ථිකය ලංකාවට හඳුන්වා දීමත් සමඟ මෙම නව ආර්ථික රටාව ලාංකේය ජනදිවියේ විවිධ අංශ කෙරෙහි අහිතකර අයුරින් බලපෑම් සිදු කළේ ය. වෙළඳපොළට භාණ්ඩ ගලා ඒම සඳහා වූ සියලු ආකාරයේ පාලන ක්‍රම ඉවත් කිරීමත් සමඟ ගුණාත්මක බවින් තොර මිනිස් පරිභෝජනයට අහිතකර නිෂ්පාදන වර්ධනය වීම වැනි ගැටලු නිර්මාණය විය. මෙබඳු පසුබිමක් තුළ පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නෛතිකමය විධිවිධාන සැලසීමේ අවශ්‍යතාව ලංකාව ආශ්‍රයෙන් පැනනගින්නට විය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය තුළ පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ සඳහන් නොවූවත්, රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම තුළ සමාජ හා ආර්ථික සාධාරණත්වයට අදාළ ප්‍රතිපත්ති අන්තර්ගත ව පවතී. 27 (ඇ) වගන්තිය තුළ දැක්වෙන්නේ "ප්‍රමාණවත් ආහාරපාන, ඇඳුම් පැළඳුම් සහ නිවාස පහසුව ද, ජීවන තත්ත්වයෙහි නිරන්තර වර්ධනය ද විවේකය හා සමාජයීය සහ සංස්කෘතික ඉඩ ප්‍රස්ථා නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම ද ඇතුළු ව ප්‍රමාණවත් ජීවන මට්ටමක් සියලු පුරවැසියන් විසින් තමන්ට සහ තම පවුල්වල සාමාජිකයින්ට අත්කර දීම රාජ්‍යයේ එක් ප්‍රතිපත්තියක් වන බවයි" (ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978).


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පුරවැසියාගේ ජීවන තත්ත්වය යහපත් අයුරින් පවත්වා ගෙන යාමට අවශ්‍ය ආර්ථික, සමාජීය ආරක්ෂණ ප්‍රතිපත්ති නිර්මාණය කිරීම රාජ්‍යය වෙත පැවරෙන වගකීමකි. විවෘත ආර්ථිකය හඳුන්වා දීම මගින් පැන නැගුණු අහිතකර තත්ත්වයන්ගෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කරගැනීමට රජයේ අවධානය යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස 1979 වසරේ අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත හඳුන්වා දෙනු ලැබී ය.

පාරිභෝගික ආරක්ෂණ පනත හඳුන්වා දීමෙන් අනතුරු ව පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් නව පනත් රාශියක් හඳුන්වා දෙනු ලැබේ. 1980 අංක 26 දරණ ආහාර පනත මගින් ආහාර නිෂ්පාදනය, ආනයනය, විකිණීම හා බෙදා හැරීම ආදිය සම්බන්ධයෙන් අදාළ වන නීතිරීති ඇතුළත් විය. 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත හා 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත ආදිය ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණ පනත් අතරින් කිහිපයකි. පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව වර්ධනය වීමත් සමඟ පාරිභෝගික අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාත්මක වන වැඩි බලතල සහිත ආයතනයක අවශ්‍යතාව පැන නැගුණි. 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය නිර්මාණය වන්නේ පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රධාන ආයතනය ලෙසිනි. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත හඳුන්වා දීමත් සමඟ එතෙක් ක්‍රියාකාරී ව පැවති පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත, සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත, මිල පාලන පනත ආදිය අහෝසි වන අතර ඒවායේ වැදගත් කාර්යයන් නව පනතට අන්තර්ගත කර තිබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යනු පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම හා සාධාරණ වෙළඳපොළ ක්‍රියාකාරීත්වය ඇති කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාවෙහි ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතනය යි. පාරිභෝගිකයන් සවිබල ගැන්වීම, වෙළඳාම විධිමත් කිරීම සහ යහපත් තරඟකාරිත්ව ප්‍රවර්ධනය මගින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මෙහෙවර වශයෙන් සැලකේ. පාරිභෝගික අයිති සුරක්ෂිත කිරීම වෙනුවෙන් අරමුණු සහ නීතිමය විධිවිධාන රාශියක් මෙම පනත මඟින් ඉදිරිපත් කර තිබෙන අතර මෑතකාලීන ව පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් පිහිටුවා ඇති ප්‍රධාන ම ආයතනය වශයෙන් සැලකෙන්නේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යි. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වූ කලී පාරිභෝගිකයින්ගේ මනා සෞඛ්‍ය සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ක්‍රියාකාරී ව පවතින ප්‍රධාන ආයතනය වන අතර පාරිභෝගික අයිතිවාසිකම් සහ පාරිභෝගික යුතුකම් වෙනුවෙන් ක්‍රියාත්මක වන නීත්‍යනුකූල ආයතනය ද වන්නේ ය. අධිකාරිය සලකනුයේ පාරිභෝගික අයිතීන් සුරක්ෂිත කිරීම යනු සිවිල් සමාජයේ වගකීම් වර්ධනය කිරීම යන්න යි. මෙබඳු පසුබිමක් තුළ පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කොපමණ දායකත්වයක් සපයා ඇත් දැයි අධ්‍යයනය කිරීම කාලෝචිත ය.

## සාහිත්‍ය විමර්ශනය

**D. C. Jayasuriya**, 2004 රචනා කරන ලද **Guide to the Consumer Affairs Authority Act** නැමති කෘතිය මඟින් ශ්‍රී ලංකාවේ පාරිභෝගික නීතියේ ඉතිහාසය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන අතර එමඟින් යටත් විජිත යුගයේ සිට වර්තමානය දක්වා පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් හඳුන්වා දෙන ලද අණ පනත් සහ ආයතන පිළිබඳ කරුණු ඉදිරිපත් කර තිබේ. ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සම්බන්ධ ව වැඩි අවධානයක් යොමු කර තිබෙන අතර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටු වීමේ අරමුණු, ක්‍රියාකාරීත්වය පෙන්වා දෙමින් පාරිභෝගික සංවිධාන ස්ථාපිත කිරීමේ වැදගත්කමත් මෙම කෘතියෙන් පෙන්වා දී තිබේ.

**H. Sunethra Perera**, 1999 - 2000 වසරවල, **Consumer Protection Education and Sri lanka**, යනුවෙන් රචනා කරන ලද ලිපිය මඟින් ශ්‍රී ලංකාවේ සාක්ෂරතා මට්ටම ලෝකයේ සෙසු රාජ්‍යයන් සමඟ සැසඳීමේ දී ඉහළ මට්ටමක පැවතියත්, පාරිභෝගික අධ්‍යාපනය ග්‍රාමීය හා නාගරික ජනතාව තුළ අවම තත්ත්වයක පවතින බව පෙන්වා දෙමින් පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ වඩාත් පුළුල් අවබෝධයක් ලබා දීම වැදගත් වන බව පෙන්වා දෙන අතර ඒ සඳහා පාසල් විෂය මාලාවට පාරිභෝගික අයිතිවාසිකම් ඇතුළත් කළ යුතු බව පෙන්වා දෙමින් ග්‍රාමීය හා නාගරික මට්ටමින් පාරිභෝගික සංවිධාන සවිබල ගැන්වීමේ අවශ්‍යතාව ද පෙන්වා දී තිබේ.

**Sunethra Chandrakanthi** 2001 වසරේ දී **The Role of Communication in Consumer Protection in Sri lanka** යනුවෙන් රචනා කරන ලද ලිපියෙන් පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් සමාජ, ආර්ථික ප්‍රතිපත්තියක අවශ්‍යතාව පෙන්වා දෙමින් පාරිභෝගික ආරක්ෂණයේ දී ජන සන්නිවේදනයේ ඇති වැදගත්කමත්, වර්තමානයේ පවතින සංකීර්ණ ජීවන රටාවත් නවීන නිෂ්පාදන පිළිබඳ පාරිභෝගිකයා තුළ ඇති නොදැනුවත්කම නිසා ජන සන්නිවේදන මාධ්‍යයන්ගේ වංචා සහගත ප්‍රචාරණය පාරිභෝගිකයා නොමඟ යවන ආකාරය මෙම ලිපිය මඟින් ඉදිරිපත් කර තිබේ. පාරිභෝගික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම උදෙසා මාධ්‍යය ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ නව අදහස් මෙම ලිපියේ අන්තර්ගත ව පවතී.

ඩී. එම්. ටී. බී. දසනායක විසින් 1994 වසරේ දී රචනා කරන ලද *පාරිභෝගික ආරක්ෂණය සහ ශ්‍රී ලංකාවේ දායකත්වය* යනුවෙන් රචනා කරන ලද කෘතියෙහි පාරිභෝගික නීතියේ ඉතිහාසය, විවිධ ආක්‍රමණයන් හේතුවෙන් මෙරට ආර්ථිකයට සිදුකරන ලද බලපෑමත්, නිදහස දිනා ගැනීමෙන් අනතුරු ව පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් ගෙන ආ ක්‍රියාමාර්ගත් පෙන්වා දේ. තවදුරටත් මෙම කෘතිය මගින් ජනගහන වර්ධනය හේතුවෙන් පාරිභෝගික ගැටලු පැනනැගීම නිසා ජනතාව දක්වන ප්‍රතිචාරයන්හි ප්‍රතිඵලයක් ලෙස අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් නිර්මාණය වූ බවත්, රාජ්‍යයන් පාරිභෝගික


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අයිතිවාසිකම් පිළිගෙන ආරක්ෂා කිරීම සඳහා නෛතික ක්‍රියාමාර්ග හඳුන්වා දීමට පසුකාලීන ව කටයුතු කළ බවත් මෙම කෘතිය මඟින් පෙන්වා දේ.

ආර්.එම්.සී. බණ්ඩාර විසින් 2008 වසරේ දී රචනා කරන ලද ප්‍රමිතිකරණය හා පාරිභෝගික ආරක්ෂණය නැමති කෘතිය මගින් පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් ලංකාවේ ස්ථාපිත කර ඇති ආයතන හා නීති රීති පිළිබඳ කරුණු ඉදිරිපත් කර තිබෙන අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි ආරම්භය එමඟින් සැපයෙන සේවාවන්, භාණ්ඩ සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් පවතින නීතිමය තත්ත්වය යනාදිය පිළිබඳ ව කරුණු ඉදිරිපත් කර තිබෙන අතර පාරිභෝගික අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ සාකච්ඡා කරන අතර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ආරම්භය සහ ක්‍රියාකාරීත්වය විධිමත් අයුරින් පාරිභෝගික පැමිණිලි ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ව ද කරුණු ඉදිරිපත් කර තිබේ.

අශිකා ඉරෝෂණී සඳරේණු විසින් 2007 වසරේ දී රචනා කරන ලද කොම්පැණි කිරට නාඩන් රන්කැටි පුතුනේ යන කෘතියෙන් කිරිපිටි භාවිතය පිළිබඳ මෙරට පාරිභෝගිකයන් තුළ පවතින මිථ්‍යා විශ්වාස හා ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කරන වංචා සහගත ප්‍රචාරණය ජනතාවට අහිතකර අයුරින් බලපාන ආකාරය පිළිබඳ කරුණු දක්වා තිබේ. මෙම අධ්‍යයනය මගින් ලක්වැසියන් බහුල වශයෙන් භාවිත කරන කිරිපිටි වර්ග කිහිපයක් පාරිභෝගික ආරක්ෂණ පනත් උල්ලංඝනය කරමින් ව්‍යාජ ප්‍රචාරණ මගින් පාරිභෝගිකයන් නොමඟ යවන අයුරු මෙම කෘතියේ සඳහන් වේ. කිරිපිටි භාවිතය පිළිබඳ වෛද්‍ය විද්‍යාත්මක ආකල්ප ද මෙහි අන්තර්ගත වන අතර කිරි නිෂ්පාදනය වර්ධනය කිරීමට යොදාගන්නා හෝමෝන මිනිස් සිරුරට බලපාන ආකාරය පිළිබඳ අදහස් ද මෙම කෘතිය මඟින් සාකච්ඡා කොට ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත, 2003 මෙම පනත තුළ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටු වීම, එහි අරමුණු, සංවිධාන ව්‍යූහය, අධිකාරියේ බලතල සහ කාර්යයන්, පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පිහිටුවීම, එහි සංයුතිය, තරඟ විරෝධී චර්යාවන් සඳහා අධිකාරිය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග, අධිකාරියේ අරමුදල් පිළිබඳවත් මෙම පනත මඟින් සාකච්ඡා කර තිබේ.

මෙම ශාස්ත්‍රීය අධ්‍යයනයෙන් මූලික වශයෙන් පාරිභෝගික අයිතිවාසිකම්, යුතුකම්, පාරිභෝගික නීතියේ ආරම්භය හා වර්ධනය, ක්‍රියාකාරිත්වය, ලෝකයේ සෙසු රටවල පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණ සහ ඒවායේ ක්‍රියාකාරිත්වය, පාරිභෝගික අධිකාරියේ අරමුණු, සංයුතිය, බලතල හා කාර්යයන් පිළිබඳ අවධානය යොමු කර තිබෙන නමුදු පාරිභෝගික අයිතිවාසිකම් සාධනය කිරීමේ දී ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුහුණ දෙන ගැටලු සහ අභියෝග පිළිබඳ සිදු කර ඇති අධ්‍යයනයන් ඉතා විරල ය. මෙකී පසුබිම මත පාරිභෝගික අයිතිවාසිකම් සාධනය කිරීමේ දී ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුහුණ දෙන ගැටලු , ප්‍රශ්න, අභියෝග සහ අවශ්‍යතා මොනවා දැයි අධ්‍යයනය කිරීම මෙමඟින් සිදුකොට තිබේ.

## අධ්‍යයනය ගැටලුව

පාරිභෝගික අයිතිවාසිකම් සාධනය කිරීමේ දී ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුහුණ දෙන ගැටලු, ප්‍රශ්න, අභියෝග සහ අවශ්‍යතා මොනවා දැයි අධ්‍යයනය කිරීම.

## පර්යේෂණයේ අරමුණු

පාරිභෝගික අයිතිවාසිකම් සහ පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ යාන්ත්‍රණය පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා කොපමණ ප්‍රමාණවත් වී ඇත් දැයි අධ්‍යයනය කිරීම.

ශ්‍රී ලංකාවේ පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ නීති, අණ පනත් සහ නෛතික විධිවිධාන මෙරට පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග අධ්‍යයනය කිරීම.

පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් අධිකාරිය ගෙන ඇති ක්‍රියාමාර්ගයන්හි ඵලදායිතාව විමර්ශනය කිරීම.

ශ්‍රී ලංකා පාරිභෝගික සේවා අධිකාරිය පාරිභෝගික අයිතීන් සාධනය කිරීමේ දී මුහුණ දෙන ධනාත්මක හා ඍණාත්මක ප්‍රතිචාරයන් සහ අවශ්‍යතා අධ්‍යයනය කිරීම.

## වැදගත්කම

අතීතයේ දී මිනිසුන් තම අවශ්‍යතා ස්වයං නිෂ්පාදනය කෙරෙන් සම්පූර්ණ කර ගත්ත ද වර්තමානය වන විට මිනිස් අවශ්‍යතාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් විනිමය මාධ්‍යක් භාවිත කොට හුවමාරුව මගින් සපුරා ගැනීමක් දක්නට ලැබේ. මෙයින් පැහැදිලි වන්නේ මිනිසුන්ගේ අවශ්‍යතා හා වුවමනාවන් ඉටු කර ගැනීම සඳහා විශාල වශයෙන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට පෙලඹී සිටින බව යි. මෙසේ තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගන්නා ගැනුම්කරුවන් නැතහොත් පාරිභෝගිකයන් විකුණුම්කරුවන් නැතහොත් වෙළඳුන්ගේ ග්‍රහණයට හසු වී තිබෙන අයුරු ද නිරීක්ෂණය කළ හැකි ය. එවන් පසුබිමක දී පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා පවතින නෛතික රැකවරණය ජාතික හා අන්තර්ජාතික මට්ටමින් අධ්‍යයනය කිරීම වැදගත් වේ.

පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ දේශීය වශයෙන් සිදු කර ඇති අධ්‍යයනයන් බොහොමයක් ආර්ථික විද්‍යාව, කළමනාකරණය, නීතිය ආදී විෂයන් පාදක කරගෙන සිදු කර ඇත. මෙහි දී මෙම අධ්‍යයනයන්ගෙන් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පවතින නීතිරීති ආදිය පිළිබඳ වැඩි අවධානයක් යොමු කර තිබේ. දේශපාලන විද්‍යා විෂය තුළ මානව අයිතිවාසිකම් ප්‍රවේශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලබන අතර ඒ යටතේ පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ ව ද විවිධ අධ්‍යයනයන් සිදුකර තිබේ. එසේ වුවත් පාරිභෝගික අයිතිවාසිකම් වෙනුවෙන් ස්ථාපිත කර ඇති පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සම්බන්ධයෙන් පාරිභෝගික අයිතිවාසිකම් දෘෂ්ටියකින් සිදු කර ඇති අධ්‍යයනයන් ඉතා සීමිත ය. එහෙයින් මෙම


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අධ්‍යයනය එම පර්යේෂණ පරතරය පියවීමට රුකුලක් වනු ඇත.

නූතන වෙළඳ පොළෙහි කිරි ආහාර, මස් ආශ්‍රිත නිෂ්පාදන හා ජානමය වශයෙන් වැඩි දියුණු කළ ආහාර යනාදී පරිභෝජනයට ගන්නා භාණ්ඩ වර්ග රාශියක් පවතී. අවාසනාවකට මෙන් පාරිභෝගිකයන්ට මෙම භාණ්ඩවල අඩංගු ද්‍රව්‍ය පිළිබඳ අවබෝධයක් නොමැති තරම් ය. වෙළඳපොළ ආර්ථිකය තුළ නිෂ්පාදකයා සිය ලාභය පමණක් උපරිම කර ගැනීමට කටයුතු කරන බැවින් පාරිභෝගිකයා කෙරෙහි තැකීමක් නොකරයි. මෙරට පවතින ජනවාර්ගික විවිධත්වය ද පාරිභෝගික අයිතිවාසිකම් කෙරෙහි විවිධ අයුරින් බලපෑම් කරනු ලැබේ. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී පාරිභෝගික අයිතිවාසිකම් කෙරෙහි පවතින තත්ත්වය තේරුම් ගැනීම මගින් එම ක්ෂේත්‍රය සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනයට ද මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල කිසියම් දායකත්වයක් සපයනු ඇත.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා කොළඹ පිහිටි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරා ගෙන තිබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය තුළ පාරිභෝගික අයිතිවාසිකම් සම්බන්ධ ව ක්‍රියාත්මක වන නිලධාරීන් 10 දෙනෙකු නියැදිය ලෙස තෝරා ගෙන ඇත. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කොළඹ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන පිහිටුවන ලද පාරිභෝගික සංවිධාන දෙකක සාමාජිකයන් අතරින් අධ්‍යයන නියැදිය ලෙස එක් පාරිභෝගික සංවිධානයකින් සාමාජිකයන් දසදෙනා බැගින් සංවිධාන දෙක අතුරින් 20 දෙනෙකු ද විවිධ වෘත්තීන්ට අයත් පාරිභෝගිකයන් 10 දෙනෙක් ද, ප්‍රදේශයේ වෙළඳ ව්‍යාපාරිකයන් 10 දෙනෙක් ද, වශයෙන් සමස්ත නියැදිය 50 දෙනෙකු සරල සසම්භාවී නියැදිය යටතේ තෝරා ගැනුණි.

ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලි ක්‍රමය යොදා ගෙන ඇත. අධ්‍යයනයට අවශ්‍ය ද්විතියික දත්ත ලබා ගැනීම සඳහා ග්‍රන්ථ" සඟරා" ලිපි හා අන්තර්ජාලය පරිශීලනය කර ඇත. අධ්‍යයනය මගින් රැස්කර ගන්නා ලද දත්ත හා තොරතුරු විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගෙන ඇති අතර එහි දී වගු, ප්‍රස්තාර, රූප සටහන් සහ උධෘත ඔස්සේ විග්‍රහයන් සිදු කර තිබේ.

## සාකච්ඡාව

### පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ක්‍රියාදාමය

1979 පාරිභෝගික ආරක්ෂණ පනත අහෝසි කරමින් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පුළුල් බලතල හා කාර්යයන් ප්‍රමාණයක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මගින් අධිකාරිය වෙත හිමිකර දී තිබේ. මෙම නව පනත මගින් ලාංකේය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ නව බලාපොරොත්තුවක් තබා ඇත. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පනත මගින් දක්වා ඇති විධිවිධාන හේතුවෙන් වෙළඳපොළෙහි සැරිසරන පාරිභෝගිකයාට රැකවරණයක් සැලසී තිබේ. අධිකාරිය විසින් පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වැටලීම් සිදු කිරීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම නිසා වෙළඳ විෂමාචාර පාලනය කිරීමට යම් ප්‍රමාණයකට හැකියාව ලැබී ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබන බව පෙන්වා දෙන්නේ ඔවුන් විසින් සිදුකරනු ලබන වැටලීම් සහ අය කර ගන්නා ලද දඩ මුදල් ආශ්‍රයෙනි.

2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අධිකාරිය විසින් සිදු කරන ලද වැටලීම්

| මාසය/වසර | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 12 | 200 | 189 | 189 | 305 | 119 | 1,845 |
| පෙබරවාරි | 16 | 253 | 260 | 217 | 132 | 242 | 1,740 |
| මාර්තු | 23 | 215 | 256 | 235 | 537 | 540 | 1,838 |
| අප්‍රේල් | 45 | 233 | 487 | 600 | 517 | 321 | 1,806 |
| මැයි | 38 | 212 | 225 | 214 | 190 | 330 | 1,816 |
| ජූනි | 27 | 211 | 347 | 203 | 421 | 528 | 3,392 |
| ජූලි | 109 | 265 | 398 | 250 | 342 | 954 | 3,519 |
| අගෝස්තු | 214 | 430 | 319 | 344 | 451 | 990 | 3,910 |
| සැප්තැම්බර් | 130 | 372 | 203 | 337 | 324 | 1,015 | 3,496 |
| ඔක්තෝබර් | 71 | 196 | 289 | 274 | 309 | 1,171 | 3,762 |
| නොවැම්බර් | 266 | 197 | 295 | 299 | 396 | 1,785 | 5,133 |
| දෙසැම්බර් | 280 | 500 | 393 | 557 | 593 | 2,905 | 4,122 |
| **එකතුව** | **1231** | **3284** | **3661** | **3716** | **4517** | **10900** | **36379** |

වගු අංක - 01


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දඩ මුදල්

| මාසය/වසර | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 0 | 863,700 | 2,956,700 | 2,680,750 | 2,776,000 | 1,626,500 | 8,723,500 |
| පෙබරවාරි | 0 | 1,095,700 | 675,500 | 697,000 | 1,733,000 | 1,317,500 | 6,355,100 |
| මාර්තු | 14,000 | 1,060,500 | 1,347,550 | 1,037,000 | 1,102,500 | 1,364,500 | 6,841,100 |
| අප්‍රේල් | 8,500 | 378,500 | 1,734,000 | 1,058,500 | 2,201,100 | 533,100 | 2,982,200 |
| මැයි | 39,500 | 545,000 | 1,501,500 | 1,667,500 | 2,574,500 | 2,253,500 | 6,403,664 |
| ජූනි | 38,000 | 1,528,500 | 2,083,500 | 952,600 | 1,303,000 | 1,109,500 | 7,464,400 |
| ජූලි | 303,500 | 847,200 | 2,113,800 | 822,500 | 2,702,000 | 3,310,500 | 7,316,250 |
| අගෝස්තු | 616,500 | 1,218,750 | 2,149,200 | 1,710,000 | 1,455,500 | 2,263,000 | 7,559,000 |
| සැප්තැම්බර් | 260,500 | 1,475,500 | 1,294,500 | 3,094,500 | 2,005,500 | 3,391,700 | 10,715,300 |
| ඔක්තෝබර් | 109,000 | 940,600 | 865,500 | 2,018,500 | 1,701,900 | 4,706,700 | 9,379,650 |
| නොවැම්බර් | 179,200 | 1,011,500 | 3,115,100 | 1,270,500 | 1,595,000 | 3,790,400 | 9,595,200 |
| දෙසැම්බර් | 353,000 | 349,500 | 570,400 | 683,000 | 1,028,100 | 2,842,100 | 5,150,200 |
| **එකතුව** | **1,921,700** | **11,314,950** | **20,407,250** | **17,692,350** | **22,178,100** | **28,509,000** | **88,485,564** |


වගු අංක - 02

2010-2016 වසරවල වැටලීම් අධ්‍යයනයේ දී පෙනී යන්නේ එය දිනෙන් දින ම වර්ධනය වී ඇති බවයි. වැටලීම් සඳහා අය කරගෙන ඇති දඩ මුදල් ද වර්ධනය වී ඇත. වැඩි ම ප්‍රමාණයක් වැටලීම් ලංකාව තුළ විවිධ ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් සිදු කර ඇත. නමුත් මෙහි සංඛ්‍යාත්මක වටිනාකමක් පැවතුණත් ගුණාත්මක වටිනාකමක් හෝ පාරිභෝගිකයාට සෘජු ව බලපාන සහන ලැබී ඇත්තේ ඉතා අල්ප වශයෙනි. වැටලීම් බොහෝ සංඛ්‍යාවක් මිල පුවරු ප්‍රදර්ශනය නොකිරීම ආදී සරල වැරදි සඳහා සිදු කර දඩ මුදල් නියම කර ඇත. මේ මගින් පමණක් සංකීර්ණ වෙළඳපොළ හැසිරීම් රටාව පාලනය කිරීමට නොහැකි ය.

එමෙන් ම අධිකාරියේ නිලධාරීන් වැටලීම් කෙරෙහි යොමු වී ඇත්තේ පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පරමාර්ථයෙන් ම නොවන බව හඳුනාගත හැක. ඔවුන්ට මසක් තුළ සපුරාලිය යුතු ඉලක්කයන් කොපමණ ප්‍රමාණයක් ද යන්න අමාත්‍යාංශය විසින් දක්වා ඇත. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා වෙහෙසෙනවා මිස අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පරමාර්ථයක් නිලධාරීන් සතු ව නැත. වැටලීම් සංඛ්‍යාව හා දඩ මුදල් ප්‍රමාණයන්ගෙන් හැඟී යන්නේ පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝනය දිනෙන් දින වර්ධනය වී ඇති බවයි. මේ අනුව නිගමනය කළ හැක්කේ වැඩි ම ප්‍රමාණයකින් රජයට මුදල් උපයා දෙන ආයතනය බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය නූතනයේ පත් ව තිබෙන බවයි. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට වඩා මිල පාලනය සඳහා වැඩි අවධානයක් යොමු කර තිබෙන බව ද සඳහන් කළ යුතු ය.

## පාරිභෝගික පනත

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත තුළින් අවධාරණය කරන ලද වගන්ති තුළ ප්‍රධාන ලෙස ම අවධානය යොමු කර ඇත්තේ පාරිභෝගිකයාගේ පැවැත්මට ඇති අයිතිය කෙරෙහි පමණි. ගරුත්වය, නිදහස හා අනන්‍යතාව වැනි මානව අයිතිවාසිකම්වල සෙසු පදනම් සංකල්ප කෙරෙහි සීමිත වශයෙන් අවධානය යොමු කර තිබේ. මෙය පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝනය වීමට බලපා තිබේ. සමස්තයක් වශයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ආරක්ෂා කරනු ලබන අයිතිවාසිකම් හා එමගින් වැඩි වශයෙන් ආරක්ෂා වන මානව හිමිකම්හි පදනම් මූලධර්ම පහත පරිදි රූප සටහනක් ඇසුරින් දැක්විය හැකි ය.




පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ආරක්ෂා කරනු ලබන අයිතිවාසිකම්
රූප සටහන් අංක 01


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මානව අයිතිවාසිකම්හි පදනම් සංකල්ප අන්තර්ගත වන පරිදි මෙන් ම නූතන සංකීර්ණ වෙළඳපොළ ක්‍රමය තුළ පාරිභෝගික ස්වාධිපත්‍ය සහිත සමාජයක් නිර්මාණය කිරීමට හැකි වන පරිදි ද පනත සංශෝධනය විය යුතු ය. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත විශ්ව ප්‍රඥප්තීන්ට අනුකූල කිරීම සඳහා මෙය වැදගත්වනු ඇත.

## පාරිභෝගික අධ්‍යාපනය

පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ දී වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගය වන්නේ පාරිභෝගික අධ්‍යාපනයයි. පාරිභෝගික අධ්‍යාපනය මගින් ලබා ගන්නා දැනුම බුද්ධිමත් හා විචක්ෂණශීලී පාරිභෝගිකයකු නිර්මාණය කිරීමේ දී වැදගත් වේ. අධිකාරිය විසින් පාරිභෝගික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම උදෙසා නන් ආකාරයේ විධිවිධාන ක්‍රියාවට නංවනු ලබයි. එහි දී පාරිභෝගික දින සමරමින් උළෙලවල් සංවිධානය කිරීම, තිනකරන්, වීරකේසරී හා Daily mirror වැනි පුවත්පත්වල පාරිභෝගික පිටු (Consumer page) ආරම්භ කිරිම, 2003 වසරේ සිට පාරිභෝගිකයා නමින් පුවත්පතක් නිර්මාණය කිරීම, පාසල් සිසුන් ඉලක්ක කර ගනිමින් දැනුම මිනුම, රචනා තරඟ හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ ජනමාධ්‍ය හරහා පාරිභෝගික දැනුම වර්ධනය කිරීම ආදී කාර්යයන් අධිකාරිය විසින් සිදු කරනු ලබයි.

පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වඩාත් ඵලදායීම ක්‍රියාමාර්ගයක් වන්නේ පාරිභෝගික අධ්‍යාපනය වුවත්, අධිකාරිය විසින් මේ පිළිබඳ නිසි අවධානයක් යොමු නොකරන බව මෙම අධ්‍යයනය මගින් අනාවරණය වූ කරුණකි. අධිකාරිය පනත මගින් මේ සඳහා විශේෂ අවධානයක් යොමු කළත්, ක්‍රියාකාරිත්වය තුළ එම අරමුණ විධිමත් අයුරින් ඉටු කිරීමට අධිකාරිය අපොහොසත් වී ඇත. පාරිභෝගික ආරක්ෂණය පාරිභෝගිකයාගේ ජීවිතයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගත් ක්‍රියාදාමයකි. අධ්‍යයනයෙන් පෙනීගිය කරුණක් වූයේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පාරිභෝගික අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කරන්නේ පාරිභෝගික දිනය ඉලක්ක කර ගැනීමෙන් හෝ දැයට කිරුළ වැනි ප්‍රදර්ශනයන් ඉලක්ක කර ගැනීමෙන් පමණක් බවයි. අධිකාරිය විසින් සිදු කරන අධ්‍යාපනික වැඩ සටහන් පාරිභෝගික දිනය සැමරීමත් සමඟ අහෝසි වී යයි. මෙම තත්ත්වය පාරිභෝගික අධ්‍යාපන ක්‍රියාදාමය සාර්ථක කර ගැනීමට බාධාවක් වී තිබේ. එමෙන් ම සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ පාරිභොගික ආරක්ෂණ අධ්‍යාපන අවශ්‍යතා තවමත් ඵලදායී අයුරින් ඉටු වී නැත. එයට මූලික හේතු ලෙස පහත සඳහන් කරුණු අධ්‍යයනය මගින් හඳුනා ගත හැකි විය.

- ❖ පාරිභෝගික ආරක්ෂණය ලංකාව තුළ තවමත් නව විෂයක් ලෙස හඳුනා ගෙන තිබීම
- ❖ සුදුසු සම්පත් හා සෙසු අවශ්‍යතාවල අඩුව
- ❖ පාරිභෝගික ආරක්ෂණයේ වැදගත් බව පිළිබඳ ජනතාව තුළ පවතින අවම දැනුවත් බව
- ❖ අධ්‍යාපන ක්‍රමයේ පවතින මන්දගාමී විෂයමාලා වර්ධනය
- ❖ පාරිභෝගික ආරක්ෂණය දියුණු කිරීමට රජය දක්වන අවම අවධානය

පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ අධිකාරිය විසින් නිකුත් කරන අත් පත්‍රිකා බොහොමයක් මුද්‍රණය කර ඇත්තේ ඉංග්‍රීසි බසිනි. මෙය ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන සාක්ෂරතාවයෙන් අඩු පාරිභෝගිකයන්ට තොරතුරු දැන ගැනීමේ අයිතියට බාධාවක් වී තිබේ.

ලංකාව තුළ අත්‍යවශ්‍ය භාණ්ඩ ඇතැම් කාලවල වෙළඳපොළෙහි සුලභ වන අතර සෙසු කාලවල දී නිෂ්පාදන අතිරික්තයක් පවතී. ඒ සඳහා කිසිදු මැදිහත් වීමක් පනත මගින් සිදු කර නැත. නමුත් 1950 මිල පාලන හා ආහාර පනත යටතේ සෑම දිස්ත්‍රික්කයක ම දිසාපතිවරයා විසින් දිස්ත්‍රික්කය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ සංචිත දින 14 රැස් කර තැබීමට රජයේ ආහාර ගබඩා භාවිත කරන ලදි. දේශීය නිෂ්පාදන අස්වැන්න හිඟ කාලවල දී ඉහළ මිලකට අලෙවි වන අතර නිෂ්පාදන බහුල කාලවල දී ඉතාමත් පහළ මට්ටමක මිල තත්ත්වයට පත් ව සියලු නිෂ්පාදන අස්වනු නෙළන කාලය තුළ විශාල වශයෙන් විනාශ වේ. මේවා සංරක්ෂණය කිරීමට හෝ ගබඩා කර තැබීම හෝ මිලදී ගැනීම පිළිබඳ විධිමත් වැඩපිළිවෙලක් අධිකාරියට නැත. අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව පැවති කාලවකවානුව තුළ අතිරේක නිෂ්පාදන මිලදී ගැනීම වෙනුවෙන් අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව, වී අලෙවි මණ්ඩලය, දේශීය ද්‍රව්‍ය මිලදී ගැනීමේ දෙපාර්තමේන්තුව වැනි ආයතන යම් මට්ටමක දායකත්වයක් සැපයුවත් අද එම ආයතන අකර්මන්‍ය වී තිබේ. පාරිභෝගික අයිතිවාසිකම් බොහෝ ලෙස අභියෝගයට ලක් වීමට මෙම තත්ත්වය බලපා තිබේ.

## පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ දී ජනමාධ්‍යයේ කාර්යභාරය

පාරිභෝගිකයන්ගේ අභිමත සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන්ගේ ජීවිතයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා ජනසන්නිවේදන මාධ්‍යයට වැදගත් භූමිකාවක් ඉටු කිරීමට ඇත. මෙහි දී අඩු ආදායම්ලාභී ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන පාරිභෝගිකයන් මෙන් ම නාගරික ප්‍රදේශවල පාරිභෝගිකයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් වැඩසටහන් සම්පාදනය කළ යුතු ය. නමුත් දේශීය ප්‍රචාරණ මාධ්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ප්‍රබල දායකත්වයක් සිදු නොකරයි. ප්‍රචාරණ මාධ්‍යයන් මගින් ඕනෑ ම භාණ්ඩයක් පාරිභෝගිකයාට සමීප කිරීමේ හැකියාව නිෂ්පාදකයාට හිමි වී තිබේ. මෙම ප්‍රචාරණ මාධ්‍ය සියල්ල මුදල් මත ම කටයුතු කරනවා හැර භාණ්ඩ හා සේවාවන්ගේ ගුණාත්මක වටිනාකම, සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වයි. මේවා පාලනය කිරීමට අධිකාරිය පනතින් හිමිකර දී ඇති බලතල ක්‍රියාකාරිත්වය තුළ ප්‍රායෝගික වී නැත. පර්යේෂණ පත්‍රිකාව සකස් කරන කාලයෙහි දී අධීක්ෂණය කරන ලද රූපවාහිනී වෙළඳ දැන්වීම් පාරිභෝගික ආරක්ෂණ පනත් උල්ලංඝනය කරමින්


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පාරිභෝගිකයා නොමඟ යවන ප්‍රචාරණයන් සිදු කරන අයුරු හඳුනාගත හැකි විය. නිදසුනක් ලෙස නෙස්ටමෝල්ට් කිරිපිටි දැන්වීමක මෙසේ සඳහන් විය.

> මගේ පුතා උසයි ක්‍රියාශීලියි
> ඔබේ පුතා
>
> දන්නව ද? නෙස්ටමෝල්ට් වෙතින් දැන් තවත් සුභ ආරංචියක් ඒ තමයි හැදෙන වැඩෙන වයසේ සිටින මගේ පුංචි හපනාට උසින් සවියෙන් වැඩෙන්නට අධි කැල්සියම් සහිත නෙස්ටමෝලට් හයි කැල් ජූනියර් හඳුන්වාදීලා.
>
> අධිකැල්සියම් මගේ දඟකාරයාගේ ශක්තිමත් දත් හා අස්ථි වර්ධනයට උපකාරී වෙනවා.
>
> මෝල්ට් හා කිරි සාරය පිරි නෙස්ටමෝල්ට් හයි කැල් ජූනියර් ඔබේ දුවට පුතාට හඳුන්වා දෙන්න.
>
> මගේ පුතාටත්, දුවටත් මොල්ට් හා කිරි සාරයෙන් අනූන අධිකැල්සියම් සහිත නෙස්ටමෝල්ට් හයි කැල් ජූනියර්
>
> මම කවදත් නෙස්ටමෝල්ට් ගුණ හඳුනන මවක්


පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතෙහි 31 වන වගන්තියේ දැක්වෙන්නේ වෙළෙන්දකු විසින් ව්‍යාපාරයක් කර ගෙන යාමේ දී පාරිභෝගිකයා නොමඟ යවන හෝ රැවටීමට තුඩු දෙන කවර හෝ ආකාරයක පැවැත්මක නිරත නොවිය යුතු බවයි. එමෙන් ම භාණ්ඩ හෝ සේවාවල නොමැති අනුග්‍රාහකත්වයක්, අනුමැතියක්, කාර්ය සාධනයක්, ප්‍රයෝජනයක් හෝ ප්‍රතිලාභයක් ඇතැයි ප්‍රකාශ කරන නිෂ්පාදකයකු පනත යටතේ වරදකරු වන බව දක්වා තිබේ. මෙය පනතට පමණක් සීමා වී තිබෙන අතර අසත්‍ය ප්‍රචාරණ පිළිබඳ අධිකාරිය කිසිදු සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් මේ දක්වා ලබා දී නොමැත. නිරීක්ෂණය කරන ලද වෙළඳ දැන්වීම්වලින් පාරිභෝගික අයිතිවාසිකම්වලට බලපෑම් නොකරන්නේ Telesean ජාත්‍යන්තර සිංහල පරිවර්තන දැනවීම් පමණි.

## පාරිභෝගික සංවිධාන

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ අටවන වගන්තියේ දැක්වෙන පරිදි පාරිභෝගික සංවිධාන පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම හා ඒවාට සහය දැක්වීම අධිකාරියේ ප්‍රධාන කාර්යයක් ලෙස දැක්වේ. පාරිභෝගික සංවිධාන හා පාරිභෝගික අධ්‍යාපනය ප්‍රවර්ධනය කළ යුත්තේ අධිකාරිය සතු අරමුදලිනි. පාරිභෝගික සංවිධාන දෙයාකාරයකින් පාරිභෝගික ගැටලු ආමන්ත්‍රණය කළ යුතු ය. එනම් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමෙන් ඉහළ ම තෘප්තියක් ලබා ගැනීමට ප්‍රවේශයක් සකස් කිරීමයි. පාරිභෝගිකයා දැනුවත් කිරීම, වෙළඳ විෂමාචාර පාලනය කිරීම, විමර්ශනය කිරීම, පාරිභෝගිකයන් සම්බන්ධ ව තීරණ ගැනීමේ දී රජයට සහය දැක්වීම ආදී කාර්යයන්වල දී පාරිභෝගික සංවිධානවලට වැඩි මැදිහත් වීමක් සිදු කළ හැකි ය. ග්‍රාමීය ප්‍රදේශවල සිටින අඩු ආදයම් ලාභී, අඩු සාක්ෂරතාවයෙන් පෙළෙන පාරිභෝගිකයන් සංවිධාන වටා ඒකරාශී කර ගනිමින් ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලවල් සැකසීමේ දී පාරිභෝගික සංවිධාන වැදගත් වේ.

පාරිභෝගික සේවා අධිකාරිය මූලිකත්වයෙන් ස්ථාපිත කරන ලද පාරිභෝගික සංවිධාන 300 ට වැඩි ප්‍රමාණයක් පමණ ලංකාවේ පවතී. අධ්‍යයන නියැදිය මත ලබා ගන්නා ලද තොරතුරු මත පදනම් ව අධිකාරිය විසින් කොළඹ දිස්ත්‍රික්කය මූලික කරගනිමින් ස්ථාපිත කරන ලද පාරිභෝගික සංවිධාන දෙකක සාමාජිකත්වය පිළිබඳ ජනතාව ලබා දුන් තොරතුරු ප්‍රතිශතාත්මක වශයෙන් පහත පරිදි ප්‍රස්තාරයක් මගින් ඉදිරිපත් කළ හැකි ය.

පාරිභෝගික සංවිධානවල සාමාජිකත්වය





මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය
ප්‍රස්තාර අංක 01


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඉහත ප්‍රස්තාරයට අනුව පාරිභෝගික සංවිධාන ද්විත්වය කෙරෙහි අවධානය යොමු කරන විට පෙනීයන්නේ එහි සාමාජිකත්වය 100% හිමි කර ගෙන ඇත්තේ සමෘද්ධිලාභීන් විසින් වන බවයි. ප්‍රදේශයේ පාරිභෝගිකයන් හෝ ස්වේච්ඡා සමිති සාමාජිකයන් කිසිවෙක් පාරිභෝගික සංවිධාන සාමාජිකත්වය හිමි කර ගෙන නැත. අධ්‍යයනයෙන් තහවුරු වූයේ පාරිභෝගික සංවිධාන අධිකාරිය සමඟ එක් ව පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට දායකත්වයක් දක්වන්නේ නැති බවයි. පාරිභෝගික සංවිධාන විසින් පාරිභෝගිකයින් සම්බන්ධ ව තීරණ ගැනීමේ දී දායකත්වයක් ලබා දෙන්නේ ද යන්න අධ්‍යයනය කළ අතර එහි දී ඔවුන් ලබා දුන් තොරතුරු 02 ප්‍රස්තාරයෙන් දක්වා ඇත.


පාරිභෝගිකයින් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී පාරිභෝගික සංවිධානවල දායකත්වය




මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණය
ප්‍රස්තාර අංක 02

පාරිභෝගික සංවිධාන දෙකෙහි ම සාමාජිකයන්ගෙන් කිසිදු සාමාජිකයකු පාරිභෝගික අයිතිවාසිකම් සම්බන්ධයෙන් තීරණ ගැනීමට ඉහළ මට්ටමේ සහයක් ලබා දෙන බව හෝ තරමක් දුරට සහය වනබව හෝ දක්වා නැත. සාමාජිකත්වයෙන් 100% ම ප්‍රකාශ කර ඇත්තේ පාරිභෝගිකයන් සම්බන්ධයෙන් තීරණ නිර්මාණයට දායක නොවන බව ය. එමෙන් ම පාරිභෝගික සංවිධාන ශක්තිමත් කිරීම සඳහා අධිකාරිය විසින් ලබා දෙන අනුග්‍රහය පිළිබඳ නියැදියෙහි අදහස් ප්‍රතිශතයක් ලෙස ප්‍රස්තාරයකින් ඉදිරිපත් කළ හැකි ය.

පාරිභෝගික සංවිධාන ශක්තිමත් කිරීම සඳහා අධිකාරිය විසින් ලබා දෙන අනුග්‍රහය




මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණය
ප්‍රස්තාර අංක 03


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඉහත ප්‍රස්තාරයට අනුව පාරිභෝගික සංවිධාන දෙකෙහි ම සාමාජිකයන්ගෙන් කිසිදු අයෙකු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පාරිභෝගික සංවිධාන දිරිමත් කිරීම සඳහා ලබා දෙන දායකත්වය පිළිබඳ සෑහීමකට පත්වන බව හෝ තරමක් දුරට සෑහීමකට පත්වේ ද යන්න ප්‍රකාශ කර නැත. සංවිධානවල සාමාජිකයන්ගෙන් 100% ප්‍රමාණයක් ප්‍රකාශ කර ඇත්තේ පාරිභෝගික සංවිධාන දිරිමත් කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ලබා දෙන දායකත්වය කිසිසේත් ම සෑහීමකට පත් නොවන බවයි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පාරිභෝගික සංවිධාන ස්ථාපිත කිරීමට හා ඒවා ප්‍රවර්ධනය කිරීමට වැඩි ප්‍රමුඛතාවයක් ලබා දීමට පනත මගින් කටයුතු කර තිබේ. නමුත් ප්‍රායෝගික ක්ෂේත්‍රයෙහි එම අරමුණ ජය ගැනීමට අධිකාරියට තවමත් හැකියාව ලැබී නැත. සක්‍රීය පාරිභෝගික සංවිධාන පිහිටු වීමට අධිකාරියේ කැපවීම කිසිසේත් ම ප්‍රමාණවත් නොවේ. අධ්‍යයන නියැදිය මගින් ලබා ගත් තොරතුරුවලට අනුව පාරිභෝගික සංවිධාන දෙක ම 100%ක් අසාර්ථක වී ඇත. පාරිභෝගික සංවිධාන නියෝජනය කරන්නේ සමෘද්ධිලාභීන් ය. සමෘද්ධිලාභීන් යනු ලංකාවේ සමස්ත පාරිභෝගිකයන් නොවේ. පාරිභෝගික සංවිධාන සඳහා මොවුන් පැමිණෙන්නේ පාරිභෝගික සංවිධාන වටා ඒකරාශී වෙමින් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් නොව සමෘද්ධි සහනාධාරය අහිමි වේ යන බිය නිසා බව ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් පෙනීගිය කරුණකි.

එමෙන් ම දේශීය පාරිභෝගික සංවිධාන මුහුණ දෙන ගැටලු ගණනාවක් ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් තහවුරු විය. එනම්, නිසි දැක්මක් හා කාර්ය ක්ෂේත්‍රයක් නොමැතිවීම, බලය හා අධිකාරිය ප්‍රමාණවත් නොවීම, පාරිභෝගික සහභාගීත්වය අවම වීම, යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, සන්නිවේදන මාධ්‍ය භාවිතයේ ඌණතාව සහ රාජ්‍ය අනුග්‍රහය ප්‍රමාණවත් පරිදි නොලැබීම යනාදියයි. පාරිභෝගික සංවිධාන දුර්වල වීමට මෙම තත්ත්වයන් ද බලපා තිබේ.

## පාරිභෝගික අයිතිවාසිකම් සාධනය කිරීමේ දී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුහුණ දෙන ගැටලු

පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දී ප්‍රධාන වගකීම් හිමි ව ඇති ආයතනය බවට පත් ව ඇත්තේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියයි. අයිතිවාසිකම් සම්බන්ධ ව කිසියම් ගැටලුවක් පැනනැගුණු විට චෝදනා එල්ල වන්නේ ද මෙම ආයතනයටයි. එම නිසා අධ්‍යයනය මගින් පාරිභෝගික අයිතිවාසිකම් සාධනය කිරීමේ දී අධිකාරිය ගැටලු රාශියකට මුහුණපා ඇති බව හඳුනා ගත හැකි විය.

## භෞතික හා මානව සම්පත් හිඟය

පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දී අධිකාරිය මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් ලෙස සම්පත් හිඟය හඳුනාගත හැකි ය. විශේෂයෙන් වැටලීම් ආදිය සිදු කිරීමේ දී ප්‍රමාණවත් නිලධාරීන් හා පහසුකම් නොමැතිවීම මෙහි දී ප්‍රබල ගැටලුවක් වන බව අධ්‍යයනයෙන් පෙනී ගිය කරුණකි. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට වැටලීම් සඳහා නිලධාරින් 200ක පමණ අවශ්‍ය වුවත්, වර්තමානයේ ඒ සඳහා සිටින්නේ නිලධාරීන් 40ක පමණ ප්‍රමාණයකි. එමෙන් ම වැටලීම් සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ, රථ වාහන හා ඒ සඳහා රියදුරන් කිසිසේත් ම ප්‍රමාණවත් නොවන බව නිලධාරීන්ගේ මතය යි. කුලී පදනම මත වාහන යොදා ගැනීමට සිදුවීම නිසා අතිරේක වියදමක් දැරීමට අධිකාරියට සිදුවී ඇත. පාරිභෝගික අධ්‍යාපනික වැඩසටහන් දීප ව්‍යාප්ත ව සිදු කිරීමට ද පුහුණු නිලධාරීන්ගේ හිඟයක් ද පවතී. පාරිභෝගික අධ්‍යාපන ඒකකයක් පවතින්නේ කොළඹ පිහිටි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය තුළ පමණක් වන බැවින් එහි සේවය කරන නිලධාරීන් 20 දෙනකුට දීප ව්‍යාප්ත ව පාරිභෝගික අධ්‍යාපනික වැඩසටහන් මෙහෙය වීමට සිදුවී ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට පරිභෝජනයට නුසුදුසු භාණ්ඩ පිළිබඳ පර්යේෂණ කිරීමට අවශ්‍ය පර්යේෂණාගාර පහසුකම් ද අධිකාරිය සතු නොවේ. උදාහරණ ලෙස පසුගිය කාලච්ඡේදයේ ප්‍රමිතියෙන් තොර සිමෙන්ති පිළිබඳ පර්යේෂණ කිරීමට අවශ්‍ය සම්පත් අධිකාරිය නොවූ නිසා ප්‍රමිති ආයතනය හරහා අදාළ සාම්පල් පරීක්ෂා කිරීමට යොමු වූ බවයි. සෙසු ආයතන ඒකාබද්ධ කර ගෙන පර්යේෂණ සිදු කිරීම නිසා අනවශ්‍ය ප්‍රමාදයන් ඇතිවන බැවින් පාරිභෝගිකයාට උපරිම කාර්යක්ෂම සේවයක් ලබා දීමට මෙම තත්ත්වය බාධාවක් වී තිබේ.

## පාරිභෝගිකයන් තුළ පවතින නොදැනුවත් බව හා නොසැලකිලිමත්බව

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පාරිභෝගික අයිතිවාසිකම් සාධනය කිරීමේ දී මුහුණ දෙන අභියෝගයක් වන්නේ ජනතාව තුළ පවතින නොදැනුවත් බව හා නොසැලකිලිමත් බවයි. භාණ්ඩ හා සේවාවන් සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු ලබා ගැනීමේ අවකාශ වැඩි වශයෙන් වර්තමානයේ පැවතියත්, විශ්වාසදායක ආයතනවලින් භාණ්ඩ මිලදී ගැනීමට පාරිභෝගිකයන් උනන්දු නොවීම නිසා නොයෙක් ගැටලුවලට මුහුණ දීමට පාරිභෝගිකයන්ටත්, අධිකාරියටත් සිදුවී තිබේ. 2005-2012 වසරවල පැමිණිලි ආශ්‍රයෙන් අධිකාරිය පෙන්වා දෙන්නේ මෙම පැමිණිලිවලින් 80% කට වැඩි ප්‍රමාණයක් සම්බන්ධයෙන් විධිමත් ආකාරයෙන් පරීක්ෂණ මෙහෙය වීමට අවශ්‍ය සාක්ෂි පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් නොකරන බවයි. කිසියම් අසාධාරණයක් සිදු වූ විට තෙමසක් ඇතුළත පැමිණිලි කළ යුතු වුවත්, ජනතාව බොහෝ කාලයක් ගත වූ පසු ඒ කෙරෙහි අවධානය යොමු කරන අතර එසේ පැමිණිලි කිරීමේ දී භාණ්ඩ ලබා ගත් දිනය, ප්‍රමාණය, ආයතනය සඳහන් බිල්පතක් ඉදිරිපත් කළ යුතු වුවත් ජනතාව ඒ පිළිබඳ අවධානය යොමු නොකරන බව අධිකාරියේ මතයයි. පාරිභෝගිකයන් ඉදිරිපත් කරන පැමිණිලිවලින් වැඩි සංඛ්‍යාවක්


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඉදිරියට මෙහෙය වීම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ගැටලුවක් වී ඇත.

## ව්‍යාපාරික බලපෑම

නූතනයේ පාරිභෝගික සංවිධාන ශක්තිමත් ආකාරයෙන් නොපැවතියත්, වෙළඳ සංවිධාන බලසම්පන්න ව ක්‍රියාත්මක වේ. ව්‍යාපාරිකයන්ට විරුද්ධ ව අධිකාරියට කටයුතු කිරීමේ දී ප්‍රබල බලපෑම්වලට නතු වීමට සිදුවේ. භාණ්ඩවල මිල ඉහළ දැමීමේ දී ලිඛිත ව අධිකාරිය වෙත දැනුම් දිය යුතු ය. එය කෙතරම් යුක්ති සහගත ද යන්න අධිකාරිය විසින් විමර්ශනය කිරීමෙන් අනතුරු ව ව්‍යාපාරිකයන් වෙත ස්වකීය තීරණය දැනුම් දේ. ඇතැම් ව්‍යාපාරිකයන් විසින් අධිකාරියේ තීරණයන් ප්‍රකාශයට පත් කිරීමට ප්‍රථම භාණ්ඩවල මිල ඉහළ දැමීමට ක්‍රියා කරන බව අධිකාරියේ මතය යි. මහා පරිමාණ වෙළඳ ආයතනවලට එරෙහි ව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ දී නිලධාරීන්ට ව්‍යාපාරිකයන්ගෙන් එල්ල වන තර්ජන ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී බාධාවක් වී තිබේ.

## අනිසි දේශපාලන මැදිහත් වීම්

සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්හි රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපා ඇති ප්‍රබල ගැටලුවක් වන්නේ අනිසි දේශපාලන මැදිහත්වීම් ය. ශ්‍රී ලංකාව වැනි රටක පරිපාලනය හා දේශපාලනය අතර සමීප සම්බන්ධතාවක් පවතී. නමුත් වර්තමානය වන විට පරිපාලනය ඉක්මවා දේශපාලනය ඉදිරියට පැමිණ ඇති බැවින් මෙය රාජ්‍ය ආයතනවල ස්වාධීන පැවැත්මට බාධාවක් වී තිබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ද ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී දේශපාලන මැදිහත් වීම් පවතින නිසා ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී බාධාවක් වී ඇතිබව ක්ෂේත්‍ර අධ්‍යයනයන්ගෙන් පැහැදිලි වූ කරුණකි. සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ අධිකාරිය ක්‍රියාත්මක වන නිසා ප්‍රධාන විධායකය වන අමාත්‍යවරයාගේ නියමයන්ට අනුව ක්‍රියාත්මක වීමට නිලධාරීන්ට සිදුවේ. අධිකාරියේ නිලධාරීන්ගේ අදහස් මගින් ඒබව මැනවින් නිරූපණය වේ. එකී අදහස් කිහිපයක් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

*"ඇමතිතුමාගෙ ටාගට්වලට තමා අපි වැඩ කරන්නෙ"*

*"ඇමතිතුමාට රැස්වීම්වල දී පෙන්නල දුන්නත් වැදගත්ම පාරිභෝගික අධ්‍යාපනය කියලා ඒක පිළිගන්න කැමති නෑ. එයාට ඕන හැමදේම රුපියල්වලින් පෙන්නල ජනප්‍රිය වෙන්න"*

*"කලින් හිටපු ඇමතිතුමා හැමදේම බැලන්ස් කරගෙන ගියා. දැන් එහෙම නෑ. ඇමතිතුමා හදන්නෙ හැමදේම මාකට් කරන්න. අපිත් ඉතින් ඇමතිතුමාගෙ කැමැත්තට ඉඩ දීලා ඉන්නවා"*

මෙම අදහස්වලින් පෙනීයන්නේ පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නිලධාරීන් තුළ පවතින අදහස් ක්‍රියාවට නැගීමට අමාත්‍යවරයා එකඟ නොවීම තුළ දෙපාර්ෂවයේ ම අදහස් අතර පරස්පර විරෝධී බවක් ඇති වී තිබෙන බවයි. පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට මෙම තත්ත්වය බාධාවක් වී තිබේ.

## ශක්තිමත් පාරිභෝගික සංවිධාන නොමැති වීම

ලෝකයේ සෙසු සංවර්ධිත රාජ්‍යයන් සමඟ සැසඳීමේ දී දේශීය පාරිභෝගික සමාජ තවමත් බලවත් ව්‍යාපාර ලෙස සංවිධානගත වී නැත. මෙම සංවිධානවලට නිසි දැක්මක් හෝ තමාට වෙන් වූ කාර්ය ක්ෂේත්‍රයක් හෝ නොමැත. විධිමත් ආකාරයෙන් සංවිධානගත නොවීම තුළ සංවිධාන නියෝජිතයන් විසින් ඇතැම් විට ව්‍යාපාරිකයන්ට එරෙහි ව ගනු ලබන ක්‍රියාමාර්ග කෙරෙහි වෙළෙන්දන් විසින් අවධානය යොමු කිරීමක් සිදු නොකරයි. එමෙන් ම පාරිභෝගික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට මෙන් ම පාරිභෝගිකයන් සම්බන්ධයෙන් තීරණ ගැනීමට මෙම සංවිධාන දායක කර ගැනීමට අධිකාරියට නොහැකි වී තිබේ. මෙම තත්ත්වය හේතු කොට ගෙන පාරිභෝගිකයා සම්බන්ධ ව සියලු කාර්යයන් ඉටු කිරීමට සිදුව ඇත්තේ අධිකාරියට ම වෙන් වූ හුදෙකලා ක්‍රියාදාමයක් ලෙසිනි. ශක්තිමත් පාරිභෝගික සංවිධාන පවතින්නේ නම් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමය වඩාත් සුභවාදී අයුරින් සිදු කිරීමට හැකිබව අධිකාරියේ මතය යි.

## ආරක්ෂාව පිළිබඳ ගැටලු

පාරිභෝගික අයිතිවාසිකම් සාධනය කිරීමේ දී අධිකාරිය මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වශයෙන් ආරක්ෂාව පිළිබඳ හට ගෙන ඇති අවදානම පෙන්වාදිය හැකි ය. අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමය පාරිභෝගිකයාට සුභවාදී ක්‍රියාමාර්ගයක් වුවත්, ව්‍යාපාරිකයාට පාඩුවක් මෙන් ම අපකීර්තියකි. ව්‍යාපාරිකයා නිරන්තර ව ම උත්සාහ කරන්නේ තමා නිර්දෝෂී අයෙක් බවට සැලකිරීමට යි. මෙම තත්ත්වය තුළ කිසිදු ව්‍යාපාරිකයෙක් තමා වැරැද්දක් කළ බව හෝ එමගින් පාරිභෝගිකයාට අසාධාරණයක් සිදු වූ බව පිළි නොගනී. වැටලීම් සිදු කිරීමේ දී නිලධාරීන් සමඟ කේවල් කිරීමට ව්‍යාපාරිකයන් පෙළඹී තිබේ. ඇතැම් නිලධාරීන් බියට පත් කිරීමට, තර්ජනය කිරීම, පහර දීමට උත්සාහ කිරීම මෙන් ම මරණ තර්ජන සිදු කිරීම ආදියට මුහුණ දීමට සිදු වී ඇත. වැටලීම් සිදු කර ලබා ගන්නා ද්‍රව්‍ය සාම්පල් ආරක්ෂිත ව පරීක්ෂණ සඳහා රැගෙන යාම ද නිලධාරීන්ට මහත් ගැටලුවකි. පොලිස් නිලධාරීන්ගේ සහය ද ඇති ව අධිකාරිය විසින් ඇතැම් වැටලීම් සිදුකිරීමට පෙළඹී ඇත්තේ මෙම තත්ත්වය තුළ ය. අධිකාරීය පනත මගින් විධිමත් ආරක්ෂාවක් නිලධාරීන්ට සැපයුවත් ප්‍රායෝගික ක්ෂේත්‍රයෙහි දී විවිධ අපහසුතාවයන්ට මුහුණ දීමට මොවුන්ට සිදුවී ඇත.

## නිගමන

මෙම අධ්‍යයනයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පාරිභෝගික අයිතිවාසිකම් සාධනය කිරීමේ ක්‍රියාදාමය පිළිබඳ අවධානය යොමු කරන ලදී. එමඟින් ගම්‍ය වූයේ 2003 වර්ෂයේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මගින් ස්ථාපිත කරන


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ලද මෙම ආයතනය මූලික කාර්යයක් වන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමය විවිධ හේතූන් මත අසාර්ථකත්වයට පත් ව ඇති බවයි. සම්පත් හිඟය, ජනතාව තුළ පවතින නොදැනුවත් බව, අනිසි දේශපාලන මැදිහත් වීම්, ව්‍යාපාරික බලපෑම, ශක්තිමත් පාරිභෝගික සංවිධාන නොමැති වීම හා ආරක්ෂාව පිළිබඳ මතු වී ඇති ගැටලු හේතුවෙන් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමය සාර්ථක කර ගැනීමට බාධාවක් වී තිබේ. එකී දුර්වලතාවන් මඟහරවා ගැනීම සඳහා යෝජනා කිහිපයක් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

විචක්ෂණ පාරිභෝගිකයකු නිර්මාණය කිරීමට පවතින ප්‍රතිඵලදායී ක්‍රියාමාර්ගයක් වන්නේ පාරිභෝගික අධ්‍යාපනය යි. එය පුද්ගලයකු ජීවිත කාලය පුරා ම ලබා ගත යුතු දෙයකි. අධිකාරිය මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් ලෙස ජනතාව තුළ අයිතිවාසිකම් පිළිබඳ පවතින නොදැනුවත් බව හඳුනාගත හැකි විය. එය දුරු කළ හැකි එක ම ක්‍රමවේදය වන්නේ පාසල් විෂය මාලාවට පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ ක්‍රමවේදයන් එකතු කිරීමයි. සංවර්ධිත රාජ්‍යයන්හි පාරිභෝගික ආරක්ෂණය ප්‍රධානතම අංගයක් ලෙස පාසල් විෂය මාලාවට ඇතුළත් කර ඇත. ළමා අපයෝජන වර්ධනය වීමත් සමඟ ළමා රක්ෂණ අධිකාරියේ ඉල්ලීම මත ළමා අයිතිවාසිකම් පිළිබඳ පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය එකඟ වී ඇත. එපරිද්දෙන් ම වෙළඳපොළ තුළ බහුල ලෙස අපයෝජනයට ලක්වන පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට ද මෙවැනි ක්‍රමවේද යෙදීම මඟින් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රුකුලක් වනු ඇත. මන්ද පාරිභෝගික අයිතිවාසිකම් සමාජයේ එක කණ්ඩායමකට නොව සමස්ත සමාජයට ම අදාළ වන නිසා ය. රජය විසින් ජාතික පාරිභෝගික වැඩසටහන් සකස් කිරීමේ දී පහත සඳහන් අංග එයට ඇතුළත් කළ යුතු ය.

- ❖ පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම්
- ❖ අතීතයේ සිට වර්තමානය දක්වා ඇති පාරිභෝගික ආරක්ෂණ නීතිරීති හා එහි වැදගත්කම
- ❖ පාරිභෝගික තීරණ ගැනීමේ ක්‍රියාවලියේ මූලික මූලධර්ම
- ❖ වර්තමානයේ පවතින වෙළඳ ප්‍රචාරණය හා දැන්වීම්කරණය පිළිබඳ පාරිභෝගිකයාගේ දැනුම වර්ධනය කිරීම
- ❖ පාරිභෝගික තීරණ ගැනීමේ ක්‍රියාදාමයේ මූලික පරමාර්ථ ඉගැන්වීම

විෂය දැනුමින් පාරිභෝගිකයා පරිපූර්ණ වූ විට අයිතිවාසිකම් උල්ලංඝනය වීමක දී අසරණ ව බලා සිටීමේ පිළිවෙතින් බැහැර ව ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීමට පාරිභෝගිකයා පෙළඹේ.

දේශීය පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝනය වීමට ප්‍රමුඛ බලපෑමක් එල්ල කිරීමට ජනමාධ්‍ය සමත් වී ඇත. මෙය වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය මැදිහත් විය යුතු ය. විශේෂයෙන් පාරිභෝගික ආරක්ෂණ සන්නිවේදන ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට කටයුතු යෙදීමට අධිකාරියට හැකි ය. ඒ සඳහා සෙසු රාජ්‍යයන් ආදර්ශයට ගත හැකි ය. රූපවාහිනිය හා ගුවන්විදුලිය ගම්බද අඩු සාක්ෂරතාවයෙන් යුක්ත පාරිභෝගිකයන් වෙත සමීප විය හැකි මෙන් ම ඔවුන්ට බලපෑම් කළ හැකි මාධ්‍යයකි. පාරිභෝගික ආරක්ෂණ හා තොරතුරු වැඩසටහන් සම්පාදනය කරමින් ඒවා ජනමාධ්‍ය හරහා විකාශනය කිරීමට සැලැස්විය යුතු ය. මෙහි දී නිෂ්පාදන අන්තරායන්, පාරිභෝගිකයාට අදාළ නීති, සහන ලබා ගත හැකි ආයතන, භාණ්ඩ හා සේවාවන්වල ප්‍රමිති පිළිබඳ දැනුවත් කිරීම ආදිය ජනමාධ්‍යයන්ට සාර්ථක ව කළ හැකි ය. පසුගිය කාලපරිච්ඡේදයේ විදුලි බලය අරපිරිමැස්මෙන් පරිහරණය කිරීම පිළිබඳ හෙට වෙනුවෙන් අද නම් වැඩසටහනක් විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් රූපවාහිනී නාලිකා මගින් විකාශය විය. එවැනි ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පාරිභෝගික කටයුතු අධිකාරියට ද ආරම්භ කළ හැකි ය. එමඟින් පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ ජනතාව සතු දැනුවත් බව වර්ධනය කළ හැකි ය.

දේශීය පාරිභෝගික සංවිධාන ශක්තිමත් කිරීම සඳහා අධිකාරියේ මැදිහත් වීම මගින් විධිමත් ක්‍රමවේදයක් සැකසිය යුතු ය. පාරිභෝගික සංවිධාන වෙත සියලු පිරිස් දායක කර ගත යුතු ය. එයට වෙන් වූ දැක්මක් කාර්යය ක්ෂේත්‍රයක් පවරා දිය යුතු අතර අනිසි දේශපාලන මැදිහත් වීම්වලින් තොර ව ස්වේච්ඡා සංවිධාන ලෙස මෙම සංවිධාන ප්‍රජාව තුළින් ඉස්මතු වීමට ඉඩ දිය යුතු අතර මෙහි කාර්යයන් නිසි ලෙස ඉටු කිරීමට හැකිවන ලෙස අවශ්‍ය අනුග්‍රාහකත්වය හා උපදේශකත්වය පමණක් අධිකාරිය විසින් ලබා දිය යුතු ය. එමෙන් ම පාරිභෝගිකයින් සම්බන්ධයෙන් තීරණ නිර්මාණය කිරීමේ දී පාරිභෝගික සංවිධානවල දායකත්වය ලබා ගත යුතු ය. පාරිභෝගික අධ්‍යාපනය ලබා දීමට මෙම සංවිධාන දායක කර ගත යුතු අතර දැනුම ලබා දීමේ දී පහත සඳහන් කාර්යය ක්ෂේත්‍රයන් ඒවාට පවරාදිය යුතු ය.

- ❖ අතීතයේ සිට ශ්‍රී ලංකාවේ වාණිජ කටයුතු පැවති ආකාරය හා ඒ පිළිබඳ පැවති නීතිරීති
- ❖ වර්තමානයේ පවතින පාරිභෝගික ආරක්ෂණ නීතිරීති
- ❖ කෘත්‍රිම ආහාර පරිභෝජනය මගින් පාරිභෝගිකයාට සිදුවන හානි
- ❖ බහුජාතික සමාගම් විවෘත ආර්ථික ක්‍රමය තුළ දේශීය වෙළඳපොළට බලපෑම් කරන ආකාරය

එමෙන් ම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත උල්ලංඝනය කරන වෙළෙඳුන්ට එරෙහි ව දඩ මුදල් සමඟ සිරදඬුවම් ද නියම කළ යුතු ය. දඩ ගෙවීමට පමණක් කටයුතු සැලැස්වීමෙන් අදාළ මුදල ගෙවීමෙන් පසු තමා කළ වරද නිවැරදි කර ගැනීමට වෙළෙඳුන් ක්‍රියාකරන්නේ නැත. දඩ මුදල් නියම කරන ලද ආයතන මාධ්‍ය මඟින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතු ය. එවිට සෙසු ව්‍යාපාරිකයන් ද පාරිභෝගිකයා කෙරෙහි සැලකිල්ලක් දැක්වීමට පෙළඹේ. ව්‍යාපාරිකයන්ගෙන් වන බලපෑම පාලනය කිරීමට මෙය වැදගත් වේ.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට බඳවා ගන්නා නිලධාරීන්ට විධිමත් පුහුණුවක් ලබා දිය යුතු ය. පාරිභෝගික ආරක්ෂණ නීති, තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම මෙන් ම ආධ්‍යාත්මික සංවර්ධනය ද වර්ධනය කළ යුතු ය. ව්‍යාපාරික බලපෑමට යටත් ව අල්ලස් ගැනීම් ආදියෙන් මිදී සැබෑ ජනතා සේවකයකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දිය යුතු ය. මන්ද පනත තුළින් නිලධාරීන්ට ලබා දී ඇති නෛතික රැකවරණ හේතුවෙන් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කරමින් පාරිභෝගිකයාට උපරිම සාධාරණයක් ඉටු කිරීම හෝ නොකිරීම තීරණය වන්නේ නිලධාරීන් තුළ පවතින උනන්දුව හා කැපවීම මත වන නිසා ය. නිලධාරීන්ට විධිමත් පුහුණුවක් ලබා දීම මගින් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ක්‍රියාවලිය වඩාත් සාර්ථකත්වයට පත් කර ගත හැකි ය.

එමෙන් ම පාරිභෝගිකයාට අසාධාරණකම් සිදු වූ අවස්ථාවල ඒ පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම සඳහා ක්ෂණික ඇමතුම් අංකයක් අධිකාරියට හඳුන්වාදිය හැකි ය. ජපානය, බ්‍රිතාන්‍ය, මැලේසියාව වැනි රටවල පාරිභෝගික ආරක්ෂණය විධිමත් කිරීමට මෙවැනි ක්‍රමවේදයන් ඉතා සාර්ථක ව ක්‍රියාත්මක වේ. අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ජනතා සහය ලබා ගැනීමට එය වැදගත්වේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මැදිහත් වීමෙන් පාරිභෝගික උපදේශන මධ්‍යස්ථාන ආරම්භ කිරීමට පියවර ගත යුතු ය. ප්‍රදේශීය ව ළඟා විය හැකි මධ්‍යස්ථාන මගින් පාරිභෝගිකයන්ට අවවාද ලබා දීමේ දියුණු පද්ධතීන් සමහර රටවල ක්‍රියාත්මක වේ. මෙවැනි ක්‍රියාදාමයන් රජයේ ආයතන මඟින්, ජාතික වශයෙන් හා ප්‍රදේශීය මට්ටමෙන් ද ඇතැම් විට රජයේ සහාය ඇතිව ස්වාධීන ආයතන මැදිහත් වීමෙන් ද ආරම්භ කළ හැකි ය. මෙවැනි උපදේශන මධ්‍යස්ථාන හරහා භාණ්ඩ මිලදී ගැනීමේ දී සැලකිය යුතු කරුණු, අසාධාරණයක දී පැමිණිලි කළ යුතු ආයතන ආදිය පිළිබඳ පාරිභෝගිකයන් දැනුවත් කළ හැකි ය. නමුත් මෙම ආයතන පාරිභෝගිකයාට අඩු පිරිවැයක් දරමින් සේවා ලබා ගත හැකි ආයතන විය යුතු ය. පාරිභෝගික දැනුවත් බව වර්ධනය කිරීමට මෙවැනි අංග වැදගත් වේ.

අධිකාරිය මැදිහත් වීමෙන් විධිමත් පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට පියවර ගත යුතු ය. පාරිභෝගික ආරක්ෂණ අධ්‍යාපනය, තොරතුරු හා සන්නිවේදනය, පාරිභෝගික ආරක්ෂණයේ නීතිමය රාමුව යනා දී කරුණු එම පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්තියට අන්තර්ගත කළ යුතු ය. පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්තියක් පවතින විට පාරිභෝගිකයාට මෙන් ම ව්‍යාපාරිකයාට ද එය වැදගත් වේ.

පාරිභෝගිකයා හා ව්‍යාපාරිකයා අතර ඇති විය යුත්තේ තරඟකාරීත්වයක් නොව අන්තර් සබඳතාවකි. එම සුහදත්වය වර්ධනය වීම මගින් අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම වඩාත් පහසුවනු ඇත. අධිකාරිය මැදිහත් වීමෙන් විධිමත් පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්තියක් නිර්මාණය කරන්නේ නම් ඉහත අරමුණු ඉටුකර ගැනීමට හැකියාව ලැබීම මගින් පාරිභෝගික අයිතීන් ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාදාමය ආයාසයකින් තොර ව ඉටු කර ගැනීමට හැකියාව ලැබේ. පාරිභෝගික අයිතිවාසිකම් සම්බන්ධයෙන් තීරණ නිර්මාණය කිරීමට රාජ්‍ය අංශය පමණක් නොව පාරිභෝගික සංවිධානවලට සහ රාජ්‍ය නොවන අංශය ද දායක කර ගන්නේ නම්, අනිසි දේශපාලන මැදිහත් වීම් යම් පමණකට හෝ අවම කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත විශ්ව මානව හිමිකම් ප්‍රඥප්තීන්ට අනුකූල කිරීමට හැකිවන අයුරින් සංශෝධනය කිරීම ද කාලීන අවශ්‍යතාවකි. එහි දී පනත තුළ ඇති කළ යුතු සංශෝධන ගණනාවක් පවතී. පළමු ව අධිකාරී පනත තුළ පාරිභෝගිකයා පිළිබඳ ඉදිරිපත් කර ඇති නිර්වචනය සංශෝධනය විය යුතු ය. මෙම නිර්වචනය මගින් පාරිභෝගිකයා පිළිබඳ අවධානය යොමු කර ඇත්තේ ආර්ථික විද්‍යාත්මක පදනමකිනි. එනම් භාණ්ඩ හා සේවා මිලදී ගන්නකු වශයෙනි. පාරිභෝගිකයා මානවයෙකු ලෙස සලකමින් නිර්වචනය කිරීම කෙරෙහි අධිකාරියේ අවධානය යොමු විය යුතු ය.

පනත මගින් දක්වා ඇති මිල දර්ශන ප්‍රදර්ශනය කිරීමේ දී සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ම සිදු කරන අයුරින් පනත සංශෝධනය කළ යුතු ය. බහුවාර්ගික ජන සමාජයක් තුළ සෑම ජන වර්ගයක් ම නියෝජනය කරන පාරිභෝගිකයන්ගේ ම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කිරීමේ දී මෙම පියවර වැදගත් වේ. වෙළඳපොළෙහි සැරිසරන සමස්ත පාරිභෝගිකයන්ගේ ම පැවැත්ම පමණක් නොව ගරුත්වය, අනන්‍යතාව හා සමානාත්මතාව ආරක්ෂා වන අයුරින් නීතිරීති සංශෝධනය කළ යුතු ය.

**පරිශීලිත මූලාශ්‍රය**

කුමාර, එම්. කේ. පී. (1998) උපාය මාර්ගික අලෙවිකරණය, වරකපොළ, ආරිය ප්‍රකාශකයෝ.

ගමගේ, එස්. අයි. (1998) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය, කොළඹ, එම්. ඩී. ගුණසේන සහ සමාගම.

ජයතිලක, නිහාල් රංජිත් (2000) වෙළඳ ප්‍රචාරණය, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දයාරත්න, බන්දුල ජී. (1995) පවුලක අයවැය කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දසනායක, ඩී. එම්. ටී. බී. (1994) පාරිභෝගික ආරක්ෂණය සහ ශ්‍රී ලංකාවේ දායකත්වය, අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව.

ප්‍රනාන්දු, ලක්සිරි (2000) මානව අයිතිවාසිකම් යනු කුමක්ද?, කොළඹ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පුහුණුකරුවන් සඳහා වන පුහුණු ආයතනය.

බණ්ඩාර, ආර්. එම්. ජේ. (2008) ප්‍රමිතිකරණය සහ පාරිභෝගික ආරක්ෂණය, කර්තෘ ප්‍රකාශන.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මහලියනආරච්චි, රෝහණ පී. (2004) සේවා අලෙවිකරණය, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Bandara, R. M. J. (2007) An essential guide to consumer regulations in Sri Lanka, Polgasovita, The Auther.

Fernando, Laksiri (2002) Human Rights Politics and State, Social Scientists Association.

Hey wood, Andrew (1999) Political Theory, New York, Macmillan Press.

Jayasuriya, D. C. (1982) Law and Social Problems modern in Sri Lanka, New Delhi, Sterling publisher.

Jayasuriya, D. C. (2004) Guide to the Consumer affaiß authority act, Nawala, Asian pathfinder publisheß & Bookselleß

Matthews, Derek (1990) Consumer Responsibilities, Generating power, I. O. C.



© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දොළොස්වන කලාපය 2021 දෙසැම්බර්
පිටු 16-27
ISSN 1800-1459 eISSN 2386-2041
© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ජෛව විවිධත්ව සංරක්‍ෂණය සඳහා අතරමැදි කලාපයේ සාම්ප්‍රදායික ගෙවතුවල භූමිකාවඃ බෙලිහුල්ඔය ප්‍රදේශය ආශ්‍රයෙන්.

# (The Role of Traditional Home Gardens in Intermediate Zone for the Biodiversity Conservation with specially to Belihul-Oya Area)

ඩබ්ලිව්. එම්. ඩී. පී. කුමාරි සහ එම්. එස්. එම්. එල්. කරුණාරත්න

භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
**dishmipriyangika@gmail.com**

### සාරසංක්ෂේපය

ලොව ජෛව විවිධත්වයෙන් උණුසුම් කලාප අතරට අයත් ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණයේ දී සාම්ප්‍රදායික ගෙවතුවල දායකත්වය කෙරෙහි වර්තමාන බොහෝ පර්යේෂකයන්ගේ අවධානය යොමු ව ඇත. මෙම අධ්‍යයනය සඳහා අතරමැදි කලාපයට අයත් බෙලිහුල්ඔය, සීලෝගම සහ යක්දෙහිවල යන ග්‍රාම නිලධාරී වසම්වලට අයත් සාම්ප්‍රදායික ගෙවතු පහක් තෝරාගනු ලැබී ය. අතරමැදි කලාපයේ සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්ෂණයට දායක වන ආකාරය හඳුනා ගැනීම අරමුණ වේ. අධ්‍යයනය මිශ්‍ර ක්‍රමවේදය යටතේ සිදු කරන ලදී. ප්‍රාථමික දත්ත රැස් කිරීම යටතේ ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීමට ස්වාභාවික විද්‍යාත්මක විධික්‍රම භාවිත කළ අතර ශාක පිළිබඳ දත්ත සිව්රැසි අධ්‍යයනය යටතේත්, පක්ෂීන් පිළිබඳ දත්ත Point Count Method හා Observation යටතේත් රැස් කරනු ලැබී ය. ගුණාත්මක දත්ත රැස් කිරීම සමාජීය විද්‍යාත්මක විධික්‍රම යටතේ සිදු කළ අතර අරමුණු නියැදීම යටතේ සම්මුඛ සාකච්ඡා හා ඒවා තහවුරු කර ගැනීමට සෘජු නිරීක්ෂණ ද සිදු කරනු ලැබී ය. ද්විතීයික දත්ත රැස් කිරීමට ආයතනික තොරතුරු, ලිඛිතමය මූලාශ්‍රය හා අන්තර්ජාලය භාවිත කරනු ලැබී ය. සාම්ප්‍රදායික ගෙවතු පහ ආශ්‍රිත සිව්රැසි අධ්‍යයන මගින් විශේෂ 147කට අයත් ශාක 736ක් හඳුනාගත හැකි වූ අතර සම්මුඛ සාකච්ඡා හා සෘජු නිරීක්ෂණ යටතේ කෘෂි ජෛව විවිධත්වය ඉහළ මට්ටමක පවතින බවත්, ප්‍රජා සහභාගීත්ව ජෛව විවිධත්ව සංරක්ෂණයක් සිදු වන බවත්, ආහාර සුරක්ෂිතාව තහවුරු වන බවත් හඳුනාගත හැකි විය. පක්ෂි විශේෂ අධ්‍යයනය හමුවේ විවිධත්වය, සුලභතාව හා විශේෂ පොහොසත්බව ඉහළ අගයක පවතින බව හඳුනාගත හැකි විය. එහි දී ගෝත්‍ර හතකටත්, කුල 25කටත් අයත් පක්ෂි විශේෂ 41ක් නියෝජනය වන පක්ෂීන් 703ක් මෙම ගෙවතු පහෙන් වාර්තා වූ අතර ආවේණික පක්ෂි විශේෂ අටක් ද, තර්ජනයට ලක්වීමට ආසන්න විශේෂ දෙකක් ද ඒ අතර විය. ඒ අනුව අතරමැදි කලාපයේ සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා දායක වන බව නිගමනය කළ හැකි ය.

**කේන්ද්‍රීය වචන**ඃ ජෛව විවිධත්ව සංරක්ෂණය, කෘෂි ජෛව විවිධත්වය, ශාක, පක්ෂීන්, සාම්ප්‍රදායික ගෙවතු

Many of present researchers have given their attention to the contribution of traditional home gardens for the biodiversity conservation of Sri Lanka which belongs to the world biodiversity hotspots. For this research, five traditional home gardens of the intermediate zone from Belihuloya, Seelogama and Yakdehiwala Grama Niladhari Divisions were selected. The research was done according to the mixed methodology. Quantitative data under the primary data collection were collected with the help of natural scientific methods. Data about the plants were collected under quadrats method and the data about the birds were collected under the point count method and observation. The collection of qualitative data was done by using the social scientific methods and their results have been confirmed through interviews taken according to purposive sampling and direct observations. Secondary data and information were collected from relevant institutions, written sources and web sites. The study found 736 plants related to 147 species from the quadrats method in relation to the five traditional home gardens. Interviews and direct observations confirmed that the agro-biodiversity, community participatory biodiversity conservation and food security in the study area remain at a higher level. The diversity, abundance and the richness of species are at a higher level and those were recognized according to the bird species study.  There were 703 birds representing 41 bird species under seven order and 25 families reported that eight endemic bird species and two species are threatened. According to the results, it can be concluded that traditional home gardens in the intermediate zone are contributing to the biodiversity conservation.

**Key words**: Biodiversity conservation, Agro biodiversity, Plants, Birds, Traditional home garden

## හැඳින්වීම

නෝර්මන් මයර්ස් විසින් 1988 දී දේශීය ආවේණික විශේෂවල අධික සාන්ද්‍රණයක් සහිත හා ඒවාට අධික තර්ජනයක් සහිත ප්‍රදේශ ජෛව විවිධත්වයෙන් උණුසුම් කලාප ලෙස නම් කර ඇති අතර ඉන්දියාවේ බටහිර ගාඩ්ස් හා ශ්‍රී ලංකාව එක් කලාපයක් ජෛව විවිධත්වයෙන් උණුසුම් කලාප 34 අතරට අයත් වේ (Myers 2000). ජීවය තුළ සියලු ආකාරයේ මට්ටම් හා සංයෝජනවල වෙනස්කම් ජෛව විවිධත්වය වන අතර එය පරිසර පද්ධති, විශේෂ හා ජානමය මිනුම් අතර එකතුව නොව ඒවා අතර ඇති විවිධත්වය නියෝජනය කරන්නකි (පද්මසිරි සහ බණ්ඩාර 2017). ජෛව විවිධත්ව හායනයට බලපාන හේතු සාධක ලෙස ශාක හා සත්ත්ව විශේෂවල වාසස්ථාන හායනය, ඛණ්ඩනය, ඉහළ උපයෝජනය මෙන් ම දූෂණය, දේශගුණික විපර්යාස හා කෘෂි ආර්ථික ක්‍රියාවලියේ බලපෑම හඳුන්වාදිය හැකි ය. එමගින් ජෛව විශේෂ නෂ්ඨ වීම හා තර්ජනයට ලක්වීම සිදු වේ (Ayyad 2003). එලෙස හායනයට ලක් වන ජෛව විවිධත්වය සංරක්‍ෂණය කළ යුතු අතර 1980 දශකයේ අවසානය වන තුරු ම සංරක්ෂණය යන වචනයේ අර්ථය කිසිඳු තැනක සඳහන් ව නොමැත. 1982 එක්සත් ජාතීන්ගේ පරිසර සම්මේලනයේ ප්‍රතිඵලයක් ලෙස එළි දැක්වූ World Conservation Strategy (ලෝක සංරක්ෂණ උපායමාර්ග) ලියවිල්ල තුළ "සංරක්ෂණය" යන්න පළමු ව අර්ථකථනය විය (Synchronic 2019). සංරක්ෂණය යන්න ලෝක සංරක්ෂණ සංගමයේ පාරිභාෂිතය (IUCN Definition Glossary) තුළ අර්ථ දක්වන්නේ "දිගුකාලීන ස්ථිරතාව සඳහා ස්වාභාවික තත්ත්වයන් ආරක්ෂා කර ගැනීමට පරිසර පද්ධති, වාසස්ථාන, වන ජීවී විශේෂ හා ජනගහනය ඔවුන්ගේ පරිසරය තුළ හෝ ඉන් පිටත ආරක්ෂා කිරීම, රැකබලා ගැනීම, කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම" යනුවෙනි (IUCN 2019). එමගින් පැහැදිලි වන්නේ හායනයට ලක් වන ජෛව විවිධත්වය සංරක්ෂණය යනු මූලික ව ම නම් කර ඇති වනාන්තර ප්‍රදේශ හා ආරක්‍ෂිත ප්‍රදේශ පමණක් සංරක්‍ෂණය කිරීම නොවන බවයි (Kenneth 2015). එනම් ජෛව විවිධත්ව සංරක්‍ෂණය යනු පෘථිවියේ ජීවය සුරැකීමට එහි ස්වරූපය හා ස්වාභාවික පරිසර පද්ධති පවත්වාගෙන යාම හා සෞඛ්‍ය සම්පන්න කිරීම වේ (IUCN 1995). තවදුරටත් විග්‍රහ කරන්නේ නම් ජෛව විවිධත්ව සංරක්‍ෂණය යනු "වත්මන් පරපුරට මූලික අවශ්‍යතා අඛණ්ඩ ව සැලසෙන පරිද්දෙන් අනාගත පරපුරේ අවශ්‍යතා හා අභිමතාර්ථ සපුරා ගැනීමට බාධා නොවන අයුරින් ජෛවගෝලය තිරසර ලෙස ප්‍රයෝජනයට ගැනීම හා කළමනාකරණය කිරීම වේ" (ජයසේකර 2015: 27).

වනාන්තරයක් යනු දේශගුණය සඳහා සාධකයක් වෙමින්, පරිසර පද්ධති නියාමනය කරනු ලබන, ජෛව විවිධත්වය සුරකින, කාබන් චක්‍රයේ අංගයක් ලෙස ක්‍රියාත්මක වන, ජීවනෝපාය සඳහා සහය වෙමින් භාණ්ඩ හා සේවා සපයන ස්වාභාවික පරිසරය තුළ ගොඩනැගුණකි (IUCN 1995). එසේ ම හෙක්ටයාර 0.5ක වපසරියකින් යුක්ත, මීටර පහට වඩා වැඩි උසකින් යුතු ගස් සමඟ 10%ට වඩා වැඩි උස වියන් ස්තරයක් සහිත නාගරික හෝ කෘෂිකාර්මික ඉඩම් පරිභෝජනයට ප්‍රධාන වශයෙන් අයත් නොවන ප්‍රදේශ වනාන්තර වේ (Kenneth 2015). ශ්‍රී ලංකාවේ වන ආවරණය වෙනස්වීම පිළිබඳ සලකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 1956 දී වන ආවරණය 44.1%ක් පැවති අතර, 1992 දී 35%ක් ද, 1999 දී 32%ක් ද, 2010 දී 29.7%ක් ද ලෙස වාර්තා වේ (Sathurusinghe 2017). 2016 වසර වන විට ශ්‍රී ලංකාවේ වන ආවරණය 32.9%ක් වන බව වාර්තා වී තිබේ (tradingeconomics.com 2020).

කෙසේ නමුදු මෙලෙස වන ආවරණය අඩු වී යාමත් සමඟ ශාක හා සතුන්ගේ ආරක්‍ෂක ස්ථාන බවට සාම්ප්‍රදායික ගෙවතු පත් වන අතර, එමගින් ජෛව විවිධත්ව සංරක්‍ෂණය සිදු වේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අජිත් පෙරේරා හා නෙවිල් රාජපක්‍ෂ යන පර්යේෂකයන්ට අනුව සාම්ප්‍රදායික ගෙවතු ජාන කිටුව පරිබාහිර සංරක්‍ෂණය සඳහා දායක වන මධ්‍යස්ථාන බවට පත් ව ඇත (කරුණාරත්න 2013). වනාන්තරයක් ආකාරයෙන් සැකසුණ සේම වනාන්තරයක පවත්නා වියන් ස්තර මෙන් සාම්ප්‍රදායික ගෙවත්ත තුළ ශාක ස්තර පිහිටා තිබීම විශේෂත්වයකි (Pushpakumara and etal 2010). සාම්ප්‍රදායික ගෙවතු බහු වාර්ෂික නිෂ්පාදන පද්ධතියකින් සමන්විත වේ. බහු වාර්ෂික ආහාර බෝග, පළතුරු, එළවළු, අල, බතල, ඖෂධ පැළෑටි, උග්ගස්, කුළුබඩු බෝග සහ දැවමය බෝගවලින් යුක්ත වේ (Marambe and etal 2012). සාම්ප්‍රදායික ගෙවත්තක් කෘෂි පාරිසරික පද්ධතියක් වන අතර ජෛව විවිධත්වයේ පොහොසත් බව රැක ගැනීමට දායක වේ. ශාක හා සතුන් විශාල ලෙස සාම්ප්‍රදායික ගෙවතු මත යැපෙන අතර විවිධ වර්ගයේ හා විවිධ මට්ටමේ නේවාසික විවිධත්වයක් හඳුනාගත හැකි ය. සාම්ප්‍රදායික ගෙවතුවල සංකීර්ණ වෘක්‍ෂලතා වර්ග පවතින අතර මේවා සතුන්ට ආරක්‍ෂාව, ආහාර සහ අභිජනනය සඳහා නේවාසික සපයයි (Pathmasiri and Bandara 2016). හිටිනායක, සිල්වා (2009) හා සින්ක්ලෙයාර්ට (2000) අනුව වනාන්තරමය ගෙවතු < 0.1 ha සහ > 2 ha දක්වා විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත වේ (Karunarathne 2013). මෙවැනි වනාන්තරමය ගෙවතු කෑගල්ල, කුරුණෑගල, මාතලේ, නුවරඑළිය සහ රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි ව්‍යාප්ත ව ඇත (Pushpakumaraet and etal 2010). අධ්‍යයනය සඳහා තෝරාගත් බෙලිහුල්ඔය ප්‍රදේශය රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ය. රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රදේශීය වපසරිය වර්ග කිලෝ මීටර් 3255 වන අතර ජන ඝනත්වය වර්ග කිලෝ මීටරයට 325ක් වේ. වන ආවරණය 19.0%ක් වන අතර ඉන් ගෙවතු 17.0%ක් පවතී (Pushpakumara and etal 2010).

සාම්ප්‍රදායික ගෙවත්තක් ලෙස මෙම පර්යේෂණයෙන් අදහස් කරනුයේ අක්කරයට වඩා අඩු භූමියක නිවසක් සහිත මිශ්‍ර බෝග වගාවකින් යුක්ත, ඒවා මත යැපෙන සත්ත්ව විවිධත්වයක් පවතින, ස්ථිර පදිංචිය වසර 50 කට වඩා වැඩි, ප්‍රදේශීය සභාවකට ඡන්ද හිමිකම ඇති නිවැසියන් වෙසෙන ගෙවත්තකි. ජෛව විවිධත්ව සංරක්‍ෂණය සඳහා අතරමැදි කලාපයේ සාම්ප්‍රදායික ගෙවතුවල භූමිකාව කෙබඳු ද යන්න බෙලිහුල්ඔය



© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රදේශය ආශ්‍රයෙන් හඳුනා ගැනීම මෙම අධ්‍යයනය මගින් අපේක්ෂිත ය.

## සාහිත්‍ය විමර්ශනය

ජෛව විවිධත්වය යනු කලාපයක ජාන, විශේෂ හා පරිසර පද්ධතිවල සතුන්, ශාක හා ක්ෂුද්‍ර ජීවීන්ගේ විවිධත්වය හා විචලතාව වේ (Agbodigi and Adorol 2013). හායනයට ලක් වන ජෛව විවිධත්වය සංරක්ෂණය කළ යුතු අතර සංරක්ෂණය පිළිබඳ නිර්වචන රාශියක් පවතී. ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග, සොබාදහම සමඟ හොඳ සබඳතාවක් දියුණු කිරීම හෝ නඩත්තු කිරීම සංරක්ෂණය ලෙස දැක්විය හැකි ය (Sandbrook 2015). ස්වාභාවික ලෝකය තුළ ජීවීන්ගේ විවිධත්වයක් ඇති බව පිළිගත යුතු ය. පෘථිවිය මත වැඩි වන මිනිස් පීඩනය යටතේ කෘෂි ජෛව විවිධත්වය ක්ෂය වීමට ලක් වේ. කෘෂි ජෛව විවිධත්වය යනු ස්වාභාවික ජෛව විවිධත්වයේ ම කොටසක් වන අතර ආහාර හා කෘෂිකර්මය සඳහා වැදගත් වන සත්ත්ව, ශාක සහ ක්ෂුද්‍ර ජීවීන්ගේ විවිධත්වය හා වෙනස්වීමේ හැකියාව එමගින් අර්ථ දක්වයි (Galluzzi and etal 2010). පෘථිවි ජීවීන්ගෙන් 75%කට වඩා මානව ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් ලෙස විනාශ වෙමින් පවතී (Bardhan and etal 2012). ජෛව විවිධත්වය සංරක්ෂණයට කෘෂි ජෛව විවිධත්ව සංරක්ෂණය ඉතා වැදගත් වේ. බෝග මෙන් ම වනජීවී විශේෂ අණුක සලකුණු භාවිත කරමින් නිදහසේ ගමන් කිරීම, ජාන ප්‍රවාහ තෝරා ගැනීම හා දිගුකාලීන සංරක්ෂණය සහතික කිරීමට මෙවැනි සංරක්ෂණ ඒකක ජානමය පරිණාමීය වෙනස්කම් අධීක්ෂණයට යොදාගත හැකි ය (Goddard and etal 2010).

පසුගිය දශක දෙක තුළ ජාන සම්පත් සංරක්ෂණය කිරීමේ වැදගත්කම කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇති අතර එහි දී ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා ගෙවතුවල භූමිකාව පිළිගෙන ඇත (Galluzzi and etal 2010). සාම්ප්‍රදායික ගෙවතු කෘෂි වන වගා පද්ධතියක් ලෙස ඵලදායී හා කාර්යක්ෂම ලෙස ජෛව විවිධත්ව සංරක්ෂණයට දායක වේ (Karunaratne 2013). සාම්ප්‍රදායික ගෙවතුවල සාමාන්‍යයෙන් බහු ස්තර අනුව සැකසී ඇති වන විද්‍යාත්මක ක්‍රමයක් දැකගත හැකි ය. ශාක විශේෂ තාවකාලික ව හෝ අවකාශීය අනුපිළිවෙල අනුව ස්තරීභූත හා ගතික ආකෘතීන් ලෙස සැකසී ඇත. තනි විශේෂ අනන්‍යතාවට වඩා විශේෂයෙන් ස්වාභාවික හා තිරසර පරිසර පද්ධතියක් ලෙස සාම්ප්‍රදායික ගෙවතු සැකසී ඇත (Smith 1996). විවිධ මූල ව්‍යුහ පෝෂණයට උපයෝගී කරගෙන විවිධ පාංශු ස්තර හා භූමි, ගුවන් අවකාශය කාර්යක්ෂම ලෙස සැකසී ඇත (Agbogidi and Adorol 2013). සාම්ප්‍රදායික ගෙවතු වනාන්තරයකට සමාන විවිධ ස්තරවලින් සමන්විත අද්විතීය ලෙස මිනිසා විසින් සාදන ලද පරිසර පද්ධතියකි. මෙම පරිසර පද්ධතියේ සුවිශේෂත්වය නම් විවිධ අවශ්‍යතා සඳහා අවශ්‍ය වන සත්ත්ව හා ශාක විශේෂ අන්වීක්ෂීය ව වඩාත් සංවේදී ව මිනිසා විසින් හඳුන්වා දී ඇති සෑම ස්තරයක ම වාසය කිරීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස දුර සිටින නිරීක්ෂකයෙකුට වනාන්තරයෙන් සාම්ප්‍රදායික ගෙවත්ත වෙන් කර හඳුනාගත නොහැක. සාම්ප්‍රදායික ගෙවතු වනාන්තර ආරක්ෂණ කලාපයක් ලෙස ක්‍රියා කරන අතර මෙම වන කලාප ආශ්‍රිත ව ප්‍රජා සහභාගීත්ව වන කළමනාකරණ වැඩසටහන් සංවර්ධනය කිරීම සඳහා යොදාගත හැකි විභවතාවක් පවතී (Karunaratne 2013).




රූප සටහන් අංක 1: ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගෙවත්තක ආකෘතිය

මූලාශ්‍රය : කුමාරි, 2019

සාම්ප්‍රදායික ගෙවතුවල පාංශු ඛාදනය පාලනය හා පාංශු සාරත්වය බොහෝ විට උපරිම මට්ටමේ පවතී. ගස්වල කොළ මගින් ස්වාභාවික වසුන් හා හියුමස් සමුච්ඡනය සපයයි. සාමාන්‍යයෙන් රසායනික පොහොර හා කෘමිනාශක නොයොදන බැවින් ස්වාභාවික වාසස්ථාන ආරක්ෂා කරයි. එබැවින් ඉහළ ශාක, සත්ත්ව හා ක්ෂුද්‍ර ජීවී විවිධත්වයක් පවතී (Smith 1996). ශාක විවිධත්වය ඉහළ මට්ටමක පවතින බැවින් සාම්ප්‍රදායික ගෙවතු පද්ධතිය තුළ එයට ආවේණික සංස්කෘතික අනන්‍යතාවක් පවතී. එසේ ම ආර්ථිකය, පෝෂණය, සෞඛ්‍ය යන අංශ සඳහා දායකත්වය සපයයි. කෘෂිකාර්මික බෝගවල ජාන වෙනස්කම් නඩත්තු කිරීම මගින් පරිසර පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සපයයි (Agbogidi and Adorol 2013). කෘෂි ජෛව විවිධත්වයේ ස්ථානීය සංරක්ෂණය ගැන අවධානය යොමු කිරීමේ දී සාම්ප්‍රදායික ගෙවතු යනු කුඩා නමුත් ඉහළ විවිධත්වයක් සහිත පාරිසරික නිකේතයකි. මේවා සංකීර්ණ ක්ෂුද්‍ර පරිසර පද්ධති මෙන් ම සාම්ප්‍රදායික ලෙස ඒකාබද්ධ වී ඇති විශාල පරිසර පද්ධති වේ (Galluzzi and etal 2010). ගම සමඟ එහි පවතින නිවාස හුදෙක් වාසස්ථානයක් නොවන අතර එය වැදගත් කෘෂි පාරිසරික පද්ධතියකි. ශාක මගින් සූර්ය ශක්තිය ලබාගෙන මිනිසාට හා සත්ත්වයින්ට ප්‍රතිචක්‍රීයකරණය කරන ලද ශක්තිය සපයනු ලබයි (Galluzzi and etal 2010).

ගෝලීය හා කලාපීය වශයෙන් රටවල් රැසක් ජෛව විවිධත්වය සංරක්ෂණය සහ සාම්ප්‍රදායික ගෙවතුවල භූමිකාව පිළිබඳ අධ්‍යයන රැසක් සිදු කර ඇත. වසර 25 කට පෙර දකුණු ආසියාවේ නිවර්තන කලාපීය රටවල් සුවිශේෂ පාරිසරික හා සංස්කෘතික අගයක් ලෙස ගෙවතු වගාව පිළිබඳ අධ්‍යයනය කරනු ලැබී ය (Galluzzi and etal 2010). සංවර්ධනය වෙමින් පවතින රටවල් ද විවිධ අධ්‍යයන සාම්ප්‍රදායික ගෙවතු ආශ්‍රය කරගෙන සිදු කළ අතර බෝගවල ප්‍රවේණික


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ගබඩාවක් ලෙස ගෙවතු වගාවේ වැදගත්කම තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත (Galluzzi and etal 2010). බටහිර ජාවාහි එක් ගෙවත්තක ශාක විශේෂ 56 ක් වාර්තා වී ඇති අතර කුඩා ගම් 41ක විශේෂ 272ක් වාර්තා වී ඇත ( Abebe 2005). ජානමය විවිධත්වය ගත් විට ටැන්සානියාවේ බුකොබාහි කෙසෙල් වගාවන්හි ප්‍රභේද 100ක් වාර්තා වී ඇත (Abebe 2005). දකුණු අන්දමාන්හි ගෙවතුවල 150කට වඩා විශේෂත්, සාම්ප්‍රදායික ගෙවතුවල විශේෂ 250ක් පමණ හඳුනා ගෙන ඇත (Michon and Mary 1994). ඊශානදිග ඉන්දියාවේ අරුණාචල් ප්‍රදේශයේ Ziro, Nirjuli සහ Doimukh යන ප්‍රදේශවල සාම්ප්‍රදායික ගෙවතුවල අහඹු මිශ්‍රණයකින් යුතු වෘක්ෂලතා වර්ගීකරණයක් පෙන්නුම් කරන බව වාර්තා වේ. ජෛව විවිධත්වයෙන් පොහොසත් මෙම ගෙවතු උන්නතාංශය හා දේශගුණික තත්ත්වය අනුව විශේෂ ව්‍යාප්තියේ වෙනසක් හඳුනා ගෙන තිබේ. ජෛව සංචිත ලෙස ශාක විවිධත්වය සංරක්ෂණය වීම සාම්ප්‍රදායික ගෙවතු මගින් හඳුනාගත හැකි ව තිබේ (Tangjang and Arunachalam 2009). වියට්නාමයේ දකුණු පළාත්වල සාම්ප්‍රදායික ගෙවතුවල ජෛව විවිධත්වය ඉහළ බව හඳුනාගෙන ඇති අතර ජීවීන් 53.9ක සාමාන්‍ය අගයක් හඳුනාගෙන ඇත (Trinh and etal 2003). චීනයේ Xishuangbanna හි ඩකා ප්‍රදේශයේ 100 $m^2$ ගෙවත්තක හඳුනා ගෙන ඇති විශේෂ සංඛ්‍යාව 18ක් වන අතර බකා ප්‍රදේශයේ 100 $m^2$ ගෙවත්තකින් හඳුනා ගෙන ඇති විශේෂ සංඛ්‍යාව ද 18කි. ඩකාහි පවුල් 73ක සණ 139ක් හා විශේෂ 179ක් හෙක්ටයාර් 0.1ක වෙනස් කෘෂි පාරිසරික පද්ධතියකින් සොයා ගෙන ඇත. බකාහි පවුල් 70ක සණ 14ක් හා විශේෂ 166ක් හෙක්ටයාර 0.08කින් සොයා ගෙන ඇත (Yongneng and etal 2006). නේපාලයේ ආර්ථිකයේ ප්‍රධාන අංගයක් ලෙස කෘෂි ජෛව සම්පත් හා සාම්ප්‍රදායික දැනුම පදනම් කරගත් වගා පද්ධතිය පෙන්වා දී ඇත. ඇස්තමේන්තු කර ඇති දත්ත මත ආහාරයට ගත හැකි ශාක විශේෂ 500ක් හඳුනා ගෙන ඇති අතර ඉන් 200ක් වගා කරන ලද ඒවා ලෙස හඳුනා ගෙන තිබේ (Pulami and Paudel 2006). බංගලාදේශයේ ද සාම්ප්‍රදායික ගෙවතු මඟින් ඉහළ ජෛව විවිධත්වයක් හඳුනා ගෙන ඇත (Muhammed and etal 2011). මධ්‍යම සූඩානයේ ද සාම්ප්‍රදායික ගෙවතුවල ඉහළ ශාක හා සත්ත්ව විවිධත්වයක් වාර්තා වී ඇත (Gebauer 2005). දකුණු ඉතියෝපියාවේ සාම්ප්‍රදායික ගෙවතු උපයෝගී කර ගෙන සිදු කළ අධ්‍යයනයක් මගින් ඉහළ ශාක විවිධත්වයක් හා කෘෂි ජෛව විවිධත්වයක් හඳුනා ගෙන ඇත (Mellisse 2018). බ්‍රසීලයේ ඇමර්සන්හි සාම්ප්‍රදායික ගෙවතු ආශ්‍රිත ව සිදු කළ අධ්‍යයනයක දී ඉහළ කඳුකර ප්‍රදේශවල ගෙවතු 33කින් විසිතුරු හා ඖෂධ පැළෑටි ඇතුළත් නොවූ විශේෂ 77කුත්, උකායලී ප්‍රදේශයේ නිවාස දෙකකින් පිළිවෙලින් ශාක විශේෂ 74ක් හා 7ක් හමු වී ඇත. ශාන්ත රෝසාහි ගෙවතු 21කින් විශේෂ 168ක් හමු වී ඇත (Smith 1996).

ඉහත සඳහන් කරන ලද තොරතුරු අනුව ගෝලීය ව හා නිවර්තන කලාපීය රටවල් සාම්ප්‍රදායික ගෙවතු ජෛව විශේෂ සංරක්ෂණය කෙරෙහි දක්වන දායකත්වය කෙරෙහි අවධානය යොමු කර ඇති බව අවබෝධ කරගත හැකි ය.

ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප රාශියක් පවතී. පහතරට තෙත් කලාපීය ගෙවතු, මැදරට තෙත් කලාපීය ගෙවතු, උඩරට තෙත් කලාපීය ගෙවතු, වියළි කලාපීය ගෙවතු සහ අතරමැදි කලාපීය ගෙවතු වශයෙනි (ජයතිස්ස 2017). මෙවැනි කලාපවල සාම්ප්‍රදායික ගෙවතු ජෛව විශේෂ සංරක්ෂණයට කොතෙක් දුරට දායක වේද යන්න පිළිබඳ සිදු කළ අධ්‍යයන රාශියක් පවතී. ජෛව විශේෂ සංරක්ෂණයට වනාන්තර තිබිය දී සාම්ප්‍රදායික ගෙවතු ජෛව විශේෂ සංරක්ෂණයට ලබා දෙන දායකත්වය සොයා බැලීමට යොමු වීම කෙරෙහි බලපාන හේතු සාධක පවතී.

බ්‍රිතාන්‍ය පාලන සමයේ එනම් 1796 දී කඳුකර වනාන්තර විනාශ කර තේ, කෝපි වැනි වාණිජ බෝග වගා කිරීමත්, 1840 යටත් විජිත ඉඩම් ආඥා පනත, 1856 විහාර දේවාලගම් පනත, 1872 ධාන්‍ය බදු පනත සහ 1897 මුඩුබිම් පනත යනාදිය හමුවේ වනාන්තර විශාල ලෙස විනාශයට පත් විය (Karunarathne 2013). මීට අමතර ව ජනගහන වර්ධනය, දේශගුණික විපර්යාස යනාදී හේතු සාධක නිසා ද වනාන්තර විනාශය සිදු වේ (Karunarathna 2016). වන ආවරණ අඩු වී යාමත් සමඟ ශාක හා සතුන්ගේ ආරක්ෂක ස්ථාන බවට සාම්ප්‍රදායික ගෙවතු පත් වූ අතර එමගින් ජෛව විශේෂ සංරක්ෂණය සිදු වේ (විතාරණ සහ විතානගේ 1992).

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගෙවතු පිහිටා තිබෙන්නේ මැදරට කලාපයේ ය. ප්‍රමුඛ දිස්ත්‍රික්කය නුවර බැවින් මෙම ගෙවතු නුවර කලාවියේ වනාන්තරමය ගෙවතු / Kandyan Forest Garden, KGF ලෙස හඳුන්වයි (විතාරණ සහ විතානගේ 1992). නුවර දිස්ත්‍රික්කයේ උණුසුම් හා තෙත් දේශගුණය, සුළු හා තද බෑවුම් සහිත භූමි සැලැස්ම, සමාජීය හා ඓතිහාසික යන කරුණු සියල්ල මෙම ගෙවතුවල දක්නට ලැබෙන ජෛව විවිධත්වයට හේතු වී ඇත (විතාරණ සහ විතානගේ 1992). නුවර දිස්ත්‍රික්කයට අමතර ව මාතලේ, කෑගල්ල, කුරුණෑගල, රත්නපුර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි ද සාම්ප්‍රදායික ගෙවතු ව්‍යාප්ත ව ඇත (Pushpakumara and etal 2010). ඉහළ ශාක හා සත්ත්ව විවිධත්වයක් මෙම සාම්ප්‍රදායික ගෙවතු තුළ අන්තර්ගත වේ (Karunarathne 2013). ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සලකා බැලීමේ දී ඒකදේශික ශාක 30%ක් හා සතුන් 40%ක් හඳුනා ගෙන තිබේ (Samaranayaka and Wanigasekara 2013). කුහඹුවන් 194ක්, මී මැස්සන් 130ක්, සමනලුන් 245ක් සහ බත්කූරන් 47ක් ශ්‍රී ලංකාවට ආවේණික වේ. සාම්ප්‍රදායික ගෙවතු මෙම ශාක හා සත්ත්ව ප්‍රජාවන්ගේ සංඛ්‍යාව වර්ධනයට උපකාරී වේ ( Samaranayaka and Wanigasekara, 2013). සාම්ප්‍රදායික ගෙවතු බහුපාර්ශවීය ශාක හා පඳුරු සංයුක්ත බහුවාර්ෂික ශාක හා පශු සම්පත් එක් එක් නිවාසවල පවතින අතර සියලු ම ශාක, බෝග, සත්ත්ව ඒකක පවුලේ ශ්‍රමය මත දැඩි ලෙස කළමනාකරණය වේ (Samaranayaka and Wanigasekara 2013). කෘමීන්, ශාක හා පෘෂ්ඨවංශීන් අතර විවිධ අන්තර් ක්‍රියාකාරීත්වයන් විශාල වශයෙන්


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

විවිධාකාරයෙන් සාම්ප්‍රදායික ගෙවතුවලින් වාර්තා වී ඇත. ශාක විශේෂ බහුල සාම්ප්‍රදායික ගෙවතුවල කෘමීන් හා පෘෂ්ඨවංශීන් වැඩි සංඛ්‍යාවක් ජීවත් වන අතර අන්තර් ක්‍රියාකාරීත්වයන් ද ඉහළ ය. කෘමීන් සඳහා ස්ථිර වාසස්ථාන සහ ආහාර සැපයීම සඳහා ගෙවතු වැදගත් වේ (Millawithanachchi and etal 2015). සාම්ප්‍රදායික ගෙවතු වගා පද්ධතිය සංවර්ධනය කිරීම හා විනාශය වැළැක්වීම ශ්‍රී ලංකාවේ ස්වාභාවික ආරක්ෂිත ප්‍රදේශ, පද්ධති හා කෘෂි භූමියෙන් පිටත කෘමිනාශක සංරක්ෂණය කිරීමට උපායමාර්ගයකි (Millawithanachch and etal 2015). පද්මසිරි සහ බණ්ඩාර විසින් පාතදුම්බර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රයෙන් සිදු කළ සාම්ප්‍රදායික ගෙවතු පිළිබඳ අධ්‍යයනය මගින් ශාක විශේෂ 345ක් හඳුනා ගෙන ඇති අතර ඉන් 10%ක් රෝපණය කරන ලද ඒවා ය. 59%ක් ස්වාභාවික ව ප්‍රරෝහනය වී ඇති අතර 31%ක් පමණ හිතා මතා රෝපණය කළ ඒවා වේ. මෙම සොයා ගත් විශේෂවලින් 47%ක් 2012 IUCN රතු දත්ත ලැයිස්තුවේ පවතී (pathmasiri and Bandara 2016). ශ්‍රී ලංකාවේ නුවර, කුරුණෑගල සහ මඩකලපුව දිස්ත්‍රික්ක ආශ්‍රය කරගෙන සාම්ප්‍රදායික ගෙවතුවල සිදු කරන ලද අධ්‍යයන මගින් ශාක විශේෂ 200ක් පමණ හඳුනා ගෙන ඇත. නුවර හා කෑගල්ල දිස්ත්‍රික්කවලට වඩා අඩු ශාක විශේෂ සංඛ්‍යාවක් මඩකලපුව දිස්ත්‍රික්කයෙන් හමු වී ඇත (Korale gedara and etal 2012). මහනුවරින් හමු වී ඇති මුළු, උපරිම, අවම හා සාමාන්‍ය ශාක විශේෂ සංඛ්‍යා පිළිවෙළින් 206, 52, 01 සහ 22 වේ. කුරුණෑගලින් හමු වී ඇති මුළු, උපරිම, අවම හා සාමාන්‍ය ශාක විශේෂ සංඛ්‍යා පිළිවෙළින් 210, 38, 05 සහ 16 වේ. මඩකලපුවෙන් හමු වී ඇති මුළු, උපරිම, අවම හා සාමාන්‍ය ශාක විශේෂ සංඛ්‍යා පිළිවෙළින් 25, 06, 00 සහ 02 වේ (Korale gedara and etal 2012).

ඉහත සියලු තොරතුරු සලකා බැලීමේ දී ශ්‍රී ලංකාව තුළ ද විවිධ ප්‍රදේශවල සිදු කළ සාම්ප්‍රදායික ගෙවතු පිළිබඳ අධ්‍යයන මගින් ජෛව විවිධත්ව සංරක්ෂණයට සාම්ප්‍රදායික ගෙවතුවල භූමිකාව තහවුරු වේ.

වියළි හා තෙත් කලාප අතර පටු තීරුවක් ලෙස පවතින බෙලිහුල්ඔය ප්‍රදේශය ඉහළ ජෛව විවිධත්වයක් ඇති කෘෂි පාරිසරික කලාපයකි (Sanjeewani and Perera 2009). අතරමැදි කලාපයට අයත් මෙම ප්‍රදේශයේ ජෛව විවිධත්වය පිළිබඳ සිදු කළ පර්යේෂණ අල්ප ය. පක්ෂි වාසස්ථාන පිළිබඳ ව සිදු කළ පර්යේෂණයකින් වාර්තා වූ විශේෂ 77න් 10.39%ක් ආවේණික, 79.22%ක් ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන්, 10.39%ක් ශීත ඍතුව නිසා සංක්‍රමණය වූ යනා දී වශයෙන් විශේෂ හමුව ඇත (Sanjeewani and Perera 2009). බෙලිහුල්ඔය ප්‍රදේශය ආශ්‍රයෙන් භූමි පරිබෝග රටාවන්ගේ වෙනස අනුව පක්ෂි විශේෂ විවිධත්වයේ ස්වභාවය පිළිබඳ සිදු කළ අධ්‍යයනයක් මගින් කුල 44ක පක්ෂි විශේෂ 106කට අයත් පක්ෂීන් 2142ක් හඳුනා ගෙන ඇති අතර මෙම පක්ෂි විශේෂයන්ගෙන් 11ක් ආවේණික විශේෂ වන බවත්, ඉන් අටක සංරක්ෂණ තත්ත්වය සලකා බැලීමේ දී තර්ජනයට ලක් වූ විශේෂ ලෙසත් හඳුනා ගෙන ඇත (Hidelle Arachchi and etal 2019).

මෙවැනි ජෛව විවිධත්වය අතින් පොහොසත් බෙලිහුල්ඔය ප්‍රදේශයේ සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්ෂණයට දක්වන දායකත්වය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ පරමාර්ථය වේ.

## පර්යේෂණ ගැටලුව

ලොව ජෛව විවිධත්වයෙන් උණුසුම් කලාප 08%ක් වැනි කුඩා ප්‍රමාණයක් පවතින අතර ශ්‍රී ලංකාව ද ලෝකයේ ජෛව විවිධත්වයෙන් උණුසුම් කලාප 34ට අයත් වේ. යටත්විජිත සමයට පෙර කාලයේ පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසීන් විසින් ශ්‍රී ලංකාව "වනාන්තරමය දූපත" ලෙස හඳුන්වා තිබීමෙන් ද එය සනාථ වේ (Sathurusinghe 2017). ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට නතු වීමත් සමඟ එකල ජෛව විවිධත්වයෙන් පොහොසත් නිවර්තන වැසි වනාන්තරවලින් $\frac{2}{3}$ක් වියළි හා වාණිජ බෝග වගාව සඳහා යොදා ගැනීම හේතු කොට ගෙන විනාශයට පත් විය (Karunarathne 2013). මෙලෙස වනාන්තර විනාශ වීමත් සමඟ ඒවායෙහි පැවති ශාක හා සතුන්ගේ ආරක්ෂක ස්ථාන බවට වනාන්තරමය ගෙවතු හෙවත් සාම්ප්‍රදායික ගෙවතු පත් වන අතර එමගින් ජෛව විවිධත්ව සංරක්ෂණය සිදු විය (කරුණාරත්න 2013). තව ද බ්‍රිතාන්‍ය නීතිය හමුවේ වාසස්ථාන අහිමි වූ සතුන්ට එක් වනාන්තරයක සිට තවත් වනාන්තරයකට ගමන් කිරීමට වනාන්තර පාලම් ලෙස සාම්ප්‍රදායික ගෙවතු ක්‍රියාත්මක විය (Karunarathne 2013). ආහාර සුරක්ෂිතතාව ඇති කරන ඒකක ලෙස ප්‍රජාවගේ ජීවන අවශ්‍යතා සපුරාලනු ලබන මෙම සාම්ප්‍රදායික ගෙවතුවල ශාක ආවරණ වියන විවිධ ස්තර ආකාරයෙන් සකස් ව ඇති අතර එම ස්තරයන් තුළ සත්ත්ව ප්‍රජාව තම පැවැත්ම තහවුරු කරගනී යි. මෙලෙස සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා තම දායකත්වය සපයයි. නුවර හා පහතරට කලාපයන්හි සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා දායක වන ආකාරය පිළිබඳ පර්යේෂණ රාශියක් සිදු කර ඇත. අතරමැදි කලාපයේ සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා දායක වන්නේ කෙසේද යන්න බෙලිහුල්ඔය ප්‍රදේශය ආශ්‍රයෙන් හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වේ.

## පර්යේෂණ අරමුණු

අතරමැදි කලාපයේ සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා දායක වන ආකාරය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර සාම්ප්‍රදායික ගෙවතුවල ශාක හා සත්ත්ව (පක්ෂි) විවිධත්වය හඳුනා ගැනීම, සාම්ප්‍රදායික ගෙවතුවල කෘෂි ජෛව විවිධත්වය හඳුනා ගැනීම, ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා ප්‍රජා සහභාගීත්වය යොදා ගන්නේ කෙසේ ද යන්න හඳුනා ගැනීම සහ ග්‍රාමීය මට්ටමේ ආහාර සුරක්ෂිතතාව සඳහා සාම්ප්‍රදායික ගෙවතුවල දායකත්වය කෙබඳු දැයි හඳුනා ගැනීම සෙසු අරමුණු වේ.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පර්යේෂණයේ වැදගත්කම

වනාන්තර එළිපෙහෙළි කිරීම, පරිසර උෂ්ණත්වය ඉහළ යාම, පරිසර දූෂණය යනාදී සාධක මත ජෛව විවිධත්ව හායනය වර්තමානය වන විට තීව්‍ර වී ඇත. එලෙස හායනයට ලක් වන ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමේ උපායමාර්ගයන් අතර නව ප්‍රවණතාවක් ලෙස සාම්ප්‍රදායික ගෙවතු හඳුනා ගෙන ඇති අතර ලොව බොහෝ රටවලින් ඒ පිළිබඳ ව සිදු කළ පර්යේෂණ රැසක් පිළිබඳ තතු හමු වේ. ශ්‍රී ලංකාවේ ද වර්තමානය වන විට සාම්ප්‍රදායික ගෙවතු ආශ්‍රිත වැදගත්කම අධ්‍යයනය කිරීමට පර්යේෂකයන්ගේ අවධානය යොමු ව තිබේ. නුවර හා පහතරට කලාපයන්හි සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්‍ෂණය සඳහා දායක වන ආකාරය පිළිබඳ පර්යේෂණ රාශියක් සිදු කර ඇති නමුදු අතරමැදි කලාපයේ සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්‍ෂණය සඳහා දායක වන ආකාරය පිළිබඳ ව සිදු කළ පර්යේෂණ නොමැති තරම් ය. ජෛව විවිධත්ව සංරක්ෂණය ආශ්‍රිත පක්ෂි විශේෂ හා සම්බන්ධ පර්යේෂණ බෙලිහුල්ඔය ප්‍රදේශය පාදක කරගෙන සිදු කර ඇත. නමුදු මෙම ප්‍රදේශයේ තවමත් දක්නට ලැබෙන සාම්ප්‍රදායික ගෙවතු හා ජෛව විවිධත්ව සංරක්ෂණය උදෙසා ඒවායෙහි දායකත්වය පිළිබඳ පර්යේෂණ සිදු කර නොමැති නිසා මෙම අධ්‍යයනය අනෙක් පර්යේෂණයන්ට වඩා වෙනස් වේ. තව ද මෙම පර්යේෂණය සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්ෂණයට දක්වන දායකත්වය සනාථ කරනු ලබනවා සේ ම මෙවැනි අධ්‍යයන දේශගුණ විපර්යාස, ග්‍රාමීය මට්ටමේ ආහාර සුරක්ෂිතතාව සහ දිළිඳුකම පිටුදැකීම වැනි කාලෝචිත පර්යේෂණ සඳහා ද නව මංපෙත් විවර කරයි. ඒ සඳහා මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ද දායක කරගත හැකි ය.

## පර්යේෂණ ක්‍රමවේදය

අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් මිශ්‍ර ක්‍රමවේදය භාවිත කර ඇත. ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද දෙක ම පරීක්ෂණයේ දී භාවිත කිරීම මිශ්‍ර ක්‍රමවේදය යි (පිනිකහන 2012). බෙලිහුල්ඔය ප්‍රදේශයේ යක්දෙහිවල, සීලෝගම සහ බෙලිහුල්ඔය යන ග්‍රාම නිලධාරී වසම්වලින් ගෙවතු පහක් තෝරාගත් අතර ප්‍රාථමික දත්ත රැස් කිරීමේ දී ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීමට Quadrats Method, Point count Method, සහ Observation යන ස්වාභාවික විද්‍යාත්මක විධික්‍රම යොදාගනු ලැබී ය. Quadrats Method තුළ දී නියැදි ප්‍රදේශය මිනුම් කර චතුරස්‍රාකාර ලෙස සලකුණු කරගෙන, ඒ චතුරස්‍රය තුළ ඇති වෘක්‍ෂලතා වර්ග සමීක්‍ෂණය කිරීම සිදු කරනු ලබයි (Bollock 2006). ඒ සඳහා විවිධ පියවර භාවිත කළ හැකි අතර මෙම අධ්‍යයනය සඳහා සාම්ප්‍රදායික ගෙවතුවල 5m X 5m කොටසක් තුළ ඇති ශාක විශේෂ ගණනය කරනු ලැබී ය. පක්ෂි විශේෂ හඳුනා ගැනීමට යොදා ගත් Point count Method තුළ දී ස්ථාවර ස්ථානයක ස්ථාවර කාලයක් රැඳී සිටිමින් පක්ෂි විශේෂ අධ්‍යයනය කරනු ලැබ ඇත (Bollock 2006). එකිනෙක ගෙවතු තුළ 100m දිගු ප්‍රදේශයක් තෝරාගෙන, එම ප්‍රදේශය 25m බැගින් ස්ථාන පහකට වෙන් කර එක් එක් ස්ථානයන්හි විනාඩි දහය බැගින් රැඳී සිටිමින් $360^0$ක වපසරියක් දක්වා දැස විහිදුවමින් දර්ශනය වන පක්ෂීන් සටහන් කර ගැනීමත්, පක්ෂි නාදය පටිගත කර, පක්ෂීන්ගේ හඬ ඔස්සේ පක්ෂි විශේෂ හඳුනා ගැනීම සිදු කරනු ලැබී ය. Observation යටතේ පක්ෂි පිහාටු හා කැදළි පැවතීම තුළ ඒවාට හිමිකම් දරණ පක්ෂීන් සිටින බව අනුමාන කෙරිණ. ගුණාත්මක දත්ත රැස් කිරීමට අරමුණු නියැදීම යටතේ සම්මුඛ සාකච්ඡා හා සෘජු නිරීක්ෂණ යන සමාජ විද්‍යාත්මක විධික්‍රම යොදාගනු ලැබිණ. ද්විතීයික දත්ත රැස් කිරීමට ආයතනික තොරතුරු, ලිඛිතමය මූලාශ්‍රය සහ අන්තර්ජාලය යොදාගනු ලැබිණ. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සරල සංඛ්‍යාන විශ්ලේෂණය යටතේ සූත්‍ර භාවිතයෙන් සිදු කරනු ලැබී ය. නියැදි පහෙහි ශාක විශේෂ පිළිබඳ දත්ත විශ්ලේෂණයට,

$$\text{සාපේක්ෂ සණත්වය} = \frac{\text{එක් විශේෂයක තනි සංඛ්‍යාව}}{\text{ගණනය කළ විශේෂවල මුළු සංඛ්‍යාව}} \times 100$$

$$\text{සංඛ්‍යාතය} = \frac{\text{විශේෂ ගණනය කළ සිව්රැසි සංඛ්‍යාව}}{\text{නියැදි කළ මුළු සිව්රැසි සංඛ්‍යාව}}$$

$$\text{ප්‍රමුඛතාව} = \frac{\text{සියලු ම සිව්රැසිවල තනි විශේෂයක සංඛ්‍යාව}}{\text{විශේෂ ගණනය කළ මුළු සිව්රැසි සංඛ්‍යාව}}$$

යන සූත්‍ර භාවිත කළ අතර පක්ෂි විශේෂ විවිධත්වය සෙවීමට,

$$H = -\sum (pi) \times \ln (pi)$$

සූත්‍රය භාවිත කරනු ලැබී ය.

ගුණාත්මක දත්ත විශ්ලේෂණය, තේමාත්මක විශ්ලේෂණය යටතේ සිදු කරනු ලැබිණ. වගු, ප්‍රස්තාර, ප්‍රතිශත අගයන් සහ සිතියම් මගින් ප්‍රමාණාත්මක දත්ත ඉදිරිපත් කරනු ලැබූ අතර විස්තරාත්මක රචනය, ඡායාරූප සහ සටහන් මගින් ගුණාත්මක දත්ත ඉදිරිපත් කෙරිණ.

## දත්ත විශ්ලේෂණය

### ශාක විශේෂ

බෙලිහුල්ඔය ප්‍රදේශයේ තෝරාගත් සාම්ප්‍රදායික ගෙවතු පහ ආශ්‍රිත සිව්රැසි අධ්‍යයන මඟින් විශේෂ 147කට අයත් ශාක 736ක් වාර්තා විය. පළමු නියැඳිය තුළ විශේෂ 56කට අයත් ශාක 181ක් ද, දෙවන නියැඳිය තුළ විශේෂ 36කට අයත් ශාක 108ක් ද, තුන්වන නියැඳිය තුළ විශේෂ 38කට අයත් ශාක 149ක් ද, සිව්වන නියැඳිය තුළ විශේෂ 40කට අයත් ශාක 140ක් ද, පස්වන නියැඳිය තුළ විශේෂ 51කට අයත් ශාක 158ක් ද වශයෙන් වාර්තා විය. ඒ තුළ ඖෂධ ශාක 26.4%ක්, ආහාර හා ඖෂධ ශාක 48.2%ක්, දැව හා ඖෂධ ශාක 14.4%ක් සහ දැව, ඖෂධ හා ආහාර 11%ක් විය. තෝරාගත් ශාක විශේෂ කිහිපයක් ආශ්‍රයෙන් සිදු කළ සරල සංඛ්‍යාන විශ්ලේෂණ තුළ දී සාපේක්ෂ සණත්වය, සංඛ්‍යාතය සහ ප්‍රමුඛතාව යන අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලැබී ය. නියැදි පහෙහි සාපේක්ෂ සණත්වය වැඩි ම ශාක පිළිවෙලින් කටු අනෝදා (*Annona muricata*), අංකෙන්ද


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

(*Acronychia pedunculata*), පුවක් (*Areca catechu*), දවුල් කුරුඳු (*Neolitsea cassia*) සහ කෝපි (*Coffea arabica*) වේ. සංඛ්‍යාතය වැඩි ම ගම්මිරිස් (*Piper nigrum*) ශාකය නියැදි හතරකින් වාර්තා විය. එකිනෙක ගෙවතුවල ප්‍රමුඛතාව වැඩි ම ශාක පිළිවෙලින් මෙසේ පෙන්වා දිය හැකි ය. එනම් කටු අනෝදා (*Annona muricata*), වෙලං (*Pterospermum suberifolium*), පුවක් (*Areca catechu*), ගම්මිරිස් (*Piper nigrum*) සහ කෝපි (*Coffea arabica*) වශයෙනි.

### කෘෂි ජෛව විවිධත්වය

ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප සලකා බැලීමේ දී බෙලිහුල්ඔය අතරමැදි කලාපයට අයත් වේ. තෙත් හා වියළි කලාප දෙකට ම ආවේණික ශාක ව්‍යාප්ත ව පවතින බැවින් කෘෂි ජෛව විවිධත්වය ප්‍රශස්ත මට්ටමක පවතී. කෘෂි ජෛව විවිධත්වය ස්වාභාවික ජෛව විවිධත්වයේ ම කොටසක් වන අතර කෘෂි ජෛව විවිධත්වය සංරක්ෂණයෙහිලා සාම්ප්‍රදායික ගෙවතු වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යයනය සඳහා තෝරාගත් ගෙවතු නියැදි පහ ආශ්‍රිත සිව්රුසි අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා හා සෘජු නිරීක්ෂණයන්හි දී කෘෂි ජෛව විවිධත්වය පිළිඹිඹු විය. එහි දී බඩ ඉරිඟු වැනි ධාන්‍ය වර්ග, සෝයා බෝංචි, දඹල, රටකජු වැනි මාෂ බෝගත්, කෙසෙල්, දොඩම්, දෙහි, අඹ, අලිපේර, පේර, අනෝදා සහ වරකා ආදී පළතුරු විශේෂත්, ඖෂධීය ශාක වර්ග, පලා වර්ග රාශියක් ද, අල වර්ග, බටු, තක්කාලි වැනි එළවළු වර්ග ද, ගම්මිරිස්, කරාබුනැටි, බුලත්, මිරිස්, ඉඟුරු සහ කහ ආදී කුළුබඩු විශේෂත් මෙම සාම්ප්‍රදායික ගෙවතුවලින් වාර්තා විය. විශේෂත්වය නම් ඒ බොහෝමයක් විශේෂයන්හි ප්‍රභේද රාශියක් හඳුනාගත හැකි වීම යි. කෘෂි ජෛව විවිධත්වය පිළිඹිඹු කරන එවැනි ප්‍රභේද කිහිපයක් මෙසේ පෙන්වා දිය හැකි ය.

කෙසෙල් ප්‍රභේද (*Musa x paradisiaca*) : සීනි කෙසෙල්, ඇඹුල් කෙසෙල්, කෝලිකුට්ටු, ආනමාළු, ඇම්බුම්, රත් කෙසෙල්, වතු පාලු, අළු කෙසෙල්, සුවඳැල්, මර්තමාන්, දිය මෝන්දම්

අඹ ප්‍රභේද (*Mangifera indica*) : කොහු අඹ, ගිරා අඹ, ඇපල් අඹ, විලාඩ් අඹ, මී අඹ, කර්තකොළොම්බන්, පෙට්ටි අඹ, රට අඹ, ඇටඹ

අනෝදා ප්‍රභේද : කටු අනෝදා (*Annona muricata*), වැලි අනෝදා (*Annona reticulata*), සීනි අනෝදා (*Annona squamosa*)

පැඟිරි කුලයේ ශාක ප්‍රභේද : දෙහි (*Citrus aurantifolia*), යකි නාරං, ඇඹුල් දොඩම්, පැණි දොඩම් (*Citrus sinensis*), හීන් නාරං, සිදරං, ජම්බෝල (*Citrus grandis*), ග්‍රේප් ෆෘට්, ගඩා දෙහි, යක් දෙහි, ලෙමන් දෙහි, ලිහිණියා, ජමනාරං, කොණ්ඩ නාරං, පඹුරු (*Pamburus missionis*)

තක්කාලි ප්‍රභේද (Lycopersicon esculantum) : තක්කාලි, රට බටු, ගොරකා තක්කාලි, වෙරළු තක්කාලි, ඇඹුල් තක්කාලි

මිරිස් ප්‍රභේද (*Capsicum annuum*) : අමු මිරිස්, හේන් මිරිස්, දළු කොටු, වන්නි මිරිස්, වැරණිය, කොච්චි (හීන්, සුදු, මහ, දම්), නයි මිරිස්, මාළු මිරිස්



ඡායාරූප අංක 1: බෙලිහුල්ඔය ප්‍රදේශයේ සාම්ප්‍රදායික ගෙවතුවලින් වාර්තා වූ ගොටුකොළ ප්‍රභේද

මූලාශ්‍රය : කුමාරි, 2019

ඡායාරූප : A- වැල් ගොටුකොළ, B- පඳුරු ගොටුකොළ, C- ලොකු ගොටුකොළ, D- සලාද ගොටුකොළ, E- මැලේසියන් ගොටුකොළ

### ප්‍රජා සහභාගීත්ව ජෛව විවිධත්ව සංරක්ෂණය

ජෛව විවිධත්ව සංරක්ෂණය යන්න සලකා බැලීමේ දී අප කවරෙකුගේ වුව ද මනසට මුලින් ම සිහි වන්නේ වනාන්තරයකි. නමුදු සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්ෂණයට දක්වන දායකත්වය සලකා බැලීමේ දී මානව කුටුම්භයක් සහිත පරිබාහිර ගෙවත්ත තුළ සිදු වන ජෛව විවිධත්ව සංරක්ෂණය සිදු වන්නේ මානව මැදිහත්වීම ඇතිව ය. එනම් එය ප්‍රජා සහභාගීත්ව ජෛව විවිධත්ව සංරක්ෂණයකි. බෙලිහුල්ඔය ප්‍රදේශයේ තෝරාගත් සාම්ප්‍රදායික ගෙවතු පහ ම ස්ථිර රජයේ රැකියාවන්හි නියැළීමෙන් තොර කෘෂිකර්මාන්තය ප්‍රධාන ආර්ථික ක්‍රමවේදය කරගත් ප්‍රජාවගෙන් යුක්ත විය. ස්ථිර මාසික ආදායමක් නොමැති ව පවතින වටපිටාවක ද වාණිජ බෝග වගාව උදෙසා විනාශ නොකර වනාන්තරයක් ආකාරයෙන් පවත්වාගෙන යාමට නම් නිතැතින් ම ඔවුන්ට ඉන් ලැබෙන ප්‍රයෝජනයක් ද පැවතිය යුතු ය. ඒවා නම් මෙම සාම්ප්‍රදායික ගෙවතු මඟින් ප්‍රජාව ආහාර, කුළුබඩු, දැව, ඉන්ධන (දර) සහ ඖෂධ යනාදී නොයෙකුත් අවශ්‍යතා සපුරාගනු ලබයි. බෝග සඳහා රසායනික පොහොර භාවිතයක් සිදු නොවන මෙවැනි ගෙවතුවල බීජ ප්‍රරෝහනයෙන් බහුතරයක් බෝග ව්‍යාප්තිය සිදු වේ.

බෝගවලට වැලඳෙන පළිබෝධ හා සෙසු රෝග මර්දනයට රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නොකරන අතර මැතිරීම, පස් පැඟිරි ඉසීම, දාස්පෙතියා මල් හා කොළ පොඩි කිරීම, දුම්මල දුම්


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඇල්ලීම, සබන් වතුර, භූමි තෙල්, අළු ඉසීම, කොහොඹ කොළ දියර ඉසීම, කැප්පෙට්ටිය අතු ගැසීම, ලුණු දිය ඉසීම සහ වතුර මැතිරීම ආදිය සිදු කරන බව අනාවරණය විය. තව ද දුම්මැස්සේ ගබඩා කිරීම, අළු සමඟ බීජ කවලම් කිරීම සහ වැලි යට තැබීම ආදී බීජ සංරක්ෂණ ක්‍රම ද භාවිත කරනු ලබයි.

මෙම ගෙවතු ආශ්‍රිත ව සත්ත්ව ප්‍රජාව නේවාසික ආහාර වැනි අවශ්‍යතා සපුරා ගනිමින් පැවැත්ම තහවුරු කරගන්නා අතර "බත් ලැල්ල" නම් ස්ථානයට ආහාර ද්‍රව්‍ය, ජලය නිතිපතා තැබීමෙන් ලේනුන් පක්ෂීන් වැනි සතුන් කුස පුරවාගනියි.

## ආහාර සුරක්ෂිතතාව

අධ්‍යයනය සඳහා තෝරාගත් ගෙවතු පහ ආශ්‍රිත සිව්රැසි අධ්‍යයන මඟින් හඳුනාගත් ශාක විශේෂ 147න් 81ක් එනම් 55%ක් ආහාරයට ගත හැකි ශාක විශේෂ වීම තුළ මෙම ගෙවතුවල ආහාර සුරක්ෂිතතාව පවතින බව පැහැදිලි වේ. තව ද කෘෂි ජෛව විවිධත්වය ප්‍රශස්ත මට්ටමක පැවතීම එය තවදුරටත් සනාථ කරනු ලබයි. එසේ ම මෙම ගෙවතුවල නිෂ්පාදිත අතිරික්තය එලෙසින් ම ගබඩා කර තබා ගැනීම හෝ විවිධ ආකාරයෙන් එනම් වියළීම, ලුණු දැමීම, පැසවීම සහ දුම් ගැසීම වැනි ක්‍රම මඟින් ආහාර කල් තබා ගන්නා බවට තොරතුරු වාර්තා විය. එවැනි ආහාර කල් තබා ගැනීමේ ක්‍රම කිහිපයක් මෙසේ පෙන්වා දිය හැකි ය.

කහ සහ ඉඟුරු වියළීම, මඤ්ඤොක්කා වියළීම, දෙල් හා කොස් අටුකොස් සෑදීම, එළවළු වියළීම, ගොරකා වියළීම, සියඹලා වියළීම, කිතුල් පිටි සැකසීම, ලුණු දෙහි දැමීම, දෙහි යුෂ සැකසීම, කොස් සිව්ඩිලි වියළීම, අළු කෙසෙල් පොතු වියළීම, කුරුඳු පොතු, ගම්මිරිස්, කරාබුනැටි වියළීම, කෝපි ඇට වේලා බැද කුඩු කිරීම, මී මල් වියළීම, අච්චාරු දැමීම, දෝසි දැමීම සහ කනෛ පැණි, මී පැණි රැස් කර තබා ගැනීම යනාදිය දැක්විය හැකි ය.

2017 වර්ෂයට අදාළ ඉඹුල්පේ ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ සම්පත් පැතිකඩ තුළ අධ්‍යයනය සඳහා තෝරාගත් සීලෝගම, බෙලිහුල්ඔය සහ යක්දෙහිවල ග්‍රාම නිලධාරී වසම් තුනෙහි ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව ඒවායෙහි සිටින මුළු ජන සංඛ්‍යාව හා සසඳා බැලීම තුළ මෙම ප්‍රදේශයන්හි ආහාර සුරක්ෂිතතාව පිළිබඳ තොරතුරු අවබෝධ කරගත හැකි වේ.

වගු අංක 1ඃ අධ්‍යයන ප්‍රදේශයේ ආබාධිත පුද්ගලයන් පිළිබඳ දත්ත

| ග්‍රාම නිලධාරී වසම | මුළු ජන සංඛ්‍යාව | ආබාධිත ජන සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|
| සීලෝගම | 1077 | 07 | 0.65 |
| බෙලිහුල්ඔය | 786 | 04 | 0.51 |
| යක්දෙහිවල | 1258 | 03 | 0.24 |

මූලාශ්‍රයඃ සම්පත් පැතිකඩ, ඉඹුල්පේ ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය, 2017.

මුළු ජන සංඛ්‍යාවට අනුව ආබාධිත පුද්ගලයන්ගේ ප්‍රතිශතය දශම අගයත් අධ්‍යයනය සඳහා තෝරාගත් සෑම ග්‍රාම නිලධාරී වසමකින් ම වාර්තා වීම තුළ මෙම ප්‍රදේශයන්හි ආහාර සුරක්ෂිතතාව ප්‍රශස්ත මට්ටමක පවතින බව තහවුරු වේ. මෙම ප්‍රදේශයෙහි හෙළ වෙදකම තවමත් පවතින අතර ඒවාට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය මෙම සාම්ප්‍රදායික ගෙවතු තුළින් ම සපයා ගන්නා බව තහවුරු වූ අතර "බෙහෙත් බඩු පෙට්ටිය" සෑම නිවසක ම පවතින බව ද හඳුනාගත හැකි විය.

## පක්ෂි විශේෂ

සාම්ප්‍රදායික ගෙවතුවල ශාක විවිධත්වය හා සණත්වය සාමාන්‍ය ගෙවතුවලට වඩා ඉහළ අගයක් වාර්තා වනවා සේ ම ඒ තුළ ආහාර, නේවාසික, ආරක්ෂාව සහ අභිජනනය යනාදී අවශ්‍යතා සපුරා ගනිමින් සත්ත්ව විශේෂයන් ද පැවැත්ම තහවුරු කර ගනිමින් සිටිති. මෙහි දී පක්ෂි විශේෂ පිළිබඳ ව ස්වාභාවික විද්‍යාත්මක විධික්‍රම යටතේ රැස් කළ දත්ත හා ඒ ආශ්‍රිත ගණනය කිරීම් මඟින් හඳුනාගත් පක්ෂි විශේෂ සුලභතාව, විශේෂ පොහොසත්බව හා විවිධත්වය පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි පෙන්වා දිය හැකි ය.


වගු අංක 2ඃ පක්ෂි විශේෂයන්ගේ සුලභතාව, විශේෂ පොහොසත් බව හා විවිධත්වය පිළිබඳ තොරතුරු


| දවස | නියැඳිය | සුලභතාවය | විශේෂ පොහොසත් බව | විවිධත්වය |
|---|---|---|---|---|
| 1 | යක්දෙහිවල | 104 | 22 | 2.845 |
| 2 | හිද්දෙණිගොඩ | 158 | 24 | 2.800 |
| 3 | දඹගහරාව | 161 | 26 | 2.866 |
| 4 | හෙලඅරාව | 124 | 23 | 2.843 |
| 5 | සීලෝගම | 156 | 25 | 2.931 |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර අධ්‍යයනය, 2019

ෂැණන් දර්ශකයට අනුව ප්‍රජාවේ පොහොසත් බව හා ඒකාකාරී බව වැඩි වන විට දර්ශක අගය ද වැඩි වේ. නියැඳි පහෙහි ම දර්ශක අගය 2.5ට වැඩි අගයක් වාර්තා වීම තුළ ඉහළ විවිධත්වයක් පවතින බව පැහැදිලි වේ. විශේෂ පොහොසත් බව යන්නෙන් යම් ප්‍රදේශයක විශේෂයන්ගේ සුලභතාව සැලකිල්ලට නොගෙන සිටින විවිධ විශේෂ ගණන අර්ථ දක්වනු ලැබේ. නියැඳි පහෙන් පක්ෂි විශේෂ 41ක් වාර්තා වූ අතර පළමු නියැඳිය තුළ විශේෂ 22ක් ද, දෙවන නියැඳිය තුළ පළමු නියැඳියෙන් වාර්තා වූ විශේෂ 12ක් හා නව විශේෂ 12ක් ද, පළමු හා දෙවන නියැඳි තුළ වාර්තා වූ විශේෂයන්ට අමතර ව තෙවන නියැඳියෙහි නව විශේෂ දෙකක් ද, සිව්වන නියැඳියෙහි නව විශේෂ තුනක් ද, පස්වන නියැඳියෙහි නව විශේෂ දෙකක් ද වශයෙන් තොරතුරු වාර්තා විය.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය





ප්‍රස්තාර අංක 1: විශේෂ සමුච්ඡිත වක්‍රය

මූලාශ්‍රය : කුමාරි, 2020

කුමන විශේෂයක වුව ද යම් ප්‍රදේශයක ජීවීන්ගේ මුළු සංඛ්‍යාව සුලභතාව ලෙස අර්ථ දක්වනු ලබන අතර නියැදි පහෙහි සුලභතාව ප්‍රශස්ත මට්ටමක පවතින බව පහත ප්‍රස්තාරය මගින් සනාථ වේ.




ප්‍රස්තාර අංක 2: පක්ෂි විශේෂ සුලභතාව සහ විශේෂ පොහොසත් බව

මූලාශ්‍රය : කුමාරි, 2020

වගු අංක 3: එකිනෙක පක්ෂි විශේෂයන්ට අදාළ විවිධ වර්ගීකරණ

| යොමුව | සංකේතය | ගෝත්‍රය<br>**Order** | කුලය<br>**Family** | සංරක්ෂණ තත්ත්වය<br>**(IUCN red data list, 2020)** | ආවේණික | ආවේණික නොවන |
|---|---|---|---|---|---|---|
| 01 | A | Passeriformes | Estrildidae | LC | | * |
| 02 | B | Passeriformes | Turdidae | LC | | * |
| 03 | C | Passeriformes | Nectariniidae | LC | | * |
| 04 | D | Passeriformes | Dicruridae | LC | | * |
| 05 | E | Passeriformes | Sylviidae | LC | | * |
| 06 | F | Passeriformes | Pycnonotidae | LC | | * |
| 07 | G | Gallifomes | Phasiandae | LC | * | |
| 08 | H | Piciformes | Picidae | LC | | * |
| 09 | I | Columbiformes | Columbidae | LC | | * |
| 10 | J | Passeriformes | Oriolidae | LC | | * |
| 11 | K | Psittaciformes | Psittacidae | LC | | * |
| 12 | L | Passeriformes | Sturnidae | LC | | * |
| 13 | M | Columbiformes | Columbidae | LC | * | |
| 14 | N | Passeriformes | Timaliidae | LC | | * |


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

| යොමුව | සංකේතය | ගෝත්‍රය **Order** | කුලය **Family** | සංරක්ෂණ තත්ත්වය **(IUCN red data list, 2020)** | ආවේණික | ආවේණික නොවන |
|---|---|---|---|---|---|---|
| 15 | O | Passeriformes | Sturnidae | NT | * | |
| 16 | P | Psittaciformes | Psittacidae | LC | * | |
| 17 | Q | Gallifomes | Phasiandae | LC | | * |
| 18 | R | Piciformes | Picidae | LC | | * |
| 19 | S | Passeriformes | Monarchidae | LC | | * |
| 20 | T | Passeriformes | Dicaeidae | NT | * | |
| 21 | U | Passeriformes | Corvidae | LC | | * |
| 22 | V | Gallifomes | Phasiandae | LC | | * |
| 23 | W | Passeriformes | Hirundinidae | LC | * | |
| 24 | X | Passeriformes | Pittidae | LC | | * |
| 25 | Y | Passeriformes | Turdidae | LC | | * |
| 26 | Z | Passeriformes | Turdidae | LC | | * |
| 27 | A | Passeriformes | Timaliidae | LC | | * |
| 28 | B | Passeriformes | Estrildidae | LC | | * |
| 29 | C | Ciconiiformes | Ardeidae | LC | | * |
| 30 | D | Columbiformes | Columbidae | LC | | * |
| 31 | E | Passeriformes | Estrildidae | LC | | * |
| 32 | F | Passeriformes | Laniidae | LC | | * |
| 33 | G | Passeriformes | Campephagidae | LC | | * |
| 34 | H | Psittaciformes | Psittacidae | LC | | * |
| 35 | I | Passeriformes | Nectariniidae | LC | | * |
| 36 | J | Passeriformes | Monarchidae | LC | | * |
| 37 | K | Passeriformes | Zostroidae | LC | * | |
| 38 | L | Coraciiformes | Alcedinidae | LC | | * |
| 39 | M | Passeriformes | Monarchidae | LC | | * |
| 40 | N | Passeriformes | Paridae | LC | | * |
| 41 | O | Coraciiformes | Bucerotidue | LC | * | |

වර්ෂය පුරා ම දැකිය හැකි (Present all year)

සීත ඍතුවේ සංක්‍රමණය වූ (Winter visitor)

(A- *Passer domesticus*, B- *Copsychus saularis*, C- *Nectarinia asiatica*, D- *Dicrurus caerulescens leucopygialis*, E- *Orthotomus sutorius sutorius*, F- *Pycnonotus cafer cafer*, G- *Gallus lafayettii*, H- *Dinopium benghalense psarodes*, I- *Streptopelia chinensis ceylonensis*, J- *Oriolus xanthornus ceylonensis*, K- *Psittacula krameri*, L- *Acridotheres tristis melanosturnus*, M- *Treron pompadora pompadora*, N- *Pellorneum fuscocapillum*, O- *Gracula ptilogenys*, P- *Psittacula calthropae*, Q- *Pavo cristatus*, R- *Megalaima zeylanica*, S- *Terpsiphone paradise*, T- *Dicaeum vincens*, U- *Corvus macrorhynchos*, V- *Coturnix chinensis*, W- *Hirundo daurica hyperythra*, X- *Pitta brachyuran*, Y- *Erithacus brunneus*, Z- *Saxicoloides fulicata leucoptera*, a- *Turdoides affinis taprobanus*, b- *Lonchura kelaarti kelaarti*, c- *Egretta garzetta*, d- *Chalcophaps indica robinsoni*, e- *Ploceus philoppinus*, f- *Lanius cristatus cristatus*, g- *Pericrocotus flammeus*, h- *Centropus sinensis*, i- *Nectarinia lotenia lotenia*, j- *Rhipiduru aureola*, k- *Zosterops ceylonensis*, l- *Halcyon smyrnensis*, m- *Terpsiphone paradise*, n- *Parus major*, o- *Tockus gingalensis*)

Carolus Linnaeus විසින් ජීවීන් වර්ගීකරණය ලොවට හඳුන්වා දුන් අතර ජීවී විශේෂයක ගණය හා එම ජීවියාගේ විශේෂ නාමය සම්බන්ධ කර විද්‍යාත්මක නාමය හඳුන්වා දී ඇත. තව ද සෑම ජීවියෙක් ම ධුරාවලි වශයෙන් වර්ගීකරණය කර ඇති අතර ගෝත්‍රය හා කුලය යන අංශ ද එම වර්ගීකරණයට අයත් වේ.

බෙලිහුල්ඔය ප්‍රදේශයේ සාම්ප්‍රදායික ගෙවතුවලින් වාර්තා වූ පක්ෂි විශේෂ 41 ගෝත්‍ර හතකට අයත් වූ අතර බොහෝමයක් පක්ෂි විශේෂ අයත් වූයේ Passeriformes ගෝත්‍රයට වූ අතර විශේෂ එකක්


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පමණක් එනම් අවම විශේෂ සංඛ්‍යාවක් අයත් වූයේ Ciconiiformes ගෝත්‍රයට ය.

බෙලිහුල්ඔය ප්‍රදේශයේ සාම්ප්‍රදායික ගෙවතු මඟින් වාර්තා වූ පක්ෂි විශේෂ 41 කුල 25කට අයත් වූ අතර වූ අතර පක්ෂි විශේෂ කිහිපයක් එක ම කුලයට අයත් වනවා සේ ම එක කුලයකට අයත් විශේෂ එකක් පමණක් පවතින බව ද වාර්තා වූ පක්ෂි විශේෂ 41 කෙරෙන් හඳුනාගත හැකි විය.

එක් භූගෝලීය කලාපයක පමණක් පවතින විශේෂ ආවේණික විශේෂ වන අතර බෙලිහුල්ඔය සාම්ප්‍රදායික ගෙවතුවලින් වාර්තා වූ පක්ෂි විශේෂ 41න් ශ්‍රී ලංකාවට ආවේණික විශේෂ අටක් හඳුනාගත හැකි විය. ශ්‍රී ලංකා වළිකුකුළා (*Gallus lafayettii*), පොම්පදොරු බටගොයා (*Treron pompadora pompadora*), ශ්‍රී ලංකා සැළලිහිණියා (*Gracula ptilogenys*), ශ්‍රී ලංකා අළු ගිරවා (*Psittacula calthropae*), ශ්‍රී ලංකා පිළිලිච්චා (*Dicaeum vincens*), ශ්‍රී ලංකා සිතැසියා (*Zosterops ceylonensis*), ශ්‍රී ලංකා අළු කෑදැත්තා (*Tockus gingalensis*) සහ ශ්‍රී ලංකා වැහිළිහිණියා (*Hirundo daurica hyperythra*) යන විශේෂ ඒ අතර වෙති.

ආවේණික හා ආවේණික නොවන පක්ෂි විශේෂ සැරිසරන කාල පරාසය සලකා බැලීමේ දී බහුතරය එනම් විශේෂ 41න් 38ක් වර්ෂය පුරා ම දැකගත හැකි ය. ආවේණික නොවන පක්ෂි විශේෂ තුනක් එනම් අවිච්චියා (*Pitta brachyura*), ඉන්දු නිල් සිටිකිච්චා (*Erithacus brunneus*) සහ බොර සබරිත්තා (*Lanius cristatus cristatus*) යන පක්ෂි විශේෂ සීත ඍතුවේ සංක්‍රමණය වන පක්ෂි විශේෂ වශයෙන් හඳුනාගත හැකි විය.

ලෝක සංරක්ෂණ සංගමය විවිධ පර්යේෂණ ඇසුරින් ජෛව විශේෂවල සංරක්ෂණ තත්ත්වය හා නෂ්ට වීමේ අවදානම තක්සේරුවට, ඇගයීමට ලක් කරමින් පවත්වාගෙන යනු ලබන රතු දත්ත පොත (IUCN red data list) 2020 ජනවාරි මාසයේ යවත්කාලීන කරන ලද දත්ත අනුව පක්ෂි විශේෂ 41න් 39කගේ සංරක්ෂණ තත්ත්වය LEAST CONCERN (LC) හෙවත් වඳ වී යාමට අඩු අවදානමක් ඇති විශේෂ වශයෙන් හඳුනාගත හැකි විය. ශ්‍රී ලංකා පිළිලිච්චා (*Dicaeum vincens*) හා ශ්‍රී ලංකා සැළලිහිණියා (*Gracula ptilogenys*) NEAR THREATENED (NT) වඳ වී යාමේ තර්ජනයට ලක්වීමට ආසන්න විශේෂ වශයෙන් 2016 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කර ඇති බව හඳුනාගත හැකි විය. අධ්‍යයනය සඳහා තෝරාගත් සාම්ප්‍රදායික ගෙවතු පහෙන් හතරක මෙම පක්ෂි විශේෂ දෙක වාර්තා වීමෙන් සාම්ප්‍රදායික ගෙවතු වඳ වී යාමේ තර්ජනයට ලක්වීමට ආසන්න විශේෂ සංරක්ෂණයට දායක වන බව තහවුරු වේ.

## නිගමනය

අනාවරණය වූ තොරතුරු සියල්ල සලකා බැලීමේ දී සාම්ප්‍රදායික ගෙවතු තුළ ශාක හා සත්ත්ව (පක්ෂි) විශේෂ විවිධත්වයත්, කෘෂි ජෛව විවිධත්වයත් ඉහළ අගයක් ගන්නා බව ද, මෙම ගෙවතු තුළ ප්‍රජා සහභාගීත්ව ජෛව විවිධත්ව සංරක්ෂණයක් සිදු වන බව ද, ග්‍රාමීය මට්ටමේ ආහාර සුරක්ෂිතතාව මෙම සාම්ප්‍රදායික ගෙවතු තුළ තහවුරු වන බව ද පැහැදිලි වන අතර ඒ අනුව අතරමැදි කලාපයේ සාම්ප්‍රදායික ගෙවතු ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා දායක වන බව නිගමනය කළ හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


කරුණාරත්න, එම්. (2013) ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණය සහ කළමනාකරණ අත්දැකීම්: සීමාන්තරික වන කලාප ස්ථාපිත කිරීම කෙරෙහි විශේෂ අවධානයකින්, කොළඹ, කර්තෘ ප්‍රකාශනයකි.
පද්මසිරි ඊ, බණ්ඩාර ටී (2017) ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණය, කොළඹ, දයාවංශ ජයකොඩි සහ සමාගම.

විතාරණ ජී, විතානගේ එච්. (1997) ජෛව විවිධත්වය හා ජීවය මත පැවැත්ම ශ්‍රී ලාංකීය අත්දැකීම්, කොළඹ, නොරාඩ් ආයතනය.

සම්පත් පැතිකඩ ඉඹුල්පේ (2017) ඉඹුල්පේ, ප්‍රදේශීය ලේකම් කාර්යාලය.

සොබා 2015.06.06, ජයසේකර මනෝජා, "ජෛව විවිධත්වය". පරිසර ප්‍රකාශනය.

Agbogidi, O.M. and Adolor, E.B (2013) Home gardens in the maintenance of biological diversity. *Appl Sci Rep*, *1*(1), pp.19-25.

Galluzzi, G., Eyzaguirre, P. and Negri, V (2010) Home gardens: neglected hotspots of agro-biodiversity and cultural diversity. *Biodiversity and conservation*, *19*(13), pp.3635-3654.

Marambe, B., Pushpakumara, G. and Silva, P (2012) Biodiversity and agrobiodiversity in Sri Lanka: Village tank systems. In *The Biodiversity Observation Network in the Asia-Pacific Region* (pp. 403-430). Springer, Tokyo.

Mohri, H., Lahoti, S., Saito, O., Mahalingam, A., Gunatilleke, N., Hitinayake, G., Takeuchi, K. and Herath, S (2013) Assessment of ecosystem services in homegarden systems in Indonesia, Sri Lanka, and Vietnam. *Ecosystem Services*, *5*, pp.124-136.

Myers, N., Mittermeier, R.A., Mittermeier, C.G., Da Fonseca, G.A. and Kent, J (2000) Biodiversity hotspots for conservation priorities. *Nature*, *403*(6772), pp.853-858.

Pushpakumara, D.K.N.G., Wijesekara, A. and Hunter, D.G (2010) Kandyan homegardens: a



© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

promising land management system in Sri Lanka. *Sustainable use of biological di-versity in socio-ecological production landscapes, 102*.

Samarkoonge, M. and Karunarathne, M.L (2013) *Kandyan forest gardens (KFG's) for sustainable development* (Master's thesis, Universitetet i Agder; University of Agder).

Sanjeewani, H.N. and Perera, M.S.J (2009) Preliminary Study on Avifaunal Diversity in the Sabaragamuwa University Premises, Belihuloya, Sri Lanka.

Smith, N.J (1996) Home gardens as a springboard for agroforestry development in Amazonia. *International Tree Crops Journal*, *9*(1), pp.11-30.

Tangjang, S. and Arunachalam, A (2009) Role of traditional home garden systems in Northeast India.



© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දොළොස්වන කලාපය 2021 දෙසැම්බර්
පිටු 28-37
ISSN 1800-1459 eISSN 2386-2041
© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ලේඛන හා භාෂණ සිංහලයෙහි භාවිත ක්‍රියා අනුසර්ගක පිළිබඳ ප්‍රතිරෝධතාත්මක අධ්‍යයනයක්

# (A Contrastive Study of the Usage of the Verb Suffixes in Writing and Spoken Sinhala.)

ඩබ්ලිව්. ඕ. තිලකරත්න සහ ආචාර්ය මොරකන්දේ අරියවංස හිමි

ර/ඇඹි/චන්ද්‍රිකාවැව ජයන්ති විද්‍යාලය, ඇඹිලිපිටිය
සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
wothilakarathna@gmail.com
ariyawansamora@gmail.com

## සාරසංක්ෂේපය

සිංහල භාෂා විකාසනයේ එක් ප්‍රතිඵලයක් ලෙස එහි ලේඛනයත්, භාෂණයත් අතර ද්විරූපතාවක් හෙවත් ප්‍රතිරෝධයක් හඳුනා ගත හැකි ය. ලේඛනයත්, භාෂණයත් අතර පවතින උක්ත ප්‍රතිරෝධතාව හේතුවෙන් සිංහලය ද්විතීයික භාෂාවක් ලෙස හදාරන විද්‍යාර්ථීන්ට මෙන් ම ස්වභාෂික ශිෂ්‍ය-ශිෂ්‍යක දෙපිරිසට ද ගැටලු උද්ගත වන අවස්ථා බහුල ය. එවැනි ගැටලු මග හරවා ගනු සඳහා සිංහලයේ ලේඛනයත්, භාෂණයත් අතර පවතින සමානතා අසමානතා මූලික කර ගත් අධ්‍යයන පිටිවහලක් වෙයි. මෙහි දී සිංහල ක්‍රියා පදය නිර්මාණය වීමේ දී උපයුක්ත අනුසර්ගක පදිම (Suffixes) ලේඛනයේ හා භාෂණයේ භාවිත අයුරු සංසන්දනාත්මක ව අධ්‍යයනය කෙරෙයි. ලේඛන සිංහලයේ ක්‍රියා පදයක් ගොඩනැගීමෙහි ලා භාවිත අනුසර්ගක පදිම හඳුනා ගැනීමේ දී ලේඛන සිංහලය සම්බන්ධයෙන් මෙතෙක් සිදු වී ඇති ප්‍රාමාණික විද්වතුන්ගේ අධ්‍යයනයන් උපයෝගී කර ගත් අතර භාෂණ සිංහලයේ භාවිත ක්‍රියා අනුසර්ගක හඳුනා ගැනීමේ දී ස්වභාෂිකයකු වශයෙන් ඇති දැනුමට අමතර ව භාෂණ සිංහලය සම්බන්ධයෙන් ඇති පොතපත හා සිංහල භාෂකයින් අතර සිදු වූ සංවාද නිරීක්ෂණ හා අවිධිමත් සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදී. හඳුනා ගත් අනුසර්ගක ප්‍රතිරෝධාත්මක වාග්විද්‍යාවේ සමානතා අසමානතා සංකල්පය මත විශ්ලේෂණය කරන ලදී. මෙම අධ්‍යයනයට බඳුන් වූ ක්‍රියා අනුසර්ගක සංඛ්‍යාව 72කි. ඒ අතුරින් ලේඛනයෙහිත්, භාෂණයෙහිත් රූපීය වශයෙන් සමාන ව යෙදෙනුයේ අනුසර්ගක හතක් පමණි. ඉතිරි අනුසර්ගක (65) අතුරෙන් අනුසර්ගක 33ක් ලේඛනයටත්, 32ක් භාෂණයටත් සීමිත වීමෙන් ලේඛනයත්, භාෂණයත් අතර පවතින ප්‍රතිරෝධය ක්‍රියා අනුසර්ගක අංශයෙන් කොතෙක් පවතී දැයි අවබෝධ කර ගත හැකි ය.

**කේන්ද්‍රීය වචන**: ලේඛනය, භාෂණය, අනුසර්ගක, සමානතාව, අසමානතාව

Forest corridors are a necessary tool for building an active connection between a forest or an ecosystem that is being fragmented. The forest passage conservation process is built on the conservation issue of deforestation. This study was limited to two of the Beragala Mukalana and Valankanda escort forests, although there were numerous fragmented forests around the World Heritage Site in the Sinharaja, the main lowland rainforest region. The main objective of the research is to investigate the need for establishing forest paths to conserve the low country rain forest areas. Interviews, participatory village access and direct observation were conducted to collect data. Qualitative methods and thematic analysis were done to analyze the collected data. In this regard, global, regional and Sri Lankan studies of deforestation and forest corridors, chronological changes in the Beragala Mukalana and Valankanda forest areas which are surrounding forested areas of World Heritage Sinharaja forest and the need for forest conservation on a geographical scale were comprehensively investigated. These analyses strongly indicate that need for timely management and conservation of forest landscapes for discoveries of endangered species endangered by human and physical factors, declining species density, impediment to animal migration, and contribution to deforestation through land use. Accordingly, it can be concluded that the concept of forest lanes as a current forest conservation measure is a best solution to the problems of effect of deforestation and the isolation of habitants to build the interconnections.

**Keywords**: Conservation, Deforestation, Forest corridor, Forest fragmentation, Sinharaja forest zone

## හැඳින්වීම

භාෂාවෙහි මූලික ස්වරූපය භාෂණය වන අතර ලේඛනය යනු භාෂණය නියෝජනය කෙරෙන දෘශ්‍ය සංකේත සමූහයක් මඟින් එය ලියා දැක්වීම යි. ලෝකයේ දැනට භාවිත භාෂා අතුරින් බොහොමයකට එයට ම ආවේණික වූ ලේඛන ද දක්නට ලැබෙයි. ඕනෑ ම භාෂාවක ලේඛනයට ප්‍රථමයෙන් භාෂණය බිහි වූ බව අවිවාදාත්මක ය. බොහෝ භාෂාවල ලේඛනය ආරම්භ වූ කාල වකවානුව පිළිබඳ යම් අධ්‍යයනයක් කළ හැකි වුවත්, භාෂණයේ ආරම්භය පිළිබඳ අධ්‍යයනය කිරීම එතරම් පහසු නොවේ. එයට ප්‍රධාන හේතුව වනුයේ භාෂණයේ ආරම්භය මිනිසාගේ ආරම්භය දක්වා වූ ඈත අතීතයකට අයත් වීම් හා ලේඛනයේ ආරම්භය මිනිසාට අධ්‍යයනය කළ හැකි සාපේක්ෂ වශයෙන් මෑත අතීතයකට අයත් ව තිබීම යි.

ශ්‍රව්‍යගෝචර භාෂණ ශබ්ද දෘෂ්ටිගෝචර සංකේත සමූහයක් මඟින් ලියා දැක්වීම ලේඛනය නම් සාම්ප්‍රදායික ලේඛන කලාවක් සහිත භාෂා බොහෝමයක මෙන් සිංහල භාෂාවෙහිත් භාෂණයත්, ලේඛනයත් අතර ප්‍රතිරෝධතා පවතින්නේ කෙසේ දැයි යන ගැටලුව මතු වෙයි. සිංහලයේ ලේඛනය ආරම්භ වූ අවධියේ ලේඛනයත්, භාෂණයත් අතර ප්‍රතිරෝධයක් නොතිබිණි යැයි අනුමාන කළ හැකි ය. (ධර්මදාස, 1996: 105) එහෙත් ලේඛන සාහිත්‍යය ක්‍රමක්‍රමයෙන් යුග යුගයන්හි දියුණු වීමේ දී ගත් වහර හා කට වහර භාවිතය සම්බන්ධයෙන් වෙනස් තත්ත්වයන් පැවති බවට 'බුත්සරණ' වැනි සංස්කෘත මිශ්‍ර විදග්ධ භාෂා ශෛලියක් භාවිත කරන ලද ගද්‍ය සාහිත්‍යයක් මෙන් ම 'සද්ධර්මරත්නාවලිය' වැනි හුදු හෙළ ගැමි ව්‍යවහාර බස පදනම් කරගත් ගද්‍ය සාහිත්‍යයක් ද විද්‍යමාන වී මෙන් සනාථ වෙයි. කේ. එන්. ඕ. ධර්මදාසය ප්‍රකාශ කරන ආකාරයට සාම්භාව්‍ය ලේඛන සාහිත්‍යය පිරිහීමට ලක් වී නැවතත් තත් සාහිත්‍යය ගොඩනැඟීමට මහනුවර යුගයේ දී වැලිවිට සරණංකර හිමියන් ප්‍රමුඛ විද්වතුන් විසින් ගන්නා ලද උත්සාහය සිංහල භාෂා ද්විරූපතාවෙහි ආරම්භය සනිටුහන් කරන්නකි (ධර්මදාස, 1996: 106). කෙසේ වෙතත් සිංහල භාෂාවෙහි ලේඛනයත්, භාෂණයත් අතර පවතින මෙම ප්‍රතිරෝධය සඳහා ලේඛනයට සාපේක්ෂ ව භාෂණය වේගයෙන් වෙනස් වීම්වලට ලක් වීම, ලේඛන කාර්යයෙහි ලා සම්ප්‍රදාය දැඩි ව අගය කිරීම, සමහර වියතුන් විදග්ධ භාෂා ශෛලීන් කෘත්‍රිම ව තම ලේඛනය උදෙසා භාවිත කිරීම හා ඇතැම් උගතුන් භාෂා ශුද්ධවාදී අදහස් ගරු කරමින් හා එය ප්‍රවර්ධනයට කටයුතු කිරීම ආදී කරුණු හේතු වී ඇත.

භාෂා දෙකක් හෝ කිහිපයක් පිළිබඳ එහි සමානතා හා අසමානතා හෙළි කර ගැනීමේ අරමුණින් සිදුකරන අධ්‍යයනය ප්‍රතිරෝධාත්මක වාග්විද්‍යාවට (Contrastive Linguistics) අයත් වන අතර මෙම විෂය තුලනාත්මක වාග්විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රධාන උපවිෂයයක් ලෙස සැලකෙයි. ප්‍රතිරෝධාත්මක වාග්විද්‍යාවේ සමානතා අසමානතා සංකල්පය (The concept of congruence and contrast in Contrastive Linguistics) අනුව මෙම අධ්‍යයනය සිදු කළ අතර ඒ සඳහා වාග්විද්‍යාවේ පදිම සංකල්පය උපයෝගී කර ගන්නා ලදී. 'පදිම' (Morphemes) යනු භාෂාවක අර්ථයක් සහිත ව වෙන් කළ හැකි කුඩා ම ඒකක වෙයි. සිංහලයෙහි 'කරයි' යන ක්‍රියා පදය අර්ථයක් ද සහිත ව ඛණ්ඩනය කළ හැකි උපරිම කොටස් දෙකකි. එනම් /කර-/ හා /-යි/ ලෙස යි. මෙහි ආකෘතික වශයෙන් රූප දෙකක් ඇති අතර එම ආකෘතික කොටස් දෙකට ම ආවේණික වූ අර්ථ ද ඇත. /කර-/ යන්නෙන් 'කිරීම' යන අර්ථය ද /-යි/ යන්නෙන් වර්තමාන කාල, ප්‍රථම පුරුෂ හා ඒක වචන අර්ථය ද ප්‍රකාශ වෙයි. එබැවින් සිංහල 'කරයි' යන පදය අර්ථයක් සහිත ව ඛණ්ඩනය කළ හැකි කොටස් දෙකකි. එනම් එහි පදිම දෙකකි. මෙහි /කර-/ යන්න ප්‍රකෘති පදිමය වශයෙනුත් /-යි/ යන්න 'අනුසර්ගක පදිමය' (suffix) වශයෙනුත් හඳුනා ගනු ලබයි.

මෙහි දී ලේඛන සිංහලයේ හා භාෂණ සිංහලයේ භාවිත ත්‍රෛකාලික ක්‍රියා, විධි ක්‍රියා, ප්‍රාර්ථනා ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා හා අපර ක්‍රියාවල අනුසර්ගක ලේඛනයේ හා භාෂණයේ ප්‍රතිරෝධාත්මක ව භාවිත වන ආකාරය අධ්‍යයනය කරනු ලැබෙයි.

## සාහිත්‍ය විමර්ශනය

කිසියම් භාෂාවක ලේඛනයත්, භාෂණයත් අතර දක්නට ලැබෙන මෙම ප්‍රතිරෝධය "භාෂා ද්විරූපතාව" (Diglossia) නමින් වාග්වේදීන්ගේ අධ්‍යයනවලට පාදක වී ඇත. එක ම භාෂාවක පවතින මෙම සුවිශේෂ භාෂා ලක්ෂණය 'ඉහළ භාෂා ස්වරූපය' හා 'පහළ භාෂා ස්වරූපය' වශයෙන් බෙදීමකට ලක් කරමින් භාෂා ද්විරූපතාව යටතේ මුල් ම වරට අධ්‍යයනය කරන ලද්දේ චාර්ල්ස් ඒ. ෆර්ගියුසන් (Charles A Ferguson) නම් වාග්වේදියා විසිනි (ධර්මදාස, 1996: 79).

ලේඛන සිංහලය හා භාෂණ සිංහලය අරබයා දැකිය හැකි මෙම ප්‍රතිරෝධය භාෂා ද්විරූපතාව නමින් බොහෝ උගතුන් විසින් අධ්‍යයනය කර ඇත. ඩබ්ලිව්. ජේම්ස් ගේයර් (Sinhalese Diglossia) කේ.එන්.ඕ. ධර්මදාස (සිංහල භාෂා ද්විරූපතාවෙහි ඉතිහාසය, භාෂාව හා සමාජය), විමල් ජී. බලගල්ලේ (භාෂාධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය), එම්.ඩබ්. සුගතපාල ද සිල්වා (සිංහල භාෂාව), ඩබ්ලිව්.එස්. කරුණාතිලක (An Introduction to Spoken Sinhala) ආදී වියත්හු මෙහි දී ප්‍රමුඛස්ථානයක් උසුලති.

## පර්යේෂණ ගැටලුව

ලේඛන සිංහලයත්, භාෂණ සිංහලයත් අතර පවතින ප්‍රතිරෝධය ක්‍රියා අනුසර්ගක අංශයෙන් කෙතෙක් පවතී ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව යි.

## පර්යේෂණ අරමුණු

සිංහලයේ ලේඛනය හා භාෂණය අතර පවතින ප්‍රතිරෝධය සඳහා ක්‍රියා පදය කෙතෙක් දුරට බලපා ඇත් දැයි ක්‍රියා අනුසර්ගක අංශයෙන් විමර්ශනය කිරීම ප්‍රමුඛ අභිප්‍රාය යි. ඊට අමතර ව ලේඛනයේ හා භාෂණයේ භාවිත වන ක්‍රියා අනුසර්ගක වෙන් වෙන්


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වශයෙන් හඳුනා ගැනීම ද අතිරේක අරමුණක් වශයෙන් පවති යි.

## පර්යේෂණයේ වැදගත්කම

සිංහලයේ පවතින උක්ත ප්‍රතිරෝධය සඳහා ක්‍රියා පදයේ විවිධ රූප භාවිතය කෙතෙක් දුරට බලපා ඇත්දැයි අවබෝධ කරගත හැකි වීම ප්‍රධාන වැදගත්කම වෙයි. ඊට අමතර ව සිංහලය ද්විතීයික භාෂාවක් ලෙස හදාරන විද්‍යාර්ථීන්ට උපයෝගී කරගත හැකි වීම, වෙනත් භාෂාවකින් රචිත කෘතියක් සිංහලට පරිවර්තනය කිරීමේ දී ඇති වන භාෂාත්මක ගැටලුවලට විසඳුමක් ලබා ගත හැකි වීම, ලේඛනය හා භාෂණය අතර අන්‍යෝන්‍ය සමගාමී බවක් ඇති කිරීමේ පොදු භාෂාත්මක සංශෝධන කාර්යයන්වලට උපයෝගී කර ගත හැකි වීම ආදිය ද මෙහි ඇති ප්‍රයෝජනයෝ වෙති.

## පර්යේෂණ ක්‍රමවේදය

ලේඛන සිංහලයේ භාවිත ක්‍රියා අනුසර්ගක පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී "ක්‍රියා විවරණය (කුමාරතුංග මුනිදාස), ව්‍යාකරණ විවරණය (කුමාරතුංග මුනිදාස), සිදත් සඟරා විවරණය (කුමාරතුංග මුනිදාස), සිංහල භාෂාවේ ව්‍යාකරණය (විල්හෙම් ගයිගර්), භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය (විමල් ජී. බලගල්ලේ), සිදත්සඟරා විමසුම (ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි), බසක මහිම පොත් පෙළ (ජේ.බී. දිසානායක) සහ විශේෂයෙන් සිංහල භාෂා ව්‍යාකරණය (ඩබ්. එස්. කරුණාතිලක) ආදී ග්‍රන්ථ ප්‍රමුඛ ස්ථානයෙහි ලා උපයෝගි කර ගැනිණි. භාෂණ සිංහලයේ ක්‍රියා අනුසර්ගක පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ස්වභාෂිකයකු වශයෙන් ඇති දැනුමට අමතර ව 'An Introduction Spoken Sinhala' (W. S. Karunathilaka), 'Studies in South Asian Linguistics' (James w. Gair), 'භාෂණ සිංහලය' (ඩයනා කුමාරි ඉද්දමල්ගොඩ, එස්.ජේ. යෝගරාජා) 'කතා කරන සිංහලය' (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව) ආදී ග්‍රන්ථ පරිශීලනය කළ අතර විශේෂයෙන් සිංහල භාෂක සමාජය තුළ පැවැත් වූ අවිධිමත් සම්මුඛ සාකච්ඡා හා සංවාද නිරීක්ෂණ ද උපයෝගී කර ගන්නා ලදී.

## සාකච්ඡාව

### වර්තමාන කාල ක්‍රියා අනුසර්ගක

ලේඛන සිංහලයේ හා භාෂණ සිංහලයේ වර්තමාන කාල ක්‍රියාව යෙදෙන ආකාරය අවබෝධ කර ගැනීමට ලේඛනයේ භාවිත වර්තමාන කාල ක්‍රියා පද සහිත වාක්‍යය කිහිපයක් හා භාෂණයේ වාගාලාප කිහිපයක් පහත දැක්වෙයි.

<table>
<tr><th colspan="2">පුරුෂ හා වචන</th><th colspan="2">ලේඛන සිංහලය</th><th>≠</th><th colspan="2">භාෂණ සිංහලය</th></tr>
<tr><td rowspan="2">ප්‍රථම පුරුෂ</td><td>ඒක වචන</td><td>ඔහු වැඩ කරයි.</td><td>-යි</td><td>≠</td><td rowspan="6">එයා/ඒ ගොල්ලො /මෙයා/ උඹ/ උඹලා/ මම/ අපි වැඩ කරනවා/ කරනෝ.</td><td rowspan="6">-නවා -නෝ</td></tr>
<tr><td>බහු වචන</td><td>ඔවුහු වැඩ කරති/කරත්.</td><td>-ති/-ත්</td><td>≠</td></tr>
<tr><td rowspan="2">මධ්‍යම පුරුෂ</td><td>ඒක වචන</td><td>තෝ වැඩ කරහි.</td><td>-හි</td><td>≠</td></tr>
<tr><td>බහු වචන</td><td>තොපි වැඩ කරහු.</td><td>-හු</td><td>≠</td></tr>
<tr><td rowspan="2">උත්තම පුරුෂ</td><td>ඒක වචන</td><td>මම වැඩ කරමි.</td><td>-මි</td><td>≠</td></tr>
<tr><td>බහු වචන</td><td>අපි වැඩ කරමු.</td><td>-මු</td><td>≠</td></tr>
</table>

ඉහත නිදසුන්වල ලේඛන සිංහල වර්තමාන කාල ක්‍රියා පද සාධනය වීම සඳහා ප්‍රකෘතියට පුරුෂ හා වචන භේදය මත /-යි/, /-ති/, /-ත්/, /-හි/, /-හු/, /-මි/, හා /-මු/ වශයෙන් අනුසර්ගක හතක් භාවිත වුවත් භාෂණ සිංහල වර්තමාන ක්‍රියා පදවල භාවිත වී ඇත්තේ /-නවා/ හා /-නෝ/ යන අනුසර්ගක දෙක පමණකි. ලේඛනයේ මෙන් භාෂණයේ වාගාලාපයක උක්තය අනුව ආඛ්‍යාතය භාවිත නොකිරීම හේතුවෙන් භාෂණ අනුසර්ගක සංඛ්‍යාව අවම වී ඇත. එය ලේඛනය හා භාෂණය අතර දක්නට ලැබෙන දැඩි ප්‍රතිරෝධයකි.

### අනාගත කාල ක්‍රියා අනුසර්ගක

ලේඛන සිංහලයේ අනාගත කාල ක්‍රියා පදය සම්බන්ධයෙන් වාග්වේදීන් අතර සම්මත එක් අදහසක් නැත. සමහර වාග්වේදීහු සිංහලයේ ශුද්ධ අනාගත කාල ක්‍රියා පදයක් ඇතැයි ද සමහර වාග්වේදීහු සිංහලයේ ශුද්ධ අනාගත කාල ක්‍රියා පදයක් නැතැයි ද පවසති. කෙසේ වෙතත් ලේඛනයේ අනාගත අර්ථය සහිත වාක්‍යවල /කර-/ ධාතු ප්‍රකෘතිය වරනැඟී ඇති ආකාරය හා එය ගොඩනැඟී ඇති පදිම පහත වගුවේ දැක්වෙයි.

| පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | කර-න-එ (ය) > කරන්නේ ය<br>කර-න-ඊ (ය) > කරන්නී ය | කර-න-ඕ (ය) > කරන්නෝ ය |
| මධ්‍යම පුරුෂ | කර-න-එ-හි > කරන්නෙහි | කර-න-එ-හු > කරන්නෙහු |
| උත්තම පුරුෂ | කර-න-එ-මි > කරන්නෙමි | කර-න-එ-මු > කරන්නෙමු |

මේ අනුව ක්‍රියා ප්‍රකෘතියට /-න/ අනුසර්ගකය බද්ධ වීමෙන් සැකසෙන (කරන) කෘදන්ත පදයට /-එ/, /-ඊ/ හා /-ඕ/ නාම අනුසර්ගක සම්බන්ධ වීමෙන් හා පුරුෂ ප්‍රත්‍යය සම්බන්ධ වීමෙන් අනාගත කාල ක්‍රියා පදය සැකසෙන බවත්, ශුද්ධ අනාගත කාල අනුසර්ගකයක් භාවිත නොවන බවත් පැහැදිලි වෙයි.

එහෙත් භාෂණ සිංහල අනාගත කාල ක්‍රියා පදය මීට වෙනස් වෙයි. ලේඛන සිංහලයේ ශුද්ධ අනාගත කාල ක්‍රියා පදයක් දක්නට නැති බැවින් තත් කාලය සඳහා ආවේණික අනුසර්ගක අවිද්‍යමාන බව ඉහත සාකච්ඡා විය. එහෙත් භාෂණ සිංහලයේ භාවිත අනාගතාර්ථ ක්‍රියා පදවල අනුසර්ගක කිහිපයක් භාවිත වෙයි. මෙම අනුසර්ගකවලින් සමහරක් ලේඛනයේ වර්තමාන කාල ක්‍රියා අනුසර්ගකවලට රූපීය වශයෙන් සමාන වුව ද අනාගතාර්ථයක් ප්‍රකාශ වීම විශේෂ ලක්ෂණයකි. ලේඛනයට සාපේක්ෂ ව භාෂණයේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණයක් වනුයේ උච්චාරණ රටාව අනුව අර්ථය වෙනස් වීම යි. අනාගතාර්ථය (හෝ සංශයාර්ථය) රැගත් එවැනි වාගාලාප කිහිපයක /-යි/ අනුසර්ගක පදිමය යෙදෙනු හඳුනා ගත හැකි ය. මෙම /-යි/ අනුසර්ගකය සහිත ක්‍රියා පදය ද්විත්ව කර ව්‍යවහාර වීම මඟින් සංශයාර්ථය හෝ අවධාරණාර්ථය ද, ක්‍රියා පදය එක් වරක් පමණක් ව්‍යවහාර කරයි නම් අනාගතාර්ථය ද ධ්වනිත වීම දක්නට ලැබෙයි. පහත නිදසුන් සේ දක්වා ඇති එක ම ප්‍රශ්නයට පිළිතුරු ලැබෙන දෙයාකාරය අනුව එය පැහැදිලි වෙයි.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නිදසුන්:

(එයා ඒක කරයි ද දන්නෑ?) කරයි. = අනාගතාර්ථය

(එයා ඒක කරයි ද දන්නෑ?) කරයි... කරයි... = සංශයාර්ථය/ අවධාරණාර්ථය

ඉහත ව්‍යවහාරයන්හි අර්ථය නිසි පරිදි අවබෝධ වනුයේ භාෂණයේ දී සිදුවන උච්චාරණ රටාව හා උච්චාරණ ධ්වනිය මත ය. කෙසේ වෙතත් ලේඛනයේ වර්තමාන කාල ප්‍රථම පුරුෂ ඒක වචන අනුසර්ගක පදිමයට සමාන /-යි/ අනුසර්ගකය මෙහි භාවිත ය. එනමුදු ප්‍රකාශ වනුයේ වර්තමාන කාල අර්ථයක් නොව අනාගත කාල (හෝ සංශය/ අවධාරණමය) අර්ථයකි.

උත්තම පුරුෂ බහු වචන සර්ව නාමය වන 'අපි' සමඟ අනාගතාර්ථය සහිත යෝජනා කිරීම්වල දී /-මු/ අනුසර්ගක පදිමය ද භාෂණ සිංහලයේ භාවිත වෙයි.

නිදසුන්:

අපි හෙට හොඳට දුවමු. (දුව-මු > දුවමු)

අපි තව පොඩ්ඩකින් අර ගමන යමු. (ය-මු > යමු)

මෙහි ප්‍රකෘති පදිම වන /දුව-/, /ය-/ ආදී පදිමවලින් පසු ව /-මු/ අනුසර්ගක පදිමය යෙදී ඇත්තේ අනාගතාර්ථයෙනි.

මීට අමතර ව භාෂණ සිංහල අනාගත කාල ක්‍රියා පදයන්හි උත්තම පුරුෂ ඒක වචන හා බහු වචන සර්ව නාම පද සමඟ /-න්නම්/ (/-න්නන්/) අනුසර්ගක ද ප්‍රථම හා මධ්‍යම පුරුෂ නාම පද සමඟ /-වි/ අනුසර්ගකය ද භාවිත වෙයි.

නිදසුන්:

මම කන්නම්/ කන්නන්. (ක-න්නම් > කන්නම්)

අපි ලියන්නම්/ ලියන්නන්. (ලිය-න්නම් > ලියන්නම්)

අම්මා බත් උයාවි. (උය-වි > උයාවි)

තාත්තා වැඩ කරාවි. (කර-වි > කරාවි)

මෙහි දී ප්‍රකෘතියට /-වි/ අනුසර්ගකය බද්ධ වීමේ දී ප්‍රකෘති අන්තයේ හ්‍රස්ව ස්වරයක් පවතී නම් එය දීර්ඝත්වයට පත් වීම විශේෂ ලක්ෂණයකි.

ඉහත සඳහන් සේ භාෂණ සිංහලයේ අනාගත ක්‍රියා පද සාධනයේ දී /-යි/, /-මු/, /-වි/ මෙන් ම /-න්නම්/ (/-න්නන්/) අනුසර්ගක පදිම භාවිත වුවත්, ලේඛන සිංහලයේ ශුද්ධ අනාගත කාල අනුසර්ගක පදිම හඳුනා ගත නොහැකි බැවින් ලේඛනය හා භාෂණය අතර ප්‍රතිරෝධයක් පවතියි.

## අතීතකාල ක්‍රියා අනුසර්ගක

අතීත කාල ආඛ්‍යාතය සාධනය වන ආකාරය පිළිබඳ විවිධ වාග්වේදීහු විවිධ අදහස් දක්වති. කුමාරතුංග මුනිදාස (ක්‍රියා විවරණය), විල්හැම් ගයිගර් (සිංහල භාෂාවේ ව්‍යාකරණය), ජේ. බී. දිසානායක (බසක මහිම පොත් පෙළ අංක (9-) ප්‍රත්‍යය) සහ ඩබ්. එස්. කරුණාතිලක (සිංහල භාෂා ව්‍යාකරණය) ආදීහු මෙහි ලා ප්‍රධානයහ. සිංහලයේ අතීත ක්‍රියා පදය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති සියලු කරුණු ද අධ්‍යයනය කිරීමෙන් සිංහලයේ අතීත ආඛ්‍යාත පද කෘදන්ත ආඛ්‍යාතය හා අතීත ශුද්ධ ආඛ්‍යාතය ලෙස දෙවර්ගයක් යටතේ අධ්‍යයනය කළ හැකි ය. කෘදන්ත අතීත ආඛ්‍යාත සැකසෙන්නේ ක්‍රියා ප්‍රකෘතියට පසු /-ඉ/, /-ඌ/, /-උණු/ ආදී අනුසර්ගක බද්ධ වීමෙන් සැකසෙන අතීත කෘදන්තවලට පුරුෂ ප්‍රත්‍යය යෙදීමෙන් ය. එබැවින් කෘදන්ත අතීත ආඛ්‍යාතය ශුද්ධ අතීත ආඛ්‍යාතයක් නොවන බැවින් මෙහි අතීත ආඛ්‍යාත අනුසර්ගක යටතේ සාකච්ඡා කළ නොහැකි ය. විමල් ජී. බලගල්ලයන්ගේ (බලගල්ලේ, (2014: 45)) සහ ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමියන්ගේ (පඤ්ඤාසාර හිමි, (2004: 155) අධ්‍යයනයන් අනුසාරයෙන් ශුද්ධ අතීත ආඛ්‍යාතය පහත සඳහන් පරිදි (අනුසර්ගක ද දැක්වෙන ලෙස) වරනඟා දැක්විය හැකි ය.

| පුරුෂය | ඒක වචන | | බහු වචන | |
|---|---|---|---|---|
| | ක්‍රියා පදය | අනුසර්ගකය | ක්‍රියා පදය | අනුසර්ගකය |
| ප්‍රථම පුරුෂ | නැටී | -ඊ | නැටූ | -ඌ |
| මධ්‍යම පුරුෂ | නැටීහි | -ඊහි | නැටූහු | -ඌහු |
| උත්තම පුරුෂ | නැටීමි | -ඊමි | නැටූමු | -ඌමු |

ධාතු ප්‍රකෘතියට අනුසර්ගකය බද්ධ වීමේ දී ප්‍රකෘතිගත මුල් ස්වරය බොහෝ විට අනම්‍යකරණයට ලක්වෙයි. (එනම් අ > ඇ, උ > ඉ, ඔ > එ)

මෙසේ ලේඛන සිංහලයේ අතීත ආඛ්‍යාතය පුරුෂත්‍රයට හා වචනද්වයට ආවේණික අනුසර්ගක සහිත ව භාවිත වුවත් භාෂණ සිංහලයේ එවන් සංකීර්ණ ආඛ්‍යාත භාවිතයක් දැක ගත නොහැකි ය.

නිදසුන්:

ප්‍රථම පුරුෂ ඒක වචන = අම්මා/ තාත්තා/ එයා/ අරයා/ මෙයා/ ඌ/ ඈ බැලුවා.

ප්‍රථම පුරුෂ බහු වචන = එයාලා/ අරයලා/ මෙයාලා/ උන්/ බැලුවා.

මධ්‍යම පුරුෂ ඒක වචන = තෝ/ මූ/ උඹ/ බැලුවා.

මධ්‍යම පුරුෂ බහු වචන= තොපි/ මුන්/ උඹලා/ බැලුවා.

උත්තම පුරුෂ ඒක වචන = මම/ මං බැලුවා.

උත්තම පුරුෂ බහු වචන = අපි බැලුවා.

මෙහි 'බැලුවා' යන අතීත ආඛ්‍යාතය 'බල-ඌ > බැලූ-ආ > බැලුවා' ලෙසින් /ව්/ ශබ්දයක් ද ආගමනය වෙමින් සැකසී ඇත. මෙම /-ආ/ අනුසර්ගක පදිමයට අමතර ව භාෂණ සිංහලයේ අතීත ක්‍රියා පද නිර්මාණය වීමේ දී /-ල/ (හෝ /-ලා/), /-පි/ හා /-ච්චි/ ආදී අනුසර්ගක ද භාවිත වෙයි. මෙම අනුසර්ගක ඉහත /-අ/ (/-ආ/) පදිමය මෙන් ම සුලබ වූවක් නොවූවත් සාමාන්‍ය භාෂකයන් අතර අතීත අර්ථයෙන් ව්‍යවහාර වනු හඳුනා ගත හැකි ය.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නිදසුන්:

(/-ල/ (හෝ /-ලා/) =

"එයාලා බත් කාල/ කාලා." (ක-ල > කාල/ ක-ලා > කාලා)

"පොඩි පුතා සතෙක් මරල/ මරලා." (මර-ල > මරල)

(/-පි/) =

"එයා ඒ වෙලාවේ වතුරට පැනපි." (ප්‍රකෘතියේ මුල් අ > ඇ වී ඇත)

"අම්බලමේ පිනා පිනා ... ඒක බිඳපි ගොනා ගොනා." (බඳ-පි > බිඳපි)

(/-ච්චි/) =

"මට ඒ වෙලාවේ සිහි නැති වෙච්චි." (ව-ච්චි > වෙච්චි)

"දුව ගෙට වෙච්චි." (ව-ච්චි > වෙච්චි)

ඉහත සඳහන් කළ /-ආ/ අතීත ක්‍රියා අනුසර්ගකය භාෂණයේ භාවිත ආකාරය මෙන් නොව, මෙහි /-ල/ හා /-පි/ අනුසර්ගක අතීත අර්ථයෙන් යෙදෙන ආකාරය අවබෝධ වීමට වාක්‍යය යෝජනය විමසා බැලිය යුත්තේ ප්‍රකරණය අනුව ඇතැම් විට මෙම පදිම දෙක මගින් (/-ල/ හෝ /-ලා/) පූර්ව ක්‍රියා අර්ථය හා (/-පි/ මගින්) ආශීර්වාද අර්ථය ද ප්‍රකාශ වන බැවිනි. "දරුවා බත් කාලා වතුර බිව්වා" ලෙස ප්‍රකාශ කරන විට 'කාලා' යන්නෙන් පූර්ව ක්‍රියා අර්ථය ප්‍රකාශ වන නමුදු "දරුව බත් කාලා." ලෙස වාගාලාපය අවසන් වනුයේ නම් එහි අතීත ආඛ්‍යාතයක් අඩංගු වෙයි. එමෙන් ම "අනේ! මේ තරගයවත් දිනපි නම්" ලෙස වන ප්‍රකාශයක දී 'දිනපි' යන්නෙහි ඇත්තේ ප්‍රාර්ථනා අර්ථයකි. එහෙත් "ඒ වෙලාවේ ඒ තරගය දිනපි කියන්නකෝ" වැනි වාර්තාමය ප්‍රකාශයක 'දිනපි' යන්නෙහි ඇත්තේ අතීත ආඛ්‍යාතයකි.

ලේඛන සිංහල අතීත ආඛ්‍යාත යෝජනයේ දී උක්තයට අනුව යෙදෙන අනුසර්ගක 6ක් හඳුනා ගත හැකි මුත් භාෂණ සිංහලයේ එබඳු විශේෂත්වයක් නොදක්වා යෙදෙන වෙනම ම අනුසර්ගක (/-ආ/, /-ල/ (/-ලා/), /-පි/ සහ /-ච්චි/) හඳුනා ගත හැකි අතර එය ද ලේඛනය හා භාෂණය අතර ප්‍රතිරෝධය දක්වන විශේෂ අවස්ථාවකි.

## විධි ක්‍රියා අනුසර්ගක

කිසියම් විධානයක් හෝ නියෝගයක් ප්‍රකාශ කිරීම සඳහා භාවිත ක්‍රියා 'විධි ක්‍රියා' ලෙසින් හැඳින්වෙයි. කුමාරතුංග මුනිදාස විධානාඛ්‍යාතය සඳහා යෙදෙනුයේ සාමාන්‍ය මධ්‍යම පුරුෂ ආඛ්‍යාතය බව පවසයි (කුමාරතුංග, 1993: 49). නූතන වාග්වෙදීන් අතුරින් සිංහලයේ විධි ක්‍රියාව සම්බන්ධයෙන් පී. බී. මීගස්කුඹුරයන් විධිමත් අධ්‍යයනයක් සිදු කර ඇත. ඔහු ලේඛන හා භාෂණ සිංහලයේ විධි ක්‍රියාව සම්බන්ධයෙන් සමාජ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් කරමින් එහි භාවිතය අනුව උත්කෘෂ්ට (Superior) මධ්‍යම (Equal) සහ නිකෘෂ්ට (Inferior) වශයෙන් බෙදා දක්වයි (මීගස්කුඹුර, 2001: 141-171). එතුමා මෙහි දී "සෙක්වා, මැනවි, යුතුයි, හොඳයි, යෙහෙකි" ආදී විස්තාරිත ප්‍රයෝග ලෙස ගැනෙන නිපාත පද ද උපයෝගී කරගනු ලැබූවත් විග්‍රහාත්මක වාග්විද්‍යාවේ පදිම සංකල්පය මූලික කරගනිමින් සිදු කරන මෙම අධ්‍යයනයෙහි දී සාකච්ඡා කරනුයේ විධි ක්‍රියා අර්ථය ප්‍රකාශ වන බහුල භාවිතයේ පවතින අනුසර්ගක සම්බන්ධයෙන් පමණි. ලේඛන සිංහලයේ භාවිත එබඳු විධි ක්‍රියා අනුසර්ගක පදිම කිහිපයක් හඳුනා ගැනීම සඳහා ලේඛනයේ භාවිත විධි ක්‍රියා සහිත වාක්‍යය කිහිපයක් නිදසුන් ලෙස පහත දැක්වෙයි.

නිදසුන්:

නුඹ සත්‍යය පවසහි. (පවස-හි > පවසහි)

තොපි පවින් වැළකෙහු. (වළක්-එ-හු > වැළකෙහු)

"මෙ පවත් කියව සැල කරනුව සුර රදුට" (සැළලිහිණි සංදේශය- 107 කවිය) (කිය-ව > කියව)

ඉහත අංක 4 යටතේ බලනු. (බල-නු > බලනු)

අනෙක් පිටුව බලන්න. (බල-න්න > බලන්න)

"යන්නේ වෙළඳගොඩ දැක මඳ කලක් සිට" (සැළලිහිණි සංදේශය- 39 කවිය) (ය-න්නේ > යන්නේ)

"බලග මිතුරු විසිතුරු මිහිරි පැන්නේ" (පරවි සංදේශය- 85) (බල-ග > බලග)

"අසන් මා පිය හිමි - උෟ තතු විලසා - ම වදනා මම" (මනමේ නාට්‍යය- 25 පිටුව) (අස-න් > අසන්)

"යන් මන් තොසින් මඟ තොරතුරු නියම දැන" (සැළලිහිණි සංදේශය- 28 කවිය) (ය-න් > යන්)

"බල මහ මුහුද එම සඳ උතුරෙන් පෙනෙන" (සැළලිහිණි සංදේශය- 16 කවිය) (බල-ɸ > බල)

ලේඛනයේ භාවිත මෙම විධි ක්‍රියා සහිත වාක්‍යවල විධි ක්‍රියාවෙහි භාවිත වී ඇති අනුසර්ගක ලෙස /-හි/, /-හු/, /-ව/, /-නු/, /-න්න/, /-න්නේ/, /-ග/, /-න්/, /-ɸ/ ආදිය වෙන් කර හඳුනා ගත හැකි ය. භාෂණ සිංහලයේ භාවිත විධි ක්‍රියා අනුසර්ගක හඳුනා ගැනීම සඳහා භාෂණයේ භාවිත විධි ක්‍රියා සහිත වාගාලාප කිහිපයක් පහත දැක්වෙයි.

නිදසුන්:

අනිත් පිටුව බලන්න. (බල-න්න > බලන්න)

ඔයා ඒක කරන්ට. (කර-න්ට > කරන්ට)

ඔයා දරුව බලන්ඩ. (බල-න්ඩ > බලන්ඩ)

ෆුඩ් බෝඩ් එකෙන් උඩට නගිනව. (නග-නව > නගිනව)

උඹ වී මිටිය උස්සපන්. (උස්ස-පන් > උස්සපන්)



© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

උඹගෙ පැන මට දියන්. (දෙ-යන් > දියන්)

තෝ එළියට බැහැපිය. (බස්-පිය > බැහැපිය)

ඔයා මෙතනින් යනවකො/යනවකෝ. (ය-න-ව > යනව-කො/කෝ > යනවකො)

ඉක්මනට ලියනො. (ලිය-නො > ලියනො)

ඉක්මනට.. බල! බල! (බල-ϕ > බල)

තොපි කුඹුර වපුරනවල.(වපුර-නවල > වපුරනවල)

ඔක්කෝමලා ඒ වැඩේ කරපල්ලා. (කර-පල්ලා > කරපල්ලා)

උඹලා කඩෙන් බඩු ගනිව්." (ගන්-ව් > ගනිව්)

(මෙහි අවසන් වශයෙන් දක්වා ඇති /-නවල/, /-ල්ලා/, /-ව්/ අනුසර්ගක අදාළ ආමන්ත්‍රිතයා බහු වචනාර්ථ වූ කල්හි පමණක් භාවිත වෙයි.

මෙම වාගාලාපවල අඩංගු විධි ක්‍රියාවල /-න්න/, /-න්ට/, /-න්ඩ/, /-නව/, /-පන්/, /-යන්/, /-පිය/, /-කො/, /-කෝ/, /-නො/, /-ϕ/, /-නවල/, /-ල්ලා/, /-ව්/ ආදී අනුසර්ගක යෙදී ඇත. මෙම විධි ක්‍රියා අනුසර්ගකවලින් /-න්න/ හා /-ϕ/ අනුසර්ගක දෙක හැර ඉතිරි අනුසර්ගකවලින් /-හි/, /-හු/, /-ව/, /-නු/, /-න්නේ/, /-ග/, /-න්/ ආදිය ලේඛනයේ පමණක් යෙදෙමින් ද /-ව්/, /-න්ඩ/, /-නව/, /-නවල/, /-පන්/, /-ල්ලා/, /-යන්/, /-පිය/, /-කො/, /-කෝ/, /-නො/, /-න්ට/ ආදිය භාෂණයේ පමණක් යෙදෙමින් ද ලේඛනයත් භාෂණයත් අතර ප්‍රතිරෝධතාවක් ඇති කරයි.

## ප්‍රාර්ථනා ක්‍රියා අනුසර්ගක

ප්‍රාර්ථනයක් හෝ ආශීර්වාදයක් ප්‍රකාශ කිරීමේ දී මෙම ක්‍රියා රූප භාවිත වෙයි. ලේඛන සිංහලයේ වර්තමාන කාල ක්‍රියා පදවල පුරුෂ හා වචනවාචී ප්‍රත්‍යයවලින් පසු ව /-වා/ ප්‍රත්‍යය යෙදීමෙන් ප්‍රාර්ථනා ක්‍රියා රූප සෑදෙයි. /-වා/ ප්‍රත්‍යය යෙදීමේ දී උත්තම පුරුෂ ඒක වචනයෙහි /-මි/ ප්‍රත්‍යය වෙනුවට 'ම්' රූපාන්තරය ද උත්තම පුරුෂ බහු වචනයෙහි /-මු/ වෙනුවට 'මෝ' රූපාන්තරය ද, ප්‍රථම පුරුෂ බහු වචන /-ති/ ප්‍රත්‍යය වෙනුවට 'ත්' රූපාන්තරය ද වෛකල්පිත ව යෙදෙනු දක්නට ලැබෙයි (කරුණාතිලක, 2014: 194).

| පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | (ලබ-ඒ-වා >) ලැබේවා | (ලබ-ති-වා >) ලබත්වා |
| මධ්‍යම පුරුෂ | (ලබ-හි-වා >) ලබහිවා | (ලබ-හු-වා >) ලබහුවා |
| උත්තම පුරුෂ | (ලබ-මි-වා >) ලබම්වා | (ලබ-මු-වා >) ලබමෝවා |

සිදත් සඟරා කතුවරයා පුරුෂත්‍රය හා සම්බන්ධ ව යහපත්වූත්, නොපැමිණියාවූත් අනාගත ප්‍රාර්ථනාර්ථයක් ඇති ක්‍රියාව ආශීර්වාද (ආසිකිරිය) ක්‍රියාව නම් වන බවත් මෙය ප්‍රත්‍යයෙන් පර ව /-වා/ යෙදීමෙන් සැකසෙන බවත් ප්‍රකාශ කරයි (පඤ්ඤාසාර හිමි, 2004: 176). සිදත් සඟරා කතුවරයාට අනුව ආශීර්වාද ක්‍රියාවට ඇතුළත් වනුයේ යහපත් ප්‍රාර්ථනා පමණි. එහෙත් අයහපත් ප්‍රාර්ථනාවල ද /-වා/ අනුසර්ගකය වන බැවින් 'ප්‍රාර්ථනා ක්‍රියාව'මේ සඳහා උචිත නම යැයි හැඟෙයි.

කුමාරතුංග මුනිදාසයෝ සිංහලයේ 'ප්‍රාර්ථනා ක්‍රියා' වශයෙන් ක්‍රියා වර්ගයක් නැති බවත් ආශීර්වාදය හැඟවුව මනා තැන්හි 'වා' නිපාතය වර්තමාන ක්‍රියාවට පසු ව යොදන බවත් සඳහන් කරති (කුමාරතුංග, 1993: 51). ඇස්. පරණවිතාන සූරීන් සීගිරි ගී අතර 'ආශීර්වාද ක්‍රියා' දක්නට ලැබෙන බව ප්‍රකාශ කරන අතර (පරණවිතාන, 2009: 223), ඩබ්. එස්. කරුණාතිලක, විමල් ජී. බලගල්ලේ, ජේ. බී. දිසානායක ආදී නූතන වාග්වේදීහු ද සිංහලයේ /-වා/ අනුසර්ගකය රැගත් ප්‍රාර්ථනා ක්‍රියා වෙන ම ක්‍රියා ගණයක් බවට පිළිගනිති.

භාෂණ සිංහලයේ ප්‍රාර්ථනා ක්‍රියාවල /-වා/ අනුසර්ගකයට අමතර ව අනුසර්ගක කිහිපයක් ම භාවිත වන ආකාරය පහත නිදසුන්වලින් හඳුනා ගත හැකි ය.

නිදසුන්:

අනේ! මේ තරඟයවත් දිනපන්... (දින-පන් > දිනපන්)

ලංකාව මේ තරඟයෙන් දිනපිය! (දින-පිය > දිනපිය)

"උඟ නයා කාපිනං" (ක-පි-නං > කාපිනං)

"මට රා නුදුන් තෝ ගහ මුල වැටීයන්" (වට-ඊ > වැටී-යන් > වැටියන්)

මේ අනුව /-වා/ අනුසර්ගකය ලේඛනයෙහිත් භාෂණයෙහිත් සමාන ව යෙදෙන නමුත් /-පන්/, /-පිය/, /-නං/ හා /-යන්/ අනුසර්ගක භාෂණයේ පමණක් භාවිත වන බව පැහැදිලි වෙයි. එබැවින් විධි ක්‍රියාව භාවිත වන ආකාරයෙන් ද ලේඛන සිංහලයත් භාෂණ සිංහලයත් අතර ප්‍රතිරෝධයක් දක්නට ලැබෙයි.

## ප්‍රයෝජ්‍ය ක්‍රියා අනුසර්ගක

වෙනත් අයකු ලවා කරවන ක්‍රියාව ප්‍රයෝජ්‍ය ක්‍රියාව ලෙස සාම්ප්‍රදායික ලේඛන ව්‍යාකරණයේ සඳහන් වෙයි. කුමාරතුංග මුනිදාස මෙවැනි ක්‍රියා 'ප්‍රයුක්ත ආඛ්‍යාතය' යටතේ සාකච්ඡා කරයි (කුමාරතුංග, 1993: 43). ප්‍රයෝජ්‍ය ක්‍රියා රූප සාධනයේ දී ලේඛන සිංහලයේ භාවිත එක ම අනුසර්ගක පදිමය /-ව/ යන්න යි. ක්‍රියා ප්‍රකෘති පදිමයට /-ව/ සර්ගකය එක් වූ පසුව පුරුෂ හා වචනවාචී පදිම යෙදෙමින් පුරුෂත්‍රයේ හා අතීත, වර්තමාන හා අනාගත කාලයන්හි වරනැගීම ද කළ හැකි ය. භාෂණ සිංහල ප්‍රයෝජ්‍ය ක්‍රියාවේ ද භාවිත වනුයේ /-ව/ අනුසර්ගකය පමණක් බැවින් ප්‍රයෝජ්‍ය ක්‍රියා අනුසර්ගක අංශයෙන් ලේඛනයත්, භාෂණයත් අතර ප්‍රතිරෝධයක් නැත.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නිදසුන්:

| ලේඛන සිංහලය | | භාෂණ සිංහලය |
|---|---|---|
| මව දරුවා ලවා පොතක් බලවයි. (< බල-ව-යි) | = | අම්මා දරුව ලවා පොතබ්බලවනව. (< බල-ව-නව) |
| මම එම ලිපිය ලියවන්නෙමි. (< ලිය-ව-න-එ-මි) | = | මං ඒ ලියුම ලියවන්නම්. (<ලිය-ව-න්නම්) |

## පූර්ව ක්‍රියා අනුසර්ගක

අර්ථමය වශයෙන් වාක්‍යයක අවසාන ක්‍රියාවට පූර්වයෙන් සිදු කෙරෙන, වාග්විද්‍යාත්මක ව පූර්ව ක්‍රියා අනුසර්ගක පදිමයක් සහිත ක්‍රියා පද පූර්ව ක්‍රියා පද ලෙස සැලකෙයි. සිදත් සඟරා කතුවරයා එක් කර්තෘවරයෙකුට අයත් ක්‍රියාවන්ගෙන් අවසාන ක්‍රියාවට පූර්වයෙහි වූ ක්‍රියා පූර්ව ක්‍රියා වශයෙන් විස්තර කරන අතර එහි දී 'ඇ, ආ, ඉන්' ප්‍රත්‍යය 'ලා' යුක්ත ව ද වියුක්ත ව ද යෙදෙන බව සඳහන් කරයි (පඤ්ඤාසාර හිමි, 2004: 186). විමල් ජී. බලගල්ලයන් අසම්භාව්‍ය ක්‍රියා මෙන් ම පූර්ව ක්‍රියා ද නෛපාතික ක්‍රියා නැමති සංගත නිපාත ගණයට අයත් කර සාකච්ඡා කර ඇත (බලගල්ලේ, 1989: 20). නිපාත මෙන් පූර්ව ක්‍රියා ද වරනැගීමකට ලක් නොවීම එයට හේතුව යි. කුමාරතුංගයන් ද පූර්ව ක්‍රියා නිපාත ක්‍රියා වශයෙන් හඳුන්වන අතර එහි දී ඔහු 'අතීත නිපාත ක්‍රියා', 'වර්තමාන නිපාත ක්‍රියා' සහ 'අනාගත නිපාත ක්‍රියා' වශයෙන් වර්ග තුනක් යටතේ අධ්‍යයනය කරයි (කුමාරතුංග, 1993: 85-86). ලේඛන සිංහලයේ පූර්ව ක්‍රියා පද සාධනයේ දී යෙදී ඇති අනුසර්ගක පදිම හඳුනා ගැනීම සඳහා ලේඛනයේ භාවිත පූර්ව ක්‍රියා කිහිපයක් නිදසුන් වශයෙන් ගත හැකි ය.

| ප්‍රකෘතිය | අනුසර්ගකය | පූර්ව ක්‍රියාව |
|---|---|---|
| බස්- | -අ | බැස |
| දක්- | -ඇ | දැක/ දැකැ |
| බඳ- | -ඊ | බැඳ/ බැඳී |
| බල- | -ආ | බලා |

ඉහත සඳහන් පූර්ව ක්‍රියා අවම අර්ථ සහිත කොටස්වලට වෙන් කළ ආකාරය අනුව /-අ/, /-ආ/, /-ඇ/, /-ඊ/ ආදිය පූර්ව ක්‍රියා අනුසර්ගක වශයෙන් හඳුනා ගත හැකි ය. මීට අමතර ව සිංහලයේ දක්නට ලැබෙන (ය-) ගොස්, (එ-) අවුත්, ඇවිත්, විත්, (ගන්-) ගෙණ, (අතුර-) අතුට, (මතුර-) මතුට, මතුටැ, (වපුර-) වපුට, වපුටැ ආදී පූර්ව ක්‍රියාවල අනුසර්ගක වෙන් කිරීම අපහසු ය. විල්හෙම් ගයිගර් ප්‍රකාශ කරනුයේ මෙවැනි පූර්ව ක්‍රියා මාතෘ භාෂාවල ගන්ත්වා > ගොස්, කෘත්වා > කොට, ආදිය මෙන් සිංහලට පරිණාමය වූ බවයි (ගයිගර්, 1968: 155). ප්‍රකෘති ප්‍රත්‍යය වෙන් කළ නොහැකි 'ඇවිත්, ගොස්' ආදී පූර්ව ක්‍රියා අනියම් ගණයේ ප්‍රකෘති මගින් සාධිත බව ජේ. බී. දිසානායකයන්ගේ අදහස යි (දිසානායක, 2008: 84). ප්‍රකෘති පදිමය හා අනුසර්ගක පදිමය රීත්‍යනුකූල ලෙස වෙන් කළ නොහැකි පූර්ව ක්‍රියා "අසාධ්‍ය වූ නිපාත ක්‍රියා" වශයෙන් කුමාරතුංග මුනිදාස නම් කරයි (කුමාරතුංග, 1993: 88). "අතුර-, මතුර-, වපුර-" ආදී ර-කාරාන්ත ප්‍රකෘති පූර්ව ක්‍රියා බවට පත් වීමේ දී 'ට' හෝ 'ටැ' වශයෙන් සිටීම විශේෂ ලක්ෂණයකි.

කෙසේ වෙතත් ඉහත සාකච්ඡා කළ /-අ/, /-ආ/, /-ඇ/, /-ඊ/ ආදිය ලේඛනයේ භාවිත පූර්ව ක්‍රියා අනුසර්ගක වශයෙන් හඳුනා ගත හැකි ය.

භාෂණ සිංහලයේ භාවිත වන පූර්ව ක්‍රියා අනුසර්ගක හඳුනා ගැනීමට පහත දැක්වෙන වාගාලාප කිහිපය විමසා බලමු.

නිදසුන්:

එයා හොඳ නැටුමක් නටල/නටලා ගියේ. (නට-ල/ලා > නටල/නටලා)

'ඔයා ඒ වැඩේ කරං එන්නකො. (කර-අං > කරං)

මේ අනුව භාෂණයේ භාවිත පූර්ව ක්‍රියා අනුසර්ගක ලෙස /-ල/(හෝ /-ලා/) හා /-අං/ ආදිය හඳුනා ගත හැකි අතර මෙම අනුසර්ගක භාෂණයට පමණක් සීමා වෙයි. එසේ ම ලේඛනයේ භාවිත /-අ/, /-ආ/, /-ඇ/, /-ඊ/ ආදී අනුසර්ගක ද ලේඛනයේ පමණක් භාවිත වන බැවින් පූර්ව ක්‍රියා අනුසර්ගක අංශයෙන් ද ලේඛනයත් භාෂණයත් අතර ප්‍රතිරෝධයක් දක්නට ලැබෙයි.

## මිශ්‍ර ක්‍රියා අනුසර්ගක

වාක්‍යයක කිසියම් ක්‍රියාවක් සමඟ මිශ්‍ර ව සිදුවන ක්‍රියා 'මිශ්‍ර ක්‍රියා' ලෙස හඳුන්වයි. ඒ අනුව මිශ්‍ර ක්‍රියාව පූර්ව ක්‍රියාව, විධි ක්‍රියාව, ප්‍රාර්ථනා ක්‍රියාව, ප්‍රයෝජ්‍ය ක්‍රියාව හෝ අවසාන ක්‍රියාව සමඟ මිශ්‍ර ව පැවතිය හැකි ය. සිදත් සඟරාවෙහි මිශ්‍ර ක්‍රියාව සඳහා 'මින්, මින, මිනි' වශයෙන් ප්‍රත්‍යය තුනක් දක්වන අතර කුමාරතුංග මුනිදාසයෝ මිශ්‍ර ක්‍රියා නිපාත ක්‍රියා වශයෙන් හඳුන්වති. ලේඛන සිංහලයේ බහුල ව භාවිත මිශ්‍ර ක්‍රියා පද සාධනය වන අනුසර්ගක පදිම අතර /-මින්/ පදිමය ප්‍රධාන වන අතර /-මිනි/, /-මින/ හා /-මිනි/ ආදී අනුසර්ගක ද කාව්‍ය භාෂාවෙහි යෙදෙයි.

නිදසුන්:

සියල්ලෝ කතාව අවසානයේ අත් පොළසන් දෙමින් ඇයට ප්‍රශංසාව පිරි නැමූහ.(දෙ-මින් > දෙමින්)

"පුදමින් එසුරවර සිරි සරණ වදිමින" (සැළලිහිණි සංදේශය, 105 කවිය) (වඳ-මින > වදිමින)

"සර හැර සියොතුන් පියපත් විදිමිනි,, (ගුත්තිල කාව්‍ය, 296 කවිය) (විඳ-මිනි > විදිමිනි)

"කෙනකන ගී නගමිනි පෙද නගමිනි නැමෙත" (කව්සිළුමිණ- 280 කවිය) (නඟ-මිනි > නගමිනි)

මීට අමතර ව ලේඛන සිංහලයේ මිශ්‍ර ක්‍රියා අර්ථ ප්‍රකාශය සඳහා පූර්ව ක්‍රියා ද්විත්වය ද යොදා ගනියි (නිද: බල බලා, නට නටා). එක ම පදයක් ලෙස නොයෙදෙන නිසා සහ ප්‍රකෘති පදිම දෙකක් අන්තර්ගත බැවින් මෙහි මිශ්‍ර කියා අර්ථය සහිත අනුසර්ගකයක් වෙන් කර හඳුනා ගැනීම අපහසු ය. භාෂණ සිංහලයේ ද මිශ්‍ර ක්‍රියා අර්ථය ප්‍රකාශ කිරීමේ ජනප්‍රිය ක්‍රමය වනුයේ ප්‍රකෘති පදිම ද්විත්වය යි. එවැනි වාගාලාප කිහිපයක් නිදසුන් ලෙස දැක්විය හැකි ය.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නිදසුන්:

| | |
|---|---|
| කතා <u>කර කර</u> බත් කන්න එපා!, | ටී වී <u>බල බල</u> බත් කන්න එපා! |
| දුව ගෙදර එනකොට <u>අඬාගෙන</u> ආවෙ., | මං එනකොට ඒ වැඩේ <u>කරගෙන</u> ම එන්නම්. |

භාෂණයේ භාවිත මෙම පූර්ව ක්‍රියා ද්විත්වය ලේඛනයේ ද භාවිත වුවත් ලේඛනයේ මිශ්‍ර ක්‍රියාවල භාවිත /-මින්/, /-මිනි/, /-මින/ හා /-මිනි/ වැනි අනුසර්ගක භාෂණයේ භාවිත නොවීම ලේඛනයත් භාෂණයත් අතර දක්නට ලැබෙන ප්‍රතිරෝධයකි. ('අඬාගෙන, කරගෙන' වැනි ක්‍රියා පද ලේඛනයේ භාවිත නොවන අතර මෙහි භාවිත 'ගෙන' යන්න ද අනුසර්ගකයක් ලෙස නොව උපපදයක් ලෙස සැලකිය හැකි ය.)

## අසම්භාව්‍ය ක්‍රියා අනුසර්ගක

ලේඛන සිංහලයේ අසම්භාව්‍ය ක්‍රියා පද අර්ථය අනුව කාලාර්ථයෙහි හා අනියමාර්ථයෙහි යෙදෙතත් පූර්ව ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා මෙන් ම කාලත්‍රයෙහි, පුරුෂත්‍රයෙහි හෝ වචනද්වයෙහි නො වරනැගෙයි. කුමාරතුංග මුනිදාස අසම්භාව්‍ය ක්‍රියාව ද නිපාත ක්‍රියා ගණයට ඇතුළත් කරන අතර එහි 'ආවස්ථිකාර්ථය' ඇති බව සඳහන් කරයි (කුමාරතුංග, 1993: 91).

**කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා**- වාක්‍යයක ප්‍රධාන ක්‍රියාව සිදු වූ හෝ සිදු වන කාලය හඟවන ක්‍රියා පදයක් වේ නම් එය කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවකි. ලේඛනයේ භාවිත කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා සහිත පහත දැක්වෙන වාක්‍ය කිහිපය විමසා බලමු.

නිදසුන්:

ඔහු වැටෙත් ම ඈ බිය වූවා ය. (වට-එ-ත් > වැටෙත්)

"කියත උන් මෙ තෙපල, අයේය ඇදුරු ගුත්තිල" (ගු. කා. 166) (කිය-ත > කියත)

"යොමා නුවණ බැලුව ව මුළු තෙදිස කුස" (ගිරා සංදේශය 6 කවිය) (බල-උ-අ > බැලුව)

මේ අනුව /-ත්/, /-ත/, /-අ/ ආදී අනුසර්ගක මගින් ලේඛනයේ කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා සැකසෙන බව පැහැදිලි වෙයි. ලේඛනයේ භාවිත "දුවද්දී, නටද්දී, කරද්දී, බලද්දී" ආදී ක්‍රියා පද ද කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා ලෙස භාවිත වන නමුත් එහි ද අඩංගු වනුයේ /-ත්/ අනුසර්ගකය ම වෙයි. /-ත්/ අනුසර්ගකයෙන් අන්ත වූ ක්‍රියා පදයට 'දී' නිපාතය සන්ධි වීමෙන් ඉහත ක්‍රියා රූප සැකසී ඇත.

භාෂණයේ භාවිත වනුයේ මෙම "දුවද්දී, නටද්දී, කරද්දී" ආදී කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පදයන් ය.
නිදසුන්:

අම්මා ගෙදර එද්දි මම හිටියේ නැහැ. (එ-ත් > එත්+දි > එද්දි)

කමල් උත්තර ලියද්දි මම බැලුව. (ලිය-ත් > ලියත්+දි > ලියද්දි)

ලේඛනයේ භාවිත වන /-ත්/ කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා අනුසර්ගකය භාෂණයේ ද භාවිත වන නමුත් ලේඛනයේ මෙන් /-ත්/ අනුසර්ගකයෙන් අවසන් වන ක්‍රියා පද භාෂණයේ ව්‍යවහාර නොවෙයි. නිරන්තරයෙන් භාෂණයේ භාවිත වනුයේ 'ද' නිපාතය සමග සන්ධි වීමෙනි. ලේඛනයේ කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා සාධනය සඳහා භාවිත /-ත/, /-අ/ අනුසර්ගක භාෂණයේ භාවිත නොවීම ලේඛනය හා භාෂණය අතර දක්නට ලැබෙන ප්‍රතිරෝධයක් වන අතර /-ත්/ අනුසර්ගකය භාවිත වීම සමානතාවක් ලෙස දැකිය හැකි ය.

**අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා**- කිසියම් වාක්‍යයක ආදාළ ක්‍රියාව සිදුවේ ද නොවේ ද ලෙස අවිනිශ්චිත බවක් හැඟවේ නම් එවැනි ක්‍රියා පද අනියමාර්ථයේ අසම්භාව්‍ය ගණයට ඇතුළත් වෙයි. ලේඛන සිංහලයේ භාවිත අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවල /-තත්/, /-තොත්/, /-ත්/ අනුසර්ගක භාවිත ය.

නිදසුන්:

ඔහු යතත් මම නොයමි.(ය-තත් > යතත්)

අමාත්‍යවරයා තීරණය කරතොත් එය සිදු කළ හැකි ය. (කර-තොත් > කරතොත්)

ඔහු එහි ගියත් ඈ නො යෑමට තීරණය කළා ය. (අනාගතාර්ථයක් සහිත අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියාවල /-තත්/ හා /-තොත්/ භාවිත අතර /-ත්/ භාවිත වනුයෙ අතීතාර්ථයක් සහිත අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියාවල ය.)

භාෂණ සිංහලයේ අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියා පද සාධනයේ දී යෙදෙන අනුසර්ගක පදිම වනුයේ /-ඔත්/,/-ඔතින්/ හා /-ත්/ ආදිය යි.

නිදසුන්:

ඈ නැටුවොත් කමල් නටනව. (නට-උෟ-ඔත් > නැටුවොත්)

ඈ බැලුවොතින් ඔයා ඒක දෙන්න. (බල-උෟ-ඔතින් > බැලුවොතින්)

මොනව කරත් මං යන්නෙ නෑ (කර-ත් > කරත්)

මේ අනුව ලේඛනයේ අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියාවල භාවිත /-තත්/, /-තොත්/ අනුසර්ගක භාෂණයේ භාවිත නොවීමෙන් හා භාෂණයේ අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියාවල භාවිත /-ඔත්/, /-ඔතින්/ අනුසර්ගක ලේඛනයේ භාවිත නොවීමෙන් ද සිංහලයේ ලේඛනයත් , භාෂණයත් අතර වන ද්විරූපතාව පැහැදිලි වෙයි.

## අපර ක්‍රියා අනුසර්ගක පදිම

පූර්ව ක්‍රියාව අවසාන ක්‍රියාවට පූර්වයෙන් සිදු කර අවසන් වූවක් වන අතර අපර ක්‍රියාව වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් පසුව සිදු වීමට නියමිත වූවකි. " මිනිසා වැට බඳිනුව කුඹුරට ගියේ ය" යන වැකියෙහි 'ගියේ' යන ආඛ්‍යාතයට පසු ව 'බඳිනුව' යන ක්‍රියාව සිදු වනු ඇත. මෙවැනි ක්‍රියා කුමාරතුංග මුනිදාසයෝ


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

'අනාගත නිපාත ක්‍රියාව' යටතේ හඳුන්වා දෙති (කුමාරතුංග, 1993ඃ 95). ඇතැම් වාග්වේදීන් අපර ක්‍රියාව ස්වාධීන ක්‍රියාවක් ලෙස නොදක්වනුයේ භාවකෘදන්ත /-නු/ අනුසර්ගකයට පසු ව අපේක්ෂාර්ථ 'වස්' නිපාතයෙහි /ස්/ ශබ්දය ලොප් වී /-නු/ හා බද්ධ වීමෙන් සැකසී ඇති බැවිනි. ලේඛන සිංහලයේ /-නුව/ හා /-න්න/ යන ක්‍රියා අනුසර්ගක අපර ක්‍රියා පද නිර්මාණය කරයි.

නිදසුන්ඃ

ඇ මවගේ පා වඳිනුව නැමුණා ය. (වඳ-ඊ-නුව > වඳිනුව)

ඔහු රෝගියා බලන්න පුටුවෙන් නැගිට්ටේ ය. (බල-න්න > බලන්න)

/-න්න/ අනුසර්ගකය විධි ක්‍රියා අර්ථයෙන් සහ අපර ක්‍රියා අර්ථයෙන් ද යෙදෙයි.

නිදසුන්ඃ

විධි ක්‍රියා - ඔබ නිවස සමීපයට පැමිණෙන්න. (පමුණ-එ-න්න > පැමිණෙන්න)

අපර ක්‍රියා- ඔබ එම අනතුර සමීපයට යන්න උත්සාහ ගන්න එපා. (ය-න්න > යන්න)

මව ළදරුවාට කිරි දෙන්න සූදානම් වෙයි. (දෙ-න්න > දෙන්න)

"සඳහා, පිණිස" ආදී නිපාත පද ද ලේඛනයේ අපර ක්‍රියා අර්ථය ප්‍රකාශ කිරීම උදෙසා භාවිත වන බව " පතල්කරු මැණික් සෙවීම සඳහා ඉල්ලම සෝදයි, ගුරුවරයා ඉගැන්වීම පිණිස පාසල් යයි" ආදී නිදසුන්වලින් පැහැදිලි වෙයි. එහෙත් මෙවැනි නිපාත අනුසර්ගක යටතේ නොව 'ප්‍රකෘති පදිම' (stem morphemes) යටතේ අධ්‍යයනය විය යුත්තකි.

භාෂණ සිංහල ව්‍යවහාරයේ පවතින අපර ක්‍රියා පදවල /-න්න/ අනුසර්ගකය භාවිත වන අතර ඇතැම් ප්‍රදේශීය ව්‍යවහාරයන්හි /-න්ට/ සහ /-න්ඩ/ ආදී විධි ක්‍රියා අනුසර්ගක සහිත ක්‍රියා පද ද අපර ක්‍රියා සේ භාවිත වෙයි.

නිදසුන්ඃ

එයා නාන්න සූදානං වෙනව. (නා-න්න > නාන්න)

මං මේ ලිවුම ලියන්ඩ හදන්නෙ. (ලිය-න්ඩ > ලියන්ඩ)

අපි බුදුන් වඳින්ට යමු. (වඳ-ඉ-න්ට > වඳින්ට)

මේ අනුව /-න්න/ අනුසර්ගකය ලේඛන හා භාෂණ අපර ක්‍රියාවල යෙදීම සමානතාවක් වුවත් /-නුව/ අනුසර්ගකය ලේඛනයේ පමණක් යෙදීම හා /-න්ඩ/ හා /-න්ට/ අනුසර්ගක භාෂණයේ පමණක් යෙදීම කරණකොටගෙන ලේඛනයත්, භාෂණයත් අතර ප්‍රතිරෝධතාව ඉස්මතු කරයි.

## නිගමනය

ඉහත සඳහන් සියලු කරුණු ගොනු කිරීමේ දී සිංහලයේ ත්‍රෛකාලික ආඛ්‍යාත අනුසර්ගක ලේඛනයේත්, භාෂණයේත් සපුරා ප්‍රතිරෝධී වෙමින් යෙදෙන බැවින් එය සිංහල භාෂා ද්විරූපතාව සඳහා ප්‍රධාන සාධකයක් බැව් සනාථ වෙයි. විධි ක්‍රියා ආඛ්‍යාතයේ භාවිත අනුසර්ගකවලින් ද /-න්න/ (කරන්න, යන්න) හා /-ϕ/ (බල, දුව, නට) අනුසර්ගක හැර ඉතිරි අනුසර්ගක සියල්ල ද ප්‍රතිරෝධී ව යෙදෙයි. මීට අමතර ව ප්‍රයෝජ්‍ය ක්‍රියා අනුසර්ගකය වන /-ව/ හැර ප්‍රර්ථනා ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා හා අපර ක්‍රියා ආදී සියල්ලේ භාවිත අනුසර්ගකවලින් ද බහුතරයක් ලේඛනයත්, භාෂණයත් අතර ප්‍රතිරෝධී ව යෙදෙන අයුරු හඳුනා ගත හැකි ය. අවසන් වශයෙන් අධ්‍යයනයට බඳුන් වූ ක්‍රියා අනුසර්ගක 72 අතුරෙන් අනුසර්ගක හතක් (10%) පමණක් ලේඛනයට හා භාෂණයට සමාන ව යෙදෙන බවත්, අනුසර්ගක 65ක් (90%) අසමාන ව යෙදෙන බවත් පැහැදිලි වෙයි.

## පරිශීලිත මූලාශ්‍රය


ඉද්දමල්ගොඩ, ඩයනා කුමාරී, යෝගරාජා, එස්. ජේ., 2012. භාෂණ සිංහලය. කොළඹ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

කතා කරන සිංහලය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 2017. නුගේගොඩ, ඉමාෂි ප්‍රකාශන.

කරුණාතිලක, ඩබ්. එස්., 2014. සිංහල භාෂා ව්‍යාකරණය. කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

කුමාරතුංග, මුනිදාස, 1958. ව්‍යාකරණ විවරණය. කොළඹ, එම්. ඩී. ගුණසේන සමාගම.

කුමාරතුංග, මුනිදාස, 1993. ක්‍රියා විවරණය. කොළඹ, කේ. ඒ. ආරියදාස සහ සමාගම.

කුමාරතුංග, මුනිදාස, 2017. සිදත් සඟරා විවරණය. කොළඹ, නව මුද්‍රණය. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගයිගර්, විල්හෙම්, 1968. සිංහල භාෂාවේ ව්‍යාකරණය. කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

දිසානායක. ජේ. බී., 2008. බසක මහිම 11- ක්‍රියා පදය. කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධර්මදාස, කේ. එන්. ඕ., 1996. භාෂාව හා සමාජය. කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ, 2008. සිදත් සඟරා විමසුම, කර්තෘ ප්‍රකාශන, කොලිටි ප්‍රින්ටර්ස්, නුගේගොඩ.

පරණවිතාන, සෙනරත්, 2009. සීගිරි ගී-වියරණ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.



© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බලගල්ලේ, විමල් ජී., 1989. වාග්විද්‍යාවේ පදිම සංකල්පය පිළිබඳ විමර්ශනයක් හා සිංහලයේ පදිම පිළිබඳ වර්ගීකරණයක්, විද්‍යෝදය, 3 කලාපය, (7-31) පිටු.

බලගල්ලේ. විමල් ජී., 2001. භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය. කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ. විමල් ජී., 2014. භාෂී සන්නිවේදනය අර්ථවිචාරය හා උපයෝගීතා විචාරය. කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ. විමල් ජී., 2016. සිංහල භාෂාවේ ප්‍රභවය හා ප්‍රවර්ධනය. කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මීගස්කුඹුර, පී. බී., 2001. සමාජ වාග්විද්‍යා ගතිකත්වය- ව්‍යවහාර සිංහල භාෂාවේ විධාන වාක්‍යය පිළිබඳ අධ්‍යයනයක්, (පරි.) මංගල කේශව දිසානායක, පියවර, සිංහල සංගමය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

සැළලිහිණි සංදේශය, 1961. කුමාරතුංග මුනිදාස සංස්කරණය, මරදාන.

Disanayaka, J. B., 1991. The Structure of Spoken Sinhala (Volume sound and their patterns). Colombo: National Institute of Educational.

James, C., 1992. Contrastive Analysis. International Encyclopedia of Linguistic. Oxford University press.

James, W. Gair., 1998. Studies in South Asian Linguistics. (Sinhala and Other South Asian Languages). New York: Oxford University Press.

Karunathilaka, W.S., 1992. An Introduction to Spoken Sinhala. Colombo: Gunasena.



© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දොළොස්වන කලාපය 2021 දෙසැම්බර්
පිටු 38-48
ISSN 1800-1459 eISSN 2386-2041
© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි විශ්වාස හා වත්පිළිවෙත් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (රත්නපුර දිස්ත්‍රික්කය ඇසුරිනි)

# (A Study Regarding Beliefs and Rituals Related to Sri Lankan Gem Industry: A Study Based on Rathnapura District)

තුෂාණි සංදීපනී මාටින් සහ ලක්මිණී ගමගේ

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය
**thushanimartin47@gmail.com**
**lakmini24@gmail.com**

**සාරසංක්ෂේපය**

මැණික් කර්මාන්තය යනු අතීතයේ පටන් ම ශ්‍රී ලංකාවෙහි පැවති ප්‍රධාන කර්මාන්තයකි. අතීතයේ දී ශ්‍රී ලංකාව "රත්නදීප" යන නාමයෙන් හඳුන්වනු ලැබුවේ ද ඒ අවධියේ පටන් ම වටිනා දුර්ලභ ගණයේ මැණික්වලට ලංකාව ප්‍රසිද්ධියක් ඉසිලූ නිසා ය. මැණික් කර්මාන්තය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී ඊට ම ආවේණික වූ ඇදහිලි, විශ්වාස හා වත්පිළිවෙත් සමුදායක් හඳුනාගත හැකි ය. ඒ අනුව මෙම පර්යේෂණය ඔස්සේ මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය ආශ්‍රිත ව පවතින මෙම ඇදහිලි, විශ්වාස, හා වත්පිළිවෙත් පිළිබඳ ව අධ්‍යයනය කිරීමට යි. මෙය සිද්ධි අධ්‍යයනය (Case Study) පදනම් කරගත් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මූලික කරගත් පර්යේෂණයකි. සාහිත්‍යය විමර්ශනය ඔස්සේ සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය ඔස්සේ දත්ත එක්රැස් කරගනු ලැබුණි. මෙහි දී රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක් වූ ගොඩකවෙල, පැල්මඩුල්ල හා රත්නපුර යන මැණික් කර්මාන්තයට ප්‍රසිද්ධ ප්‍රදේශ තුනක් මුල් කර ගෙන සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබී ය. ඒ අනුව තෝරාගත් හතළිස්පස් දෙනෙකුගෙන් සමන්විත වූ පුද්ගල කණ්ඩායමක් සමඟ ඉලක්කගත කණ්ඩායම් සහ ඉලක්කගත පුද්ගලයින් වශයෙන් සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබී ය. මෙම පර්යේෂණයෙන් මැණික් කර්මාන්තයට ආවේණික වූ දුක්කම්කටොළු සහ අවදානම් සහගත ස්වරූපයත්, මැණික් ලැබෙනුයේ වාසනාව මත පදනම්වය යනුවෙන් පැවති විශ්වාසයත් නිසා මැණික් කර්මාන්තය තුළ අතීතයේ පටන් ම විවිධ විශ්වාස, ඇදහිලි හා වත්පිළිවෙත් සමුදායක් පැවත ආ බව හඳුනාගනු ලැබුණි. ඒ අනුව මැණික් කර්මාන්තයේ නියැළෙන්නන් ආරක්ෂාව හා ආශිර්වාද පතාගෙන මෙවැනි අංගයන් වෙත යොමු වූ බව පැහැදිලි ය. මැණික් කර්මාන්තය ආශ්‍රිත ව පවතින ඇදහිලි විශ්වාස හා වත්පිළිවෙත් අතර බුදුන්වහන්සේ පිළිබඳ විශ්වාසය, කතරගම හා සුමන සමන් දෙවියන් විශ්වාස කිරීම, ජ්‍යෝතිෂ්‍යය මූලික කරගත් විශ්වාසයන්, සාස්තර, පේන හෝ අංජනම් එළි බැලීම, බහිරව පූජාව, කාලි මෑණියන්ට බිලි පූජා පැවැත්වීම, දෙහි කැපීම, සූනියම් කැපීම, කිරිඅප්පා දානය දීම, කෙම් ක්‍රම භාවිතය ආදිය වැදගත් වේ. වර්තමානයේ දී පවා මෙවැනි අංගයන් බොහොමයක් මැණික් කර්මාන්තය ආශ්‍රිත ව නොනැසී පවතින බව පෙනී යයි.

**කේන්ද්‍රීය වචන:** ඓතිහාසික, ඇදහිලි විශ්වාස හා වත්පිළිවෙත්, සංස්කෘතිමය, මැණික් කර්මාන්තය, සම්ප්‍රදායන්

Gem industry has been one of the major industries in Sri Lanka since antiquity. Historically, the country was identified as ‘‘Rathnadeepa’’ for it comprised the most valuable and rarest gems, and it is noteworthy that Sri Lankan gem industry has been connected with its inherited cultural values, beliefs and rituals since ancient times. This research thus focuses on understanding these beliefs and rituals that are related to the Sri Lankan gem industry. This is a qualitative research based on the case study method. For the study, the data were collected using two primary methods namely literature survey and interviews. Field investigations were conducted in three Divisional Secretariats: Godakavela, Palmadulla and Rathnapura of the Rathnapura district. Key informants and focus group discussions were conducted with selected samples and forty male respondents participated in the interviews. It was revealed that various traditions, beliefs and rituals were closely connected with the inherited risky nature of the gem industry and attitudes of people about fortune. Therefore, the people involved in this industry expect blessings and protection by engaging in various rituals. Among these traditions, respect and veneration of Lord Buddha, faith in God Katharagama and God SumanaSaman, astrology - based rituals, palm - reading, Cleromancy, Sacrifice for Genie, Sacrifice for Goddess Kali, the practice of Lime cutting, hoodoo, Alms giving, *Kem* practices, etc. were identified. Those rituals and beliefs continue to exist among people engaged in the gem industry in Sri Lanka even at present.

**Keywords:** Ancient Period, Beliefs and Rituals, Cultural, Gem Industry, Traditions

## හැඳින්වීම

වසර ගණනක් මුළුල්ලේ දේශීය සංස්කෘතියේ පෝෂණය නිබඳ ව ලබමින්, සබරගමුව පළාත පුරා ම ව්‍යාප්ත ව පවතින්නා වූ මැණික් කර්මාන්තය පිළිබඳ ව ලංකාවට හිමිවනුයේ ලෝකයේ රටවල් අතරින් අද්විතීය ස්ථානයකි. "පෙරදිග මුතු ඇටය", "රත්නදීප", "රත්න දේශය", "සෙරන්ඩිබ් දිවයින" ආදී නම්වලින් ලංකාව හැඳින්වීමට හේතු වූයේ අප රටේ ඉතා ඈත අතීතයේ පටන් මැණික් සඳහා ප්‍රසිද්ධියක් උසුලන බැවිනි. එහි පෞරාණිකත්වය හා සමාන ව ම ඒ හා බැඳී වර්තමානය දක්වා ම පෙරට ආ ඇදහිලි, විශ්වාස හා වත්පිළිවෙත් සම්ප්‍රදායක් හඳුනාගත හැකි ය. වෘත්තීයමය වශයෙන් සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීම උදෙසාත්, අදාළ වෘත්තීය හා බැඳී ගිය ස්වාභාවික ආපදාවන් හා අවදානම් සහගත තත්ත්වයන්ගෙන් මිදීම සඳහාත්, අතීත මිනිසා ඇදහිලි, විශ්වාස හා වත්පිළිවෙත්වල පිහිට පැතූ බව පෙනී යයි.

## සාහිත්‍ය විමර්ශනය

ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය පිළිබඳ ව අතිවිශාල පර්යේෂණ ප්‍රමාණයක් සිදු වී නොතිබුණත්, ඒ සම්බන්ධ ව විශේෂ අවධානයක් යොමු කළ ශාස්ත්‍රීය පර්යේෂණ කිහිපයක් සොයා ගත හැකි ය. ඒ අනුව ආරියරත්න (1977) ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය පිළිබඳ ව ඓතිහාසික දෘෂ්ටි කෝණයකින් යුතු ව විවරණය කර ඇත. කවිතිලක (වර්ෂය සඳහන් නොවේ) මැණික්වල අන්තර්ගත වටිනාකම සහ භෞතික වටිනාකම පිළිබඳ ව විවරණය කිරීමට වැඩි උනන්දුවක් දක්වා ඇත. රාජපක්ෂ (2003) මැණික් කර්මාන්තය හා සැබැඳි වත්පිළිවෙත් පිළිබඳ ව මූලික අවධානය යොමු කරන අතර ම, මැණික්වල ඇති වාණිජ වටිනාකම සේ ම එහි ඓතිහාසිකත්වය පිළිබඳ වත් අවධානය යොමු කර ඇත. චන්ද්‍රජෝති හිමි (1992) මැණික් ගලෙහි අන්තර්ගත විද්‍යාත්මක පැතිකඩ පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කිරීමට උනන්දු වී ඇති අතර මූලික වශයෙන් ම මැණික් කර්මාන්තය පිළිබඳ ව අවධානය යොමු කර තිබේ. ඊට අමතර ව ජ්‍යොතිෂ්‍යය හා මැණික් අතර ඇති සම්බන්ධතාව ද අවධානයට හසුකර තිබේ. නාඔටුන්න (1986) මැණික්වල බිහිවීම, මතුවීම, විද්‍යාත්මක ලක්ෂණ සේ ම මැණික් හා බැඳී ගිය වෙළඳ රටාව පිළිබඳ ව හැදෑරීමට උනන්දුවක් දක්වා තිබේ. එමෙන් ම, ඤාණවිමල හිමි (1946), (1967), අවධාරණයට ලක් කර ඇත්තේ පොදුවේ මැණික් කර්මාන්තය පිළිබඳ ව ය. තව ද අමරසිංහ (1999) පැල්මඩුල්ල හා ඕපනායක ප්‍රදේශ ඉලක්ක කරගෙන කුඩා කර්මාන්ත, මැණික් හිමියන් පිළිබඳ ව සමාජ ආර්ථික විග්‍රහයක යෙදී ඇත. නමුත් එහි දී මැණික් කර්මාන්තයට අනන්‍ය වූ ඇදහිලි විශ්වාස හා අභිචාර විධි පිළිබඳ ව අවධානය යොමු කර නොමැත. මේ අනුව විවිධ ශාස්ත්‍රීය පර්යේෂණ ඔස්සේ මැණික් කර්මාන්තය පිළිබඳ ව අධ්‍යයනයන් සිදු වී ඇත. නමුත් මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි විශ්වාස හා වත්පිළිවෙත් පිළිබඳ ව ඍජු ව ම ඉලක්ක වූ ගැඹුරු පර්යේෂණයක් දැකීම විරල ය. මේ නිසා මෙම පර්යේෂණය ඔස්සේ මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි විශ්වාස හා වත්පිළිවෙත් පිළිබඳ ව ගැඹුරු අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂිත ය.

## පර්යේෂණ ගැටලුව

මෙම පර්යේෂණයෙහි මූලික ගැටලුව වන්නේ, මෙරට මැණික් කර්මාන්තය ආශ්‍රිත ව පවතින ඇදහිලි, විශ්වාස හා වත්පිළිවෙත් මොනවාද කියා අධ්‍යයනය කිරීමයි.

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය ආශ්‍රිත ව පවතින ඇදහිලි, විශ්වාස හා වත්පිළිවෙත් පිළිබඳ ව ඓතිහාසික දෘෂ්ටිකෝණයක් මත පිහිටා අධ්‍යයනය කිරීම ය.

## පර්යේෂණ වැදගත්කම

එසේ ම මෙම පර්යේෂණයේ වැදගත්කම වර්තමානය වන විට මැණික් කර්මාන්තය වාණිජකරණයට ලක් ව ඇති බැවින් මෙවැනි අංගයන්ට හිමිවන වැදගත්කම අල්ප ය. සමහර අවස්ථාවල මෙම සංස්කෘතික අංගයන් කාලයත් සමඟ වියැකී ගොස් ඇත. එබැවින්, මෙම පර්යේෂණය ඔස්සේ අතීතයේ සිට පැවත ආ මෙකී අංගයන් නැවත ගවේෂණය කර වාර්තා කරනු ලැබේ. එය කාලයත් සමඟ වියැකී යන ශ්‍රී ලාංකේය සංස්කෘතියේ අනන්‍යතාවන් ආරක්ෂා කර, මතු පරම්පරාවට එම දැනුම බෙදා හැරීමකි. එය මෙම පර්යේෂණයට සුවිශේෂ වැදගත්කමක් හිමිවීමට හේතුවක් ද වන්නේ ය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙය ගවේෂණාත්මක පර්යේෂණයකි. අදාළ ගවේෂණය රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල, රත්නපුරය හා ගොඩකවෙල ප්‍රදේශීය ලේකම් කොට්ඨාස මූලික කොට ගෙන සිදු කරන ලදී. ලෝකයේ මැණික් අපනයනය සිදුකරන ප්‍රධාන රටවල් පහ අතරට ශ්‍රී ලංකාව ද අයත් වන අතර, ලංකාවේ ප්‍රධාන දිස්ත්‍රික්ක දහහතරක් (14) පුරා මැණික් පතල් කර්මාන්තය ව්‍යාප්ත ව පැවතියත්, සමස්ත මැණික් පතල් කර්මාන්තයෙන් 82%ක් ව්‍යාප්ත ව පවතින්නේ රත්නපුර දිස්ත්‍රික්කය ප්‍රමුඛ කොට ගෙන ය (Department of Census & Strtistics, 2015). ඒ අනුව මෙම පර්යේෂණයට අදාළ ව වඩාත් පොහොසත් දත්ත (Rich Data) ලබා ගැනීමේ අරමුණින් මැණික් කර්මාන්තය ප්‍රමුඛ ඉහත කී ප්‍රදේශවල ගවේෂණාත්මක අධ්‍යයනයක් සිදු කොට ඇත. සම්මුඛ සාකච්ඡා ක්‍රමය ඔස්සේ දත්ත එක්රැස් කරගනු ලැබී ය. එහි දී ගැඹුරු සම්මුඛ සාකච්ඡා (In – Depth Interview) හා කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා (Focus Group Interview) ක්‍රියාත්මක කරනු ලැබිණි. තනි පුද්ගල සම්මුඛ සාකච්ඡා සඳහා පහළොස් දෙනෙකුගෙන් (15) යුතු පහසු නියැදියක් (Convenient Sampling) තෝරා ගත් අතර මෙම පුද්ගලයන් සියලු දෙනා ම දීර්ඝ කාලයක් මුළුල්ලේ ම මැණික් පතල් කර්මාන්තයේ යෙදුණු, විවිධ වයස් කණ්ඩායම්වලට අයත් පිරිමි


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අය වූහ. ඉලක්කගත කණ්ඩායම් සඳහා කුඩා කණ්ඩායම් (වරකට දෙදෙනා (2) හා තිදෙනා (3) බැගින් වූ විසිපස් දෙනෙකු (25)) සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබී ය. මීට අමතර ව ස්වයං නිරීක්ෂණ ක්‍රමවේදය යටතේ දත්ත එක්රැස් කරනු ලැබිණ.

## දත්ත විශ්ලේෂණය

### මැණික් කර්මාන්තය ආශ්‍රිත ඇදහිලි විශ්වාස හා වත්පිළිවෙත්

මැණික් කර්මාන්තයට ම අනන්‍ය වූ දුෂ්කර හා අනතුරුදායක ස්වරූපය නිසාත්, මැණික් කර්මාන්තයෙන් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමට පුද්ගලයින් වාසනා ගුණය මත දැඩි ව විශ්වාසය තබන නිසාත්, ඇදහිලි විශ්වාස හා වත්පිළිවෙත් සමුදායක් ඒ වටා ගොඩනැගී ඇත. ඇදහීම යන්න සිංහල භාෂාවෙහි විග්‍රහ වන්නේ ශ්‍රද්ධාව හා භක්තිය ලෙස ය. විශ්වාස යනු යම්කිසි දෙයක් පිළිබඳ ව ස්ථිරසාර වූ නිගමනයකට එල්බ තිබීමයි. "වත්පිළිවෙත්" යනු මෙම ශ්‍රද්ධාව භක්තිය විශ්වාසය නිසා යම් කිසි චාරිත්‍ර වාරිත්‍ර සමුදායක් සිදුකිරීම යි. මෙහි දී සිදුවන්නේ යම් කිසි වූ දෙයක් ප්‍රතිනිර්මාණයක් ලෙස අනුකරණය කිරීම යි.

### දෙවියන් ඇදහීම

මැණික් කර්මාන්තය ආශ්‍රිත ව පවතින ප්‍රධාන ඇදහීමක් වන්නේ දේව ඇදහීම යි. මෙම කර්මාන්තයෙහි නියැළෙන්නන් සෑම කර්තව්‍යයක් ම සිදුකිරීමට පෙර දෙවියන් උදෙසා භාර වේ.

> *"අපෝ ඔව්. දවසේ වැඩ පටන් ගන්නෙත් අහවර කරන්නෙත් අපි දෙවියන් බුදුන් වැඳලා තමයි. සමන් දෙවියන්ට භාර වෙලා, කතරගම දෙවියන්ට භාර වෙලා තමයි අපි වැඩ කරන්නේ. මේක එහෙම ආවාට ගියාට කරන්න පුළුවන් කර්මාන්තයක් නෙමෙයි. සෙල්ලමකට ගත්තොත් නගින්නත් බැරි නෑ". (සම්මුඛ සාකච්ඡා, ඉලක්ක ගත පුද්ගලයින් - 01, 2018.05.07, පැල්මඩුල්ල, අවුරුදු 67, පුරුෂ)*

සමන් දෙවියන්ට, කතරගම දෙවියන්ට මෙම පඬුරු ගැටගැසීම් කරන අතර මහා සමන් දේවාලය වෙතට යන පතල්කරුවන් තමාගේ පතලේ කාර්යය සාර්ථක කර දෙන ලෙස ඉල්ලා පඬුරු ගැටගසා භාර වීම කරයි. එසේ ම රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති දේවාලවල, කතරගම දෙවියන්ට පුද පූජා පවත්වන ස්ථානයන්ට ගොස් පඬුරු ගැට ගසා, තමාගේ පතලේ කාර්යයන් සාර්ථක ව ඉටු කර ගැනීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටී. මෙම පඬුරු ගැට ගසා ගැනීමට පෙර මල් පහන් පුදා බුදුන් වැද පැමිණ කපුමහතා ලවා යාතිකාවක් කර පඬුරු ගැට ගැසීම කරයි. තමාගේ පතලෙන් වටිනා මැණික් හමු වූ පසු භාරය ඔප්පු කරන බවට පොරොන්දු වී පඬුරු ගැට ගැසීම කරයි. තම තමන්ට හැකි පමණින් විවිධ වස්තූන් භාරය සඳහා දීමට පොරොන්දු වෙයි. සෑම භාරයක් ම නිදහස් කිරීමේ දී පූජා වට්ටියක් දීම කරනු ලැබේ. පූජා වට්ටිය ඉස්තරම් අන්දමින් දීමට පතල්කරුවන් කටයුතු කරන්නේ තමාට ලැබුණ වාසියක් සමඟ ය. බටපොතු වට්ටියකට, ඇළුමිනියම් පිඟානකට බුලත් අසුරා, පළතුරු හයක්, කැවිලි හයක්, පඬුරු ආදිය ඒ මත තබා රතු, නිල්, සුදු ආදී වර්ණවලින් ඒ ඒ දෙවියන්ට අයත් වර්ණයෙන් එක් මාලයක් තබා පූජා වට්ටියක් සකස් කරනු ලබන අතර, ඔවුන් භාරවීමේ දී පොරොන්දු වූ වෙනත් ද්‍රව්‍යයක් තිබේ නම් ඒවාත් සමඟ ම රැගෙන ගොස් බුදුන් වැඳ, දෙවියන්ට භාරය ඔප්පු කිරීම කරයි. මෙහි දී කපු මහත්තයා විසින් සියලු පිරිසට ම යාතිකා කිරීම දක්නට ලැබෙන අතර, පතලේ හවුල්කරුවෝ සියලු දෙනා මේ සඳහා සහභාගි වෙති. භාරභාර වීමේ දී පොරොන්දු වන ද්‍රව්‍ය විවිධාකාරයක් ගනු ලබන අතර, තම ආර්ථික මට්ටමට අනුව එහි ප්‍රමාණය තීරණය වේ.

1. පිත්තල පහනක් පූජා කිරීම.
2. දේව ප්‍රතිමාවක් හෝ දේවරූපයක් පූජා කිරීම.
3. තිර රෙද්දක් පිදීම - මෙහි දී භාරය වන දෙවියන්ගේ පාටට අනුව තිර රෙද්ද පූජා කරයි. උදාහරණ -: කතරගම දෙවියන්ට භාරභාර වූ විට රතුපාට තිර රෙද්දක් පූජා කරයි.
4. ආලෝක පූජාවන් පැවැත්වීම.
5. සිරිපා වන්දනාවට, අටමස්ථානේ වන්දනාවට, කතරගම වන්දනාවට පිරිසක් එක් කර ගෙන යන බව පොරොන්දු වීම.
6. දානමාන දීමට පොරොන්දු වීම

ආදී භාර භාරයන් වෙයි.

කතරගම දෙවියන්ට භාර වීම මැණික් කර්මාන්තයේ දී සුලභව දක්නට ලැබෙන අතර එවිට භාර නිදහස් කිරීමට කතරගම මහා දේවාලයට පැමිණෙන ඔවුහු පූජා වට්ටියක් සහිත ව භාර වුන දේ පූජා කරති. මෙම භාරභාර වීම් අතීතයේ පවා තිබූ බවට සාක්ෂි පවතී. දඹදෙණි යුගයේ දී දෙවැනි පැරකුම්බා රජුගේ මහ ඇමති වූ ආර්ය කාමදේව ඇමති මැණික් ගැරීම සඳහා සබරගමු පළාතට ගිය අතර එහි දී තමාට වටිනා මැණික් ලැබුණ හොත් සමන් දෙවියන් උදෙසා තෙමහල් ප්‍රාසාදයක් තනා දෙන බවට පොරොන්දු වී භාරයක් විය. සබරගමුවේ දී ඔහුට ඉතා වටිනා මැණික් ලැබුණ නිසා නැවත පැමිණි ඔහු සමන් දෙවියන්ට ප්‍රාසාදය සාදා දුන් බව සඳහන් වේ. සමන් සිරිතේ කවිවල ද ඒ ගැන සඳහන් වේ.

සුරිඳුනි සිරිබර - අප මිණි කම් කරන වර  
ලදුවොත් මිණි පවර - ගෙයක් කරවමි තුන් මහල් කර

(දැරණියගල, 1960: පිටුව 63)

පතල් කැණීමට ප්‍රථම ව පතලයේ හවුල්කරුවන් සියලු දෙනා සහභාගි වී කරන මෙම භාරභාර වීම් පතලේ ඉල්ලම් ගැරීමට ප්‍රථම ව ද කරනු දක්නට ලැබේ. ඉල්ලම් ගැරීමේ දී මැණික් හමුනොවේ නම් ඉල්ලම් ගැරීම නවතා ඔවුන්ගෙන් කිහිපදෙනෙකු සමන් දේවාලයට ගොස් පඬුරක් ගැට ගසා පැමිණ නැවතත් ඉල්ලම් ගැරීම කරයි. එවිට මැණික් හමු නොවූ ගැරුම් වට්ටියෙන් මැණික් හමුවන අවස්ථා ඇත (2018.05.11 දින පැල්මඩුල්ලේ දී ඉලක්ක ගත කණ්ඩායම් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා ඇසුරිනි). මැණික් හමු වූ පසු එම ගල විකිණීමට ගිය විට එහි නියම වටිනාකමට මිලක් නොලැබෙනවා නම් එවැනි අවස්ථාවල දී ද සමන්


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දේවාලයට යන මැණික් ගල් හිමිකරුවන් සමන් දෙවියන්ට භාරහාර වීම් ද කරයි. මැණික් විකුණූ පසු භාරහාර සඳහා පළමු මුදල් කොටස වෙන් කිරීම විකුණුම්කරුවන්ගේ සිරිත ය. මෙලෙස භාරහාර වීම් වූ විට පතලේ සෑම කටයුත්තක දී ම ඉල්ලම් ගැඹුරේ ඇති විට, ඉල්ලම් ගැරීමේ දී මැණික් හමු නොවන විට ආදී අවස්ථාවල දී "අනේ බං සමන් දෙවියන්ට ගල් එපාද?", "කතරගම යන්න වෙනෙකක් නැද්ද", "මේ පාරවත් සිරිපාදේ යන්න පුළුවන් වුනොත්", " බුදුන්ගේ සරණයි, සමන් දෙවියන්ගේ පිහිටයි ආරක්ෂාවයි" වැනි වචන භාවිත කරයි. එහි දී සිදු වනුයේ තමා විසින් වුන භාරය හැම අවස්ථාවේ දී ම, සිහි කිරීමෙන් තමාගේ බලාපොරොත්තුව සඵල වේය යන විශ්වාසයයි.

### ජන්ම පත්‍රය පරීක්ෂා කරවා ගැනීම

පතලයක වැඩ ඇරඹීමට ප්‍රථම ව භාරහාර ආදිය වී පැමිණි පතලේ හිමිකරුවා තම හඳහන නැතිනම් ජන්ම පත්‍රය ජ්‍යොතිෂ්‍යවේදියකු ලවා පරීක්ෂා කරවා ගැනීම කරයි. ග්‍රහදෝෂ අනුව තමාට ධන ලාභ, භූමි ලාභ තිබේ ද නැද්ද යන්න බලවා ගෙන පතල ආරම්භය සඳහා සුභ වේලාවක් බලා ගැනීම සාමාන්‍ය සම්ප්‍රදාය වේ. තමාට යම් කිසි අපල උපද්‍රවයක් තිබේ නම් ඒ ගැන දැනගෙන ඒ සඳහා සුදුසු පූජා කර්ම කිරීම අභිප්‍රේරිත අරමුණයි.

> *"පතලක් පටන් ගන්න කලින් අපේ මහත්තැලා වේලපත්කඩේ නම් බලනවාම තමයි නොවැ. ඒක ඉතින් කරන්න ඕන දෙයක්. මොකද මය එක එක අපල තියෙනවා සෙනසුරු, රාහු කියල, ඉතින් ඒවාට භාර භාර වෙලා නිදහස් වෙන්න ඕනා හොඳ වැඩක් පටන් ගන්න කලින්." (සම්මුඛ සාකච්ඡා, ඉලක්ක ගත පුද්ගලයින් - 02, 2018.06.12, ගොඩකවෙල, අවුරුදු 62, පුරුෂ)*

පතලේ සෑම කටයුත්තක් ම සිදුවනුයේ මෙලෙස ජන්ම පත්‍රය බලා සාදාගනු ලබන සුභ හෝරාවකට නැතිනම් සුභ නැකැත් වේලාවකට අනුගතව ය. පතල ලකුණු කිරීම, පතලේ පළමු පස් පිඩැල්ල කැපීම, ඉල්ලම් කැඩීම, ඉල්ලම් ගැරීම, මැණික් විකිණීම ආදී සෑම කර්තව්‍යයක් ම සුභ හෝරාවක කරනු ලැබේ. ජන්ම පත්‍රය බලන ජ්‍යොතිෂ්‍යවේදියා එම නැකතට හිමි සුභ දිශාවක් ද ඒ සමඟ ලබා දෙයි. මෙලෙස සුභ හෝරාවෙන් සුභ දිශාව බලා වැඩ කිරීමෙන්, තම කාර්යය සාර්ථක ව කරගත හැකි ය යන විශ්වාසය පතල් හිමියන් තුළ පවතියි.

### බුදුන් ප්‍රමුඛ සතර වරම් දෙවියන්ට පහන් දැල්වීම

පතල ආරම්භයේ සිට පතලේ වැඩ අවසන් වන තුරු පතල් භූමියේ පසෙකින් තනන ලද මල් පැලක බුදුන්ට හා දෙවියන්ට පහන් දැල්වීම කරන අතර ආරම්භක දිනයේ පතල් සීමා ලකුණු කළ පසු සිව්කොණ සාදන ලද මල් පැල් හතරක පහන් දැල්වීම කරයි (2018.08.14 දින රත්නපුරේ දී ඉලක්කගත කණ්ඩායම් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා ඇසුරිනි).

> *"මේ කරුමාන්තය පටන් ගන්න කලින් අපි පතලේ පැත්තකින් මල් පැලක් පත්තු කරනවා. බුදුහාමුදුරුවන්ට වැඳලා, සමන් දෙවියන්ට වැඳලා අවසර අරන් තමයි මේවා ඉෂ්ට සිද්ධ කරන්නේ. හිතු මනාපෙට මේවා කොරන්න බැහැ. අපේ ජීවිතවල ආරක්සාව ඉතින් උන්දැලාට තමයි භාර දීලා තියන්නේ." (සම්මුඛ සාකච්ඡා, ඉලක්ක ගත පුද්ගලයින් - 03, 2018.08.14, රත්නපුරය, අවුරුදු 67, පුරුෂ)*

ඇතැම් පළාත්වල පතලේ දෛනික ව දල්වනු ලබන පහනක් දක්නට ලැබෙන අතර එම පහන ගලකින් නිමවන ලද්දකි. පතලේ වැඩ අරඹන සෑම දිනක ම එම ගල් පහනට වැඳ නමස්කාර කර, වැඩ ඇරඹීම පතල්කරුවන්ගේ සිරිතකි. ඉල්ලම් කඩා ගත් පසු ඉල්ලම් කමත මත ඉල්ලම් මුදුනේ දල්වන එවැනි ම ගල් පහනක් සමහර පළාත්වල දක්නට ලැබේ. ඉල්ලම් ගරන අවස්ථාවේ දී මැණික් නොලැබෙන විට පහනක් දැල්වීම කරන අතර ඒ සඳහා රත්න චාමුණ්ඩය මන්ත්‍රයෙන් හෝ රාජගිංගිලියාව මන්ත්‍රයෙන් ජීවං කරන ලද තැඹිලි තෙල් යොදා ගනි (රාජපක්ෂ, 2003: 38).

### සාස්තර, පේන හෝ අංජනම් එළි බැලීම

තමාට වෙනත් පාර්ශවයකින් සිදුවන්නා වූ අනතුරු අන්තරා කරදර, බාධක, හදි හූනියම්, අණවින කොඩිවින පිළිබඳ ව දැනගැනීම සඳහා මෙම ක්‍රම උපයෝගි කර ගනු ලැබේ. පතලක් ආරම්භ කිරීමට පෙර මැණික් ඉල්ලම් සහිත ප්‍රදේශ සොයා ගැනීම් සඳහා මෙම ක්‍රමෝපායන් යොදා ගත් අතර පතලේ වැඩ කිරීමේ දී අතර මඟ සිදුවන අතුරු ආන්තරාවන්හි නිමක් නොමැති විට ද මෙම සාත්තර බැලීම්, පේන බැලීම් අංජනම් එළි බැලීම්වල පතල් කරුවෝ නියැළෙති. මල් බුලත් තටුවක් සාදා ඒ මත විශේෂ ආකාරයට සාදන ලද තැටියක් වැනි දෙයක් ඉදිරියේ තබා පහන් ආලෝකයෙන් බලා යම් කිසි දෙයක් පැවසීම කරනු ලබන අතර මෙහි දී එය කියන පුද්ගලයා ආරූඪ වීමක් හෝ නොවීමක් දක්නට ලැබේ (2018.08.25 දින ගොඩකවෙල දී ඉලක්කගත කණ්ඩායම් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා ඇසුරිනි).

මැණික් කර්මාන්තය හා සමඟ බැඳි ඇදහිලි, විශ්වාස ගෙන බැලීමේ දී රත්නපුර ප්‍රදේශයේ පතල්කරුවන් අතර තිබෙන විශ්වාසයකි, ශ්‍රී පාද සමය ආරම්භ වීමත් සමඟ වැඩිපුර මැණික් ලැබේය යන විශ්වාසය. ඊට හේතුව ලෙස ඔවුන් දක්වන්නේ සුමන සමන් දෙවියන් මැණික් ලබා දෙන බව ය. සමන් දෙවියන් වැඳ පුදා ගැනීම උදෙසා ම මිනිසුන්ට ධනය ලබාදීමට සේ ම තමාගේ අණසකයකට නතුවන, වැඩහිඳින, සබරගමු පළාතේ පොළෝ ගැබෙන් අහිංසක ජනතාවට මිණිකැටයක් ලබා දී, සමන්ත කූටය වන්දනා කර වන බව සබරගමු වැඩිහිටියන්ගේ විශ්වාසයක් පවතී. (2018.08.25 දින ගොඩකවෙල දී ඉලක්කගත කණ්ඩායම් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා ඇසුරිනි)

රතුකැට, නිල්කැට, ගෝමේද ආදී විවිධ වර්ගයේ මැණික් ලබාගැනීම උදෙසා එම මැණික් වර්ගයට අධිගෘහිත දෙවියන්ට පුද පූජා පැවැත්විය යුතු බවටත්, පහන් දැල්වීම කළ යුතු බවටත් විශ්වාසයක් පතල්කරුවන් තුළ පවතී. එහි දී රතු කැටයක් ලබා ගැනීම උදෙසා කතරගම දෙවියන්ට පූජෝපහාර දැක්විය යුතු බවත්, විෂ්ණු දෙවියන්ට පුද පෙත් ලබා දීමෙන් නිල්කැට ලබාගත හැකි බවටත් ඔවුන්ගේ


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

විශ්වාසයයි. එමෙන් ම, මංගර දෙවියන් වෙනුවෙන් සබරගමු පළාත තුළ දේවාල රාශියක් ඉදි කර ඇති අතර ප්‍රධාන දේවාලයක් බළංගොඩ, රජවක නම් ප්‍රදේශයේ ඉදිකර ඇත. මේවායේ වාර්ෂික මඩු තොත්‍ර පවත්වමින්, මංගර දෙවි ප්‍රධාන දේව සමූහයාට පුද පූජා ලබාදීම සිදු කෙරේ. මංගර දෙවියන් මැණික් සම්පත ලබා දෙන අතර මැණික්වලට අධිගෘහිත දෙවියන් ලෙස ඇතැම් ප්‍රදේශවල පුද පූජා පවත්වනු ලැබේ. ඒ ඒ ප්‍රදේශයන්හි පතල් කැපීමට ප්‍රථමයෙන් මංගර දෙවියන් උදෙසා පූජාවක් ලබා දෙන අතර මංගර දෙවියන්ගේ නමින් පඬුරු වෙන් කිරීමක් ද සිදුකරයි.

එපමණක් නොව "මැණික් රජා" යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන මැණික් බණ්ඩාර දෙවියන් ගැමියන් අතර වන්දනාවට පාත්‍ර වී තිබේ. එම දෙවියන් පිළිබඳව විවිධ කවි පංති ගැමියන් අතර ප්‍රචලිත අතර පහත සඳහන් වන්නේ ඉන් එක් කවියකි.

| | |
|---|---|
| මැණික් ගඟට දෙවි වැඩම | කරන්නේ |
| මැණික් ගරා පුටුවේ වැඩ | ඉන්නේ |
| මැණික් බැඳපු රන් වේවැල් | ගන්නේ |
| මැණික් රජාණන් සයනේ | වඩින්නේ |

2018.08.20 දින ගොඩකවෙල දී ඉලක්කගත කණ්ඩායම් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා ඇසුරිනි)

**ජ්‍යෝතිෂ්‍ය විද්‍යාව හා මැණික් භාවිතය**

මීට පෙර විග්‍රහ කළ පරිදි මැණික් කර්මාන්තයේ බොහෝ කටයුතුවල දී ජන්ම පත්‍රය පරීක්ෂා කර ගැනීමට පතල්කරුවන් යොමු වුවා සේ ම ජ්‍යෝතිෂ්‍ය විද්‍යාව හා මැණික් භාවිතය අතර ඇත්තේ ද ඉතා ම කිට්ටු සම්බන්ධතාවකි. එබැවින්, මැණික් කර්මාන්තයේ නියැළෙන පුද්ගලයින් ද ප්‍රබල ලෙස මැණික් හා බැඳීමක් පවතී. ග්‍රහයන්, නැකැත්, වර්ෂ, මාස, දින, රාශි හැම එකක් සමඟ ම මැණික් ගල් සම්බන්ධ වේ. අතීතයේ ජ්‍යෝතිෂ්‍යය ආරක්ෂා කරන ලද ඍෂිවරුන් විසින් ඒ ඒ ග්‍රහයන් සඳහා අයත් මාණික්‍ය වර්ගයන් නිර්දේශ කර ඇත. එම මැණික් පැළඳි විට ග්‍රහයාගේ බලය, ගුණය ලැබේ යැයි විශ්වාස කෙරිණ. මැණික් ගල්වලින් වර්ණ, භූත, දිශා ආදී බලයන් ඇති කරයි. එක් එක් ග්‍රහයන්ට අයත් නියමිත මැණික් ගැන ඍෂිවරුන් පවසා ඇති ආකාරයට විවිධ ය. ඔවුන්ගේ අදහසට අනුව රත්තරන් මුද්දක මුදුන ගෝලාකාර කොටස් 09කට බෙදා පූර්ව දිශාවේ ග්‍රහයින්ට අයත් ගල් අල්ලා ගැනීම කළ යුතු බවත්, එසේ නිවැරදි ව ගල් අල්ලා ගැනීමෙන් ග්‍රහයින් සතුටු වන බවත් ය (හරමාණිස්, 1997: 255). මැණික් පැළඳීමේ දී දත යුතු කරුණු බොහෝ ය. මැණික් කැපීමේ දී වැරදි ක්‍රමයට කැපූ ගල් පැළඳීම අශුභ ඵල ලැබීමට හේතුවක් වන්නේ ය. නිවැරදි ග්‍රහයාට පළඳින ගලක් වුව ද වැරදියට කැපී තිබුණොත්, එහි ප්‍රතිඵල අයහපත් වේ. ග්‍රහ අපලයක දී අදාළ ග්‍රහයාගේ කිරණ වැඩිපුර ලබා ගැනීම සඳහා දිලිසීමක් ඇති නොවන පරිදි ගල කැපිය යුතු අතර, එම ගල ශරීරයේ ස්පර්ශ වන ලෙස පැළඳීමෙන් ගලේ ඇති රසායනික ද්‍රව්‍ය ශරීරයට උරා ගැනීමට ඉඩ සලස්වා ගලේ ඇති බලය පුද්ගලයාට ලබා දීමට කටයුතු කළ යුතු බවට මතවාද පවතින බව සම්මුඛ පරීක්ෂණවල දී තහවුරු විය.

ලංකාවේ පුද්ගලයෙකුට පැළඳීමට සුදුසු වන්නේ ලංකා භූමියෙන් ම ලබා ගත් මැණික් ගලකි. මුද්දේ නැගෙනහිර දිශාව කිවි ග්‍රහයාට දියමන්තියක් ද, සඳුට ගිණිකොන මුතු ඇටයක් ද, රාහුට නිරිත දිග ගෝමේදයක් ද, කුජට දකුණු දිශාවේ පබළුවක් ද, ශනිට බටහිර නිලක් ද, වයඹ දිග කේතුට වෙරළුමිණක් ද, උතුරු දිග ගුරුට පුෂ්පරාගයක් ද, බුධට ඊසාන දිග මරකතක් ද, හිරුට මැද මැණිකක් ද, පළඳී. මේ ගැන සඳහන් ශ්ලෝක පවා ජ්‍යොතිෂ්‍යයේ සඳහන් වේ.

නවරත්නයක මැණික් අල්ලන ආකාරය සුවිශේෂ ය. මැණික මිනිසාට වාලම්පූරියක් සේ ම වාසනාව ලබා දෙන්නකි. නවරත්නය පැළඳීම ඕනෑ ම පුද්ගලයෙකුට කළ හැකි සේ ම දෛවඥයෙක් හඳහන බලා එහි අපල උපද්‍රව ඇති විට එය දුරු කර ගැනීමට මැණික් ඇල්លූ ආභරණ පැළඳීමට කියයි. එම සුභඵල ලබා ගැනීමට ඒවා පළුදු නොවූ මැණික් විය යුතු ය. ඒ අනුව උපන් මාසය අනුව, උපන් ලග්නය අනුව, උපන් සතියේ වර්ණය අනුව, ග්‍රහයින්ට අනුව හා ජය අංකයට අනුව ආදී ලෙසින් පළඳිනා මාණික්‍යයන් එකිනෙකට වෙනස් ස්වභාවයෙන් යුක්ත ය.

උපන් මාසය අනුව පළඳිනා මැණික් වර්ගයන් මෙලෙස දක්වාලිය හැකි ය. ජනවාරි රබහ ද පෙබරවාරි අඹතේස්ත ද මාර්තු නිල් කිරිංචි ද අප්‍රේල් දියමන්ති හා සුදුනිල් ද මැයි පච්ච හා මරකත ද ජූනි මුතු හා වෛරෝඩි ද ජූලි රතු ද අගෝස්තු ජාගුන් ද සැප්තැම්බර් නිල් ද ඔක්තෝම්බර් පුනක්කන් ද නොවැම්බර් පඩියං හා දෙසැම්බර් ආරනූල් ද භාවිතයට යොදා ගනු ලබයි.




රූපාවලිය අංක 01 - නවරත්න මැණික්



රූපාවලිය අංක 02 - නවරත්න මැණික්වලින් කරන ලද මුදුවකි


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

උපන් සතියේ වර්ණය අනුව පළඳිනා මැණික් වර්ගයන් ද මෙලෙස සඳහන් කළ හැකි ය. ඉරිදා පද්මරාග ද සඳුදා මුතු ද අඟහරුවාදා රතු ද බදාදා පච්ච හා තෝර ද බ්‍රහස්පතින්දා පුෂ්පරාග ද සිකුරාදා සුදුනිල් හා සෙනසුරාදා කාකනිල් ද භාවිතයට යොදා ගනු ලබයි. එසේ ම ග්‍රහයින්ට අනුව පළඳිනා මැණික් වන්නේ හිරුට පද්මරාග ද බුදට පච්ච හා තෝර ද අඟහරුට රතු කොරල් ද බ්‍රහස්පතිට පුෂ්පරාග ද සිකුරුට දියමන්ති හා සුදුනිල් ද සෙනසුරුට කාකනිල් ද සඳුට මුතු හා චන්ද්‍රකාන්ති ද රාහුට ගෝමේද හා කේතුට වෛරෝඩි ද පැළඳීමට නියමිත ය. එසේ ම ජ්‍යෝතිෂ්‍ය විද්‍යාවේ දී ග්‍රහ අපලයන්ට අනුව විවිධ රෝගාබාධයන් සඳහා වෙන් වෙන් වශයෙන් මැණික් වර්ග නම් කර ඇත (අතුරලියනගම, 2006). රූබි - වා, සෙම්, පිත්, තුන් දොස් සමනයට අධික උෂ්ණ ශරීරවලට රුධිර වර්ධනයට, ධාතු වර්ධනයට, ක්ෂය රෝගයට, ආහාර මාර්ගයේ රෝග සඳහා ද මුතු - ශරීරයේ කැල්සියම් ඌනතාවයට, ක්ෂය රෝගයට, කැස්ස, හුස්ම ගැනීමේ අපහසුතාව, අධික රුධිර පීඩනය සඳහා ද කොරල් - ගර්භණී මව්වරුන්ගේ උදරයේ ගැල්වීමෙන් කළල මරණ සිදු වීම වැළැක්වීමට ද ආහාර අරුචිය, උණ හා අග්න්‍යාශය ආශ්‍රිත රෝගවලට ද සුවය ගෙන දෙයි. තව ද එමරල්ඩ් - ශරීර උෂ්ණ මේදය වැඩීමට අධික ආම්ලිකතාව, ඇදුම සමනය කරයි. ආහාර ජීරණය කරයි. හෘද වේදනා සමනය කිරීමට ද සුදු පඩියං - කහ උණ, කැස්ස, අතීසාරය, ශ්වසන අවහිරතා මගහරවයි. විෂ කෘමීන් දෂ්ඨ කළ විට එම කුඩු තබයි. වා සෙම් රෝග ද අජීර්ණ රෝග ද සමනය කරයි. එපමණක් නොව දියමන්ති - ක්ෂය රෝගය, දියවැඩියාව, රක්තහීනතාවය, හන්දි ඉදිමුම්, බඩවැල් තුවාල සුව කරන අතර සැපයාර්ස් - තද උණ, මීමැස්මොරය, මානසික දුබලතා, හන්දිපත් රුදාව, උදරාබාධා ද සුව කරයි. සර්කන් - චර්ම රෝග, පණු රෝග, අතීසාරය වැනි රෝග සඳහා ද වෛරෝඩි - කැස්ස, ආහාර අජීරණය, මලබද්ධය, අක්ෂි රෝග ආදී රෝග ද තෝරමල්ලි - උණ, ක්ෂය රෝගය, ශ්වසන අවහිරතා සුව කරයි.




රූපාවලිය අංක 03 - ශ්‍රී ලංකාවේ නිකුත් කළ ලෝකයේ ප්‍රථම මැණික් ලිත




රූපාවලිය අංක 04 - මිණිපුර මිණි මියුසියම් මැණික් ලිත

කුජ ග්‍රහයා වෘශ්චික රාශියේ ගමන් කරන විට භූමි ලාභ ගෙන දෙන බවත්, එය මැණික් ගරන්නන්ට වාසිදායක ග්‍රහ යෙදුමක් බවත් ජ්‍යෝතිෂ්‍යවේදීන්ගේ අදහසයි. එසේ ම අපල සඳහා යොදා ගන්නා මැණික් ගලක් අවම වශයෙන් කැරට් 2ක් වත් බර තිබිය යුතු ය (කොඩිකාර, 2004: 05). ඉපැරණි ග්‍රීක විශ්වාසවල තිබූ පරිදි මුතු ඇටයක් කුඩු කර එම කුඩු තේ හෝ බීම විදුරුවකට දමා බීමට දීමෙන් පෙම්වතුන්, පෙම්වතියන් වශී කර ගත හැකි ය (තාරක, 1997: 08-09). තව ද ග්‍රහ අපල සඳහා කළ හැකි සරල ශාන්තිකර්මයක් ලෙස මැණික් පැළඳීම දැක්විය හැකි ය. අපලයක් උදා වන්නේ යම් ග්‍රහයෙකුගේ කිරණ ජන්මියා කෙරෙහි දුර්වල ව බලපාන විට ය. එම ග්‍රහ කිරණ උරාගෙන ඇති මැණික් ගලක් පැළඳීමෙන් දුර්වල වූ හීන වූ ග්‍රහ කිරණ තම ශරීරයට ලැබීමට සැලැස්විය හැකි ය.

## මැණික් කර්මාන්තය ආශ්‍රිත වත්පිළිවෙත්

අදෘශ්‍යමාන බලවේගයන් පිළිබඳ ඇති විශ්වාසය හා ගෞරව භය පක්ෂපාති භාවය නිසා ඒ හා සම්බන්ධ ව විවිධ වූ වත්පිළිවෙත් අනුගමනය කිරීමට පතල්කරුවෝ උත්සුක වෙති. දෙවි දේවතාවුන්, යකුන් යක්ෂණියන්, භූත, ප්‍රේත බලවේගයන් හා අනෙකුත් අදෘශ්‍යයමාන බලවේගයන්ට කෙරෙන්නා වූ පුද පූජා, දොළ බිලි දීම් ආදිය විවිධ වූ නාමයන්ගෙන් මැණික් කර්මාන්තය තුළ දී භාවිත වේ.

### බහිරව පූජාව

පතල් කර්මාන්තය පොළොව මූලික කරගෙන කරනු ලබන කර්මාන්තයක් බැවින් භූමියට අරක්ගත් අදෘශ්‍යමාන බලවේග කෙරෙහි පුද පෙත් ලබා දීම සිදුකරනු ලබයි. බහිරව වන්දනාව එහි දී විශේෂය. "භූමි දේවතාවා", "බහිරව යකා" යන නම්වලින් ගැමියන් අතර ප්‍රසිද්ධ ව ඇති බව සම්මුඛ සාකච්ඡාවල දී පැහැදිලි විය. මැණික් සම්පතට


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අරක් ගෙන සිටින මේ බහිරව වර්ගයා සතුටු කර ඔහුගේ අවසරය ඇති ව මැණික් සම්පත ලබා ගැනීමේ දී කිසිදු අතුරු ආන්තරාවක් නොවන බව පතල්කරුවන්ගේ විශ්වාසය යි. බහිරවයා මැණික් සඟවන බවත්, පතලක් ආරම්භයට පෙර ඔහු වෙත පුද පෙත් ලබා දීම මගින් මැණික් බහුල ව පවතින ඉල්ලමක් ලැබෙන බවත්, ඉල්ලම් ගරන අවස්ථාවේ දී මැණික් නොලැබෙන විට බහිරව පූජාවක් පැවැත්වීමෙන් මැණික් ලබා ගත හැකි බවටත් මතයක් ගැමියන් අතර ප්‍රසිද්ධ ය. පතල් පොළක දිගින් දිගට ම මැණික් නොලැබෙන අවස්ථාවන්හි දී "බහිරව පූජාවක්", "බහිරව දොල පිදේනියක්" දී ම කරනු ලැබේ. නිදන් වස්තු ගැනීමේ දී, නිවාස තැනීමේ දී ආදී සෑම කටයුත්තක දී ම බහිරවයා පුද පෙත් බලන අතර බහිරවයා වැඩහිඳින තැන " බහිරව පාදය" ලෙස සලකයි.

බහිරව කාර්යය මණ්ඩලයේ ප්‍රධානියා නාග බහිරවයා ය. නයි පෙන හතක් ඇති ව පෙනී සිටින නාග බහිරවයාහට "ආතාල", "පාතාල", "වේතාල" යනුවෙන් පරිවාර පිරිසක් ද සිටී යයි විශ්වාස කෙරේ. මේ තුන්දෙනා යටතේ අට දිශාවන්ට අධිපති අට්ඨ බහිරවයන් ද සිටින අතර ශෛල බහිරව, රත්න බහිරව, ජල බහිරව ආදී වශයෙන් ඒ ඒ වස්තු සම්භාරයන්ට අධිගෘහිත බහිරව කොට්ඨාසයක් ද සිටිති. බහිරවයන් සියලු දෙනාහට පුද පූජා පැවැත්වීම මැණික් පතලක දී සිදු කරන අතර රත්න බහිරවයා මැණික්වලට අධිගෘහිත බහිරවයා ලෙස සැලකේ.

බහිරව පූජාව සඳහා කැකුළු හාල් කිරිබතක් පිසින අතර එයට මුං ඇට ද එකතු කරයි. එක් වර්ගයකින් හත බැගින් පළතුරු වර්ග 49ක් ද, එක් වර්ගයකින් හත බැගින් කැවිලි වර්ග 49ක් ද, මල් වර්ග හතකින් මල් 49ක් ද, බුලත් කොළ 49ක් ද, තැඹිලි, පොල් දෙවර්ගය එක් වර්ගයකින් හත ගණනේ ද, කඩල, හබල පෙති, කජු, කිතුල් හකුරු, රන් රිදී සහ කාසි ආදී පුද පඬුරු ද මෙම පූජාව සඳහා අවශ්‍ය වේ. මෙම පූජා භාණ්ඩ තැන්පත් කරනු ලබන්නේ නෙළුම් කොළ හතක් මත ය. පූජා භාණ්ඩ තබා තෙල් වර්ග හතක් මිශ්‍ර කර සෑදූ තෙල් වත් කළ පහන් වර්ග හතක් ද ඒ මත දල්වනු ලැබේ.

බහිරව පූජාව පැවැත්වීමට පෙර පතල කැපීමට යන භූමියේ ස්ථානයක් තෝරා ගැනීම කළ යුතු අතර ඉතා රහසිගත ව කරන පිළිවෙත් නිසා මෙය රාත්‍රී කාලයේ දී කරනු ලැබේ. ප්‍රථමයෙන් ම ඉඩම වටා සිව් කොණ පහන් දැල්වීම කරන අතර බුදුන් වැඳ, දෙවියන් වැඳ පූජාව ආරම්භ කිරීම කරයි. බහිරවයාට පූජාව තැබීම කරනුයේ අලුයම 02.02ට පමණ ය. එම වේලාව "බහිරව හෝරාව", "බහිරව වේලාව" ලෙස හඳුන්වයි.

බහිරව දෙවියන්ට පුද පෙත් දුන්විට පූජාවේ ඇති දේ අනුභව කිරීමට මිනිසුන්ට හැකි වුව ද බහිරව යකාට පිදවිලි තැබූ විට ඒවා අනුභව කිරීම නුසුදුසු සේ සැලකේ. බහිරව පූජා මල් පැල් තනවා, ඉහළ ස්ථානයක සිට දෙන අතර බහිරව දොල පිදෙන්න භූමියේ භාරන ලද වළක් තුළ දෙනු ලබයි. මෙම වත්පිළිවෙත් සඳහා යකැදුරු මහතකුගේ සහාය අවශ්‍ය වන අතර පළාත් අනුව ද බහිරව පූජාවේ හා බහිරව දොළ පිදේනි දීමේ වෙනස්කම් පවතී.

රත්නපුර දිස්ත්‍රික්කයේ ඇතැම් පළාත්වල බහිරව පූජා පැවැත්වෙන තැන අට කොනට පුදනු ලැබූ පොල් ගෙඩි එම පතලේ අයිතිකරු ලවා බිඳවාගෙන පතල් භූමිය තුළ ම සාදනු ලබන ලිපක් මත තබා තෙල් සිඳවා ගෙන සමාන ප්‍රමාණයෙන් තෙල් දමා මැටි පහන් අටක් භූමිය වටේ අට කොණ තැබීම කරයි. එම පහන්වලින් දීර්ඝ වේලාවක් දැල්වෙන පහන ඇති ස්ථානයේ පතල කැපීම කරනු ලැබේ (රාජපක්‍ෂ, 2003: 41). මෙම බහිරව පූජාව අවසානයේ පතල් හිමියා සහ පතලේ සියලු පිරිස කැඳවා පිදේනි තටුව ප්‍රධාන හිමියාගේ හිස මත තබා ගෙන ගොස් පතල් භූමියේ මායිමේ තැන්පත් කරයි (රත්නපුර, අවුරුදු 61, පුරුෂ).

තව ද බහිරව දොළ පිදේනි තැබීමේ දී පොළොව තුළ භාරන වළක තැනූ තටුවක නෙලුම් කොළ දහයක්, කැවිලි දහයක්, මල් වර්ග දහයක් ආදී ද්‍රව්‍ය තබා බහිරවයාට යාතිකාවක් කර අවසානයේ පතල් පොළට ඉඩම් හතකට එහා ඉඩමක තටුවේ ප්‍රමාණයට වළක් හාරා, එම තටුව ගෙන ගොස්, එම වලේ තබා බහිරවයා එම ස්ථානයට කැඳවා යාතිකා කර, එම වල වසා දමයි. එමගින් පතල් භූමිය තුළ තිබූ බහිරව බලවේගය අනෙක් ඉඩමට ගිය බව විශ්වාසය යි.

**නවග්‍රහ ශාන්තිය**

රාහු, කේතු, රවි, සඳු, කුජ, බුධ, ගුරු, කිවි සහ සෙනසුරු යන නවග්‍රහයන්ගෙන් සිදුවන්නා වූ අපලයන් උපද්‍රවයන් තිබේ නම් එය දුරු කර ගැනීමට කරනු ලබන සෙත් ශාන්තිය "නවග්‍රහ පූජාව", "නවග්‍රහ සෙත් ශාන්තිය" ලෙස හඳුන්වයි. මෙය ජ්‍යොතිෂ්‍යය සමඟ බද්ධ ව පවත්වනු ලබන පූජා විදියකි. පතල් හිමියා තම ජන්ම පත්‍රය පරීක්‍ෂා කරවා ගැනීමෙන් පසු ව තමාට නවග්‍රහයන්ගෙන් සෑදී වැලඳී පවත්නා වූ අපලයක් උපද්‍රවයක් තිබේ නම් එය දුරුකරවා ගැනීම උදෙසා නවග්‍රහ ශාන්තියක් සිදු කරයි. නවග්‍රහයන් උදෙසා පුද පූජා පැවැත්වීම ඈත අතීතයේ පටන් අප රටේ බලි ශාන්තිකර්මයන් ලෙස පවත්වා ගෙන එන අතර උඩරට, පහතරට, සබරගමු භේදයකින් තොර ව සම්ප්‍රදායන් තුනෙහි ම බලියාතුකර්මය සිදු කරන අතර සම්පූර්ණ බලියක් නොකළ ද පතල් භූමිය තුළ මල් පහන් පැලක් සාදවා, සාමාන්‍ය නවග්‍රහ ශාන්තියක් සිදු කිරීම පතල් භූමියක නවග්‍රහ පූජාව කිරීමේ පිළිවෙතයි. මෙම නවග්‍රහ පූජාවේ දී අඹනු ලබන බලිය කිරිබත්වලින් සාදන අතර එම බලිය පතල්හිමියාගේ දෙපතුල පාමුල තබා ශාන්තිය අරඹනු ලැබේ. බුදුන් දෙවියන් වැඳ, මල් පැලට ඔවුන්ට ආරාධනා කර ශ්ලෝක, ස්තෝත්‍ර, කවි කියමින් නවග්‍රහයින්ගේ ගුණ වණමින්, ඔවුන්ට බලිය කැප කර දී අවසානයේ සිරස පාද කවි කියමින්, ආතුරයාගේ හිස සිට පාදාන්තය දක්වා දෙහි අත්තකින් ආවඩමින්, එම දෙහි අත්ත බලියට ගසමින් සෙත් කරයි. අවසානයේ බලි ඇදුරා බලිය ගෙන ගොස් ඇළට හෝ දොළකට දැමීම කරයි. නවග්‍රහයින් වෙනුවෙන් පුදපෙත් ලබා දීමෙන් තමාට වන්නා වූ ග්‍රහ අපල දෝෂයක් වේ නම් හෝ වස්තූන් නොලැබීමේ ග්‍රහ දෝෂයක් ඇතිනම් හෝ එය ඉවත් කරගෙන, සාර්ථක ව පතලේ වැඩ කරගැනීමට හැකි වාතාවරණයක් ඇති කරගැනීම


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මෙම පූජාවේ අපේක්ෂාවයි. මෙහි දී භාවිත වන සිරස පාද කවියක් පහත දැක්වේ.

මැණික් ගලේ සමන්ත කුල එබු සිරිපා සිත ලොල්ලේ
අනෙක් පතුල එර්දි බලෙන් තිබුවයි මක්කම වැල්ලේ
මැණික් පහන් සතර රුවන් වැලි දා ගොඩ එක එල්ලේ
මැණික් කට්ටු දෙකේ දෝස දුරුවෙයි අද මේ සියල්ලේ

(සම්මුඛ සාකච්ඡා, ඉලක්කගත පුද්ගලයින් - 04, 2018.10.12, පැල්මඩුල්ල, අවුරුදු 58, පුරුෂ)

## කාලි මැණියන්ට බිලි පූජාව පැවැත්වීම

භූමි ගත ව ඇති වස්තූන් මිහිපිටට ගැනීමට නොදෙන නොයෙක් භූත, ප්‍රේත, බලවේගයන් ද, ඇති බව විශ්වාස කරන පතල්කරුවන් මැණික් ඉල්ලම් නොලැබෙන විට හෝ ඉල්ලම් ගැරීමේ දී මැණික් නොලැබෙන විට හෝ පතල කැණීමේ දී පතල් කඩා වැටීම් ආදී කරදර සිදුවීමේ දී සාස්තරයක් හෝ පේනයක් බලා එම භූමියට අරක් ගත් භූතයෝ ප්‍රේතයෝ සිටිනවා නම් ඔවුන්ව අයින් කර ගැනීම සඳහා කාලි මැණියන්ට දොළ පිදේනි දීම සිදු කරනු ලබයි. මෙම පූජාවේ දී කාලි මැණියන්ට කුකුළු බිල්ලක් දීම කරනු ලබන අතර මල් පහන්, බුලත්, පඬුරු, ගොඩදිය, මස් ආදිය දොළ වශයෙන් පූජා කර භූතයා ව පිටමන් කිරීම අපේක්ෂාවයි. මෙය කලාතුරකින් සිදු වන පිළිවෙතක් වන අතර බෞද්ධාගමික පසුබිම මේ තුළ දක්නට නොලැබේ. නමුත් යක්ෂයින්ගෙන් තමාට අතුරු ආන්තරාවන් වීම වළක්වා ගැනීමට ඇදුරු පාර්ශවය මුල දී බුදුන්ට දෙවියන්ට පහන් දැල්වීම කරනු ලැබේ.

## කුමාර දානය දීම

පතල් භූමිය ආසන්නයේ දෙනු ලබන කුමාර දානය සඳහා කුඩා පිරිමි ළමුන් සහභාගී කර ගන්නා අතර ඔවුන් හත්දෙනෙක් හෝ දාහතර දෙනෙක් මේ සඳහා යොදා ගනිති. දානය දෙනු ලබන්නේ හිමිදිරි පාන්දර ය. දානයේ සියලු ම වැඩකටයුතු පුරුෂ පක්ෂය විසින් කරනු ලබන අතර කාන්තා පාර්ශවය ඊට සම්බන්ධ වීමක් දක්නට නොලැබේ. සුදු වස්ත්‍රයෙන් සැරසුණු කුඩා පිරිමි ළමුන් පතල් භූමියේ එලන ලද පැදුරු මත හිඳුවන අතර ඊට ඔබ්බෙන් සැදු මල් පහන් පැලක පූජා වට්ටියක් තබා එය කතරගම දෙවියන් ප්‍රධාන සතරවරම් දෙවියන් උදෙසා පූජා කෙරේ. දානයේ වැඩ කටයුතු ආරම්භයට ප්‍රථම, බුදුන් වැඳ නමස්කාර කර දෙවියන්ට කන්නලව් ගායනා කරයි. මෙහි දී කතරගම දෙවියන් වෙනුවෙන් ගැයෙන යාදින්න " කුමාර යාදින්න" ලෙස හඳුන්වයි. කුමාර යාදින්න කපු මහතකු ලවා කියවන අතර ඉන් පසු ව කුඩා ළමුන්ට දානය බෙදීම කරයි. දරුවන් දානය අනුභව කර අවසන් වූ පසු කපු මහතා විසින් දෙවියන්ට පිං දී, මියගිය ඥාතින්ට පිං දීම කරයි. මෙම දානය දීමෙන් පතල් භූමියට තිබෙන්නා වූ ඇස්වහ දෝස ආදිය ඉවත් ව යහපත උදාවේවා යනුවෙන් සෙත් කරයි. ඒ අවසන පතල් හිමියන් විසින් ළමුන් වෙතට තෑගි බෝග පිරිනැමීම සිදු කෙරෙයි.

## දෙහි කැපීම

ජ්‍යොතිෂ්‍යයවේදීන් ලවා ජන්ම පත්‍රය පරීක්ෂා කර ගැනීමෙන් පසු පතල් හිමියාහට මාරක අපලයක් නවග්‍රහ අපලයක් තිබේ නම් හෝ ඇස්වහ කටවහ දෝෂයක් තිබේ නම් හෝ ඒ අපල උපද්‍රව දෝෂයන් සමනය කර ගනු වස් දෙහි කැපීමේ චාරිත්‍රය කරනු ලැබේ. මල් බුලත් තටුවක් සාදා ඒ මත මල්පස් වර්ගයක්, ඇට ඇටි, හඳුන්කුඩු, පඬුරු, ආදියත්, පහනකුත්, සුවඳ දුම් ආදියත් තබා ඒ මත දෙහි ගෙඩි නවයක් හෝ විසි එකක් ආදී ප්‍රමාණවලින් තබයි. මල් බුලත් තටුව ඉදිරියේ බිම එලන ලද පැදුරක් මත හිඳ ගනු ලබන පතල් හිමියාගේ දෙපතුල පාමුල අතුල් පතක් තබා ඒ මත සහල් විසුරුවා ඒ මත මෝල් ගසක්, පොල් ගෙඩියක්, දෙහි ගෙඩියක්, තොළබෝ, හීරැස්ස ආදියත් තබනුයේ කකුලේ ස්පර්ෂ වන පරිදි ය. පතල් හිමියා අතට පහන දී තෙල් වක්කරවා තෙරුවන් සිහිකර පහන දල්වන ලෙසට පවසා එම පහන ඔහු අතින් ම මල් බුලත් තටුවේ තබයි. ඉන් පසු හඳුන්කූරු දල්වයි. දුම්මල දුම් තටුවට අල්ලන අතර පන්සිල් ගෙන, තෙරුවන් වැඳ දෙවියන්ට ආරාධනා කරමින් ශ්ලෝක, මන්ත්‍ර, ස්තෝත්‍ර, සිරස පාද කවි කියමින් සියලු දෝෂ මෝල් ගසට, පොල් ගෙඩියට ආදී දෙපතුල තබා ඇති ද්‍රව්‍යවලට බස්සවයි. අවසානයේ දෙහි ගෙඩිය ගෙන කපමින් නැවුම් මැටි කොරහක හෝ නැඹිලියකට පිරවූ වතුරට දැමීම කරයි. අවසානයේ තොළබෝ, හීරැස්ස ආදිය කපා දමා අඹ කොළ අත්තෙන් ආවැඩීම කරයි. අවසානයේ මෝල් ගහ හැර අන් සියලු ම දේ ගලා බසින දිය කඩිත්තකට ගෙන ගොස් දමන අතර ආවඩන අඹ කොළ අත්ත පතල් භූමියේ හෝ පතල් හිමියාගේ නිවසේ ඉහළ තැනක එල්ලා තබයි. මෙය පතල් භූමියේ දී හෝ පතල් හිමියාගේ නිවසේ දී පවත්වන චාරිත්‍රයකි.

## සූනියම් කැපීම

පතල් භූමිය තුළින් හිමිවන මැණික් නොලැබී යාම වැනි අවස්ථාවල දී අංජනම් එළි බැලීමක් කරනු ලබන අතර එහි දී පතලට වෙනත් කෙනෙකු විසින් කොඩිවිනයක් කර ඇතැයි පැවසුණ හොත් එය ඉවත් කිරීම උදෙසා සූනියම් කැපීම කරයි. මේ සඳහා ඇදුරු සහය ලබාගන්නා පතල්කරුවන් ඇදුරා හමු වී අවශ්‍ය ද්‍රව්‍ය සකසා ගනී. බොහෝවිට පතල් සඳහා බහිරව බන්ධන සූනියම් කරනු ලබන්නේ ය. එය ඉවත් කරලීම සඳහා පතල්හිමියා කටයුතු කරයි. ඊට අමතර ව යම් පතලක හොඳින් මැණික් ලැබේ නම් එය වැළැක්වීමට කුකුල් ලේවලින් රූපයක් ඇඳ, රත් හඳුන්, මිනී අළු ආදිය ගෙරි ඔළුවක දමා පතල් භූමියේ වළලයි. මෙවැනි අවස්ථාවක දී සූනියම් කැපීම කරයි (රාජපක්ෂ, 2003: 46). ඌරුතෙල් මැතිරීම, දෙහි වැළලීම, වැලි, ගෙරිපස් ආදිය මතුරා ඉසීමෙන් ද පතලෙන් මැණික් නොලැබී යා හැකි ය. මේ සෑම දේ ම පතලට කරන කොඩිවින ලෙස දැක්විය හැකි ය. එය ඉවත් කර ගන්නා තුරු මැණික් නොලැබෙන අතර පතලේ වැඩ කරන්නවුන්ගේ ජීවිතයට ද බලපෑමක් වන බව විශ්වාස කෙරේ. යකදුරා පතලට ඒමට පෙරාතුව "


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සීමා කැපිල්ල" නමින් චාරිත්‍රයක් සිදුකරන අතර එහි දී වතුර පුරවන ලද භාජනයකට මගුරෙක් දමා ජීවම් කර, පතලේ සීමාවේ තබා කැත්තකින් කපා මැරීම කරයි (රාජපක්ෂ, 2003: 46). ඇතැම් ඇදුරන් එය නීච කුල තීන්දුව කැපීම ලෙස හඳුන්වයි. පතල් භූමිය තුළට එන ඇදුරා ප්‍රථමයෙන් මල් පැලක අඳුන්, සඳුන්, ලේ, කිරි තැවරූ ගොටු, ඇට ඇටි, බිත්තර, දිය ගොඩ මස් ආදිය තබා පූජාව කිරීම කරන අතර ඉන් අනතුරු ව තීන්දු කැපීම සිදු කරයි. එහි දී දෙහි, හොඬල, අළු පුහුල් ආදී තීන්දු කැපීම මන්ත්‍ර, ශ්ලෝක ගයමින් සිදුකරන ඇදුරා සූනියම ඉවත් කිරීම කරයි. සූනියම් ඉතා බලගතුයි නම් මතුරන ලද ගෙරි ඔළුවක් ලී කොටයක් මත තබා පතල්හිමියා ලවා කැත්තකින් හෝ පොරවකින් කැපීම කරනු ලැබේ. මෙය මහා කුල නීචය ලෙස හඳුන්වයි (රාජපක්ෂ, 2003: 46). කොඩිවින, සූනියම් කැපීමෙන් අනතුරු ව නැවතත් එවැන්නක් සිදු නොකිරීම සඳහා මැණික්, පස් තෙල්, වැලි ආදිය ආරක්ෂා මන්ත්‍රවලින් ජීවම් කර පතලේ සිව් කොණ හෝ අට කොණ හෝ වැළලීම කරනු ලැබේ.

**රාහු පූජාව**

කලවාන ප්‍රදේශයේ පතල්කරුවන් බහිරව පූජාව පැවැත්වීමට ප්‍රථම පවත්වන පූජා කර්මයකි. පතල් භූමියේ නිරිත දිග දිශාවේ ස්ථානයක පූජාව පවත්වයි. මෙහි දී පූජා තටුව සාදන්නේ වැටකේ ගසක සාදන ලද මැස්සක ය. මෙම රාහු පූජාවට අනතුරු ව බහිරව පූජාව පවත්වයි. පළතුරු, කැවිලි, ගිතෙල් කිරිබත්, ඇට ඇටි, ගිතෙල් පහන, නිල් රෙදි, නිල් මල් ආදී ද්‍රව්‍ය යොදා ගනී. රාහු නයි පෙන හතක් සහිත මුහුණකින් යුක්ත වෙයි. නාගයින් මැණික් ආරක්ෂා කරන අතර ඔවුන් සතුටු කර මැණික් ලබා ගැනීමේ අරමුණින් මෙම පූජාව පවත්වයි. වැටකේ ගහ රාහු ග්‍රහයාට අධිපති වෘක්ෂය නිසා එය යොදා ගනී (රාජපක්ෂ, 2003: 41-42).

**කිරිඅප්පා දානය දීම**

මෙය පතල් කර්මාන්ත හා බැඳි දානයකි. මේ සඳහා වයස අවුරුදු 60 - 70ත් අතර පුරුෂයින් සත් දෙනෙකු සහභාගි කරනු ලැබේ. විශේෂයෙන් ඔවුන් දැහැමි ජීවිතයක් ගත කරන පිරිසක් විය යුතු ය. මෙහි දී අවශ්‍ය කැවිලි කිරිබත් සියල්ලට පතල් පැලේ දී පිරිමි අය ම සාදති. පතල් සීමාව ගොප් රැහැන් ඇඳ වෙන් කරන අතර මල් යහනක් සාදවා භූමියට කහ දියර ඉසියි. ඉන් අනතුරු ව සුදු වස්ත්‍රයෙන් සැරසුණ වැඩිහිටියෝ පතල් භූමියට කැඳවති. මෙම දානය හිමිදිරි පාන්දර පැවැත්වෙන්නකි. මල් යහනට පූජා වට්ටිය පූජා කර පන්සිල් ගෙන දානය දීම ආරම්භ වේ. පූජා වට්ටියේ කතරගම හා සමන් දෙවියන්ට රතු සහ සුදු මල්මාලා දෙකක් ද පූජා කරයි. දානයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන වැඩිහිටි පුද්ගලයා සමන් දෙවියන්ට හා කතරගම දෙවියන්ට දේව දිෂ්ටිය නම් මන්ත්‍රය ගයයි. මෙය ඇතැම් අවස්ථාවල කපු මහතකු විසින් ද කරනු ලැබේ. දානය අවසානයේ දෙවියන්ට පිං දී පතලයට සෙත් කර දානය අවසන් කරයි (රාජපක්ෂ, 2003: 48).

**බෝධීන්වහන්සේට කරනු ලබන පූජාව**

මැණික් පතලයක් වෙනුවෙන් බෝධිපූජා පැවැත්වීම රත්නපුරයට, සබරගමුවට ආවේණික වුවත්, ලංකාවට බුදු දහම පැමිණි දින සිට බෝධි පූජාවන් පැවැත්වීමට ලාංකේය ජනතාව පහසුවෙන් හුරුවූයේ මෙරට ප්‍රාථමික ඇදහිලි හා විශ්වාස තුළ වෘක්ෂ වන්දනාව නම් චාරිත්‍රය පැවැති බැවින් යැයි සිතිය හැකි ය. බෝධීන්වහන්සේ උදෙසා පූජාවන් පතල් ආරම්භයට ප්‍රථමවත් ඉල්ලම් ගැරීමට ප්‍රථමවත්, මැණිකක් ලැබුණු පසු එය විකිණීමට ගෙන යාමට ප්‍රථමවත් යන අවස්ථා ත්‍රිත්වයෙහි දී ම හා ඒ අතරතුරදීත් පවත්වනු ලබයි. මේ සඳහා තම ගමේ පන්සලට එකතුවන පතලේ සියලු දෙනා දින හතක්, නවයක්, එක දිගට ම, නොවරද්දා ම මෙම පූජාව සිදු කරන අතර ස්වාමීන්වහන්සේගේ සහය ද ඒ සඳහා ලබාගනී.

මේ සඳහා සාමාන්‍ය බෝධි පූජාවක දී යොදාගන්නා පරිදි මල්, පහන්, සුවඳ දුම්, ගිලන්පස, දැහැත්, බෙහෙත් පැන් ආදිය යොදා ගනු ලැබේ. පතල ආරම්භයට පෙර පවත්වන බෝධි පූජාවක දී පතල් හිමියාගේ හෝ එම පතල අයත් ඉඩමේ නම ලියන ලද බුලත් කොළ හතක් බෝධිය වටා තැබීම කරයි. වැඩ ඇරඹූ පතලයක නම් පතල් භූමියේ ඉල්ලම් කමතෙන් ගත් ඉල්ලම් පස් සහිත භාජන හතක් හා පතල් වළෙන් පෙරා ගත් වතුරෙන් සැකසූ වතුර භාජන හතක් පූජාව සඳහා ගෙන එනු ලබයි. ඒවා බෝධිය වටේ තැබූ බුලත් කොළ අසලින් ම තබන අතර එම අසලින් ම පහන් හත ද තබයි, මල් ද තබයි. මේ ආකාරයෙන් පූජා ද්‍රව්‍යයන් පූජා කර අවසානයේ එම වැලි භාජන හා පැන් භාජන ආරක්ෂාකාරී ව තැබීම කරයි. මෙලෙස දින හයක් එක දිගට ම සවස් වේලාවේ බෝධි පූජාව පවත්වා අවසාන දිනයේ මධ්‍යම රාත්‍රියේ දී පූජාව පවත්වා බෝධිය වටේ තබා තිබූ පස් භාජනත්, පැන් භාජනත් රැගෙන පතලට විත් පතල වටා දක්ෂිණාවර්තව පැදකුණු කරමින් පතල් භූමියේ එම පස් හා පැන් ඉසීම කරයි. මෙම දින හතෙහි දී ම පතල්කරුවන් විසින් ස්වාමීන්වහන්සේට පිරිකර පිළිගැන්වීම කරන අතර අවසාන දිනයේ සෙත් පිරිත් ගායනා කර ඔවුන්ගේ අත්වල පිරිත් නූල් බැඳීමක් ද සිදු කරයි. ඇතැම් පිරිස් පතලේ ආරක්ෂාව පිණිස පිරිත් නූල් වටේ ඇදීමක් ද සිදු කරති.

මෙම බෝධි පූජාවන් පැවැත්වීම ප්‍රදේශයෙන් ප්‍රදේශයට සුළු සුළු වෙනස්කම් ඇති ව කරන අතර ඇතැම් පළාත්වල බෝධි පූජාව අවසාන දිනයේ පතල් භූමියේ ලිපක් බැඳ කිරිබතක් සාදා එයත් සමඟ පතල් භූමියට රැගෙන විත් එහි ඇවිද්ද වීමට සැලැස් වූ කුකුළෙක් ද පූජාවට ගෙන එයි. මෙහි දී කිරිබත පූජා කර අලුයම පාන්දර දෙකට පමණ පූජාව පවත්වා ප්‍රධාන පතල් හිමියා ලවා කුකුළා ව බෝධිය වටේ පැදකුණු කරවා පූජාව හමාර කරයි. පූජාව අවසාන ඔවුහු කුකුළා පතලට රැගෙන විත් පතල වටා නැවතත් පැදකුණු කරවා මුදා හරියි (රාජපක්ෂ, 2003: 45).


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

### දෙවියන් උදෙසා දේව පූජාව පැවැත්වීම

පතල අරඹන ප්‍රථම දිනයේ සුභ හෝරාවට පෙර පතල් භූමිය දෙවියන් උදෙසා කැප කිරීමට මෙම පූජාකර්මය සිදු කෙරේ. මේ සඳහා කපු මහතෙකුගේ සහය ලබාගන්නා අතර ප්‍රථම ව මල්පැල දෙකක් පතල් භූමියේ සාදවා ගනී. එක් මල් පැලක සමන් දෙවියන් උදෙසා පහනක් දල්වන අතර, අනෙක් මල් පැලේ කතරගම දෙවියන් වෙනුවෙන් පහන් දැල්වීම කරනු ලැබේ. දෙවියන් දෙදෙනා වෙනුවෙන් ම පූජා වට්ටියක් තැබීම කළ යුතු ය. ඇතැම් පිරිස් කතරගම දෙවියන් සමග පුදපෙත් ලැබීමට විෂ්ණු, පත්තිනි දෙවියන්ට ද ආරාධනා කරයි. එසේ වුවහොත් එම මල් යහනේ තැන්පත් කරන පූජා වට්ටිය සඳහා රතු, නිල්, කහ වර්ණ තුනෙන් ම මල් මාලා දැමීම කරයි. සමන් දෙවියන් උදෙසාවෙන් වන පූජා වට්ටිය සඳහා සුදු මල් මාලාවක් යොදා ගනී. ඊට අමතර ව පළතුරු පස් වර්ගයකින් පූජා වට්ටි දෙක සඳහා පළතුරු ද එක් වට්ටියකට බුලත් විසි එක ගානේ බුලත් කොළ හතලිස් දෙකක් ද පොල් හා තැඹිලි ගෙඩි දෙක බැගින් ද පහන් දෙකක් ද, පඬුරු පූජා වට්ටි දෙකට ම සෑහෙන තරම් ද, කැවිලි පස් වර්ගයකින් පූජා වට්ටි දෙක සඳහා ද, කපුරු, සුවඳ දුම්, පාට හතරෙන් මල් ද, මෙම පූජා වට්ටි සඳහා අවශ්‍ය වේ.

පූජා වට්ටි මල් යහනේ තබා, පන්සිල් ගෙන, ඒ ඒ යහන සමීපයට ගොස් ඒ ඒ දෙවියන්ට කන්නලව් කර මල් යහන් වෙතට ආරාධනා කර, පූජාව කැප කර මෙම භූමිය ආරක්ෂා කර දෙන ලෙසත් පතලේ කාර්යයන් සාර්ථක කර දෙන ලෙසත්, වටිනා ගල් ලබා දී වාසි කර දෙන ලෙසත් ඉල්ලා සිටියි. මෙහි දී ද දෙවියන් වෙනුවෙන් පඬුරු ගැටගසන අතර මැණිකක් ලැබුණු පසු ඒවා නිදහස් කිරීම කරයි. ඇතැම් අය වෙන දානමාන පිංකම් සඳහා ද පඬුරු වෙන් කිරීම කරයි. පත්තිනි දේවිය වෙනුවෙන් පඬුරු ගැටගසා, කිරි දානයක් දීමට භාරහාර වීම ද සිදු වේ.

අවසානයේ දී මල් යහනේ තබා තිබූ මල් ගෙන පතල් භූමියේ ඇතුළුවන තැන නොපෑගෙන ස්ථානයක සීමාවේ වැළලීම කරන අතර මල් යහනේ තිබූ පොල් ගෙඩි දෙක ගෙන පතල් භූමියේ ගලක් තබා ඒ ගල මත ගසා බිඳීම කරයි (රාජපක්ෂ, 2003: 43). තැඹිලි ගෙඩි දෙකේ වතුර පතල් භූමිය පුරා ම ඉසීම කරයි. ඇතැම් ප්‍රදේශවල අවසානයේ දී කපු මහතා ආරක්ෂා ගාථා කියමින් පතල් භූමියට අපල උපද්‍රවය ඇති නොවීමට පතල් භූමිය ආරක්ෂා කර, පිහියක් ගෙන පතල් සීමාවේ ඉරි තුනක් ඇද මැද ඉරෙන් පිහිය පොළොව තුළට කිඳා බැස වීම කරයි). මෙවැනි ම චාරිත්‍රයක් වන්නියේ පූජා කර්මවල දී ද දක්නට ලැබේ (මුදියන්සේ, 1996: 31-32).

### කෙම් ක්‍රම භාවිත කිරීම

එක්තරා සුභ හෝරාවකින් ඉතා රහසිගත ව කථා නොකර කරනු ලබන ගුරුහරුකමක් ලෙස කෙම් ක්‍රම ගත හැකි ය. මේවායේ දී මන්ත්‍ර භාවිතයක් නොවන අතර ප්‍රබල ව යොදා ගන්නේ නැකත යි. පතල්හිමියා විසින් කරනු ලබන මෙය, ඔහු පමණක් දැනුවත් වේ. නැකතට අනුව මල් වර්ගවලින් හෝ ගල් කැටවලින් හෝ පතල් භූමිය හතර වටේ සීමා කරයි. මෙලෙස කරන්නේ පතල් භූමියට යම් කිසි කෙනෙකු හදි හූනියමක් කළොත් එයින් ආරක්ෂා වීම සඳහා ය. නැකැත් බලය නිසා එම භූමිය ආරක්ෂා වීමක් වේ. ඇතැම් පිරිස් රත්තරන් හෝ රිදී ආභරණයකට මතුරා බහිරව බන්ධනය කර පතල් භූමියේ වළදැමීම වැනි දේ කරයි. එවැනි දේ ආරක්ෂා වීම සඳහා පතල් හිමියන් මෙවැනි කෙම් ක්‍රම ඉතා රහසිගත ව සිදු කරයි.

### අවශේෂ වත්පිළිවෙත්

පතල් කර්මාන්තය සමග බැඳි වත්පිළිවෙත් ගෙන බැලීමේ දී සෑම අවස්ථාවක් ම ඉතා වැදගත්කමක් ගෙනෙන අතර නාම්බුව බලන අවස්ථාවේ දී ද ඔවුන් විසින් අනුගමනය කරන චාරිත්‍ර කිහිපයකි. ගැරුම් වළෙන් ගොඩට ගන්නා ගැරුම් වට්ටිය හිරු එළිය එන දිශාවට මුහුණ හරවා මැණික් තිබේදැයි බැලීම මැණික් කර්මාන්තය ආරම්භ වූ දා පටන් ම පැවත එන සිරිත වෙයි. මෙම අවස්ථාවේ දී කට වරද්දා ගැනීම් ආදී දේ නොකරන අතර ඉතා ගරු බුහුමන් ඇති ව නාම්බු වට්ටියට තෙවරක් වැද අඩමානයට වාඩි නොවී "හොඳින් දෙපතුල බිම ස්පර්ශ වන ලෙස බිම හිඳගෙන නාම්බුව බැලීම කරයි". කකුලක් අඩමානයට තබාගෙන නාම්බුව බැලීමට කිසිවිටක ඉඩ නොදෙන අතර නාම්බුව බලන්නා හැර අනෙක් පිරිසට වට්ටිය දෙස බැලිය හැක්කේ නාම්බුව බලන්නාගේ පසු පසින් හිඳගෙන ය. ගැරුම් වට්ටිය ඉදිරිපසින් හිරු එළිය එන අතර එය දෙවියන් බලා සිටින දිශාවයි. නාම්බුව බැලීමේ දී ද අත හසුරුවන ආකාර සුවිශේෂ ය. ඔවුන් කිසිවිටකවත් නාම්බු වට්ටිය හරහා අත යැවීමේ දී දබරැඟිල්ල භාවිත නොකරයි. එය අසුබ ක්‍රියාවක් නිසා දබරැඟිල්ල නවා නාම්බු බැලීම කරයි. ඇතැම් පිරිස් මෙහි දී මහපටැඟිල්ල නැවීම ද සිදු කරති.

### නිගමනය

ප්‍රධාන වශයෙන් අතීතයේ සිට ම මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් විවිධ අභියෝගවලට මුහුණ දෙමින් මෙම මිනිසුන් මැණික් කර්මාන්තයේ නියැළුණු බව මැනවින් පැහැදිලි ය. එම නිසා, ඔවුහු විවිධ අභිචාර හා වත්පිළිවෙත් විධිවලට පුරුදු වී සිටිය හ. එම ප්‍රධාන අභිචාර නම් දෙවියන් ඇදහීම, ජන්ම පත්‍රය පරීක්ෂා කරවා ගැනීම, බුදුන් ප්‍රමුඛ සතර වරම් දෙවියන්ට පහන් දැල්වීම, සාස්තර පේන අංජනම් එළි බැලීම, ජ්‍යෝතිෂ්‍ය විද්‍යාව හා මැණික් භාවිතය මෙන් ම වත්පිළිවෙත් ලෙසින් බහිරව පූජාව, නවග්‍රහ ශාන්තිය, කාලි මෑණියන්ට බිලි පූජාව පැවැත්වීම, කුමාර දානය දීම, දෙහි කැපීම, සූනියම් කැපීම, රාහු පූජාව, කිරිඅප්පා දානය දීම, බෝධීන්වහන්සේට කරනු ලබන පූජාව, දෙවියන් උදෙසා දේව පූජාව පැවැත්වීම හා කෙම් ක්‍රම භාවිත කිරීම ආදී තිබූ බව දැක්විය හැකි ය. ඒ අනුව මැණික් කර්මාන්තය හා සම්බන්ධ ඇදහිලි විශ්වාස හා වත්පිළිවෙත් ගණනාවක් හඳුනාගත හැකි වූ අතර ඒවා බොහොමයක් සුළු වශයෙන් වෙනස්කම්වලට ලක්වෙමින් වුවත් වර්තමානය දක්වා ම නොනැසී පවතින බව පෙනී යයි.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පරිශීලිත මූලාශ්‍රය


අතුරලියගම, කේ. සී. (2006) මැණික් ලිත, මිණිපුර මිණි මියුසියම්.

ආරියරත්න, ඩී. එච්., (1977) ශ්‍රී ලංකාවේ මැණික්, කොළඹ, ගුණසිරි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

කවිතිලක, කේ. කේ. එම්., (වර්ෂය සඳහන් නොවේ) රත්න පරීක්ෂක ශාස්ත්‍රය, කේ. ඇම්. සමයවර්ධන යන්ත්‍රාලය.

ගුණතිලක, කේ. (1997, ජූනි 04) මුතු මැණික්වලින් ගෙන එන ගුප්තමය වාසනා බල මහිමය, තාරකා.

චන්‍ද්‍රජෝති, එම්., (1992). ලංකාවේ මැණික්, කොළඹ, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය සහ මැණික් කර්මාන්තයේ ප්‍රගතිය, (2007) කොළඹ 03, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය.

ඤාණවිමල, කේ., (1946) සබරගමුවේ පැරණි ලියවිලි, කොළඹ, ලෝකෝ යන්ත්‍රාලය.

දැරණියගල, පී. ඊ. පී (සංස්කරණය) (1960, සැප්තැම්බර්) මානව විද්‍යාව ලංකා ජාතික කෞතුකාගාර පුස්කොළ ග්‍රන්ථ මාලා අංක ix, දේව වර්ණනා කාව්‍ය, හතරවන කලාපය.

නාඹටුන්න, කේ., (1986). පොළවේ සම්පත්, රත්නපුරය, සෆයර් ශ්‍රී ලංකා ප්‍රකාශන.

නාඹටුන්න, කේ., (1986) භූගර්භයේ සැඟවුණු මැණික, රත්නපුරය, සෆයර් ශ්‍රී ලංකා ප්‍රකාශන.

මේධානන්ද එල්., වජිරබුද්ධි එම්. (2003) සබරගමු වංශ කතාව 02 වන වෙළුම, සබරගමු පළාත් සභාව.

රාජපක්ෂ, එස්., (2000) මැණික් කර්මාන්තය හා බැඳි වත්පිළිවෙත, කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රූපසිංහ, එම්. එස්. (2000) ශ්‍රී ලංකාවේ ගෙවුඩ, මහරගම, තරංජි ප්‍රින්ටස්.

වනිගරත්න, ඩබ්ලිව්. ඒ. (1976) මූලික රත්න විද්‍යාව හා මැණික් කර්මාන්තය, කොළඹ, සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම.

සිල්වා, එච්. එච්. (1956) ජීවිතය සහ ග්‍රහයො, කොළඹ, ලංකාපුත්‍ර මුද්‍රණාලය.

කොඩිකාර, එස්. (2004, සැප්තැම්බර්. 20 වන දින) මැණික් ගලේ සැඟවුන රහස, දිවැස පත්‍රය, අවසාන කොටස, කොළඹ, වාසනා ප්‍රකාශනය.

පතිරණ, පි. සී. (2010, සැප්තැම්බර් මස 17 වන සිකුරාදා) ජ්‍යොතිෂ්‍යය ගුප්ත විද්‍යාවකි, දිවයින සතිපතා පළවන ජ්‍යොතිෂ්‍යය අතිරේකය, නැකත.

Amarasinghe, S (1999). A Socio - Economic Study of Small - Scale Gemstone Mining in Sri Lanka. Best Practice in Small - Scale Gemstone Mining DFLD Knowledge and Research Project, United Kindom. https://www.researchgate.net/publication/315001029_A_SOCIO-ECONOMIC_STUDY_OF_SMALL-SCALE_GEMSTONE_MINING_IN_SRI_LANKA



© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දොළොස්වන කලාපය 2021 දෙසැම්බර්
පිටු 49-63
ISSN 1800-1459 eISSN 2386-2041
© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ‘තුන්දෙනෙක්’ චිත්‍රපටයෙහි නිරූපිත සංහිඳියාව සහ ජාතික සමගිය යන සංකල්ප පිළිබඳ සිනමා න්‍යායාත්මක අධ්‍යයනයක්

# (A Film Theoretical Analysis of the Concepts of Inter-Ethnic Harmony and Reconciliation Represented in the Film *Him, Her, The Other*)

ආචාර්ය ප්‍රභා මනුරත්න

ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
pmanuratne@kln.ac.lk

## සාරසංක්ෂේපය

ප්‍රසන්න විතානගේ, විමුක්ති ජයසුන්දර සහ අශෝක හඳගම විසින් අධ්‍යක්ෂණය කරන ලද **තුන්දෙනෙක්** (2018) චිත්‍රපටයෙහි ජාතීන් අතර සංහිඳියාව පිළිබඳ ව ඉදිරිපත් කෙරෙන අදහස සිනමා න්‍යාය ආශ්‍රයෙන් කියවීම මෙම ලිපියෙහි අරමුණ වේ. මෙම චිත්‍රපටය ජාතික සමගිය සහ සංහිඳියාව පිළිබඳ ව උපදේශාත්මක අදහසක් ප්‍රේක්ෂකයාට සම්ප්‍රේෂණය කිරීමේ අරමුණින් නිර්මාණය වූවා යයි සිතිය හැකි වුව ද, සිනමා ආඛ්‍යානය සහ සිනමා වින්‍යාසය ආශ්‍රයෙන් ගත් කල මෙම චිත්‍රපටය විසින් ජාතික සමගිය සහ සංහිඳියාව පිළිබඳ ව උත්ප්‍රාසාත්මක අරුත් මතු කෙරේ. රූපය සහ සමාජය අතර සම්බන්ධය න්‍යායගත කළ හැක්කේ කෙසේ ද යන පර්යේෂණ ගැටලුව වටා මෙම පර්යේෂණය ගොඩනැගී ඇත. මෙහි න්‍යායාත්මක එළඹුම ලෙස සිනමා න්‍යායයෙහි එන රූපයෙහි සද්භාවවේදය යන අදහස ද සිනමාව පිළිබඳ සමාජ විද්‍යාවෙහි වර්ගීකරණයක් වන සමාජ ගැටලු සිනමාව යන ශානරය පිළිබඳ න්‍යාය ද යොදා ගනු ලැබේ. මෙම අධ්‍යයනයට පදනම් වන මූලික පර්යේෂණ ප්‍රශ්න තුන නම් යුද්ධයෙහි සමාජ විද්‍යාත්මක යථාර්ථයක් ලෙස මරණය පිළිබඳ රූප සංසරණයෙහි ස්වරූපය කුමක්ද යන්න, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ රූප විසින් කෙනෙකුගේ නොපැවතීම සලකුණු කෙරෙන අතර ම රූපය නව ප්‍රජාවන්ගේ ආරම්භක මොහොතක් ලෙස ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න සහ සිනමා පඨිතය තුළ ජාතිය රූපයක් ලෙස නිරූපණය වන්නේ කෙසේ ද යන්නයි. මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන නිගමනය ලෙස ඉදිරිපත් කෙරෙන තර්කය වන්නේ, ජාතික සමගිය හා සංහිඳියාව සිය ප්‍රකාශිත තේමාව ලෙස රැගත් චිත්‍රපටයක් වුව ද **තුන්දෙනෙක්** චිත්‍රපටය විසින් පෙන්වා දෙනු ලබන්නේ ශ්‍රී ලංකාවේ යුද්ධයෙහි ගමන් පථය සහ එය අවසන් වූ මිලිටරිමය විලාසය නිසා කිසියම් වූ ධනාත්මක සංහිඳියාවක් මෙම සන්දර්භය තුළ පරිකල්පනය කළ නොහැකි බව ය. ඒ වෙනුවට නොපැවැත්මක් ලෙස පමණක් පවතින නව ප්‍රජාවන් හෝ සමාජීය සබඳතා පිළිබඳ සිනමාත්මක ඉඟි කිරීමක් පමණක් ඉදිරිපත් කෙරෙන බව නිගමනය කෙරේ. උපදේශාත්මක ලෙස සමාජ ගැටලු චිත්‍රපටයක යෝජනා කෙරෙන ආකාරයේ සරල ජාතික සංහිඳියාවක් වෙනුවට එබඳු සංහිඳියාවක් වළක්වාලන සමාජ විද්‍යාත්මක හේතු සහ ආචාරධාර්මීය භාවිතයන් සොයා යා යුතු බව චිත්‍රපටය පිළිබඳ එම කියවීමෙන් යෝජනා කෙරේ.

**කේන්ද්‍රීය වචන:** සංහිඳියාව, සිනමා න්‍යාය, සමාජ ගැටලු සිනමාව, දේශපාලනික හිංසනය, සද්භාවවේදය

This study examines the film *Him, Her, the Other* (2018) directed by Prasanna Vitanage, Vimukthi Jayasundara and Asoka Handagama from the angle of film theory. Although the film appears to have intended to present a didactic message about reconciliation and inter-ethnic harmony, this text undercuts that didacticism with irony, presenting a nuanced picture about inter-ethnic harmony and reconciliation. The larger research problem shaping this study is the ways in which the relation between the image and society could be theorized. This study draws on the idea of the ontology of the image present in film theory as well as the theorization of the genre of the social problem film in sociological theory. The research questions of the study are, 1) how can the circulation of the images of death be theorized within the social reality of war? 2) how do images of the disappeared both mark the absence and the continued presence of those forcibly disappeared and how does the abstraction of that image lead to possibilities of new communities? and 3) how is the nation represented as an image in the film’s text. The central argument that is presented as a finding in this study is that the filmic text’s irony points to how the military ending of the war, unaccompanied by any discourse or political intervention on justice cannot lead to a positive representation of harmony or reconciliation; the film emphasizes the need to examine the deep socio-political roots of the conflict that can only lead to any sustainable idea of reconciliation, rather than resort to the easy didacticism promoted by powerful discourses about a quasi-ethnic harmony and reconciliation.

**Key words**: Reconciliation, Social problem film, Film Theory, Ontology, Political Violence

## හැඳින්වීම

යුද්ධය විසින් අපට උරුම කර ඇත්තේ කවරාකාරයේ ජීවිතයක් ද? යුද්ධය විසින් අපට උරුම කර ඇත්තේ කවරාකාරයේ මරණයක් ද? යුද්ධය විසින් අපට ජීවිතය නොමැති ජීවිතයක් සහ මරණය නොමැති මරණයක් ද, වැලපුම අහිමි කළ ශෝකයක් ද ඉතිරි කර ගොස් ඇත.[i] *තුන්දෙනෙක්*[ii] චිත්‍රපටය පිළිබඳ ව කෙරෙන මෙම අධ්‍යයනයෙන් ජීවිතය, මරණය, සහ වැලපීම යන තේමා ඔස්සේ ගොනු කරන්නේ අප ජීවත්වන යුගයෙහි රූපය සහ සමාජය අතර සම්බන්ධය සහ එහි සමාජ විද්‍යාත්මක මානයයි. අප මෙ හි දී රූපය යන්න භාවිත කරන්නේ හුදෙක් එක් එක් සුවිශේෂ රූපයක් ලෙස නොව, රූපයෙහි අමූර්තනයක් **(abstraction)** සමාජ විද්‍යාත්මක ව විග්‍රහ කරන්නේ කෙසේද යන ප්‍රශ්නය ඇසීමට ය. ශ්‍රී ලංකාවේ පැවති වාර්ගික යුද්ධය පිළිබඳ ව ඇති විවිධ කතිකාමය ගොඩනැංවීම් අතර 2009 දී සිදු වූ දෙමළ විමුක්ති කොටි සංවිධානයේ මිලිටරිමය පරාජයෙන් පසු ව ඇති වූ පශ්චාත් යුධ කාලීන අන්තර්වාර්ගික සමගිය සහ සංහිඳියාව පිළිබඳ කතිකාව සමාජ විද්‍යාත්මක කෝණයකින් සහ සිනමා න්‍යායෙහි කෝණයෙන් මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් විග්‍රහ කෙරේ. මෙම අධ්‍යයනයෙහි පළමු පර්යේෂණ ප්‍රශ්නය ස්ථානගත කෙරෙනුයේ මරණය පිළිබඳ රූප සංසරණය සහ ඒවා හරහා ගොඩනැගෙන සමාජ සබඳතා ඇසුරිනි. අධ්‍යයනයෙහි දෙවැනි පර්යේෂණ ප්‍රශ්නය වන්නේ, අතුරුදන් වූවන්ගේ රූප සහ නව සමාජ ප්‍රජාවන්ගේ භව්‍යතාව **(possibility)** පිළිබඳ ප්‍රශ්නයයි. මෙහි දී මනෝවිශ්ලේෂණයෙහි ප්‍රධාන න්‍යායයක් වන වැලපුම යන සංකල්පය ඇසුරෙන් අතුරුදහන් වූවන්ගේ රූප පිළිබඳ ව සලකනු ලැබේ. ඡායාරූපය විසින් කෙනෙකුගේ නොපැවතීම සලකුණු කරන අතර ම එම නොපැවතීම වටා නව ප්‍රජාවන් ගොඩනැගීමේ අභව්‍යතාව **(impossibility)** පිළිබඳ ගැටලුව ද මෙහි දී සාකච්ඡා කෙරේ. තුන්වැනි පර්යේෂණ ප්‍රශ්නය වන ජාතිය පරිකල්පනීය රූපයක් ලෙස ගොඩ නගන්නේ කෙසේ ද යන්න පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ජාතිය යන ප්‍රවර්ගය එසේ රූපයක් ලෙස ගොඩ නැගෙන ක්‍රියාවලිය සහ පශ්චාත් යුධකාලීන සංහිඳියා සංවාද තුළ ජාතිකවාදී කතිකාව ගොඩ නැගෙන උත්ප්‍රාසාත්මක, ඇතැම් විටෙක දී විසුළුකාරී ස්වරූපය මෙම ලිපියෙහි තුන්වැනි කොටස තුළ සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය. ජාතික සමගිය සහ සංහිඳියා කාර්යාංශයේ අනුග්‍රාහකත්වයෙන් නිර්මාණය වූ මෙම චිත්‍රපටයෙහි මුඛ්‍ය පරමාර්ථය ලෙස දක්වෙන්නේ ජාතීන් අතර සංහිඳියාව ගොඩනැංවීම පිළිබඳ රූපයක් නිර්මාණය කිරීම වුව ද සමාජ විද්‍යාත්මක ව ගත් කල නොවිසඳුණු සමාජ-දේශපාලනික ගැටලු සහ අසමානතා විසින් ව්‍යුහගත කරනු ලබන සංහිඳියාවක උත්ප්‍රාසාත්මක ව්‍යාජත්වය සහ අභව්‍යතාව එම පඨිතය විසින් නිරාවරණය කරනු ලබයි. ශ්‍රී ලාංකේය යුධ-විරෝධී සිනමාවෙහි පුරෝගාමී අධ්‍යක්ෂවරුන් ලෙස සැලකෙන ප්‍රසන්න විතානගේ, විමුක්ති ජයසුන්දර, සහ අශෝක හඳගම විසින් වෙන් වෙන් ව, කොටස් තුනක් ලෙස විකාශනය වන තුන් ඈඳුතු චිත්‍රපටයක් සේ අධ්‍යක්ෂණය කරන ලද මෙම පඨිතයෙහි එක් එක් කොටස ***ඇය, ඔහු, අනෙකා*** යනුවෙන් නම් කර ඇත. මෙම අධ්‍යයනය තුළ ඉහත සඳහන් පර්යේෂණ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම මේ එක් එක් කොටස විග්‍රහ කිරීම මගින් සිදු කෙරේ.

## පර්යේෂණ ගැටලුව සහ පර්යේෂණ ප්‍රශ්න

මෙම පර්යේෂණයෙහි ආමන්ත්‍රණය කෙරෙන පර්යේෂණ ගැටලුව වන්නේ රූපය සහ සමාජය අතර සම්බන්ධය න්‍යායගත කරන්නේ කෙසේ ද යන්නයි. පොදු ව්‍යවහාරය තුළ රූපය සහ සමාජය අතර සම්බන්ධය සැලකෙන්නේ උපදේශාත්මක සම්බන්ධයක් **(didactic relation)** ලෙස හෝ ප්‍රතිරූපණාත්මක සම්බන්ධයක් **(representatioil relation)** ලෙස ය. පළමුවැන්නෙන් බොහෝ විට හැඟෙනු ලබන්නේ රූපමය හෝ දෘශ්‍යමය කලාවන් පමණක් නොව සියලු ම කලාවන්ගේ මූලික අරමුණ කිසියම් උපදේශාත්මක පාඩමක් ලබා දීම හෝ කිසියම් යහපත් පණිවිඩයක් ලබා දීම බවයි. අනෙක් අතින් කලාවෙහි අරමුණ යථාර්ථය නිරූපණය කිරීම බව විශ්වාස කෙරේ. මෙහි දී කලාත්මක පඨිතයකින් බලාපොරොත්තු වන්නේ යථාර්ථය ඇති පරිදි නිවැරදි ව නිරූපණය කිරීමයි. මෙහි දී යළිත් මතු වන ගැටලුව නම් කලාව හුදෙක් සමාජ විද්‍යාත්මක ව තේරුම් ගත් යථාර්ථයකට යටත් කිරීමයි. එනම් සිනමා පඨිතය (හෝ ඕනෑ ම කලාත්මක පඨිතයක්) පවතින සමාජ විද්‍යාත්මක විග්‍රහයකට යටත් කිරීමයි. මෙය ගැටලුවක් වන්නේ එහි දී පඨිතය විසින් ඉඟි කරන සමාජ විද්‍යාත්මක ව ග්‍රහණය නොවන අර්ථකථන විද්‍යාවන්ට **(hermeneutics)** යටත් සත්‍යයන් මඟහැරී යාමයි. එවිට රූපය සැලකෙන්නේ හුදු සමාජ විද්‍යාත්මක ලේඛනගත කිරීමක් ලෙස ය.

මෙම පර්යේෂණයෙහි රූපය සහ සමාජය අතර සම්බන්ධය වඩාත් සංකීර්ණ කිරීමට උත්සාහ කෙරෙන්නේ ශ්‍රී ලංකාවෙහි අධිකාරීත්වයෙන් යුත් කතිකාවක් බවට පත් වී ඇති ජාතික සංහිඳියාව පිළිබඳ කතිකාව හරහා ය. ශ්‍රී ලංකාවෙහි පවතින සංහිඳියාව පිළිබඳ කතිකාව වූ කලි මිලිටරිමය ගැටුමක අවසානයෙහි ජයග්‍රාහී පාර්ශවය විසින් ගොඩනගන ලද කතිකාවකි. බොහෝ අවස්ථාවල දී එහි හඟවනු ලබන්නේ දමිළ ජනතාවගේ දේශපාලනික අභිලාශයන් මඟහැර ගොස් හුදෙක් සංකේතීය ලෙස කෙරෙන සංස්කෘතිකමය වූ සංහිඳියාවකි. මෙම පර්යේෂණය තුළ යථෝක්ත දේශපාලනික ප්‍රශ්නය, රූපයෙහි සමාජ විද්‍යාත්මක නොවන මානයන් මගහැරීමේ ගැටලුව හා සම්බන්ධ කෙරේ. එනම් රූපය සහ සමාජය යන ගැටලුව හරහා ලාංකේය සංහිඳියා කතිකාවෙහි ඇති හිදැස් සොයා යාමට උත්සාහ කෙරේ.

ඒ සඳහා මෙම පර්යේෂණයෙහි ප්‍රධාන පර්යේෂණ ප්‍රශ්න තුනක් අසා ඇත. එනම් යුද්ධය නමැති යථාර්ථය තුළ සංසරණය වන මරණය පිළිබඳ රූප සංසරණය න්‍යායගත කළ හැක්කේ කෙසේ ද යන්න, අතුරුදහන් කරවනු ලැබූ පුද්ගලයන්ගේ රූප විසින් ඔවුන්ගේ නොපැවැත්ම සහ නොනිමි පැවැත්ම සලකුණු කිරීම හරහා නව ප්‍රජාවන් පිළිබඳ වියහැකිභාවයන් අපට සොයා යා හැක්කේ කෙසේ ද යන්න සහ සිනමා පඨිතය තුළ ජාතිය රූපයක් ලෙස නිරූපණය වන්නේ කෙසේ ද යන ප්‍රශ්නයයි. මේ එක් එක් ප්‍රශ්නය හරහා යුද්ධයෙහි යථාර්ථයන් සිනමා


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පඨිතය තුළ ගොඩනංවා ඇති ආකාරයත්, එහි රූපමය භාෂාවත් ආඛ්‍යාන ආකෘතියත් හරහා සිනමා පටය විසින් බැලූ බැල්මට සරල ලෙස පෙනෙන සංහිඳියා කතිකාවක් නිර්මාණය කරන අතර ම, එහි සිනමා භාෂාව, විශේෂයෙහි එහි උත්ප්‍රාසාත්මක මානය හරහා එම සංහිඳියා කතිකාව ගැඹුරු ලෙස විපර්යාසකරණයට ලක් කරන ආකාරයත් මෙහි දී සාකච්ඡා කෙරේ. ඒ අනුව චිත්‍රපටයෙහි දෘෂ්ටිමය භාෂාව ද එහි රූපමය භාෂාව සහ සමාජ යථාර්ථයත් අතර සාම්‍ය නොවන යටිඅරුත් ද ගවේෂණය කෙරේ.

## සාහිත්‍ය විමර්ශනය

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය සහ ජාතීන් අතර සංහිඳියාව පිළිබඳ ව නිර්මාණය කෙරුණු චිත්‍රපටයක් වන **තුන්දෙනෙක්** චිත්‍රපටය ශාස්ත්‍රීය විග්‍රහයන්ට බඳුන් කෙරුණේ නැති තරම් ය. එබැවින් මෙහි දී සාහිත්‍ය විමර්ශනය යටතේ අපට සැලකීමට සිදුවන්නේ එය පිළිබඳ ව පළ වූ පුවත්පත් විචාර වේ. චිත්‍රපටය කෙරෙහි විචාරක ප්‍රතිචාර මූලික වශයෙන් වර්ග දෙකකට බෙදා වෙන් කළ හැකි ය. ඇතැම් විචාරකයන් මෙය හුදෙක් රාජ්‍යයේ වුවමනාව උදෙසා නිර්මාණය කෙරුණු උපදේශාත්මක, ප්‍රචාරකවාදී ගතිකයන්ගෙන් යුත් චිත්‍රපටයක් ලෙස දක ඇත. අනෙක් විචාරකයන් මෙහි ඇති උපදේශාත්මක ස්වරූපය පිළිගන්නා අතර ම, ජාතීන් අතර සංහිඳියාව ද යුද්ධය ද පිළිබඳ ව නිර්මාණය වී ඇති සංවේදී සිනමා පඨිතයක් ලෙස මෙය හඳුනා ගත හැකි ය. මේ බොහෝමයක් විචාර එක ම අදහස් පුනරුච්චාරණය කරන බැවින්, මෙහි දී අපගේ අධ්‍යයනයට ඍජු ව සම්බන්ධ විචාර දෙකක් පමණක් සැලකිල්ලට ගැනේ.

සිනමා න්‍යාය සහ මනෝවිශ්ලේෂණය ආශ්‍රයෙන් සමන් වික්‍රමාරච්චි විසින් ***තුන්දෙනෙක්*** චිත්‍රපටය පිළිබඳ ව කරන ලද විචාරයෙන් මෙම සාහිත්‍ය විමර්ශනය ආරම්භ කළ හැකි ය. "විපරීත තුන්දෙනෙක්"යනුවෙන් නම් කර ඇති මෙම අන්තර්ජාල විචාරයේ දී වික්‍රමාරච්චි සඳහන් කරන්නේ, සිනමාව යනු විපරීත කලාවක් බැවින්, සිනමා පඨිතය විසින් සිදු කෙරෙන්නේ "යථාර්ථයේ ප්‍රබන්ධ මානය වටහා දීම" බවයි. එනම්, ජිජැකියානු සිනමා ප්‍රවාද ආශ්‍රයෙන් ඔහු ඉදිරිපත් කරන මෙම අදහස, සිනමා පඨිතය යථාර්ථය සහ ප්‍රබන්ධය අතර පිහිටුවන ලද්දකි. මනෝවිශ්ලෙෂණයෙහි ප්‍රධාන අදහසක් වන යථාර්ථය යනු ප්‍රබන්ධයක් යන්න මෙහි දී වික්‍රමාරච්චි උපුටා දක්වයි. සිනමාව විසින් සිදු කෙරෙන්නේ යථාර්ථයෙහි ප්‍රබන්ධිත මානය ප්‍රේක්ෂකයාට මුණගස්වා ඒ හරහා ප්‍රේක්ෂකයාගේ අවිඥානික අශ්ශීල ආශාව ඔහුට/ඇයට මුණගැස්වීම බව ඔහු පවසයි. එනම් යථාර්ථය ම ප්‍රබන්ධයක් බව පෙන්වීමයි. එහි දී එක් එක් චරිතය මනෝවිශ්ලේෂණයට ලක් කරන ඔහු, චිත්‍රපටයෙහි එන කේසවරාජන් නම් චරිතය (මොහු පෙර එල්. ටී. ටී. ඊ. සංවිධානයේ වීඩියෝ කැමරාකරණයෙහි යෙදෙන්නෙකු ලෙස කටයුතු කර, යුද්ධයෙන් පසු ව අශෝක හඳගම යන චිත්‍රපට චරිතය සමඟ සමබන්ධ වන පුද්ගලයෙකි. චිත්‍රපටයෙහි කතාව තුළ ඔහු තමා වරක් දුරකථනයෙන් කතා කළ හිටපු සිංහල සොල්දාදුවෙකුගේ පෙම්වතිය සොයා යාමේ වුවමනාවෙන් පෙළෙයි. චිත්‍රපටයෙහි මුඛ්‍ය කතාවෙහි හඳගම සහ කේසවරාජන් එම තරුණිය සොයා යති. සැබෑ යථාර්ථය තුළ සිටින පුද්ගලයන් දෙදෙනෙකු වන හඳගම සහ කේසවරාජන් චිත්‍රපටය තුළ ප්‍රබන්ධිත චරිත ලෙස ඉදිරිපත් කෙරේ) කියවන්නේ අධි-අහමීය අණට[iii] **(super-egoic injunction)** යටත් වීම නිසා ඔහු විසින් මිය ගිය සෙබලාගේ පෙම්වතිය වන යසෝ සොයා යන බවයි. සුපිරි අහමේ මෙහෙයවීම පිට හඳගමගේ ආධාරයෙන් දුෂ්කර ගමනක යෙදෙන කේසාට හමුවන්නේ තම දෙවන විවාහයෙන් ගැබ්බර ව සිටින ගැහැනියක මිස ඔහුගේ ෆැන්ටසි රූපය නොවේ. එසේ ම ඔහු හඳගමගේ ***අනෙකා*** නම් චිත්‍රපටයේ එන ත්‍රීරෝද රථ රියැදුරු තරුණයාගේ චරිතය කියවන්නේ ද තම අවිඥානික ආශාවේ ෆැන්ටසි වස්තුවක් වන ගැහැනිය සොයා යන අශ්ශීල ආශාවක් විසින් මෙහෙයවෙන්නෙකු ලෙස ය. විමුක්ති ජයසුන්දරගේ ***ඔහු*** නම් කොටසෙහි එන සිංහල ගුරුවරයා ද ඔහු දකින්නේ මෙසේ අධි-අහමීය අශ්ශීල ආශාවකට යටත් වන්නෙකු ලෙස ය. මෙම කියවීම අපගේ අධ්‍යයනයට සම්බන්ධ වන්නේ චරිත මනෝවිශ්ලේෂණය කිරීම හරහා මතු කරන ප්‍රේක්ෂකයාගේ ආශාව පිළිබඳ ව වික්‍රමාරච්චි විසින් රැගෙන එනු ලබන ප්‍රවාදය නිසා ය. එහි දී වික්‍රමාරච්චි පෙන්වා සිටින්නේ මෙම චරිතවල විපරීත ආශාවන් විසින් ප්‍රේක්ෂකයාගේ ආශාව ඔහුට/ඇයට මුණ ගැස්වීම හරහා "යථාර්ථයේ ප්‍රබන්ධ මානය මුණගස්වන්නේ ය" යන අදහසයි. මෙහි දී වික්‍රමාරච්චි විසින් ප්‍රේක්ෂකයා සහ සිනමා යාන්ත්‍රණය අතර ඇති දේශපාලනික සබඳතාව ඉස්මතු කළ ද රූපය සහ එහි විමර්ශකය අතර සම්බන්ධය කෙරෙහි අවධානය යොමු කරන්නේ නැත. ඔහු පඨිතය විසින් ගොඩනගන යථාර්ථයෙහි ප්‍රබන්ධිත ස්වරූපය වෙත අවධානය යොමු කරන විට එම පඨිතයෙහි රූපය සහ එය විසින් සලකුණු කෙරෙන යථාව (real) අතර සම්බන්ධය මඟහැරී යයි. මීට වෙනස් ලෙස මෙම අධ්‍යයනය මගින් සිදු කෙරෙන්නේ, චරිත මනෝවිශ්ලේෂණය කරනු වෙනුවට පඨිතය තුළ ම ද්වීයත්වයක් **(duality)** බිහි කරන උත්ප්‍රාසය යන මානය සැලකිල්ලට ගැනීමෙන්, සරල සංහිඳියා කතිකාවක් වෙත දක්වන ප්‍රතිරෝධයක් ලෙස අප මෙම චිත්‍රපටය කියවන්නේ කෙසේ ද යන ප්‍රශ්නය ඇසීමයි. කිසලොව්ස්කිගේ වාර්තා චිත්‍රපට නිර්මාණය පිළිබඳ අත්දැකීම මෙහි දී වැදගත් වන්නේ යථාර්ථයෙහි ප්‍රබන්ධමය මානය පවත්වා ගැනීම අවශ්‍ය යයි අප තර්ක කරනා මෙහොතේ දී ම ඒ සඳහා පාදක වන රූපය සහ යථාව අතර සම්බන්ධය, එනම් රූපයෙහි සද්භාවවේදය පිළිබඳ ප්‍රශ්නය අපට ඇසීමට සිදුවීම ය. මෙම අධ්‍යයනය මඟින් අවධානය යොමු කර ඇත්තේ මෙම ගැටලුව කෙරෙහි ය.

උපාලි අමරසිංහ (අමරසිංහ, 2018) විසින් රචනා කරන ලද 'තුන්දෙනෙක් **Him, Her, the Other**: මිනිස්කම අහිමි වීම පිටුපස ඇති දේශපාලන ප්‍රශ්නය නිරාවරණය කිරීමේ අභියෝගය' නම් ලිපියෙහි චිත්‍රපටයෙහි දේශපාලනය පිළිබඳ ව වඩා ඍජු මැදිහත්වීමක් දැකිය හැකි ය. චිත්‍රපටයෙහි රූපරාමු සහ එහි රූපමය වින්‍යාසය කෙරෙහි වඩාත් අවධානයකින් ලියවී ඇති මෙම ලිපියෙහි චිත්‍රපටය කියවනු ලබන්නේ "සහජීවනයෙන් ජීවත් වන්නට ඕනෑකමක් තිබේ නම් අඩු වශයෙන් තනි තනි ප්‍රජාවන් වශයෙන් අප තුළ ඇති මෙවැනි


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දෘෂ්ටිවාදාත්මක විශ්වාසයන් උඩු යටිකුරු කිරීමට'' අවශ්‍ය කරන "ලාලසාව සපයන'' චිත්‍රපටයක් ලෙස ය. දෘෂ්ටිවාදාත්මක තලයේ දී මෙම ප්‍රශ්න කිරීම අත්‍යවශ්‍ය වුව ද වර්තමාන දේශපාලනික යථාර්ථය තුළ එම දෘෂ්ටිවාදාත්මක ප්‍රශ්න කිරීමට අප ව යොමු කරවන රූපය යනු අහිංසක දෙයක් නොවේ. ඒ වෙනුවට රූපයෙහි සද්භාවවේදය සහ එහි දේශපාලනය පිළිබඳ ව ප්‍රශ්නකිරීමටත්, එය විසින් විමර්ශනය කරනු ලබන ජීවිත කෙරෙහි සමාජීය සහ පුද්ගලික ලෙස අප වගකියන්නේ කෙසේ ද යන ප්‍රශ්නයත් මෙම අධ්‍යයනය මගින් ප්‍රශ්න කෙරේ.

තවත් බොහෝ අන්තර්ජාල සහ පුවත්පත් විචාර අතරින් ඉහත විචාර දෙක උපුටා දක්වූයේ චිත්‍රපටය පිළිබඳ ව ඇති වූ සංවාදයේ ස්වරූපය සලකුණු කිරීමට ය. මෙම චිත්‍රපටයට පාදක වන්නේ මනෝවිශ්ලේෂණය සහ සිනමා න්‍යායෙහි එන රූපයෙහි සද්භාවවේදය පිළිබඳ අදහසයි. රූපයෙහි සද්භාවවේදය පිළිබඳ ව පහතින් සාකච්ඡා කර ඇත. එමෙන් ම මනෝවිශ්ලේෂණයෙන් උපුටා ගන්නා වැලපුම සහ මෙලන්කෝලියාව පිළිබඳ අදහස විශ්ලේෂණය තුළ සාකච්ඡා කර ඇති බැවින්, මෙහි දී මෙම අධ්‍යයනයෙහි යටින් දිවෙන මනෝවිශ්ලේෂණයෙන් උපුටා ගත් ප්‍රධාන අදහස් කිහිපයක් සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය. මනෝවිශ්ලේෂණයෙහි ප්‍රධාන අදහසක් වන අවිඥානය යන්න මෙම අධ්‍යයනය තුළ යොදා ගන්නා ආකාරයත්, සංකේතීය පිළිවෙළ සහ යථාව යන සංකල්ප ආශ්‍රයෙන් අභව්‍යතාව **(impossibility)** යන්න තේරුම් ගෙන ඇති ආකාරයත් පැහැදිලි කෙරේ. එහි දී මෙම අධ්‍යයනයට අදාළ වපසරිය තුළ පමණක් මෙම සංකල්ප සාකච්ඡා කෙරෙන බැවින් මනෝවිශ්ලේෂණ න්‍යාය තුළ අතිශය සංකීර්ණ වන මෙම සංකල්පවල සියලු පැතිමානයන් මෙහි දී ආවරණය නොවනු ඇත. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් විසින් හඳුන්වා දෙන ලද අවිඥානය යන සංකල්පය රොබර්ට් ස්ටෑම් විසින් මෙසේ නිර්වචනය කර දක්වයි: "ඉතාමත් පොදු අර්ථයෙන් ගත් කල, අවිඥානය යනුවෙන් හැඳින්වෙන්නේ ඍජු නිරීක්ෂණයන්ට යටත් නොවන එහෙත් සවිඥානික ක්‍රියාවලීන් සහ චර්යාවන් මත එය විසින් ඇති කෙරෙන ආචරණයන් හරහා හඳුනාගත හැකි මානසිකයෙහි **(the psyche)** අංශයයි" (Stam 1992:127). අවිඥානය යන්න ඇති වන්නේ ම අපගේ ආශාවන් යටපත් කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස ය. එනම් අවරෝධනය (repression) විසින් සවිඥානික ව අප සිතන චෛතසික ලෝකයට ඇතුළත් කරගත නොහැකි ආශාවන් යටපත් කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස අවිඥානය ඇති වේ. අපට එය ඍජු ව නිරීක්ෂණය කළ නොහැකි ය. එහෙත් එහි ආචරණයන් නිරීක්ෂණය කළ හැකි ය. ශාක් ලකාන් විසින් අවිඥානය පිළිබඳ ව කරන ලද තේරුම් කිරීමේ දී අවිඥානය භාෂාවක් ලෙස ව්‍යුහගත වී ඇතැයි පැවසී ය. මෙයින් අදහස් වන්නේ අවිඥානය යනු කිසියම් රහස්, ගුප්ත, යටපත් කරන ලද සිතිවිලි දාමයක් නොව භාෂාවක ආකාරයෙන් ව්‍යුහගත වූ , අපට භාෂාව තුළ ම හඳුනාගත හැකි, භාෂාවෙහි හිදැස් අතර මතුවන, එහි ආචරණයන් විසින් එහි පැවැත්ම පිළිබඳ ව අපට හඟවන මානසික පැවැත්මක් බවයි[සඬ]. සිනමා විශ්ලේෂණයේ දී බොහෝ විට අප දකින චරිත විශ්ලේෂණ, එම චරිතවල අවිඥානික ආශාව පිළිබඳ විශ්ලේෂණ බවට පත්වනු අපට දැකිය හැකි ය. ඒ ඒ චරිතයෙහි කිසියම් චර්යාවක් තුළ එහි මර්දිත අවිඥානික සත්‍යය සෙවීමට විශ්ලේෂකයෝ උත්සාහ දරති. තවත් තලයක දී සිනමාවෙහි "පාරමනෝවිද්‍යාව" **(the metapsychology)** (Stam 1992:126) ලෙස හඳුනා ගන්නා න්‍යායගත කිරීම තුළ සිනමා යාන්ත්‍රණයෙහි ප්‍රතිඵලයක් ලෙස විෂයය **(subject)** එනම් සිනමා ප්‍රේක්ෂකයාගේ විෂයීයත්වය ගොඩනැගෙන්නේ කෙසේ ද යන්න විග්‍රහ කෙරේ (Stam 1992:126). එහෙත් මෙහි දී යාන්ත්‍රණයක් ලෙස සිනමාව විසින් ප්‍රේක්ෂකයාගේ ආශාව, මනඃකල්පිතයන්, මර්දිත අන්තර්ගතයන් මෙහෙයවමින් ප්‍රේක්ෂක අවිඥානය පිළිබඳ ව කිසියම් සලකුණු කිරීමක් කරන්නේ කෙසේ ද යන්න විශ්ලේෂකයෙකුට සෙවිය හැකි ය.

ෆ්‍රොයිඩ්ට මෙන් ම ලැකාන්ට ද අවිඥානය සෑම විට ම සාමූහික ය. එක් එක් තනි තනි පුද්ගලාභ්‍යන්තරයෙහි ඇති දෙයක් ලෙස එය නොසැලකේ. ඒ වෙනුවට එය සෑම විට ම අනෙකා සමඟ (අවසාන විග්‍රහයේ දී භාෂාව සමඟ) ඇති වන සම්බන්ධයේ ප්‍රතිඵලයක් වන අතර එය ව්‍යුහගත වන්නේ අනෙකාගෙනි. විෂයය "අර්ථයෙහි වසඟයට කොටුවන්නේය යන්න වෙනත් විවිධ ලෙස ලැබුණු අර්ථ සමඟ එම අර්ථය කතිකාව තුළ සංහිඳියාගත කිරීමෙන් ද එය සන්නිවේදනය කිරීමෙන් ද වෙනස් වන්නේ " යයි ලැකාන් පවසයි (Lacan 1981:63). ඔහු පෙන්වා දෙන්නේ "කථනයෙහි භූමිකාවෙහි නාභිය වන්නේ අනෙකාගේ විෂයීයත්වයයි" (Lacan 1981:64) යනුවෙනි. ලැකාන් මෙය ඉදිරිපත් කරන්නේ ආශාවේ රූප සටහන පිළිබඳ ව කරන විග්‍රහය අතරතුර දී ය. එනම් කිසියම් විෂයයක ආශාව යනු හුදෙක් පුද්ගලානුබද්ධ අත්දැකීමක් නොව සෑම විට ම කතිකාව විසින්, භාෂාවේ අනෙකා විසින් ව්‍යුහගත කරන්නකි. මෙය ලැකාන් පැහැදිලි කරන්නේ සංකේතීය පිළිවෙළෙහි ප්‍රාග්-විෂයික ස්වරූපය ඇසුරිනි. පසු කාලීන 11 වන සම්මන්ත්‍රණයේ දී ඔහු මෙය පැහැදිලි කරයි: "කිසිඳු අත්දැකීමකට පෙර, කිසිඳු පුද්ගල අනුමිතියකට **(deducton)** පෙර, සමාජ අවශ්‍යතාවලට පමණක් සම්බන්ධ වන සාමූහික අත්දැකීම් ඒ මත ලේඛනය වීමටත් පෙර, යම් කිසිවක් විසින් මෙම ක්ෂේත්‍රය සංවිධානය කරනු ලබයි" (Lacan 1981:20). ලැකාන් මෙය විස්තර කරනුයේ "අවිඥානය භාෂාවක් ලෙස ව්‍යුහගත වී ඇත" යන ප්‍රවාදය පැහැදිලි කරමිනි (එම). ප්‍රධාන ලෙස ම මෙහි දී මා මතු කිරීමට උත්සාහ කරනුයේ අවිඥානයෙහි ඇති සාමූහික, පුද්ගලානුබද්ධ නොවන ස්වරූපයයි. මෙය සිනමා පඨිතයක් කියවීමේ දී වැදගත් වන්නේ සිනමා න්‍යාය මගින් ගොඩනැගෙන පාර-පුද්ගල අවිඥානය පිළිබඳ සාකච්ඡාවෙහි මනෝවිශ්ලේෂණාත්මක පදනම පැහැදිලි කිරීමට ය.

එබැවින් සිනමා යාන්ත්‍රණයෙහි ගොඩනගන ප්‍රේක්ෂක විෂයය සෑම විට ම තනි තනි ප්‍රේක්ෂකයෙකුගේ අවිඥානය වෙනුවට සාමූහික අවිඥානයක් වෙත අප ව යොමු කරවයි. සිනමා යාන්ත්‍රණය විසින් ගොඩනගනු ලබන පඨිතය පවතින සංකේතීය ලෝකයේ කිසියම් වරනැගීමක් වන තාක් එය දෘෂ්ටිවාදාත්මක වෙයි. ඉහත සංකල්පගත කිරීමේ


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ධාරාවන් දෙක අප එකට සලකන කල පෙනී යන්නේ සිනමාව දෘෂ්ටිවාදාත්මක යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක වන විට, එම යාන්ත්‍රණය විසින් ගොඩනගනු ලබන විෂය ද එම දෘෂ්ටිවාදී ක්‍රියාවලියෙහි ම කොටසක් වන බවයි. රොබර්ට් ස්ටෑම් පවසන්නේ මේ පිළිබඳ ව දීර්ඝ විවාදයක් 1970 දශකයේ සිනමා න්‍යායවේදීන් අතර ක්‍රියාත්මක වූ බවයි (Stam 1992:155). විශේෂයෙන් ෂෝන්-ලුවී බෝද්‍රි වැනි සිනමා න්‍යායවේදීන් මේ පිළිබඳ ව දීර්ඝ ලෙස සාකච්ඡා කර ඇත. විශේෂයෙන් ම ප්‍රධාන ධාරාවේ හොලිවුඩ් චිත්‍රපට නිදසුන් කරමින් මෙම තර්කය ගොඩනැගී ඇත. මේ සම්බන්ධ විශේෂිත ගොඩනැංවීමක් ස්ත්‍රීවාදී ආස්ථානයෙන් ලෝරා මුල්වී වැනි න්‍යායවේදිනියක් පෙන්වා දෙයි. උදාහරණයක් ලෙස ඇය හොලිවුඩ් සිනමාව දකින්නේ පිතෘමූලික දෘෂ්ටිවාදයන් ජනනය කරන, ඒ හරහා ස්ත්‍රිය ව ආශාවේ වස්තුවක් සේ ගොඩනගන යාන්ත්‍රණයක් ලෙසයි. එමෙන් ම, ක්‍රිස්ටියන් මෙට්ස් ඇතුළු බොහෝ සිනමා න්‍යායවේදීන් මෙසේ න්‍යායගත කර ඇත.

එහෙත් මෙහි දී මනෝවිශ්ලේෂණයෙහි ම එන තවත් අදහසක් වන යථාව **(real)** යන්න ද සැලකිල්ලට ගෙන ඇත. සිනමාව දෘෂ්ටිමය පඨිතයක් ලෙස සලකන්නේ නම්, අන් සෑම පඨිතයක් මෙන් ම එය ද ව්‍යුහගත වී ඇත්තේ එහි අනේකත්වය වන අඩුව **(lack)** විසිනි. ක්‍රිස්ටියන් මෙට්ස් ඇතුළු මුල්කාලීන සිනමා න්‍යායවේදීන් විසින් සිනමා පඨිතය සංකල්පගත කරන ලද්දේ කිසියම් ආකාරයක පූර්ණ අර්ථයක් ගොඩනැගිය හැකි පරිකල්පනීය **(imaginary)** සහ සංකේතීය **(symbolic)** අර්ථ පද්ධතියක් ලෙස ය. ඒ තුළ පඨිතය විසින් ගොඩනගනු ලබන අර්ථවල චංචලත්වය **(play)**[v] සහ සුවිශේෂ විෂයයක් ලෙස සෑම ප්‍රේක්ෂකයෙකුගේ ම ආශාවෙහි ඇති අනන්‍යභාවය **(uniqueness)** මෙහි දී මගහැරෙනවා පමණක් නොව, එයින් සෑම ප්‍රේක්ෂකයෙකු ම නිශ්ක්‍රිය ලෙස පඨිතය පරිභෝජනය කරන්නෙකු බවට පත් කෙරේ. මනෝවිශ්ලේෂණය තුළ මනුෂ්‍ය විෂයය ක්‍රියාත්මක වන රෙජිස්තර තුනක්, එනම් පරිකල්පනීය ලෝකය, සංකේතීය ලෝකය සහ යථාව පිළිබඳ ව සාකච්ඡා කෙරේ (Lacan 1981:53). මෙහි දී සංකේතීය ලෙස, එනම් භාෂාව හරහා අර්ථ පද්ධතියට ඇතුළු නොවුණු නොපවතින්නක් ලෙස පවතින දෙය යථාව වේ. වෙනත් ලෙසකින් කියන්නේ නම්, සෑම මිනිස් විෂයයක් ම ව්‍යුහගත කරන, එම විෂයට ම සංකේතීය නොවන, එහෙත් මානසික පැවැත්මක් ලෙස පවතින තත්ත්වය යථාව වේ. එය සෑම විට ම පවතින්නේ අනාගත විභවතාවක් ලෙස ය. මනෝවිශ්ලේෂණය තුළ මෙන් ම පොදුවේ දර්ශනය තුළ ද අභව්‍යතාව **(impossible)** යන්න යෙදෙන්නේ මෙම අනාගත විභවතාවක් ඇති, එහෙත් නොපවතින්නක් ලෙස පවතින්නක් ලෙස ය[ඩස]. මෙය සිනමා පඨිතයක් තුළ බොහෝ විට පවතින්නේ රූප ඛණ්ඩයේ **(shot)** අඩුවක් හෝ අතිරික්තයක් ලෙස ය. එනම් එහි අර්ථයෙහි කිසියම් බාධාවීමක් තුළ ය. මනෝවිශ්ලේෂණ විධික්‍රමය තුළ ම අවිඥානය සලකුණු කෙරෙන්නේ මෙසේ කිසියම් කතිකාවක ඇති අඩුවක්, හිදැසක්, විරුද්ධාභාසයක් යනා දී ලෙස සංකේතීය දාමයේ **(symbolic chain)** ඇති හිස්තැන් සලකුණු කොට, විශ්ලේෂිතයා ඒවාට ලබා දෙන අර්ථ ගොඩනැංවීමෙනි. සිනමා පඨිතයක් කියවීමේ දී එසේ විශ්ලේෂිතයෙකු නැති වුව ද අපගේ අර්ථකථනය යනු අවිඥානික ලෙස (සාමූහික ව) පවතින අර්ථ යළි ගොඩනැංවීකි.

මෙම අධ්‍යයනය පුරා මනෝවිශ්ලේෂණයෙහි සංකල්ප කිහිපයක් ඍජු ව යොදා ගෙන ඇත. එනම් චාල්ස් සැන්ඩර්ස් පියර්ස් විසින් හඳුන්වා දෙන ලද දර්ශීය සංඥාව යන සංකල්පය සහ අන්ද්‍රේ බසැන්ගේ රූපයෙහි සද්භාවවේදය යන අදහස් දෙක ම මනෝවිශ්ලේෂණය ඇසුරින් යළි කියවා ඇත. උදාහරණයක් ලෙස ඡායාරූපයක විමර්ශකය **(referant)** සහ දර්ශීය සංඥාවක් අතර සම්බන්ධය න්‍යායගත කිරීමේ දී එහි අවිඥානික අරුත්, එම වෙනස තුළ ගොඩනැගෙන යථාවේ මානය මෙම අධ්‍යයනය තුළ අර්ථගන්වා ඇත්තේ ඉහත සඳහන් කළ අභව්‍යතාව හෝ නොපැවැත්මක් ලෙස පවතින දෙය පිළිබඳ ව කරන කියවීමකිනි. එහි දී හුදෙක් චරිත මනෝවිශ්ලේෂණය කිරීමක් නොව, පඨිතයෙහි සංකේතීය ගොඩනැංවීමෙහි හිදැස් **(gaps)**, පරස්පරතා, සහ නිහඬ කිරීම් හරහා මතුවන එහි අර්ථ, එහි මුඛ්‍ය අර්ථයට වෙනස් අර්ථ ගොඩනැංවීමට යොදා ගන්නා ලදී. එමෙන් ම පොදුවේ ගත් කල රූපමය භාෂාව හරහා එහි අවිඥානික ගතිකයන් කියවීමේ පොදු උත්සහයක් දරා ඇත. පහත දැක්වෙන න්‍යායික රාමුව පිළිබඳ සාකච්ඡාවේ දී ද, චිත්‍රපට විශ්ලේෂණයේ දී යොදා ගන්නා න්‍යායන් සඳහන් කිරීමේ දී ද සිනමා න්‍යාය සහ මනෝවිශ්ලේෂණයෙන් මෙම අධ්‍යයනය ලබාගන්නා එළඹුම් වඩාත් පැහැදිලි කෙරෙනු ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයෙහි ඇරඹුම් ලක්ෂ්‍යය වන්නේ ජාතික සමගිය සහ සංහිඳියාව සිය මුඛ්‍ය තේමාව කොටගත් චිත්‍රපටයක් වන ***තුන්දෙනෙක්*** චිත්‍රපටය කෙතෙක් දුරට එම සංහිඳියා කතිකාව ඇතුළත පිහිටුවිය හැකි ද යන ප්‍රශ්නයෙනි. ඒ හරහා රූපය සහ සමාජය අතර සම්බන්ධයත්, රූප හරහා ගොඩනැගෙන සමාජ සබඳතා පිළිබඳවත් සාකච්ඡා කෙරේ. සමාජ විද්‍යාත්මක ව ගත් කල අපට මෙම වර්ගයේ චිත්‍රපට සමාජ ගැටලු චිත්‍රපට ශානරයට අයත් වන්නේ යයි තර්ක කළ හැකි ය. අධ්‍යයනයේ න්‍යායික පදනම වන්නේ කෙතෙක් දුරට මෙම චිත්‍රපටය උක්ත ප්‍රවර්ගයට අයත් වන්නේ ද යන්න සෙවීමෙන් චිත්‍රපටය විසින් සාමය සහ සංහිඳියාව පිළිබඳ ව ජනනය කෙරෙන අදහස් කවරේ ද යන්න සෙවීමයි. මෙහි පර්යේෂණයේ සද්භාවවේදී පදනම **(ontological basis)** වන්නේ යථාර්ථය විෂයබද්ධ **(subjective)** ලෙස අර්ථ විවරණය කළ හැකිය යන ප්‍රත්‍යක්ෂ-මූලික නොවන **(non-positivist)** එළඹුමයි. එහි දී මෙම අධ්‍යයනයේ ඥානවිභාගාත්මක එළඹුම **(epistemological approach)** වන්නේ අර්ථකථනවේදයයි **(hermeneutics)**. ඒ යටතේ චිත්‍රපටය පිළිබඳ ව දෘෂ්ටිමය විශ්ලේෂණයක් සිදු කෙරේ. එහි දී සිනමා පඨිතය පිළිබඳ මූලික කියවීමට පදනම වන්නේ සිනමා න්‍යායෙහි එන අන්ද්‍රෙ බසැන් විසින් ඡායාරූපමය රූපයේ සද්භාවවේදය පිළිබඳ ව ඉදිරිපත් කරන අදහසයි (මෙම අදහස පහත න්‍යායික රාමුව යන කොටස තුළ වඩාත් සවිස්තර ව සාකච්ඡා කෙරේ.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මෙම පර්යේෂණය තුළ ***"තුන්දෙනෙක්"*** චිත්‍රපටයෙහි පඨිතය මානයන් දෙකක් හරහා අර්ථකථනය කෙරේ. තුන් ඈඳුතු චිත්‍රපටයෙහි එන එක් එක් කොටස කෙතෙක් දුරට සමාජ ගැටලු චිත්‍රපටයක් ලෙස හඳුනාගත හැකි ද යන්න මුලින් ම විග්‍රහ කෙරේ. එහි දී සංහිඳියාව පිළිබඳ චිත්‍රපටයක් වශයෙන් එය කෙතෙක් දුරට ජාතික සංහිඳියාව පිළිබඳ උපදේශාත්මක දෘෂ්ටියකින් ඉදිරිපත් කෙරේ ද යන්න සලකා බැලේ. දෙවනුව එක් එක් චිත්‍රපටයෙහි එන උත්ප්‍රාසාත්මක මානය විග්‍රහ කෙරේ. එනම් ඒ ඒ චිත්‍රපටයේ රූප මෙන් ම විශේෂිත ලෙස චිත්‍රපට තුනෙහි ම දැකිය හැකි ඡායාරූප සහ එහි විමර්ශකය අතර සම්බන්ධය විග්‍රහ කෙරේ. රූපයෙහි සද්භාවවේදය යන එළඹුම හරහා, විශේෂයෙන් ම එම ඡායාරූප වූ කලි විමර්ශක සංඥා **(indexical sign)** ලෙස සලකා, එම රූපවල සද්භාවවේදී මානය මෙන් ම දේශපාලනික මානය ද සලකා බැලෙයි. එහි දී චිත්‍රපට තුනෙහි ම ඒ ඒ ඡායාරූපය විසින් හඟවන දර්ශීය සංඥාව සහ එහි විමර්ශකය අතර සම්බන්ධය ගොඩනැගීමේදී මෙම පඨිතවල මුලින් හඳුනාගත් සමාජ ගැටලු චිත්‍රපට ශානරයට අයත් ලක්ෂණ ඇතුළතින් ම බිඳවට්ටවන **(undermine)** අයුරු නිරීක්ෂණය කෙරේ. විශේෂයෙන් ම ගත් කල ඡායාරූපය එහි විමර්ශකයෙහි මුල් සන්දර්භයෙන් ගැලවී රූප වෙළඳපොළ, කතා ජාවාරම්කාර මාධ්‍යවේදය හෝ දේශපාලනික භූමිදර්ශන යනාදී වෙනත් සන්දර්භයකට මාරුවන මොහොතේ දී එම මැකී ගිය ඉතිහාසය තුළ එහි විමර්ශකය කිසියම් ආකාරයක පාවා දීමකට ලක්වන ආකාරය අපට නිරීක්ෂණය කළ හැකි ය. මෙය ඉහත විවිධ සන්දර්භ අතර ගොඩනැගෙන බන්ධකයක් **(nexus)** බවට මෙහි දී ඡායාරූපමය රූපය **(photographic image)** පත් වේ. මෙහි දී අර්ථකථනවේදීමය ලෙස පඨිතයෙහි ඇති ඒකීය සහ ස්ථාවර අර්ථ සේ පෙනෙන (විශේෂයෙන් ම සංහිඳියාවට අදාළ අර්ථ ලෙස පහසුවෙන් හඳුනාගතහැකි අර්ථ) අස්ථාවර සහ පාවෙන අර්ථ බවට පත් කිරීම හරහා, චිත්‍රපටියෙහි මුඛ්‍ය දේශපාලනික හැඟවුම් ඉක්මවා ගිය වෙනත් අර්ථ පද්ධතීන් මතු කර ගැනීමට උත්සාහ කෙරේ. අවසාන වශයෙන් එම න්‍යායික විග්‍රහය ඔස්සේ මුලින් හඳුනාගත් උපදේශාත්මක සමාජ ගැටලු චිත්‍රපට ලක්ෂණවල දේශපාලනික ඌණිතභාවය හඳුනා ගනිමින්, අධිපතිත්වයේ ආස්ථානයක සිට ගොඩනංවන සංහිඳියා කතිකාවන්ගේ ව්‍යාජ බව ද රූපය විසින් මතුකරන උත්ප්‍රාසයන් හරහා ගොඩනැගිය හැකි නව දේශපාලනික අරුත් ද ගවේෂණය කෙරේ.

## න්‍යායික රාමුව

චිත්‍රපටයෙහි මුඛ්‍ය පණිවිඩය නිසා අපට මෙම චිත්‍රපටය එක විට ම සමාජ ගැටලු චිත්‍රපටය **(social problem film)** යන ශානරය තුළ පිහිටුවීමට හැකි වේ. සමාජ ගැටලු චිත්‍රපටයක මූලික ලක්ෂණයක් වන්නේ කිසියම් සමාජ ගැටලුවක් පිළිබඳ ව ඒ වටා ගොඩනැගුණු කතා වින්‍යාසයකින් යුතු ව, එමෙන් ම එම ගැටලුව සම්බන්ධයෙන් කිසියම් උපදේශාත්මක පණිවිඩයක් සහිත ව නිර්මාණය වීමයි. මෙම ශානරය පිළිබඳ ව නිර්වචනාත්මක විග්‍රහයක යෙදෙන ක්‍රිස් කැග්ල් පෙන්වා දෙන්නේ ශානරයක් ලෙස ගත් කල සමාජ ගැටලු චිත්‍රපටය වෙනත් ශානර මෙන් එහි ශානරමය සුවිශේෂත්වය පිළිබඳ ව "ස්වයං-සවිඥානික ලෙස සංසරණය නොවුන ද'' චාල්ස් මැලැන්ඩි විසින් මෙම ශානරය පිළිබඳ ව ඉදිරිපත් කරන නිර්වචනයෙන් අපට ඒ පිළිබඳ අධ්‍යයනය ආරම්භ කළ හැකි බවයි. එය "සමාජ ගැටලුවක් ඉදිරිපත් කිරීම ඇතුළත් වන හෝ එහි කේන්ද්‍රීය අවධානය හෝ ගැටුම සමාජ ගැටලුවකට සම්බන්ධවීම යන ආඛ්‍යානමය ලක්ෂණයෙන් යුක්ත ය'' (Malandi, cited in Cagle 2016:2). කැග්ල් විසින් මැලැන්ඩිව දීර්ඝ ලෙස උපුටා දක්වමින් සමාජ ගැටලු චිත්‍රපටයක පහත ලක්ෂණ උධෘත කරයිඃ

> "සමාජ ගැටලුව සමකාලීන පසුබිමක පිහිටා ඇත. එය සාමාන්‍යයෙන් සජීව වන්නේ වින්දිතයා/වින්දිතයන් කෙරෙහි හෝ ගැටලුවට විරුද්ධ ව සටන් කරන්නා/කරන්නන් කෙරෙහි හෝ මානුෂික සැලකිල්ලක් දක්වන අතරම යහපත් ආධ්‍යාශයකින් යුත් ලිබරල් සමාජ ප්‍රතිසංස්කරණ හරහා අදාළ ප්‍රශ්නයට විසඳුම් ලබා දීමට හෝ ප්‍රශ්නය තුරන් කිරීමට හැකි වෙතැයි යන ව්‍යංග උපකල්පනයකිනි'' (Malandi, cited in Cagle 2016:2).

මැලැන්ඩි විසින් ඉදිරිපත් කරනු ලබන මෙම ලක්ෂණවලට තවත් ලක්ෂණ දෙකක් කැග්ල් එකතු කරයිඃ"උපදේශාත්මක ස්වරයක් ද බැලූබැල්මට වාස්තවික සේ පෙනෙන කතා කීමේ ශෛලිය හා නොගැළපෙන ආවේදනාත්මක ආකර්ෂණයක් ද සමාජ ගැටලු චිත්‍රපටිවල නිරන්තරයෙන් පවතියි'' (Cagle 2016:2) කැග්ල් සහ මැලැන්ඩිගේ නිර්වචනය ඇසුරින් ***තුන්දෙනෙක්*** චිත්‍රපටය සමාජ ගැටලු චිත්‍රපටයක් ලෙස හඳුනා ගත හැකි ය. ජාතීන් අතර සංහිඳියාව මෙහි ප්‍රධාන තේමාව වන අතර ශ්‍රී ලංකාවේ ජනවර්ග අතර අන්‍යෝන්‍ය දේශපාලනික සහ සංස්කෘතික අවබෝධයක් ඇති කර ගැනීම එහි පරමාර්ථය වේ. එමෙන් ම, එහි ආවේදනාත්මක අන්තර්ගතය **(affective content)** වන්නේ පඨිතය තුළ විදාරණය වන මිනිස් සබඳතා ය. ***තුන්දෙනෙක්*** චිත්‍රපටය සමාජ ගැටලු චිත්‍රපටයක් ලෙස ඉදිරිපත් කරන්නේ මෙම නිර්වචනය මත පිහිටා ය.

රූපයේ සද්භාවවේදය පිළිබඳ අන්ද්‍රේ බසැන්ගේ අදහස මෙම අධ්‍යයනයට කේන්ද්‍රීය න්‍යායික පදනමක් සපයයි. ඔහු පවසන පරිදි රූපමය කලාවන් යනු කාලය විසින් ජීවිතය මත ඇති කරන බාදනය ඉක්මවා යෑමට දරන උත්සාහයකි.

> "එනයින් ගත් කල, කාලය ඉක්ම යාමට එරෙහි ආරක්ෂණයක් සැපයීම හරහා මිනිසා තුළ ඇති මූලික මානසික අවශ්‍යතාවක් එය විසින් ඉටු කළේ, මරණය යනු කාලයෙහි විජයග්‍රණය වන බැවිනි. ඔහුගේ ශාරීරික පෙනුම කෘත්‍රිම ලෙස සංරක්ෂණය කිරීම මඟින් එය කාලයේ ගලා යාමෙන් පිළිවෙළ සහගත ලෙස ඩැහැගෙන, ජීවිතයේ ග්‍රහණයට ගන්නේ යයි පැවසිය හැකිය'' (Bazin 2005:9).

ඡායාරූපයක් ගන්නා මොහොතේ දී එම රූපය තුළ සලකුණු වන ශරීරයෙහි පැවැත්ම, එම රූපය තුළ සදාකාලික ව ගල්ගස්වන බව, එනම් කාලය විසින්


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ශරීරය මත ඇති කරන දිරායාම ඡායාරූපය විසින් අතික්‍රමණය කරන බව බසැන්ගේ අදහසයි. ඡායාරූපමය රූපයේ සද්භාවවේදය යනුවෙන් බසැන් හඳුන්වන්නේ මෙයයි. එහෙත් මෙම රූපය හා ඒ මත නිරූපණය වන ශරීරය අතර සම්බන්ධය කුමක් ද? අප පොදු ව්‍යවහාරයේ දී දකින්නේ ඡායාරූපයක් විසින් අදාළ ශරීරය ප්‍රතිනියෝජනය **(representation)** කරන බවයි. එහෙත් බසැන්ගේ න්‍යායගත කිරීම හරහා අපට මෙම රූපයෙහි වෙනත් සද්භාවවේදයක් **(ontology)** හඳුනාගත හැකි ය. ඡායාරූපය එහි නියෝජිත වස්තුව හා දක්වන්නේ හුදු සංකේතීය සබඳතාවක් (එනම් ශරීරය වෙනුවට ඡායාරූපයේ පෙනී සිටීමක්) නොවේ. ඒ වෙනුවට ඡායාරූපය විසින් වස්තුව ආලෝක කදම්භයක් හරහා ආලේඛනය කරන මොහොතේ දී එය වස්තුවේ පැවැත්ම පිළිබඳ සාක්ෂියක් බවට පත් වේ (හරියට ඇඟිලි සලකුණක් හෝ සුළං දිශා දර්ශකයක් මෙන්). ෆිලිප් රෝසන් පෙන්වා දෙන්නේ බසැන්ගේ තේරුම් ගැනීම තුළ විමර්ශකයෙහි (referant) එනම් ඡායාරූපයේ පෙනී සිටින ශරීරයේ) පැවැත්ම පිළිබඳ දර්ශීය සංඥාවක් (indexical sign) බවට ඡායාරූපය/සිනමාව පත්වන බවයි. එනම් ඡායාරූපය විසින් විමර්ශකය ප්‍රතිනියෝජනය කරනු වෙනුවට එහි පැවැත්ම පිළිබඳ දර්ශකයක් **(index)** බවට එය පත්වෙන බවයි.

> "එහෙත් තවමත් බසැනියානු ප්‍රශ්නය වනු ඇත්තේ සද්භාවවේදී සිනමා විෂයට මේ අතරින් මූලික වනු ඇත්තේ කුමන පැතිකඩද යන්නයි, පිළිතුර වන්නේ දර්ශකත්වය (indexicality) යන්නයි. එනම් විෂයානුබද්ධ ග්‍රස්ථිය හා සම්බන්ධයෙන් ඡායාරූපමය රූපයට නව මට්ටමක විශ්වාසනීයත්වයක් ලබා දෙන්නේ එහි සංඥාමය භූමිකාව නිසා ය. සුවිශේෂ විමර්ශකයක් සහ හැඟවුම්කාරකය අතර ඇති සද්භාවවේදී සම්බන්ධය නිසා දර්ශීය සංඥාවක් බවට එය පත්වන බැවින්, හැඟවුම්කාරකය විසින් සෑම විටම විෂයට විමර්ශකයෙහි සැබෑ පැවැත්ම පිළිබඳ ව ප්‍රතික්ෂේප කළ නොහැකි සහතිකයක් සපයයි'' (Rosen 2003:49).

ඡායාරූපය විසින් එහි සිටින්නා නිරූපණය කරනු වෙනුවට, එම පුද්ගලයා සිටි බවට සංඥාවක් බවට එය පත් කරන විට එය පැවැත්මෙහි සාක්ෂ්‍යයක් බවට පත්වෙයි.[ඩසස] එහෙත් රෝසන් පෙන්වා දෙන පරිදි, ''මෙම ස්වංක්‍රීයව ගොඩනැගෙන රූප පිළිබඳ ව ප්‍රේක්ෂකයාගේ පූර්ව දැනීමක් මත ඒවා රඳා පවතියි. ඒ සැබවින්ම ඒවායේ පෙනුම පිළිබඳ දැනුමක් ලෙස නොව, එම සංඥා උත්පාදනය කෙරුණේ කෙසේද යන්න පිළිබඳ ව ඇති දැනුමක් ලෙසයි'' (Rosen 2003:50). මෙම චිත්‍රපටය පුරා ම දැකිය හැකි රූප, විශේෂයෙන් ඡායාරූප ඒවායේ මෙම දර්ශීය හැඟවුම්කාරකමය ස්වරූපය මකා දමා ඒවායේ ඉතිහාසය රූපයෙන් ගලවයි. එවිට සන්දර්භයෙන් මුක්තවන රූපය ඒවායෙහි විමර්ශකයා මෙන් ම ප්‍රේක්ෂකයා ද කිසියම් ආකාරයක පාවා දීමකට ලක් කරන ආකාරය මෙම අධ්‍යයනය මඟින් ගවේෂණය කෙරේ.

## පළමු කොටස

ප්‍රසන්න විතානගේ විසින් අධ්‍යක්ෂණය කරන ලද, අශෝක හඳගම සහ කේසවරාජන් නවරත්නම් රඟපෑමෙන් එක්වන ***ඇය*** යනුවෙන් නම් කර ඇති පළමු චිත්‍රපටයෙහි කතා ආඛ්‍යානය බැලූ බැල්මට බෙහෙවින් සරල ය. ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානය වෙනුවෙන් වීඩියෝරූප පටිගතකරණ ශිල්පියෙකු ලෙස ක්‍රියාකරන කේසා (සැබෑ ජීවිතයේ කේසවරාජන් ම මෙම චරිතයට පණ පොවයි) ප්‍රේක්ෂකයාට හමුවන්නේ සිංහල සොල්දාදුවන්ගේ රූප පටිගත කරමින් සිටිය දී ය. එහි දී අහුලා ගන්නා සොල්දාදුවෙකුගේ මුදල් පසුම්බියක තිබී ඔහුට සොල්දාදුවාගේ පෙම්වතියගේ (යසෝගේ) ඡායාරූපයක් හමු වේ. එහි ඇති දුරකථන අංකය හා සම්බන්ධ වී ඇය හා දොඩමලු වන ඔහු, ඇයගේ පෙම්වතා තවමත් ජීවතුන් අතර සිටින්නේ යයි ඇයට බොරුවක් කියයි. දිගින් දිගට ම ඇය හා දුරකතනයෙන් කතා කරමින් සිටින ඔහු, ඇය හා පෙමින් වෙළෙන අතර ඔහු දැන ගන්නේ ඇය දරුවෙකු ලැබීමට සිටින බවයි. මේ වන විට උත්සන්න වෙමින් තිබෙන යුද්ධය නිසා ඔහුට පළා යාමට සිදුවෙයි. එහෙත් යුද්ධයෙන් පසුව යාපනයේ චිත්‍රපටයක් රූ ගත කිරීමට පැමිණෙන අශෝක හඳගම සමඟ මිතුරු වන ඔහු, ඡායාරූපයේ සිටි තරුණිය සොයා යාමට හඳගමගේ සහය ලබා ගනියි. අවසානයේ දී ඔහුට හමුවන්නේ ඡායාරූපයේ දීප්තිමත් දෑස් සහිත ව සිටින රූමත් තරුණිය වෙනුවට, අව් කාශ්ඨකයට පිච්චී කේඩෑරි වී ගිය වෙනත් පුරුෂයෙකු හා විවාහ වී සිටින තරුණියකි. බලාපොරොත්තු සුන්වන කේසාට අවසානයේ ඉතිරිවන්නේ හඳගම සමඟ ඇති කරගත් මිත්‍රත්වය පමණකි.

මෙම චිත්‍රපටයෙහි කතා නායකයා එල්. ටී. ටී. ඊ. සාමාජිකයෙකු වුව ද ඔහු මනුෂ්‍ය ඝාතකයෙකු නොව මියගියවුන් ඡායාරූපගත කරන්නෙකි. සංහිඳියා කතිකාවකට අවශ්‍ය කරන වර්ගයේ ප්‍රමාණවත් තරමට සංකීර්ණ, එහෙත් සංවාදය අවුරනසුලු තරමට වරදකාරී නොවන චරිතයක් ලෙස කේසා ගොඩනැගීමටත්, ඒ හරහා ඔහුගේ මානුෂිකත්වය උලුප්පා දැක්වීමටත්, මිය ගිය සිංහල සොල්දාදුවන්ගේ රූප රැගත් මෙම දර්ශනය වැදගත් වෙයි. යුද්ධයෙහි රූප සංසරණ පද්ධතිය වෙත මියගියවුන්ගේ රූප මුදා හරින කේසා, සැබවින් ම සංවේදී, නිර්මාණකරුවෙකු වන අතර යුද්ධය නිසා ඔහුට එල්. ටී. ටී. ඊ. සංවිධානය වෙනුවෙන් සේවය කිරීමට සිදු වී ඇත. ඔහුගේ ප්‍රධානියා සහ ඔහු අතර වන සංවාදයන්ගෙන් පෙනී යන පරිදි, ඔහු සම්පූර්ණ ලෙස ම එල්. ටී. ටී. ඊ. යට නතු වී නැත. ඔහු සිංහල තරුණියකට, එය ද සිංහල සොල්දාදුවෙකුගේ පෙම්වතියකට පෙම් බඳියි. එයින් නොනැවතී අශෝක හඳගම සමඟ මිතුදමක් ආරම්භ කරයි. එය නිර්මාණකරුවන් දෙදෙනෙකු අතර වන ආදරණීය සම්බන්ධයක් ලෙස චිත්‍රපටය තුළ හුවා දක්වේ. බොහෝ වෙහෙස දරමින් හඳගම ද කේසා සමඟ තරුණිය සොයමින් ගමන් කරයි. සිංහලයෙකු සහ දමිළයෙකු අතර මෙම මිතුදම යනු පැවතිය හැක්කක් (possible) ලෙස පරිකල්පනය කිරීමට චිත්‍රපටය උත්සාහ කරන්නේ සමාජ ගැටලු චිත්‍රපටයක් වශයෙන් එය ජාතික සමගිය සහ සංහිඳියාව පිළිබඳ ව ගොඩනැගීමට උත්සාහ කරන ධනාත්මක කතිකාව


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නිසා ය. චිත්‍රපටයේ මුඛ්‍යාර්ථයට එම චරිත නිරූපණය අත්‍යවශ්‍ය වන නිසා ය. සමාජ විද්‍යාත්මකව ගත් කල, චිත්‍රපටය විසින් කේසාගේ චරිතය සහ කේසා සහ අශෝක හඳගම අතර මිත්‍රත්වය නිරූපණය කිරීමට පෙලඹෙන්නේ කිසියම් ධනාත්මක, අභව්‍යතාවයක් සහිත, උපදේශාත්මක ගුණයකින් යුත් මානුෂික සම්බන්ධය හුවා දැක්වීමට ය.

සමාජ විද්‍යාත්මක එළඹුමකින් ගත් කල අපට සරල ලෙස මෙය සමාජ ගැටලු චිත්‍රපටයක් ලෙස, සංහිඳියාව සහ ජාතික සමගිය පිළිබඳ චිත්‍රපටියක් ලෙස දැක්විය හැකි වුව ද සිනමා න්‍යාය ආශ්‍රයෙන් ගත් කල චිත්‍රපටයෙහි මෙම මුඛ්‍ය උපදේශාත්මක පණිවිඩය කිසියම් උත්ප්‍රාසයකට ලක් වේ. ඒ යුද්ධය සහ හිංසනයේ භූමිදර්ශන තුළ රූප සංසරණය සමාජ-දේශපාලනික කරුණක් බවට පත් වන බැවිනි. යුධමය සන්දර්භයන් තුළ ගැටුම්, තුවාලකරුවන්, හිංසනයට ලක්වූවන්, සරණාගතයන්, සොල්දාදුවන්ගේ රණකාමී රූප, ආයුධ යනාදී විවිධ රූප විවිධ සමාජ කතිකාවන් හා අන්තර්ඡේදනය වේ. උදාහරණයක් ලෙස සරණාගතයන්ගේ ඡායාරූප විවිධ ජාත්‍යන්තර සහන ආයතනවල දැන්වීම්වල භාවිත වන ආකාරය නිසා සරණාගතයන් පිළිබඳ ඒකාකෘතික රූප ගොඩනගනසුලු කතිකාවන් සහ සරණාගත ස්ත්‍රීන් හුදු වින්දිතයන් සහ ''ළදරුදරණය''(infantalization) වූවන් ලෙස ප්‍රතිනිර්මාණය කරන කතිකාවන්ගේ අන්තර්ඡේදනයේ ගැටලුකාරී ස්වභාවය මාලතී ද අල්විස් විසින් සඳහන් කර ඇත (de Alwis 2004:224). *තුන්දෙනෙක්* චිත්‍රපටියෙහි ආරම්භක රූපයෙහි දකින මියගිය සොල්දාදුවන්ගේ රූප, යුධ වාර්තාකරණය, රණකාමීත්වය, සහ ඇතැම් විටෙක කාම වෙබ් අඩවිවල හුවමාරුවන යුධ අසභ්‍යරූප **(war porn)** සිහිගන්වයි. කතිකාමය වශයෙන් ගත් කල, මෙම සන්දර්භ තුනෙහි ම මරණය හා සම්බන්ධ රූප ඒවා ප්‍රභවය ලබන සන්දර්භයෙන් මිදී වෙනත් කතිකාමය ලෝකයන් තුළ සංඥා ලෙස ක්‍රියා කරයි. ඒවා බොහෝ විට තව දුරටත් මරණයට පත්කරන ලද ජීවිතයක් පිළිබඳ සාක්ෂි වෙනුවට වෙනත් සන්දර්භයක ඉලේන් ස්කාරි විසින් "බලය පිළිබඳ ප්‍රබන්ධයක්'' (Scarry 1985:18) යනුවෙන් හඳුන්වන දෙයෙහි සාක්ෂියක් බවට පත් වේ. එනම් ඝාතකයාගේ පාර්ශ්වයේ බලය පිළිබඳ ව සංඥා කරන්නක් බවට එබඳු රූප පත් වේ. ඒ රූපය තුළ මරණය ගල්ගස්සවා, යටත්වීම පිළිබඳ දර්ශීය සංඥාවක් **(indexical sign)** බවට එය පත් කරයි. එම රූප විසින් සෑම විට ම සාක්ෂි දරන්නේ යටත් කරවනු ලැබීම ය.

මරණය පිළිබඳ රූප සංසරණය කරන්නන් එක් අතෙකින් එම මරණය පිළිබඳ සාක්ෂියක් ලෙස එම රූප ඡායාරූප ගත කරන අතර ම ඒ තුළින් කිසියම් ශවකාමයක් **(necrophilia)** සහිත මරණ රූප සංසරණය හරහා ගොඩනැගෙන සතුටෙහි සමාජ ප්‍රජාවන් **(pleasure communities)** ජනිත කරනු අපට පෙනේ (Manuratne 2014:370). චිත්‍රපටයෙහි එන කේසාගේ චරිතය වූ කලි මෙම සංසරණ ක්‍රියාවලිය උදෙසා මියගියවුන්ගේ රූප කැමරාවට හසුකරගන්නෙකි. එනයින් ගත් කල ඔහු පමණක් නොව ඔහු විසින් පටිගත කෙරෙන රූප ද අහිංසක හෝ නිර්ව්‍යාජ නැත. බලයෙහි හෝ ස්වකාමයෙහි සංසරණය තුළට මියගියවුන්ගේ රූප මුදා හැරීමේ ක්‍රියාවලිය විසින් එක් අතෙකින් ඒවා ප්‍රභවය ලැබූ සන්දර්භයෙන් ඒවා මුදා හරිමින් ඒවා වෙනත් බලය පිළිබඳ කතිකාවන් තුළට, එසේත් නැතහොත් රූප සංසරණයෙහි වෙළඳපොළ සන්දර්භයට ඇතුළු වේ. රූපයෙහි ඉතිහාසයෙන් එය ගලවා දමයි. එවිට රූපය විසින් විමර්ශනය කරන ජීවිතය එම රූපය විසින් ම පාවා දෙනු ලබයි. එනම් එක් අතෙකින් එම ජීවිතය දේශපාලන බල ව්‍යුහයෙහි හෝ වෙළඳපොළෙහි තර්කනයට යටත් කර, හුවමාරු භාණ්ඩයක් බවට පත් කරයි. අනෙක් අතින් එය රූපය සහ පැවැත්ම අතර සම්බන්ධය අප වෙත නිරාවරණය කරයි.

අපගේ සාකච්ඡාවට බඳුන් වන බල ව්‍යාපෘති තුළ හෝ රූප වෙළඳපොළ තුළට මෘතශරීරවල රූප මුදා හැරීම විසින් අපට අහිමි කරවන්නේම දර්ශීය සංඥාව පිළිබඳ මෙම පූර්ව-දැනුමයි. චිත්‍රපටයෙහි ආරම්භක දර්ශනය විසින් අපට මුණගස්වන මෘතශරීරවල රූප පටිගත කිරීම විසින් චිත්‍රපටයේ අවිඥානික ලක්ෂ්‍යයක් වෙත අප ව මාරු කරවයි. එනම් පැවැත්මෙහි දර්කශකයක් විය හැකි ව තිබූ රූපය රූප වෙළඳපොළක හුවමාරු භාණ්ඩයක් බවට පත්වන ආකාරය චිත්‍රපටයෙහි අවිඥානික ලක්ෂ්‍යයක් ලෙස මතු වෙයි. සැබෑ ලෙස ම නම්, කේසා පටිගත කරන රූප විසින් ඒවායෙන් විමර්ශක ශරීර හිංසක බල ව්‍යුහවලට සහ වෙළඳපොළ වෙත පාවාදෙනු ලබන අතර ම එහි ප්‍රේක්ෂකයන් ලෙස අපි ද එම ක්‍රියාවලියෙහි සාක්ෂිකරුවන් බවට පත් කෙරෙමු. සමාජ ගැටලු චිත්‍රපටයක් ලෙස සැලකීමේ දී ජාතීන් අතර මිත්‍රත්වය සහ සංහිදියාව පිළිබඳ උපදේශාත්මක කතාවෙහි අවිඥානික අන්තර්ගතයක් ලෙස යුද්ධය තුළ රූප සංසරණය විසින් එම රූප තුළ නිරූපිත ශරීර පාවාදෙන ආකාරය අපට පෙනෙයි. එම මෘත ශරීර පිළිබඳ රූප පමණක් නොව චිත්‍රපටයේ ඕනෑ ම රූපයක්, එය විසින් විමර්ශනය කරන විමර්ශකයා පාවාදීම වෙත නිරාවරණය වී ඇති බව ප්‍රේක්ෂකයාට අනතුරු අඟවයි[ඩසසස].

***ඇය*** යන චිත්‍රපටයෙහි, සංහිඳියාව පිළිබඳ රූපිකයක් ලෙස මනුෂ්‍ය සබඳතා දෙකක් විදහා දක්වයි. ඉන් පළමුවැන්න නම් සිංහල තරුණිය කෙරෙහි කේසා තුළ ඇතිවන ආදරයයි. සැබවින් ම නම්, ඔහු ආදරය කරන්නේ කයෝර යුද්ධය අතරතුර ඔහුට හමුවන සුන්දර තරුණියගේ ඡායාරූපයටයි. දෙවැනි මිනිස් සම්බන්ධය නම් කේසා සහ හඳගම අතර ඇතිවන මිතුදමයි. ඉහත බසෑන් විසින් ඉදිරිපත් කරන ලද න්‍යාය ඇසුරින් පෙන්වා දෙන ලද පරිදි ම, ඡායාරූපය තුළ ගල්ගස්සවා ඇති **(mummified)** පැවැත්ම වූ කලි තරුණියගේ එක් මොහොතක පැවැත්මකි. ඇගේ පැවැත්මෙහි එක් මොහොතකි. එහෙත් සැබෑ ලෙස ම කේසාට තරුණිය හමුවන මොහොතේ දී ඔහුට යථාව තුළ හමුවන ස්ත්‍රිය යනු ඔහුට කිසිදින හමුවිය නොහැකි ස්ත්‍රියයි. සිංහල තරුණිය කෙරෙහි වන කේසාගේ ආදරය යනු නොපවතින (නොපැවැත්මක් ලෙස පමණක් පැවතිය හැකි, present only as an absence) ආදරයකි. අනෙක් අතින් කේසා සහ හඳගම අතර මිත්‍රත්වය යනු අතීත දේශපාලන බලාපොරොත්තුවකි. වර්තමානයේ දී එම බලාපොරොත්තුව වරනැගීම ම පවා මිහිදන් වූ සිහින සොහොන් කොත් අතර සැරිසරන අතීතකාමයක්


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පමණකි. චිත්‍රපටය අවසානයෙහි ගඟක බැස දිය නාමින් කේසා සහ හඳගම හෞතීස්ම කරන්නේ එම මිත්‍රත්වයෙහි නොපැවැත්මයි. ඔවුනට සිපවැලඳගත හැක්කේ මධුවිතක බමනමතින් පමණක් වීම දේශපාලනික උත්ප්‍රාසයකි. සමාජ විද්‍යාත්මක ව සලකන කල පුද්ගලික මිත්‍රත්වයකින් ඔබ්බට ගිය, දමිළ ජනයාගේ සමාජ-දේශපාලනික අභිලාශයන් පිළිබඳ ව වගකීමක් ගන්නා දේශපාලනික ව්‍යුහයක් හෝ අන්තර් වාර්ගික සමගියක් යුද්ධයේ මිලිටරිමය අවසානයෙන් දශකයක් ගතවීත් තවමත් ගොඩනැඟී නැත. සමාජ විද්‍යාත්මක ව ගත්කල, දමිළ ජනයාගේ භාෂා ගැටලුව, ඉඩම්, අතුරුදන්වූවන් සොයා ගැනීම, කිසියම් වූ දේශපාලනික විසඳුමක් හරහා ඔවුන්ගේ දේශපාලනික අභිලාශයන් වෙත යම් දුරකට හෝ පිළිගතහැකි විසඳුමක් ලබා දීමට ලාංකේය ජාතික රාජ්‍යය අසමත් වී ඇති සන්දර්භයක් තුළ කේසා සහ හඳගම අතර මිත්‍රත්වය හුදු පුද්ගලික ආත්මබද්ධ සංහිඳියාවකි. එබඳු මතුපිට සංහිඳියාවක් පිළිබඳ හුදු උපදේශාත්මක චිත්‍රපටය වෙනුවට ප්‍රසන්න විතානගේ විසින් නිර්මාණය කර ඇත්තේ චිත්‍රපටයේ මතුපිට පණිවිඩය එහි රූප වින්‍යාසය හරහා උත්ප්‍රාසයට ලක් කරමින්, ගැඹුරු සංහිඳියාවක අභව්‍යතාව පිළිබඳ නිරූපණයකි. කේසා විසින් පටිගත කරනු ලබන රූප, ඒවායෙහි පැවැත්ම බලය සහ වෙළඳපොළ වෙත පාවාදෙන ආකාරයට ම, කේසා සහ හඳගම අතර හුදු පුද්ගලික, ආත්මබද්ධ මිත්‍රත්වය, මත්පැන් අතර සැරිසරන අසභ්‍ය කතාවලින් හෙබි ව්‍යාජයක් බවට පත් කරන්නේ, යුද්ධය විසින් මරණය ද සාම-සංහිඳියා කතිකාව විසින් ආදරය ද පවතින බල ව්‍යුහ සහ වෙළඳපොළ වෙත කෙරෙන පාවාදීම පිළිබඳ ව ප්‍රේක්ෂකයාට සිහිපත් කරමිනි.

## දෙවන කොටස

දීර්ඝ කාලීන වශයෙන් හිංසනයට යටත් වූ සමාජවල, විශේෂයෙන් දේශපාලනික හිංසනය හෝ යුද්ධය පැවති සමාජවල අතුරුදහන් කිරීම් සුලභ සමාජීය ගැටලුවක් ලෙස පවතියි. සමාජ විද්‍යාත්මක ව ගත්කල අතුරුදහන් කිරීම් නිසා ඇතිවන විශාල සමාජ ප්‍රශ්න ගණනාවක් ඇත. සමාජ ගැටලු චිත්‍රපටිවල සාමාන්‍යයෙන් අතුරුදහන් කිරීම/වීම වැනි ගැටලු සාකච්ඡා වනු දැකීම එතරම් සුලභ නොවූවත්, අතුරුදහන් වීම නිසා ඇතිවන සමාජ ගැටලු ගණනාවක් නිරූපිත චිත්‍රපට අපට හඳුනාගත හැකි ය. මෙම චිත්‍රපට බොහෝමයක තේමාව වන්නේ අතුරුදහන් වූ පුද්ගලයන් සොයා යන මවුවරුන්, පියවරුන්, සහකරුවන් ආදීන් විඳින අත්දැකීම් ය. මේවායෙහි ප්‍රධාන ගුරු අරුත **(motif)** ලෙස ‘සොයා යාම’ පවතියි. එනම් චිත්‍රපටයේ ප්‍රධාන කතා වින්‍යාසය ගොඩනැගෙන්නේ පෙර සිටි, නමුත් දැන් ජීවත් ව සිටින්නේ දැයි අප නොදන්නා පුද්ගලයන් සොයා යාම වටා ය. ***අනෙකා*** නම් වන ***තුන්දෙනෙක්*** චිත්‍රපටයේ අශෝක හඳගම විසින් අධ්‍යක්ෂණය කරන ලද කොටසෙහි ද මුඛ්‍ය කතාව ලෙස පවතින්නේ අතුරුදහන් වූවන් සොයා දෙන මෙන් ඉල්ලා කරන උද්ඝෝෂණයකට සහභාගී වීමට කොළඹට පැමිණෙන දමිළ මවක සහ බිරිඳක පිළිබඳ කතාවකි. තමාට ආගන්තුක මහලු මව කෙරෙහි අනුකම්පා කරන තරුණ ස්ත්‍රිය ඇය සමඟ කඩයකට ගොඩවන අතර, ඇසිල්ලෙකින් තම පුතාගේ වැනි රූපයක ඡායාවක් දැකීම නිසා මව තනි ව ම කඩයෙන් පිටතට ගමන් කරයි. මවගේ පසුපසින් තරුණ ස්ත්‍රිය ද පැමිණිය ද ඔවුන් දෙදෙනාට අදාළ තරුණයා මඟ හැරෙයි. ඔහු සොයා යාමට ඔවුන්ට සහය වීමට ඉදිරිපත් වන ත්‍රිරෝද රථ රියැදුරා තරුණයකු සමඟ මව දුටු තරුණයා සොයා යාමේ ගමන චිත්‍රපටියෙහි ප්‍රධාන කතාව වෙයි. එහි දී තරුණ ස්ත්‍රිය හා පොලිස් නිලධාරියා අතර සංවාදය මගින් දමිළ ජනයා අත්විඳින භාෂා ගැටලුවත්, අතුරුදහන් වීම නිසා මවුවරුන් සහ බිරින්දෑවරුන් අත්විඳින ශෝකය සහ පීඩනයත් චිත්‍රපටිය පුරා ගැඹුරු ලෙස ගවේෂණය කෙරේ. එසේ වුවත් අවසානයේ දී මෙම චිත්‍රපටය ද උපදේශාත්මක සමාජ ගැටලු චිත්‍රපටයක් වීම වළක්වාලනු ලබන්නේ ***ඇය*** චිත්‍රපටය තුළ මෙන් ම ***අනෙකා*** යන මෙම චිත්‍රපටිය තුළින් ම මතු වන උත්ප්‍රාසය නිසා ය. එම උත්ප්‍රාසයේ ද ආකාර දෙකක් පවතියි. පළමුවැන්න නම්, දමිළ මව විසින් තම දරුවා යයි වරදවා වටහාගෙන තිබෙන්නේ රජයේ හමුදාවේ ආබාධිත සෙබලෙකු වීමයි. දෙවැන්න නම්, ත්‍රිරෝද රථ රියැදුරා තරුණ දමිළ ස්ත්‍රිය කෙරෙහි ආකර්ෂණය වුව ද කොළඹින් පිටවීමටත් පෙර ඔහුගෙන් ලැබෙන දුරකතන ඇමතුම ඇය විසින් විසන්ධි කිරීමයි. චිත්‍රපටියෙහි මෙම උත්ප්‍රාසාත්මක මානය හේතු කොට ගෙන සරල සහ ව්‍යාජ සංහිඳියා කතිකාවක් බවට පත්විය හැකි ව තිබූ කතාවක් එය විසින් ම ප්‍රශ්න කරනු ලබයි. මතුපිට සිංහල-දමිළ සමගියක් පිළිබඳ කතාවකට වඩා එය එබඳු සංහිඳියාවක අභව්‍යතාව **(impossible)** පිළිබඳ ව ආඛ්‍යානයක් බවට පත් වෙයි. සමාජ ගැටලු පිළිබඳ චිත්‍රපටයක උපදේශාත්මක මානයේ සිට ගැඹුරු දේශපාලනික ප්‍රශ්න කිරීමක් දක්වා ආඛ්‍යානය ගමන් කරන්නේ චිත්‍රපටියෙහි ඇති මෙම උත්ප්‍රාසය නිසා ය.

යුද්ධය විසින් උරුම කරන මරණය අහිමි කරන ලද මරණය අතුරුදහන් වීම විසින් නියෝජනය කෙරේ. අතුරුදහන් කරවීමේ එක් ප්‍රබල සමාජීය ප්‍රතිඵලයක් වන්නේ මියගියවුන් වෙනුවෙන් ශෝක වීමේ සහ වැලපීමේ සමාජීය අභිචාර විධි අහිමි වීමයි[සං]. සාමාන්‍ය තත්ත්වයන් යටතේ දී කෙනෙකු මියගිය විට ඔවුන් සිහිපත් කර විවිධ ආගමික සහ සංස්කෘතික අභිචාර විධි පැවැත්වීම සහ පුනරුප්පත්තිය, ස්වර්ගයට හෝ දෙවියන් වෙත ගමන් කිරීම වැනි ආගමික අදහස් ඔස්සේ මිය ගිය පුද්ගලයා පිළිබඳ ව කිසියම් ආඛ්‍යානයක් ගොඩනගා ගැනීමට මෙම සමාජ අභිචාර විධි සහය වෙයි. කෙනෙකු ආගම සම්බන්ධයෙන් කුමන අදහසක් දැරුව ද කිසියම් අයුරකින්, අහිමි වීම පිළිබඳ ව මානසික ව කිසියම් යථාර්ථයක් ගොඩනගා ගැනීමට එබඳු අභිචාර විධි ප්‍රයෝජනවත් ය. සංස්කෘතික වශයෙන් වැලපුම් කාලයක් වෙන් කෙරෙන්නේ මේ සඳහා ය. සිග්මන් ෆ්‍රොයිඩ් විසින් වැලපුම සහ මෙලන්කෝලියාව **(Mourning and Melancholia)** යනුවෙන් ලියනු ලැබ ඇති ලිපියෙහි සඳහන් කරන ආකාරයට කිසියම් මිනිස් විෂයයකට යම් කෙනෙකු හෝ දෙයක යථාර්ථය තුළ අහිමි වූ විට මනස එම යථාර්ථයට හුරු වීමට කිසියම් කාලයක් ගනියි. එහි දී යළි යළි යථාර්ථය පරීක්ෂාවට ලක් කරයි. යම් කාලයකට පසු ව මනස විසින් අහිමි වූ දෙය/පුද්ගලයා යථාර්ථයෙහි නැවත නොපැමිණෙන බව සාක්ෂාත් වූ පසු ව එම පුද්ගලයා/දෙය කෙරෙහි ආයෝජනය කර තිබූ ලුබ්ධිමය ශක්තිය එයින් නිර්-ආයෝජනය කර වෙනත්


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වස්තුවක් වෙත ආයෝජනය කරයි (Freud 1957:244). මෙය වැලපුමෙහි අවසානයයි.

> "නිරන්තරයෙන් ම වැලපුම යනු ආදරය කරනු ලැබූ පුද්ගලයෙකු අහිමි වීම හෝ එබඳු පුද්ගලයෙකුගේ ස්ථානය ගත් තමාගේ රට, නිදහස, කිසියම් පරමාදර්ශයක් වැනි අමූර්තනයක් අහිමිවීම කෙරෙහි දක්වන ප්‍රතිචාරයකි. ඇතැම් පුද්ගලයන් තුළ එම බලපෑම් විසින් ම වැලපුමක් වෙනුවට මෙලන්කෝලියාවක් නිර්මාණය කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස අපි ඒ තුළ කිසියම් ව්‍යාධිවේදීමය චරිත ලක්ෂණයක් (pathological charachteristic) දකිමු. ජීවිතය කෙරෙහි වන සාමාන්‍ය ආකල්පවලින් බරපතල ලෙස දුරස්වීම් අපට හඳුනාගත හැකි වුවත් අප එය ව්‍යාධිවේදීමය තත්ත්වය ලෙස හඳුනාගෙන ප්‍රතිකර්මවලට යොමු කිරීමට අපට සිත් පහළ නොවන බව සටහන් කිරීම ද වැදගත් ය. කිසියම් කාලයක් ගෙවුණු පසු එයින් මිදෙනු ඇතිය යන්න මත අප රඳා පවතින අතර, ඊට බාධා කිරීම ඵල රහිත හෝ ඇතැම්විටක හානිකර විය හැකි යයි අපි දකිමු'' (Freud 1957:243-4).

එහෙත් කිසියම් කෙනෙකු අහිමි වූ වස්තුව වෙත අහමීය **(ego)** ලෙස අනන්‍ය වුවහොත්, එනම් අහිමි වූ වස්තුව වෙනුවට තම අහමය මත ම යළි ලුබ්ධිමය ආයෝජනයක් **(libidinal investment)** කළහොත් එම විෂයයට තම වැලපුම **(mourning)** අවසන් කිරීමට නොහැකි ව මෙලන්කෝලියා තත්ත්වයට පත් වේ. අතුරුදහන් කිරීමේ දී සිදු වන්නේ මෙම වැලපුම් ක්‍රියාවලිය වැළකීමයි. අහිමි වූ පුද්ගලයා මිය ගිය බව නිශ්චිත ව නොදන්නා බැවින් ඔහු හෝ ඇය සොයා දිගින් දිගට ම ගමන් කිරීම සිදු වේ. සමහර විට කඳවුරින් කඳවුරට, නැතහොත් කාර්යාලයෙන් කාර්යාලයට, උද්ඝෝෂණයෙන් උද්ඝෝෂණයට. එවැනි අවස්ථාවක දී තම ආදරණීයයා පිළිබඳ ව බොහෝ දෙනා රැගෙන යන සාක්ෂිය වන්නේ අතුරුදහන් වූ පුද්ගලයාගේ ඡායාරූපයයි.

කෙනෙකු අතුරුදන් වූ බවට එක ම සාක්ෂිය වන ඔවුන්ගේ ඡායාරූප රැගත් ශෝකවන්තයන් සහ විරෝධතාකරුවන් වර්තමාන දේශපාලනික භූමි දර්ශනවල සුලභ දර්ශනයකි. මේ ඡායාරූපවල අනාගතය කුමක් ද? කෙනෙකු ජීවත් වන්නේ ද? නොවන්නේ ද? යන්න පිළිබඳ අවිනිශ්චිතතාවයේ සලකුණු බවට මෙම රූප පත්වෙයි. අතුරුදන් වූ පුද්ගලයාගේ ඡායාරූපය නොපැවැත්ම සලකුණු කරන හැඟවුම්කාරකයක් බවට හෝ එසේත් නැතහොත් අනාගතයෙහි යළි පැවතිය හැකි බව පිළිබඳ හැඟවුම්කාරකයක් බවට ද පත් කරයි. අතුරුදන් වූ පුද්ගලයාගේ ඡායාරූපය සැමවිට ම අපට අනාගතයෙහි එම පුද්ගලයා සොයා ගැනීම හෝ අවම වශයෙන් ඔහුගේ හෝ ඇයගේ මරණය පිළිබඳ සාක්ෂ්‍යයක් සොයා ගැනීම කෙරෙහි ආදරණීයයා බැඳ තබා ගනියි. ඉහත සාකච්ඡා කරන ලද පරිදි, " ඡායාරූපමය රූපයෙහි සද්භාවවේදය'' යන බසැන්ගේ ලිපියෙහි ඔහු පවසන්නේ රූපමය කලාවන් වූ කලී මිනිසාට කාලය ඉකමවා යාමට, කාලයට යටත් නොවී සිටීමට ඇති ග්‍රස්ථිය නිසා ඇති වූ කලාවන් ආරම්භ වූ බවයි. එහෙත් උත්ප්‍රාසාත්මක ලෙස බසැන් මෙම ලියවීම තුළ ගොඩනගන රූපයෙහි සද්භාවවේදී මානය, අතුරුදන්වූවන් සම්බන්ධයෙන් නව දේශපාලනික අගයක් ගනියි. " ආකෘතිය සහ රූපය අතර අනන්‍ය සද්භාවවේදී අනන්‍යවීම තවදුරටත් කිසිවකු විසින් විශ්වාස කරනු ලබන්නේ නැති වුව ද රූපය අපට විෂයය මතක් කිරීමට උදවු වන අතර ඔහුට දෙවැනි ආධ්‍යාත්මික මරණයක් අත්වීම වැළැක්වීමට උදවු කරන බවට සියලු දෙනා ම එකඟ වෙති'' (Bazin 2005:10). අතුරුදන් වූවන් සම්බන්ධයෙන් ගත්කල ඡායාරූපය යනු එක් අතකින් ඔවුන්ගේ පැවැත්ම පිළිබඳ රූපමය සාක්ෂියක් වන්නා සේ ම, ඔවුන් පිළිබඳ මතකය, එනම් සමාජ-සංකේතීය පද්ධතිය තුළ ඔවුන්ගේ රූපය පවත්වා ගෙන යාමට මෙම ඡායාරූප ආධාරක බවට පත්වෙයි. සාමාන්‍ය මරණයකට වඩා, මෙහි දී ඇති සුවිශේෂය නම්, සාමාන්‍යයෙන් කාලය අභිභවා මරණය ජය ගැනීමට මිනිසා තුළ ඇති ආශාව, අදාළ දේශපාලනික සන්දර්භය තුළ අතුරුදහන් වූ පුද්ගලයාගේ පැවැත්ම දේශපාලනික සහ සංස්කෘතික ලෙස සංරක්ෂණය කිරීම වෙත ද අදාළ වෙයි. බසැන් ව්‍යුක්ත මිනිස් ආශාවක් ලෙස දුටු දෙය, අතුරුදහන් වූවන්ගේ ඡායාරූප සම්බන්ධයෙන් හදිසි දේශපාලනික සහ ආවේදනාත්මක වගවීමක් බවට පත්වෙයි.

අශෝක හඳගම විසින් අධ්‍යක්ෂණය කරන ලද " අනෙකා'' නම් කොටසෙහි දැක්වෙන්නේ එසේ ඡායාරූප කරපින්නාගත් මව්පියවරුන් ය. තුන්ඇඳුතු චිත්‍රපටයේ මුල්කොටසේ මෙන් ම මෙහිදී ද සංහිඳියාව ව්‍යාජයකි. සිහි විකල් වූ දමිළ මව සිය පුතු යයි වරදවා හඳුනා ගන්නේ යුද්ධයෙන් ආබාධිත ව සිටින සිංහල තරුණ සෙබළෙකි. ඕනෑම හමුවීමක් මෙන් ම මෙය ද අනිවාර්ය ලෙස මඟහැරුණු හමුවීමකි. අප සොයන මනුෂ්‍යයා සෑම විට ම අපට හමු වන්නේ වෙනත් අයෙකු බවට රූපාන්තරණය වී ය. චිත්‍රපටය හරහා දමිළ ජනයාගේ අහිමිවීම් පිළිබඳ දැනුමක්, ඔවුන් පිළිබඳ සානුකම්පිකත්වයක් සිංහලයා තුළ ඇති කිරීම සඳහා ඔවුන්ගේ ගැටලු ඉදිරිපත් කරන්නාක් සේ, එනම් කිසියම් උපදේශනයක් සිදු කරන්නා සේ පෙනුණ ද චිත්‍රපටය අපට දිගින් දිගට ම පෙන්වන්නේ විය නොහැකි මනුෂ්‍ය සබඳතාවයන් ය. මහලු මවට සිය පුතු ව සිංහල සෙබළා වෙතින් හමු විය නොහැකි සේම සිංහල තරුණයාට දෙමළ ස්ත්‍රිය සමඟ "පවතින'' සබඳතාවක් ගොඩනගාගත නොහැකි ය. එබඳු සබඳතාවක් පරිකල්පනය කරන ප්‍රේක්ෂකයාගේ බලාපොරොත්තු සුන් කරන අධ්‍යක්ෂකවරයා ඒ වෙනුවට අපට මතක් කරන්නේ මිනිස් හමුවීම් යනු මඟහැරුණු හමුවීම් පමණක් බවයි. එමෙන් ම සිංහලයන් සහ දමිළයන් අතර සාමයක් ඇති වීමට නම්, ඔවුන්ගේ මූලික සමාජ-දේශපාලනික ගැටලුවලටවත් අවම මට්ටමේ පිළිතුරක් ලැබිය යුතු බව ය. මෙම චිත්‍රපටයට දශක දෙකකට පමණ පෙර අශෝක හඳගම විසින් නිර්මාණය කරන ලද ***මේ මගේ සඳයි*** (2000) චිත්‍රපටයෙහි හමුදා සෙබළෙකු විසින් දූෂණය කරනු ලැබූ දමිළ ස්ත්‍රියක් ඔහු පසුපසින් සිංහල ගම්මානයකට පැමිණ එහි බොහෝ පිරිමින්ගේ ගොදුරක් බවට පත්වෙන ආකාරය පෙන් වූ හඳගමට වඩා මෙම චිත්‍රපටයේ හඳගම සංශයවාදී ය. ඔහුට තව දුරටත් සිංහල-දමිළ


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබඳතා අතර ධනාත්මක, සරල සබඳතාවක් පරිකල්පනය කිරීමට නොහැකි ය.

තුන්වැනි චිත්‍රපටයෙහි මෙම මියගිය පුතුගේ ඡායාරූපය නිසා මෙය චිත්‍රපටය තුළ පැවැත්ම අවිනිශ්චිත වන පුද්ගලයන් වටා ගොඩනැගෙන බැවින් අතුරුදහන් වූවන් විසින් සමාජ සංකේතීය පද්ධතියේ අඩුවක්, හිස්බවක් සංඥා කරයි. එම (නො)පැවැත්ම විසින් පරිකල්පනීය සංහිඳියාවක් වෙනුවට අතුරුදන්වූවන් යන හිස් හැඟවුම්කාරකය **(signifier)** වටා නව ප්‍රජාවන්ගේ ක්ෂණ භංගුර **(transient)** මතුවීමක් හඟවයි. චිත්‍රපටයෙහි මියගිය පුතුගේ ඡායාරූපය හමුවන්නේ වෙනත් මවකගේ හා වෙනත් පුතෙකුගේ ඡායාරූපයක් ලෙසිනි. මෙය සරල තලයක දී "අපි ඔක්කොම එක ම අම්මලාගේ ළමයි'' වැනි පැතලි සමානාත්මතාවක් ලෙස සැලකිය හැකි වුවත් එය පහසු වැඩි ය. එය සරල උපදේශනාත්මක ස්වරූපයක් දරයි. ඒ වෙනුවට එය අතුරුදන්වූවන් සොයා යන අය අතර ගොඩනැගෙන දේශපාලනික සම්බන්ධයක්, එනම් අතුරුදන් වූ පුද්ගලයාගේ හිස්තැන වටා ගොඩනැගෙන සාමූහික ප්‍රජාවක් පරිකල්පනය කිරීමට මෙම චිත්‍රපටය ප්‍රේක්ෂකයාට ආරාධනා කරයි. චිත්‍රපටය ගොඩනැගෙන්නේ අතුරුදහන් වූ තරුණයා වටා ගොඩනැගෙන නාඳුනන පුද්ගලයන් අතර ඇති වන දේශපාලනික සබඳතාවක එක්තරා ආකාරයක ක්ෂණ-භංගුර ශෘංගාරයකි. පුතු අහිමි වීම නිසා උන්මත්තක වූ මව, ද්‍රවිඩ තරුණිය කෙරෙහි පෙමින් බැඳෙන සිංහල තරුණයා මෙන් ම තම පුතු සොයා පැමිණෙන මෙම පිරිස වෙත දයාවෙන් සලකන සිංහල මව ද එම ප්‍රජාවෙහි කොටස්කරුවෝ ය. එහෙත් එබඳු සමූහයන් යනු අත්‍යවශ්‍යයෙන් ම අසම්පූර්ණ, නොපවතින සමූහ වේ. එසේ වන්නේ එබඳු ප්‍රජාවන් තාවකාලික දේශපාලනික එකතුවීම් වන නිසා ය. එනයින් ගත්කල චිත්‍රපටය අවසානයේ දී සිංහල තරුණයා විසින් ලබා දෙන දුරකතන ඇමතුම දමිළ තරුණිය විසින් විසන්ධි කිරීම ඉතිහාසයේ අවශ්‍යතාවකි. එම සුවිශේෂ දේශපාලනික-අනුරාග **(political passion)** මොහොතින් පිටත එම සම්බන්ධයට පැවතිය නොහැකි ය. අප එය සංහිඳියාව පිළිබඳ ව්‍යාජ කතිකාවක් බවට පත් කිරීමට යන මොහොතේ දී ම එය විසින් අනෙකා නිහඬ කරවනු ලබයි. චිත්‍රපටයේ එන මවගේ නිහඬ උන්මාදය විසින් ශරීරය දෙනු ලබන්නේ මෙම පැවතිය නොහැකි සංහිඳියාව පිළිබඳ කතිකාවට ය. බොහෝවිට සිදු වන පරිදි ම ඒ සඳහා පීඩිත ස්ත්‍රියගේ ශරීරයට බෙලහීන දේශපාලනයක බර දරා සිටීමට සිදු වේ.

## තුන්වන කොටස

මෙම චිත්‍රපටයෙහි ඉතාමත් හිංසාකාරී ම කොටස වන්නේ විමුක්ති ජයසුන්දරගේ ***ඔහු*** යන කොටසයි. එය තුළ ගොඩනගන්නේ ජාතිය රූපයක් ලෙස පරිකල්පනය කිරීමට යාමේ දී යහපත් ජාතිකවාදියා මුහුණ දෙන අනිවාර්ය අර්බුදයයි. ජාතීන් අතර සංහිඳියාවක් පිළිබඳ කතිකාවක දී පීඩිත ජනවර්ගය පැත්තෙන් ගත්කල අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් වන්නේ ඔවුන් කෙරෙහි යුක්තිය ඉටුවීම වන්නා සේ ම, ගැටුම තුළ බලවත්වන ජනවර්ගය පැත්තෙන් ඉල්ලා සිටින්නේ ජාතිය යන සංකල්පගත කිරීම තුළ තමන් භුක්ති විඳින හෙජමොනික ආධිපත්‍යයෙහි වරප්‍රසාද යම් දුරකට හෝ හරණය කිරීමකි. බහු-ජනවාර්ගික රටක ජාතික අනන්‍යතාව යන සාධකය එක් ජනවර්ගයක් විසින් පුරවනු ලැබුව හොත් එතැන දී අනිවාර්ය ලෙස ගැටුම් පැන නගිනු ඇතැයි ෆ්‍රාන්ස් ෆැනෝන් කළ පුරෝකතනය අප්‍රිකානු ජාතීන් සම්බන්ධයෙන් පමණක් නොව ශ්‍රී ලංකාව වැනි ආසියාතික පශ්චාත් යටත්විජිත සමාජ සම්බන්ධයෙන් ද සත්‍ය වී ඇත:

> "සියලු ම ජනයාගේ වඩාත් අභ්‍යන්තරමය බලාපොරොත්තුවල සියල්ල වැලඳගන්නාසුලු කැටිගැන්වීම වෙනුවට, ජනතාව බලමුළුගැන්වීමේ ආසන්නත ම සහ වඩාත් පැහැදිලි ම ප්‍රතිඵලය වනු වෙනුවට, ජාතික සවිඥානකත්වය හිස් සැකිල්ලක්, එය පත්විය හැකි ව තිබූ දෙයෙහි රළු සහ බිඳෙනසුලු විකාර ස්වරූපයක් බවට වනු ඇත. ළාබාල සහ ස්වාධීන ජාතීන් ඇසුරින් සැලකීමේ දී, ජාතිය වෙනුවට ජනවර්ගය පෙනී සිටින සහ රාජ්‍යය වෙනුවට ගෝත්‍රය පෙනී සිටින පහසු ආකාරය අප එහි දකින වැරදි ඇසුරින් වඩාත් පැහැදිලි ව තේරුම්ගත හැකි ය. ප්‍රතිගමන ක්‍රියාවලිය විදහා දක්වන ප්‍රාසාදයෙහි කඩතොලු වන මේවා ය, ජාතික ප්‍රයත්නයන්ට සහ ජාතික එකමුතුවට බෙහෙවින් ම හානිකර සහ ආධානග්‍රාහී වන්නේ'' (Fanon 2003:156).

එබඳු සන්දර්භයක දී ජාතිකවාදියෙකු වීම යනු ම ජනවාර්ගික අනන්‍යතාව ඉක්මවා යන ජාතික අනන්‍යතාවක් පරිකල්පනය කළ හැකි අයෙකු වීමයි. එනම් සිංහල, දමිළ, මුස්ලිම් යනා දී ජනවාර්ගික අනන්‍යතාවන් ඉක්මවා ගිය ශ්‍රී ලාංකේය ජාතියක් පිළිබඳ ව පරිකල්පනය කරන යහපත් ජාතිකවාදියෙකු විශේෂයෙන් ම හෙජමොනික ජනවර්ගය පැත්තෙන් ඉල්ලා සිටියි. විමුක්ති ජයසුන්දර විසින් අධ්‍යක්ෂණය කරන ලද ***ඔහු*** යන කොටසේ අපට හමු වන්නේ එබඳු යහපත් ජාතිකවාදියෙකි.

***ඔහු*** නම් චිත්‍රපටයේ කථානායකයා පුත්තලම ආසන්න ප්‍රදේශයකට අලුතින් මාරු වී ආ සිංහල ගුරුවරයෙකි. යහපත් සිංහලයෙකු වන ඔහුට දමිළ කතා කරන සිංහල දරුවන් මුණ ගැසේ. එම ප්‍රදේශයේ වාර්ගික සහ භාෂාමය විවිධත්වය සාමාන්‍යයෙන් සිංහල හෙජමොනික කතිකාව විසින් ගොඩනගා ඇති "සිංහලත්වය'' පිළිබඳ රූපය අභියෝගයට ලක් කරයි. විවෘත මනසක් සහිත ගුරුවරයා මෙම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීමට උත්සහ කරන්නේ, තම පුද්ගලික ව්‍යාපාරවල නියැළෙමින් තම රාජකාරිය අතපසු කරන පාසැලේ විදුහල්පතිවරයාට වෙනස් ලෙස ය. ඔහු දරුවන් කෙරෙහි හිතෛෂී, ඔවුන්ට ඉගැන්වීමට සැබවින් ම වෙහෙසෙන ගුරුවරයෙකි. එහෙත් ඔහුගේ සිංහල පාඩමෙන් අපට පෙනෙන ලෙස ඔහුගේ වෘත්තිය වන්නේ ම ජාතිය සහ ආගම පිළිබඳ එක් හෙජමොනික අදහසක් අධ්‍යාපනය හරහා දරුවන් වෙත සම්ප්‍රේෂණය කිරීමයි. දිව පැටලෙමින් පාඩම කියවන දරුවන් හරහා චිත්‍රපටයේ පඨිතය අපට පෙන්වන්නේ මෙම අධ්‍යාපනයෙහි අසාර්ථකත්වයයි. මේ අතර සිටිනා එක් දරුවෙකු තමා මීට පෙර ආත්මයේ දී එල්. ටී. ටී. ඊ. සාමාජිකයෙකු වී සිටි බව කියයි. දරුවාගේ මව සහ මුස්ලිම් ජාතික රියැදුරෙකු සමඟ ගුරුවරයා දරුවා පෙර ආත්මය පවසන ඉසව්ව


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සොයා යයි. තුන්දෙනෙක් චිත්‍රපටයේ අන් කතා දෙකෙහි මෙන් ම මෙහි දී ද අපට යළිත් සොයා යාමේ රූපකය හමු වේ. එපමණක් නොව මිය ගිය එල්. ටී. ටී. ඊ. සාමාජිකයාගේ නිවසේ දී ඔවුනට ඔහුගේ රාමුකරන ලද ඡායාරූපයක් ද හමුවේ. අපට යළිත් හමු වන්නේ නොපැවැත්මක් ලෙස පවතින, මිය ගිය ද මිය නොගිය සටන්කරුවෙකුගේ රූපයයි. චිත්‍රපටයේ කතා තුනෙහි ම කේන්ද්‍රීය රූපකයක් ලෙස මියගිය හෝ අතුරුදන් වූ හෝ නාඳුනන, සොයාගත යුතු පුද්ගලයෙකුගේ ඡායාරූපයක් පවතියි (මේ පිළිබඳ ව පහත සාකච්ඡා කෙරේ). දරුවාගේ පුනරුප්පත්ති කතාව සත්‍ය වීමෙන් චිත්‍රපටය අවසන් නොවේ. යළි ගම්බිම වෙත පැමිණි පසු ව විදුහල්පතිවරයා විසින් පුවත්පත් වාර්තාකරුවෙකුට අදාළ කතාව පිළිබඳ ව දැනුම් දෙයි. වාර්තාකරුවාට දරුවා පිළිබඳ කතාව පවසන ගුරුවරයා ඔහුට කසිප්පුවලින් සංග්‍රහයක් ද කර ඉල්ලා සිටින්නේ මෙම කතාව පළ නොකරන ලෙසයි. එහෙත් පසු දින අවදි වන විට පුවත්පතෙහි ඉතාමත් අසංවේදී ලෙස මෙම දරුවාගේ කතාව පළවී තිබෙනවා පමණක් නොව, කසිප්පු වීදුරුවක් අත තබා සිටින ගුරුවරයාගේ ඡායාරූපයක් ද පළ කර ඇත. එල්. ටී. ටී. ඊ. සාමාජිකයෙකු පුනරුප්පත්තිය ලබා ඇතැයි චෝදනා කරමින් ගම්වාසීන් ඔවුන්ට පහර දීමට සැරසෙන විට ගුරුවරයා හොර රහසේ ම දරුවා සහ මව ගමෙන් පිට කරයි.

මෙම චිත්‍රපටය අන් චිත්‍රපට දෙකට ම වඩා හිංසාකාරී වන්නේ යහපත් ජාතිකවාදියෙකු වීමට යන සිංහල ගුරුවරයා පත්වන විගඩම්කාරී ස්වරූපය සිනමාකරුවා විසින් දයා විරහිත ලෙස කරන නිරූපණය නිසා ය. එය විසින් කිසිඳු ආකාරයක ව්‍යාජ සමගියකට ඉඩ නොතබා දිගින් දිගට ම පෙන්වා දෙන්නේ පුද්ගලික ව යහපත් අභිලාශ තිබෙන නමුදු මෙබඳු ආත්මබද්ධ මැදිහත්වීම්වලින් වර්ගවාදයට අභිමුඛ වීමට සාම කතිකාවට ඇති නොහැකියාවයි. එක් අතෙකින් ඔහුට පැවරෙන රාජකාරිය යනු ම විය නොහැකි (impossible) රාජකාරියකි. බෙනඩික්ට් ඇන්ඩර්සන් පවසන පරිදි ජාතිය යනු පරිකල්පිත ප්‍රජාවකි. "එය පරිකල්පිතයක් වන්නේ, ඉතාමත් කුඩාත ම ජාතියක සාමාජිකයන් පවා එහි සහෝදර-සාමාජිකයන්ගෙන් බහුතරයක් කිසිදිනෙක මුණගැසෙන්නේ හෝ අවමයෙන් ඔවුන් ගැන අසා දැනගන්නේවත් නැති වුව ද, ඔවුන් සෑම කෙනෙකුගේ සිතක ම ඔවුන්ගේ එක්වීමෙහි රූපයක් ජීවත් වෙයි'' (Anderson 2016:6). එනම් ජාතිය යන්න ම අපට පරිකල්පනය කරන්න සිදුවන්නේ ම රූපයක් ලෙස ය. එහෙත් එසේ පරිකල්පනය කිරීමට යාමේ දී එම ජාතිය කිසියම් වියනොහැකි ඒකීයත්වයක් කරා ගෙන යාමට සිදුවේ. එහෙත් ජාතිය යනු සැබෑ ලෙස ඒකමිතියක් වශයෙන් පවතින්නක් නොවේ. එය ස්වභාවයෙන් ම ඛණ්ඩිත ය.

එසේ ඒකමිතියක් ලෙස නොපවතින ජාතිය, අධ්‍යාපනය තුළ ගොඩනැගීමේ කාර්යය ***ඔහු*** නම් චිත්‍රපටයේ නිරූපිත ගුරුවරයාට පැවරෙයි. යහපත් ජාතිකවාදියෙකු වීමට, එනම් එක් ජාතිවාදී නොවී දරුවන් සියලු දෙනාට ම එක සේ සලකා අධ්‍යාපනය තුළ ජාතිය පිළිබඳ ඒකමිතියක් ගොඩනැගීමට යාමේ දී ගුරුවරයාට හමු වන්නේ හුදු පුද්ගලවාදයත්, ජාතික සහ ආගමික අන්තවාදයත්, රූප සහ කතා ජාවාරම්කරුවන් බවට පත් වී සිටින මාධ්‍යවේදියාත් ය. ජනවාර්ගික අනන්‍යතාව විසින් ශ්‍රී ලාංකේය ජාතිය යන හැඟවුම්කාරකයෙහි හිස්බව, සිංහල ජාතිය යනුවෙන් පරිපූර්ණත්වයකට පත්කරන මොහොතේ දී ම මෙම ගුරුවරයාට ජාතිය පිළිබඳ ව තමාට ඇති පරිකල්පනීය සමස්තය බිඳ වැටෙන්නේ ඔහුට හමුවන වාර්ගික විවිධත්වය සහ මෙම රූපය අතර සාම්‍යයක් ඇති කරගැනීමට ඔහුට නොහැකි වන නිසා ය.

සමාජ ගැටලු චිත්‍රපටයක් ලෙස මෙම චිත්‍රපටය විසින් මතු කිරීමට උත්සහ කරන්නේ අප අතරින් කවරෙකු පෙර භවයේ දී එල්. ටී. ටී. ඊ. සාමාජිකයෙකු ව සිටියාදැයි නොදන්නා බව පෙන්වමිනි. එනම් අපගේ අවම මානුෂිකත්වය යනු භවයෙන් භවයට ගමන් කිරීම තුළ පුනරාවර්තනය වීමක් එයින් පෙන්වයි. එහෙත් මෙම පණිවිඩය ලබා දීමට යන මොහොතේ දී ම චිත්‍රපටයේ ඡායාරූපවල දේශපාලනය යළිත් මතුවේ. ඉහත ද සඳහන් කළ පරිදි, මිය ගිය එල්. ටී. ටී. ඊ. සාමාජිකයාගේ ඡායාරූපය ද පුවත්පතේ පළවන සිංහල ගුරුවරයාගේ ඡායාරූපය ද අපට ශ්‍රී ලාංකේය ජනවාර්ගික අර්බුදයෙහි එක්කළ නොහැකි මානයන් දෙකක් මුණගස්වයි. කෙතරම් යහපත් ආධ්‍යාශයන්ගෙන් කටයුතු කළ ද ගුරුවරයාට සිංහල-බෞද්ධ කතිකාවෙන් ද රූප සහ කතා ජාවාරම්කාර මාධ්‍යවේදියාගේ ද හිංසනයෙන් ගැලවිය නොහැකි ය. චිත්‍රපටයෙහි එන පුනර්භවය පිළිබඳ ආඛ්‍යානය හරහා අපට සරල ලෙස මේ සියලු දෙනා අපගේ දරුවන් ය වැනි ව්‍යාජ සංහිඳියාවක් වෙත ගමන් කළ හැකි ය. එහෙත් සත්‍ය ලෙස ම නම් සිදුවන්නේ එසේ කිරීමට යාමේ දී ම එම ආඛ්‍යානය ම කතා ජාවාරම්කරුවකු විසින් ඩැහැගනු ලැබීමයි. තම ව්‍යවහාරයේ ප්‍රායෝගික ප්‍රතිඵල සහ එයින් ඇතිවන බලපෑම ඔහුට අදාළ නැත. ඔහුට අදාළ වන්නේ එම රූපය හැකිතාක් විකිණීමට හැකි ලෙස ඉදිරිපත් කිරීමයි. අපගේ මානුෂික සහ සාධාරණ සිංහල ගුරුවරයා රා වීදුරුවක් සුරතින් දරා විගඩමක් ලෙස ප්‍රතිනියෝජනය වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙස ය. එම රූපයෙහි හිංසනය වඩාත් තීව්‍ර කරමින් සිනමාකරුවා අපට ඌරන් දෙදෙනා සහ බූරුවාගේ රූපයක් පෙන්වමින් මතක් කර සිටින්නේ ජාතිය, ඛණ්ඩනය නොවූ පරිපූර්ණ රූපයක් ලෙස ගොඩනැගීමට යාමේ දී, ඒ තුළ ජාතිය පිළිබඳ ප්‍රබන්ධයන් වඩ වඩා විශ්වාස කිරීමට යාමේ දී අපට ඉතිරිවන්නේ බූරුවන් සහ ඌරන් පමණක් බවයි.ංස චිත්‍රපටය පුරා ඉතා ම හිංසාකාරී රූපය ලෙස බීමත් ගුරුවරයාගේ පුවත්පත් ඡායාරූපය සහ මෙම ගොවිපොළෙහි ඌරන් සහ බූරුවාගේ දර්ශනය දැක්වේ. අවසානයේ දී අපට ජාතිය යන රූපයෙහි පැවතිය නොහැකිභාවය පමණක් ඉතිරි වේ. දිගින් දිගට ම සිය ජාතිකත්වයත් මානුෂිකත්වයත් සමබර කිරීමට උත්සාහ කරන සිංහල ගුරුවරයා මේ වියනොහැකිභාවයේ රූපකයක් බවට පත්වන විට අපට සංහිඳියා කතිකාවෙහි බිඳවැටීම සහ ව්‍යාජත්වය හමුවේ.

## සමාප්තිය

මෙම අධ්‍යයනය මගින් ගවේෂණය කෙරුණේ ජාතික සමගිය සහ සංහිඳියාව පිළිබඳ සමාජ ගැටලු චිත්‍රපටයක් නිර්මාණය කිරීමට යාමේ දී ඇතිවන උත්ප්‍රාසජනක අභව්‍යතාවයි. පර්යේෂණයෙහි මූලික පර්යේෂණ ප්‍රශ්න වූ යුද්ධය නමැති යථාර්ථය තුළ


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සංසරණය වන මරණය පිළිබඳ රූප සංසරණය න්‍යායගත කළ හැක්කේ කෙසේ ද යන්න ද අතුරුදහන් කරවනු ලැබූ පුද්ගලයන්ගේ රූප විසින් ඔවුන්නේ නොපැවැත්ම සහ නොනිමි පැවැත්ම සලකුණු කිරීම හරහා නව ප්‍රජාවන් පිළිබඳ භව්‍යතාවයන් අපට සොයා යා හැක්කේ කෙසේ ද යන්න සහ සිනමා පඨිතයෙහි ජාතිය රූපයක් ලෙස නිරූපණය වන්නේ කෙසේ ද යන ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමේ දී අපට දිගින් දිගට ම පෙනී යන්නේ රූපය සහ දේශපාලනය අතර හුදු උපදේශාත්මක ස්වරූපය ඉක්මවා ගිය දේශපාලනික සම්බන්ධයක් ඇති බවයි. මරණය පිළිබඳ රූප සංසරණය සහ ඒ ඔස්සේ ගොඩනැගෙන මඟහැරුණු හමුවීම් මෙහි දී කියවා ඇත්තේ ආදරය, මිත්‍රත්වය වැනි හැඟීම් ඔස්සේ ගොඩනැගීමට උත්සහ කෙරෙන ව්‍යාජ සංහිඳියාවක අභව්‍යතාවය සලකුණු කරන්නක් ලෙස ය. එමෙන් ම මෙම පර්යේෂණයේ දී අතුරුදන් කරවනු ලැබූවන් පිළිබඳ රූප කියවා ඇත්තේ ඔවුන්ගේ (නො)පැවැත්ම හරහා ගොඩනැගෙන ප්‍රජාවන් දේශපාලනික එහෙත් ක්ෂණ භංගුර ප්‍රජාවන් ලෙස ය. තෙවනුව ජාතිය රූපයක් ලෙස කියවීමට යාමේ දී අනිවාර්ය ලෙස ඛණ්ඩිත සහ අසම්පූර්ණ ජාතිය පරිපූර්ණ රූපයක් බවට පත් කිරීමට යාමේ දී හමුවන අශ්ශීලමය විසුළුකාරීත්වය තුන්වන ප්‍රශ්නය ආශ්‍රයෙන් විග්‍රහ කොට ඇත. මේ සෑම අවස්ථාවක ම කේන්ද්‍රීය රූපයක් වන ඡායාරූපයක් එහි විමර්ශකයෙහි මුල් සන්දර්භයෙන් ගැලවී වෙනත් සන්දර්භ හා සංයෝජනය වන විට සිදුවන මගහැරිය නොහැකි දේශපාලනික පාවාදීම සහ එම රූප සම්බන්ධයෙන් නිර්මාණකරුවන් පමණක් නොව ප්‍රේක්ෂකයන් ද වගවෙන්නේ කෙසේද යන ප්‍රශ්නය අපට ඉතිරි වේ.

යුධවිරෝධී සිනමාවෙහි පුරෝගාමීන් තිදෙනෙකුගේ එකතුවෙන් නිර්මාණය වී ඇති ***තුන්දෙනෙක්*** චිත්‍රපටය, සරලමතික මතුපිට සංහිඳියාවක අභව්‍යතාවය මතු කිරීම එක අතකින් එතරම් පුදුමයක් නොවේ. මෙම අධ්‍යයනය පුරා පෙන්වා දී ඇති පරිදි, උපදේශාත්මක සමාජ ගැටලු චිත්‍රපටයක් ලෙස බැලූබැල්මට පෙනෙන මෙම චිත්‍රපටය තුළ ම ඇති උත්ප්‍රාසාත්මක මානයන් ද එහි ඇති කේන්ද්‍රීය රූපවල (විශේෂයෙන් ඡායාරූපවල) දේශපාලනයත් ඒවායෙහි විමර්ශකයන්ව එම රූප භාවිතාවන් විසින් ම පාවා දෙන ආකාරයත් මෙම අධ්‍යයනය තුළ සාකච්ඡා කර ඇත. සාමාන්‍යයෙන් ජාතික සමගිය සහ සංහිඳියාව පිළිබද ව වන වඩාත් ඉන්ද්‍රියගෝචර අධ්‍යයනයන් තුළ දී අපට සෙවීමට අපහසු, වඩා අවිඥානික අන්තර්ගතයන් සිනමා න්‍යාය සහ රූපය පිළිබඳ විචාර න්‍යාය හරහා ඉස්මතු කරගැනීමට මෙහි දී උත්සහ දරා ඇත. එහි දී අපට පෙනී යන්නේ මිලිටරිමය ලෙස එල්. ටී. ටී. ඊ.ය පරාජය කළ ද යුද්ධයටත් ජනවාර්ගික අර්බුදයටත් තුඩුදුන් මූලික ගැටලු සහ ජාතිය පිළිබඳ නොවිසඳුණු දේශපාලනික පරස්පරතා ද නොවිසඳා සමගිය සහ සංහිඳියාව පිළිබඳ ව කතා කිරීමේ ගැටලුව සිනමාකරුවන් විසින් මතු කෙරෙන බවයි. මෙම චිත්‍රපටය පුරා යළි යළිත් වරනැගෙන ප්‍රශ්නයක් වන්නේ සිනමාකරුවන් පමණක් නොව ප්‍රේක්ෂකයන් ද මෙම විවිධ රූපමය ආඛ්‍යානයන් කෙරෙහි වගකියන්නේ කෙසේ ද යන්නයි. සංහිඳියාව, නිහඬ කරවනු ලැබූ දමිළ ස්ත්‍රිය, පමණක් නොව අනිවාර්ය බෙලහීනත්වයකට ලක් ව ඇති යහපත් ආධ්‍යාශයන්ගෙන් සපිරි, එහෙත් දේශපාලනික ලෙස බෙලහීන යහපත් ජාතිකවාදී සිංහල බෞද්ධ පිරිමියා ද අප දේශපාලනික සංවාදය තුළට රැගෙන එන්නේ කෙසේ ද යන්න චිත්‍රපටය විසින් අසනු ලබන බව මෙම අධ්‍යයනය හරහා එළඹෙන නිගමනයයි. රූපයෙහි සද්භාවවේදය ද මෘතදේහවල රූප බලයට සහ වෙළඳපොළට යටත් කිරීමේ භාවිතාව ද අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට මරණය වෙනුවෙන් වැලපීමට නොහැකි වීම නිසා ඇතිවන නිහඬකරවීම ද ජාතිකත්වය තුළ ම ගැබ්වන දේශපාලනික පරස්පරය එම ජාතිකත්වයට සිය ශරීරය දෙන පුද්ගලයන්ට විසුළුකාරී ලෙස දරා සිටීමට සිදුවීම ද මෙම චිත්‍රපටයෙහි පඨිත සහ දෘෂ්ටිමය අධ්‍යයනයක් හරහා ඉදිරිපත් කර ඇත. සමාජ ගැටලු වඩා උපදේශාත්මක සහ සංශෝධනවාදී ලෙස මතු කිරීමට යාමේ සීමා මතු කර ගැනීමට චිත්‍රපටයෙහි පඨිතය විසින් අප ව යොමු කරවයි. අවසානයේ දී සැබෑ සමාජ-දේශපාලනික ගැටලුවලට පරිකල්පිත සංහිඳියාවක පිළිතුරු වෙනුවට එම සමාජ දේශපාලනික ගැටලු ආමන්ත්‍රණය කළ හැකි ආකාරයේ දෘෂ්ටිවාදීමය සහ දේශපාලනික වගවීමක සමාජ විද්‍යාත්මක අවශ්‍යතාව මෙම කියවීම හරහා අවධාරණය කෙරෙන අතර එසේ වන්නේ සිනමා පඨිතයේ ම ඇති උත්ප්‍රාසාත්මක අවිඥානික අන්තර්ගතය හේතු කොට ගෙන ය.

## පරිශීලිත මූලාශ්‍රය


අමරසිංහ, උපාලි (2018) තුන්දෙනෙක් එක්ක දෙන්නෙක්, කැලණිය විශ්වවිද්‍යාලය, වෙනස සඟරාව සහ ප්‍රතිබිම්බ කලා සංගමය, අප්‍රකාශිත ලිපි එකතුව.

Anderson, Benedict (2016) Imagined Communities: Reflections on the Origins and Spread of Nationalism, London, Verso.

Barthes, Roland (2001) “From Work to Text” Leitch, Vincent B. et al (eds:) Norton Anthology of Theory and Criticism, London, W.W. Norton & Co.

Bazin, Andre (2005) What is Cinema? Volume I. 2nd edition, Gray, Hugh (trans) California, University of California Press.

Cagle, Chris (2016) Sociology on Film: Postwar Hollywood's Prestige Commodity, New Brunswick, London, Rutgers University Press.

de Alwis, Malathi (2004) “The “Purity” of Displacement and the Reterritorialization of Longing: Muslim IDPs in Northwestern Sri Lanka” Hyndman, Jennifer & Wenona Giles (eds:) Sites of violence: Gender and Conflict Zones, California, University of California Press.
Fanon, Franz (2003) “National Culture” Ashcroft, Bill, G. Griffiths & H. Tiffin (eds:) The




© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Postcolonial Studies Reader, London and New York, Routledge.

Freud, Sigmund (1957) "Mourning and Melancholia" James Strachey (ed:) On the History of the Psycho-Analytic Movement; Metapsychology and Other Works, London, The Hogarth Press.

Geimer, Peter (2007) "Image as Trace: Speculations about an Undead Paradigm" Differences: A Journal of Feminist Cultural Studies, 18(1).

Her, Him, The Other (2018) Directed by Prasanna Vitanage, Vimukthi Jayasundara, Asoka Handagama, Sri Lanka, Office of National Unity and Reconciliation.

Lacan, Jacques (1998) The Four Fundamental Concepts of Psychoanalysis (Book XI) Miller, Jacques Alain (ed:) Sheridan, Alan (Trans) New York, W.W Norton & Company.

--- (1993, 1997) The Psychoses 1955-1956 (Book III), Miller, Jaques Alain (ed:) Greig, Russel (trans.) New York, W.W Norton & Company.

Manuratne, Prabha (2014) "Parody of War: Pleasure at the Limits of Pornography" David Squires Steven Ruszczycky & Tim Dean (eds:) Porn Archives, Durham, Duke University Press.

Mulvey, Laura (2001) "Visual Pleasure and Narrative Cinema" Leitch V. B. et al (eds:) Norton Anthology of Theory and Criticism, London, W.W. Norton & Co.

Rosen, Philip (2003) "History of Image, Image of History: Subject and Ontology in Bazin" Ivone Margulies (ed:) Rites of Realism: Essays on Coporeal Cinema, Durham, Duke University Press.

Scarry, Elaine (1985) The Body in Pain: The Making and Unmaking of the World, Oxford, Oxford University Press.

Stam, Robert et al (1992) Structuralism, Poststructuralism and Beyond, London and New York, Routledge.

This Is My Moon (2000) Directed by Asoka Handagama, Sri Lanka, Nilwala Films.

Žižek, Slavoj (1991) Looking Awry: An Introduction to Jacques Lacan through Popular Culture, Cambridge, Massachussettes, October Books and MIT Press.

Žižek, Slavoj (1994) The Metastases of Enjoyment: Six Essays on Woman and Causality, London, Verso.

මවුබිම 2021.01.10, හෙට්ටිහේවා, ප්‍රියාශා සහ නාලීර් ජමල්දීන් යාපනය විශ්වවිද්‍යාලයේ ස්මාරකය ඉවත් කිරීමට විරෝධය පා හෙට හර්තාල් ව්‍යාපාරයක්, Available at: https://mawbima.lk/news-search/%E0%B6%BA%E0%B7%8F%E0%B6%B4%E0%B6%B1%E0%B6%BA%20%E0%B7%80%E0%B7%92%E0%B7%81%E0%B7%8A%E0%B7%80%E0%B7%80%E0%B7%92%E0%B6%AF%E0%B7%8A%E2%80%8D%E0%B6%BA%E0%B7%8F%E0%B6%BD%E0%B6%BA/news-more/75735 [Accessed 22 January 2021].

[i] මෑත කාලීන ව මීට දිය හැකි උදාහරණ වශයෙන් 2020 නොවැම්බර් මාසයේ දී හින්දු ජාතිකයන්ගේ මළවුන් සිහිකිරීමේ උත්සවයේ දී එල්ල වූ විරෝධතාවය සහ යාපනය විශ්වවිද්‍යාලයේ පිහිටි යුද්ධයෙන් මිය ගියවුන් සිහිපත් කිරීමට ගොඩනැගූ මුල්ලිවෛක්කාල් ස්මාරකය විශ්වවිද්‍යාල පරිපාලනය විසින් විනාශ කිරීම උපුටා දැක්විය හැකි ය (Hettihewa, P. & Jamaldeen , N.,).

[ii] චිත්‍රපටයෙහි සිංහල නම තුන්දෙනෙක් වුව ද එහි ඉංග්‍රීසි නම Her, Him, The Other වේ. චිත්‍රපටයේ එක් එක් කොටස ද මේ අනුව නම් කර තිබෙන්නේ ඇය, ඔහු, අනෙකා යනුවෙනි. මෙම ලිපිය මගින් සම්පූර්ණ චිත්‍රපටය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී තුන්දෙනෙක් යන නම ද ඒ ඒ කොටස පිළිබඳ ව සාකාච්ඡා කිරීමේ දී ඒ ඒ කොටසෙහි නම ද භාවිත කෙරේ.

[iii] මනෝවිශ්ලේෂණය තුළ අධි-අහමීය අණ යනු කිසියම් විෂයයක මානසික ව්‍යුහයේ ප්‍රධාන කාරකයෙකු වන අධි-අහමය සැලකෙන්නේ සෑම විට ම කිසියම් සදාචාරාත්මක අණකට එම විෂයය යටත් කරවන කාරකයෙකු ලෙස ය. එහෙත් ෂාක් ලැකාන් සහ ඔහු ඔස්සේ යන ස්ලාවෝයි ජිජැක් පෙන්වා දෙන්නේ අධි-අහමය සෑම විට ම විෂයයට අණ කරන්නේ ප්‍රමෝද වන්න යනුවෙන් බවයි. මෙහි දී ෆ්‍රොයිඩ් විසින් සමාජයෙහි සදාචාරාත්මක නීතීන් අභ්‍යන්තරීකරණය කිරීමෙන් සෑදෙන මානසික කාරකයෙකු ලෙස හඳුනාගනු ලැබූ අධි-අහමය විසින් විෂයයට තමාගේ ම ප්‍රමෝදය අත්විඳීමට බල කරන බවයි. මෙය විෂයය කිසියම් අශ්ශීල ප්‍රමෝදයක් කරා රැගෙන යන බව ජිජැක් පෙන්වා දෙයි. වික්‍රමාරච්චි විසින් සිය විග්‍රහයට පාදක කරගෙන ඇත්තේ මෙම න්‍යායකරණය යයි අනුමාන කළ හැකි ය. (බලන්න Žižek 199 67-73).


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

[සඩ] සංකේතීය පිළිවෙළ සහ යථාව අතර සම්බන්ධය විශ්ලේෂණ සන්දර්භය තුළ මතුවන ආකාරය පිළිබඳ විස්තරයක් සඳහා බලන්න Lacan,Jacques (1993,1997) 81-85.

[v] මෙම අදහස රෝලන්ඩ් බාත් විසින් ඉදිරිපත් කරන ලද "play යන අදහස සමග සම්බන්ධ ය. බලන්නඃ Barthes, Roland.

[vi] ලැකාන් විසින් මෙම සංකල්පය ඔහුගේ ලිවීම්වල විවිධ අවස්ථාවල දී විග්‍රහ කර ඇත. මෙහි ගෙන එන අර්ථයෙන් යථාව සහ වියනොහැකිභාවය අතර සම්බන්ධය සඳහා බලන්න (Lacan, Jacques 1981:167); යථාවේ විවිධ ප්‍රකාශමානිතයන් පිළිබඳ සාකච්ඡාවක් සඳහා බලන්න Žižek, Slavoj, *Looking Awry* 24-25; 136-137;

[vii] ඡායාරූපයක් දර්ශීය සංඥාවක් ලෙස ක්‍රියා කරන්නේ ය යන අදහස බොහෝ න්‍යායවේදීන් විසින් සාකච්ඡා කර ඇත. රෝලන්ඩ් බාත්ස්. සූසන් සොන්ටාග්, අන්ද්‍රේ බසෑන් ආදිය විසින් මෙම න්‍යාය ඉදිරිපත් කර ඇත. මීට ප්‍රතිවිරුද්ධ මතයේ සිටින න්‍යායවේදීන් අතර ප්‍රමුඛයා වන්නේ පියෑර් බෝදියු ය. ඔහු ඇතුලු ඡායාරූපයේ සංකේතකරණය පිළිබඳ ව සාකච්ඡා කරන බොහෝ දෙනා තර්ක කරන්නේ ඡායාරූපය වස්තුවේ පැවැත්මෙහි දර්ශකයක් නොව ඡායාරූපමය කතිකාව තුළ ක්‍රියාත්මක වන විවිධ කේත හරහා ගොඩනැගෙන සංකේතීය කතිකාවක් බවයි. මෙම විවාදය පිළිබඳ ප්‍රයෝජනවත් සාකච්ඡාවක් සඳහා බලන්න. ගයිමර්, පීටර්.

[viii] මෙම චිත්‍රපටයේ දී මෙය වඩාත් වැදගත් වන්නේ හඳගම සහ කේසා ද තම තමාගේ චරිත රඟපෑමයි. එය එක් අතෙකින් ඔවුන්ව චිත්‍රපටයේ මූර්තිමය සංඥා **(iconic sign)** බවට පත් කරන අතර ම අනෙක් අතින් සිනමා පඨිතය ඔවුන්ගේ පැවැත්ම පිළිබඳ දර්ශීය සංඥාවක් බවට පත් කරයි. (රෝසන් 49). එහෙත් ඒ අතරම ඊට ප්‍රතිවිරුද්ධ ලෙස ප්‍රේක්ෂකයා එම රූපයේ උත්පාදනීය තත්ත්වය, එනම් ඔවුන් කවුද, ඔවුන් මෙහි සිටින්නේ කුමකට ද යන්න  පිළිබඳ ව නිශ්චිත ලෙස නොදනී. ඇත පිටිසර තරුණිය හමුවීමට යන අවස්ථාවේ දී ඇය එක් විට ම හඳගම නම් සුප්‍රකට සිනමා අධ්‍යක්ෂවරයා හඳුනා නොගැනීම මගින් මෙය සංකේතවත් වේ. වෙනත් වචනයෙන් කියන්නේ නම් රූපය එක් විට ම, විමර්ශකයේ පැවැත්මෙහි සහතිකයක් වන අතර ම එම විමර්ශක සංඥාව උත්පාදනය වූ ඓතිහාසිකත්වයෙන් එය ගලවා දමන බවයි.

[ix] මෙම අභිචාර විධිවල සංකේතීය වැදගත්කම ස්ලාවෝයි ජිජැක් මෙසේ විස්තර කරයිඃ "සංකේතීයකරණය එහි පාරිශුද්ධ ම ආකාරයෙන් පෙනී සිටින්නේ අවමංගල අභිචාර ක්‍රම තුළ වන්නේ නිශ්චිත ලෙස ම මෙම හේතුව නිසා ය. මියගියවුන් සංකේතීය සම්ප්‍රදායෙහි පඨිතය තුළ ඒ හරහා ලේඛනය කරනු ලැබේ. ඔවුන්ගේ මරණය නොතකා ඔවුන් ප්‍රජාවෙහි මතකය තුළ ජීවත්වනු ඇති බව ඔවුන්ට එම අභිචාර හරහා සහතික කරනු ලැබේ." ( Žižek Looking Awry:  23).

[x] ලැකාන් විසින් පෙන්වා දෙනු ලබන්නේ මිනිස් විෂයය යථාවට විවෘත වන ඕනෑ ම හමුවීමක් යනු මඟහැරුණු හමුවීමක් බවයි. Lacan:1981, 55. අපට චිත්‍රපටය පුරා එබඳු මඟහැරුණු හමුවීම් ගණනාවක් හමුවේ. මහලු මවට ඇගේ නැති වූ දරුවා (නො)හමුවීම, දමිළ තරුණිය කෙරෙහි සිංහල ත්‍රිරෝද රථ රියැදුරාගේ ප්‍රේමය මේ අතර වේ.

[xi] උපාලි අමරසිංහ ද මෙම රූපය පිළිබඳ මීට සමාන්තර විග්‍රහයක් ඉදිරිපත් කර ඇත.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දොළොස්වන කලාපය 2021 දෙසැම්බර්
පිටු 64-71
ISSN 1800-1459 eISSN 2386-2041
© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය සහ ව්‍යවස්ථා වර්ධනයː ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය

# (Political Culture and the Constitutional Development: the Constitutional Council and Democratic Governance in Sri Lanka)

රවින්ද්‍ර ගුණසේකර

දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**gunasekarasdr@sjp.ac.lk**

**සාරසංක්ෂේපය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් එම ජනතාවගේ පරමාධිපති බලය නිරූපණය කළ යුතු අතර එය තීරණ නිර්මාණ ක්‍රියාවලියේ දී පුළුල් මහජන සහභාගීත්වයක් සහතික කිරීම සඳහා හේතු පාදක වන බව අවිවාදිත ය. ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරම්භක අවිධියේ පටන් දැඩි දෝෂදර්ශනයට ලක් වන්නේ දෙමුහුන් නැතහොත් ජනාධිපති-කැබිනට් ලක්ෂණ සහිත ව්‍යවස්ථාදායක හා විධායක ක්‍රමය තුළ ජනාධිපතිවරයා සිය බලතල හා කාර්යයන් විෂයයෙහි අනම්‍ය හා අතිශය බලපෑම් සහගත වීම හේතු කොටගෙන, ඔහුගේ ක්‍රියාකාරකම් ව්‍යවස්ථාදායකයට හෝ අධිකරණයට සංවරණය කළ නොහැකි වීම යි. මේ තත්ත්වය පිටු දැකීම සඳහා විවිධ ව්‍යුහාත්මක හා කාර්යාත්මක ප්‍රතිසංස්කරණයන් ඉදිරිපත් වුව ද ඒ පිළිබඳ වඩාත් සාධනීය උත්සාහයක් ලෙස සැලකෙන්නේ 2015 වර්ෂයේ ඉදිරිපත් වූ 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ස්ථාපිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ජනාධිපතිවරයාගේ තත්ත්වය හා බලතල ආශ්‍රිත ව 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ප්‍රකාශිත තුළනය සහ එය මෙරට ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනය සඳහා සිදු කර ඇති දායකත්වය, දේශපාලන - සංස්කෘතික ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා ගුණාත්මක ක්‍රමය යටතේ ද්විතීයික දත්ත පදනම් කරගෙන ව්‍යවස්ථා-ජන වර්ග අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරමින් ප්‍රධාන නිගමන තුනකට එළඹෙන ලදි. පළමු ව, සමානුපාතික නියෝජන ක්‍රමය සහ මහජන මතය පරිවර්තනීය කාර්යභාරයක් ඉටුකර ඇති නමුත් තවදුරටත් ජනාධිපතිවරයාගේ අධිපතිධාරී ක්‍රියාකලාපය ව්‍යාවස්ථාදයකය හෝ අධිකරණය මගින් සංවරණය සඳහා විෂය නොවන බව. දෙවනු ව, 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අරමුණු වශයෙන් ඉතා නිවැරදි වුව ද සැලකිව යුතු වැරදි හා දුර්වලතා රාශියක් සහිත මෙරට දේශපාලන සංස්කෘතිය පිළිබඳ සාවද්‍ය තක්සේරුවක් සහිත ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් බව. තෙවනු ව, ව්‍යවස්ථාදයක සභාව මූලික වශයෙන් මෙරට දේශපාලනීකරණ ක්‍රියාදාමයේ ප්‍රධාන උපායමාර්ග තුන වන පවුල්වාදය හා ගජමිතුරු ක්‍රමය සහ සහචරවාදය පිටුදැකීම සැලසුම් සහගත ව පිටුදැකීම සඳහා සම්පාදනය කරන ලද සාර්ථක ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් බව මෙම අධ්‍යයනය මගින් පෙන්වා දී ඇත.

**කේන්ද්‍රීය වචනඃ** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, විධායකය, ප්‍රජාතන්ත්‍රවාදය, ආණ්ඩුකරණය, දේශපාලන සංස්කෘතිය

A constitution should reflect the sovereignty of people which leads to a broad public participation in the decision making process. From the very beginning, the president-cabinet hybrid has been severely criticized owing to the excessive authority vested in the office of president in Sri Lanka. In this sense, the powers and functions of president are not subjected to check and balance by the legislature and court. Consequently, several efforts have been taken to introduce a 'balanced scheme' and, the nineteenth amendment to the constitution has been the most recent alteration to host a constitutional council for shared powers in the democratic governance. The main objective of this study is to examine the balance of power introduced under 19A and its contribution to politico-administrative deliberation in a political culture perspective. For this, the constitutional ethnography method is employed with qualitative-secondary data design and arrived at three main conclusions: first, the proportional representation and public opinion play a transitional role in the decision making process but the authoritative executions of president cannot be monitored or composed in legislative and judicial occupations. Second, even though the 19A is objectively vibrant and strategically prodigious, it comprises several technical deficiencies and functional miscalculations. Finally, the Constitutional Council is an effective initiation in mitigating the adversaries from nepotism, cronyism and companionism which have been the major impediments in the political culture of Sri Lanka.

**Key Words**: Constitution, Executive, Democracy, Governance, Political Culture

## හැඳින්වීම

නිදහසින් පසු ව ශ්‍රී ලංකාවෙහි නිර්මාණය වූ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පටන් අද දක්වා ගෙවුණු කාලය තුළ දීර්ඝ වශයෙන් අත්දැකීම් ඇත්තේ අධිකාරීවාදී නැතහොත් අර්ධ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ ව යි. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද එම ලක්ෂණ වර්ධනය කිරීම හැරුනු විට සැලකිය යුතු සංවරණයකට උත්සාහ දරා නැති අතර එමගින් ජනාධිපතිවරයා වෙත විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ යන ත්‍රිවිධ ක්ෂේත්‍ර ආවරණය කරමින් පුළුල් බලතල පවරා ඇත. එහි ප්‍රතිඵලය වන්නේ ජනාධිපතිවරයා රාජ්‍යයේ, ආණ්ඩුවේ සහ බහුතර බලය හිමි දේශපාලන පක්ෂයේ හෝ කණ්ඩායමේ නායකයා වශයෙන් මෙන් ම සෘජු මහජන ඡන්දයෙන් තේරීපත් වන අයෙකු වශයෙන් සමාජ-ආර්ථික ජීවිතයේ සෑම අංශයක් ම තම දේශපාලන ආශාවන්ට අනුකූල වන ආකාරයෙන් පාලනය කිරීමට, නැතහොත් දේශපාලනීකරණයට නතුකර ගැනීමට හැකියාව ලැබීමයි (Priyantha at, al. 2019: 211). මේ තත්ත්වය සමහර දේශපාලන විද්‍යාඥයින් පැහැදිලි කර ඇත්තේ වැඩවසම්-ප්‍රජාතන්ත්‍රවාදී හෙවත් සාම්ප්‍රදායික අධිකාරීවාදී ලක්ෂණ නූතන ප්‍රජාතන්ත්‍රවාදී ඇගයුම් සමඟ මිශ්‍රවීමක් වශයෙනි (Jupp, 1978: 32). තවත් සමහර පර්යේෂකයන් මෙම දේශපාලනීකරණ ක්‍රියාවලිය පැහැදිලි කර ඇත්තේ සාම්ප්‍රදායික පාලක පන්තියේ යළි නැගිටීමක් වශයෙන් වන අතර එය පැරණි ලංකා සමාජයට අනන්‍ය ලක්ෂණයක් ලෙස සියවස් ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වූවකි (Wijeweera, 1988: 21). කෙසේ වුව ද මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ එක් අතකින් දිවයිනේ උතුරු-නැගෙනහිර ප්‍රදේශ මුල්කරගෙන වෙන ම රාජ්‍යයක් සඳහා වූ සුළුතර ද්‍රවිඩ ජනවාර්ගික-ජාතිකවාදී ව්‍යාපාරයක් නිර්මාණය වීම සහ අනෙක් පසින් බහුතර සිංහල ජනවර්ගය තුළ ආණ්ඩුවේ අධිපතිධාරී ක්‍රියාකලාපයට එරෙහි ප්‍රබල මහජන ව්‍යාපාරයක් ඇති වීම යි. මෙම පොදුජන විරෝධය සමාජවාදී රාජ්‍යයක් කරා ගමන් කිරීමට 1971 සහ 1987-89 ආදී වශයෙන් අවස්ථා දෙකක දී උත්සහකර ඇති මුත් එය සාර්ථක වූයේ නැත. ඉන්පසු එල්.ටී.ටී.ඊ සංවිධානය මුල්කරගෙන වෙන ම රාජ්‍යයක් සඳහා වූ ද්‍රවිඩ ජනවාර්ගික-ජාතිකවාදී ව්‍යාපාරය සිවිල් යුද්ධයක් දක්වා වර්ධනය වුව ද එය 2009 මැද භාගයේ දී යුධමය වශයෙන් පරාජයට පත් විය. මේ කාල පරාසය තුළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ආශ්‍රිත ව ප්‍රබල ඉල්ලීමක් බවට පත්වූයේ බලය බෙදීම පිළිබඳ අදහස වුව ද යුධ ජයග්‍රහණයෙන් අනතුරු ව එයට තවදුටත් වැදගත් පිළිගැනීමක් ලැබුණේ නැත (Uyangoda, 2009: 104). ඒ වෙනුවට 2010 වර්ෂයේ ඉදිරිපත් කරන ලද 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් එතෙක් අක්‍රිය ව පැවති 17 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉදිරිපත් කළ ජනාධිපතිවරයාගේ බලතල සංවරණය පිළිබඳ සියලු විධිවිධාන අහෝසි කොට, මුල් ව්‍යවස්ථාවේ බලතල ද ඉක්මවා යන ආකරයෙන් බලය තහවුරු කරගන්නා ආකරය දැකිය හැකි ය.

මෙම අධිපතිධාරී පසුබිමෙහි වර්ධනය වන මහජන විරෝධය හමුවේ 2015 මැතිවරණයෙන් පැවති ආණ්ඩුව පරාජයට පත්වන අතර නව ආණ්ඩුවේ වැදගත් මැතිවරණ පොරොන්දුවක් ලෙස 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ බලතල සංවරණය කොට ව්‍යවස්ථාදායකය සමඟ එක්තරා සහමතිකතාවක් ගොඩනැගීමට උත්සාහ කර තිබේ (Fernando, 2016:2). මෙම පරිවර්තනය සඳහා කැපීපෙනෙන දායකත්වයක් සැපයූයේ සිවිල්-දේශපාලන ව්‍යාපාරය වන අතර එහි ප්‍රබල ඉල්ලීමක් වූයේ පරිණත ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා ව්‍යවස්ථාදායක විධායක හා අධිකරණ යන ආයතන අතර පැහැදිලි බල බෙදීමක් සහිත ව සංවරණය හා තුළනය මූලධර්මය ක්‍රියාත්මක විය යුතු බව යි.

## සාහිත්‍ය විමර්ශනය

මෙම අධ්‍යයනයේ සාහිත්‍ය විමර්ශනය මගින් දේශපාලන සංස්කෘතිය හා ව්‍යවස්ථානුකූලවාදය පිළිබඳ න්‍යායික හා සංකල්පීය විශ්ලේෂණයකින් අනතුරු ව එය ලංකාවේ ව්‍යවස්ථා වර්ධනය හා ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය පිළිබඳ අත්දැකීම් ආශ්‍රිත ව සලකා බලනු ලැබේ.

## දේශපාලන සංස්කෘතිය හා ව්‍යවස්ථානුකූලවාදය

දේශපාලන සංස්කෘතිය යනු කිසියම් දේශපාලන ක්‍රමයක පුළුල් ව පැතිර පවතින ආකල්ප, විශ්වාස සහ මතවාදවල එකතුවක් වන අතර එය එම දේශපාලන ක්‍රමයේ පැවැත්ම සම්බන්ධ මූලික චර්යාවන් තීරණය කරයි (IESS, 1968: 218). දේශපාලන සංස්කෘතිය මගින් කිසියම් දේශපාලන ක්‍රමයක් තුළ සිටින ජනතාවක් වෙත එම දේශපාලන ක්‍රමයේ පවතින මූලික ඇගයුම්වලට සමාන්තර ව ඔවුනගේ දේශපාලන චර්යාවන් තීරණය කිරීමට අවශ්‍ය නිර්නායක සපය යි. මෙහි දී ග්‍රේබ්‍රියල් ආමන්ඩ් ඇතුළු පර්යේෂක කණ්ඩායම පෙන්වා දෙන්නේ කිසියම් දේශපාලන ක්‍රමයක පවතින තත්ත්වය එම දේශපාලන ක්‍රමයේ දීර්ඝකාලීන ලක්ෂණ ආශ්‍රිත ව නිර්මාණය වී ඇති බව යි. ඔවුනට අනුව දේශපාලන සංස්කෘතියක් මගින් එම රටේ දේශපාලනය පිළිබඳ සියලු කරුණු පැහැදිලි නොකරනවා සේ ම එම දේශපාලන සංස්කෘතිය නොවෙනස් ව පවතින්නේ ද නැති නමුත් දේශපාලන සංස්කෘතියේ වෙනස්කම් සාමාන්‍යයෙන් සිදුවනුයේ ඉතා සෙමින් වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් දේශපාලන ක්‍රියාකාරකම්වල එක්තරා නිශ්චිත ස්වාභාවයක් දක්නට ලැබේ (Almond et al, 2000: 49). මේ නිසා දේශපාලන සංස්කෘතිය යන්න කිසියම් රටක දේශපාලන හැඩගැස්ම හඳුනා ගැනීම සම්බන්ධ ව තීරණාත්මක සාධකයක් වන අතර සංකල්පීය වශයෙන් දේශපාලන ක්‍රමයක පුරවැසි ප්‍රාරම්භනය අංක 1 රූප සටහන අනුව එය ප්‍රධාන කොටස් තුනකට වර්ග කළ හැකි ය.

 © 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය


**රූප සටහන 1: දේශපාලන සංස්කෘතියේ පැතිකඩ**

| ක්‍රමය | ක්‍රියාවලිය | ප්‍රතිපත්ති |
|---|---|---|
| ජාතිය පිළිබඳ අභිමානය | ආණ්ඩුවේ මූලධර්ම | ආණ්ඩුවේ භූමිකාව |
| ජාතික අනන්‍යතාව | පුරවැසි භූමිකාව | ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා |
| ආණ්ඩුවේ සුජාතභාවය | දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ නැඹුරුව | |

මූලාශ්‍රය: Almond, G.A, Powell, G.B, Strom, K and Dalton, R.J (2000). *Comparative Politics Today: A World View.* 7th ed., New York: Longman. p. 50.

දේශපාලන සංස්කෘතියේ විවිධ පැතිකඩයන්ට අනුව දේශපාලන ක්‍රමයක තත්ත්වය වෙනත් දේශපාලන ක්‍රම දෙකක් හෝ වැඩි ගණනක් සමග සංසන්දනය කරමින් පරීක්ෂා කළ හැකි ය. නිදසුනක් ලෙස දේශපාලනය හා ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාදාමය ගත්විට දේශපාලන ක්‍රියාවලිය වෙත ජනතාවගේ නැඹුරුව ප්‍රධාන වශයෙන් සහභාගී, විෂයික හා පටු සංස්කෘතීන් වශයෙන් වර්ග කළ හැකි ය. මෙය ආමන්ඩ් ඇතුළු පර්යේෂක කණ්ඩායම පහත අංක 2 රූප සටහන යටතේ දක්වා ඇත.

**රූප සටහන 2: දේශපාලන ක්‍රියාවලිය තුළ ඇති නැඹුරුව අනුව දේශපාලන සංස්කෘතිය**




මූලාශ්‍රය: Almond, G.A, Powell, G.B, Strom, K and Dalton, R.J (2000). *Comparative Politics Today: A World View.* 7th ed., New York: Longman. p. 52.

අංක 2 රූප සටහනේ පළමු සහ දෙවන තීරු මගින් සංවර්ධිත ප්‍රජාතන්ත්‍රවාදී සහ පශ්චාත් කොමියුනිස්ට් සමාජ දක්වා ඇති අතර මෙම රටවල් දේශපාලන සහභාගීත්වය අතර ඉතා පැහැදිලි පරතරයක් තිබේ. දෙවන වර්ගීකරණයට සාපේක්ෂ ව තෙවන එනම් පශ්චාත් කොමියුනිස්ට් සංවර්ධනය වෙමින් පවතින සමාජ ගත් විට ඒවායේ දේශපාලන සහභාගීත්වයේ කිසියම් වර්ධනයක් දකින්නට තිබේ. පශ්චාත් යටත්විජිත ප්‍රජාතාන්ත්‍රික සමාජ ගත්විට ඒවායෙහි ප්‍රාදේශික නැතහොත් සීමිත ඇඟයුම්වල විශාල වර්ධනයක් දැකිය හැකි අතර එය ඉහත මූලික වර්ගීකරණයන් තුන ම අභිබවා ඉදිරියට පැමිණ තිබේ. මෙහි දී ආමන්ඩ් ඇතුළු පර්යේෂක කණ්ඩාම පෙන්වා දෙන්නේ මෙම පටු නැතහොත් සීමිත ඇගයුම් දරන පිරිසෙන් බහුතරයක් දිළිඳු, නූගත් පැල්පත් වාසීන් හෝ කම්කරු හෝ ග්‍රාමීය දිළිඳු ගොවි ප්‍රජාව වන අතර මොවුන්ට දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නැත (Almond et al., 2000: 53). නිදසුන් වශයෙන් අප්‍රිකානු හා දකුණු ආසියානු කලාපවල රටවල ග්‍රාමීය, ආගමික හා දේශපාලන වශයෙන් සවිඥානික නොවන බහුතර ජනතාවක් ජීවත් වෙති. මේ සමාජවල දේශපාලන සහභාගීත්වය ප්‍රධාන වශයෙන් දැනට දේශපාලනයේ නියැළෙන අයගේ පවුල්වල සාමාජිකයන්ට, ව්‍යාපාරික ප්‍රභූන්ට හා උගත් වෘත්තිකයනට සීමා වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මේ සමාජවල බහුතර ජනතාවක් නිදහස හෝ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම්වලට වඩා ආගමික හා ජනවාර්ගික-ජාතිකවාදී ව්‍යාපාර කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වති.

රටක දේශපාලන සංස්කෘතිය හැඩගැසීමෙහි ලා තීරණාත්මක බලපෑමක් කරනුයේ එම රටෙහි පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යි. වෙනත් ආකාරයකට පෙන්වා දෙන්නේ නම් දේශපාලන ක්‍රමයක නෛතික-තාර්කික නැතහොත් ප්‍රජාතන්ත්‍රවාදී හෝ අධිකාරීවාදී ලක්ෂණ මුලින් ම ප්‍රකාශිත වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සපයා ඇති ප්‍රතිපාදන මගිනි. මේ අර්ථයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් කිසියම් දේශපාලන අධිකාරීත්වයක් සුජාතියකරණය සඳහා ප්‍රබල දායකත්වයක් සපයන අතර එහි දී බලය ජනතාව කෙරෙන් උපදින්නේය යන්න නූතන ව්‍යවස්ථානුකූලවාදය තුළ ඇති ප්‍රබල පිළිගැනීමකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සම්බන්ධ මූලධර්ම වෙත අවධානය යොමු කරන විට බලතල බෙදීම, රාජ්‍ය හා පෞද්ගලික අංශය, රාජ්‍ය හා පුද්ගලයන්, මූලික අයිතිවාසිකම් හා ආණ්ඩුවේ විවිධ ආයතන අතර සීමා


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නිර්ණනය කිරීම ආදිය ඇතුළත් වේ (Cottier and Hertig, 2003: 264). මෙම පසුබිමෙහි සීමිත ආණ්ඩුකරණය පිළිබඳ සංකල්පය මගින් මූලික වශයෙන් නීතියේ ආධිපත්‍යය යන්න අදහස් වෙයි. වෙනත් ආකාරයකට පෙන්වා දෙන්නේ නම් ආණ්ඩුකරණය යන්න නීතිය සම්බන්ධ වනවා මිස කිසිසේත් එය පුද්ගල බද්ධ කරුණක් නොවේ. ඒ අනුව රටක මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ වෙනත් නීති හා විධිවිධාන මගින් පාලන ක්‍රියාවලියට සම්බන්ධ අය මෙන් ම ඊට යටත් අය ද හසුරුවමින් දේශපාලන ක්‍රමයක ස්ථාවරත්වය තහවුරු කිරීමෙහි නිරත වේ.

ව්‍යවස්ථානුකූලවාදය මගින් කියැවෙන්නේ ආණ්ඩුවේ විවිධ ක්‍රියාකාරකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශිත විධිවිධානවලට අනුකූල වියයුතු බවයි. ඒ අනුව ව්‍යවස්ථාව පදනම් කරගෙන නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක විය යුතු අතර එය කිසිවිටකත් පාලන තන්ත්‍රයේ අත්තනෝමතික ඒකඝතා හෝ නිලබලක්‍රමයේ සීමාවන් මගින් උල්ලංඝනය නොකළ යුතු ය. ව්‍යවස්ථානුකූලවාදය සංකල්පයේ මූලික හරය වන්නේ කිසියම් දේශපාලන සමාජයක දේශපාලඥයින් හෝ නිලධාරීන් කිසිවිටකත් තම අභිමතය අනුව ක්‍රියා නොකළ යුතු අතර ඔවුන් තම බලතල, ඒවා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ නියමිත පටිපාටි මෙන් ම ඒවායේ සීමාවන් ද මනාකොට දැනසිටිය යුතු බවත්, ඒ සියල්ල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල ව මිස අනනුකූල ව නොවිය යුතු බවත් ය (Fellman, 1974: 485). මේ අනුව ව්‍යවස්ථානුකූලවාදය අත්තනෝමතික හෝ අධිපතිධාරී පාලනයකින් තොර ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක හවුල්කරුවන් වීම සඳහා ඇති අයිතිය සඳහා වන මූලික කොන්දේසියකි.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය

ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එරෙහි ප්‍රධාන විවේචනය වන්නේ ජනාධිපතිවරයා සතු ව ඇති අතිමහත් විධායක බලතල සහ ඒවා ව්‍යවස්ථාදායකයට හෝ අධිකරණයට කිසිදු අයුරකින් සංවරණය කිරීමට නොහැකි වීම යි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වගන්තිය අනුව ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා ද, ආණ්ඩුවේ නායකයා ද, විධායකයේ ප්‍රධානියා ද, සන්නද්ධ සේවාවන්හි ප්‍රධාන අණදෙන නිලධාරියා ද වේ. මීට අමතර ව ඔහු පාර්ලිමේන්තුවේ බහුතර බලය හිමි පක්ෂයේ හෝ කණ්ඩායමේ නායකයා ද එහි දේශපාලන ප්‍රධානියා ද වන පසුබිමක දිවයිනේ දේශපාලන-පරිපාලන තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ ඉහළ සිට පහළට ම ඔහුගේ අභිමතය අනුව ක්‍රියාත්මක වීම නොවැළැක්විය හැකි දෙයක් බවට පත් වේ. මේ තත්ත්වය වඩාත් තීව්‍ර වනුයේ ජනාධිපතිවරයා සෘජු මහජන ඡන්දයෙන් තේරී පත්වීම තුළ ඔහු රටේ පළමු පුරවැසියා සහ විධායක තීරණ සම්බන්ධ ව ප්‍රධාන චරිතය ද බවට පත් වීම තුළයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 (අ) උප වගන්තිය අනුව ජනාධිපතිවරයා සිය බලතල හා කාර්ය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතු වුව ද ඔහු පාර්ලිමේන්තුවේ සාමාජිකයෙකු නොවේ. ව්‍යවස්ථාවේ 42 (3) උප වගන්තිය අනුව ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් ද එහි ප්‍රධානියා ද වශයෙන් සිය විධායක තීරණ අමාත්‍ය මණ්ඩලය මගින් පාර්ලිමේන්තුවට සන්නිවේදනය කරන අතර එහි දී ඒ සම්බන්ධයෙන් පිළිතුරු දීමට සිදුවන්නේ අමාත්‍ය මණ්ඩලයට යි. මේ අනුව ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකියනු ලබන්නේ සිය අමාත්‍ය මණ්ඩලය හරහා වක්‍රාකාරයෙන් වන අතර එමගින් ඔහුට සෘජු වගකීමක් නැති බලයක් පැවරී ඇති බව පැහැදිලි ය.

මේ අනුව පාර්ලිමේන්තුවට ජනාධිපතිවරයාගේ තීරණ අනුමත කරන සහායක ආයතනයක් වීම හැරුණු විට නිරීක්ෂණය හෝ සංවරණ පිළිබඳ වැදගත් කාර්භාරයක් ඉටු කළ හැකි තත්ත්වයක් නැත. මේ පසුබිමෙහි දේශපාලන පක්ෂ ක්‍රමයේ බැඳීම් හා සමහර ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් හැරුණු විට ප්‍රායෝගික දේශපාලනය තුළ ජනාධිපතිවරයා ව්‍යවස්ථා ප්‍රතිපාදන නිරන්තරයෙන් අවභාවිත කරමින් සිය බලය හා වරප්‍රසාද තර කොට ගෙන තිබේ. මේ තත්ත්වය අවාසනාවන්ත ලෙස දේශපාලන ක්‍රමය තුළ බරපතල ගැටලු ඇති කර ඇති අතර එයින් සමහරක් වන්නේ දේශපාලන-පරිපාලන යාන්ත්‍රණය පවුල්වාදය (Nepotism), ගජමිතුරු ක්‍රමය (Cronyism) හා සහචරවාදය (Companionism) මුල්කරගෙන පුළුල් දේශපාලනීකරණයකට ලක් වීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස තීරණ ගැනීමේ ක්‍රියාවලිය මුලුමනින් ම අනියම් හා අවිධිමත් එකක් බවට පත්වන අතර ව්‍යවස්ථාවේ 35 (1) වගන්තිය මගින් ජනාධිපතිවරයාට එරෙහි ව සිය ධූරකාලය තුළ කිසිදු අධිකරණයක නඩු පැවරීමේ මුක්තිය හිමිවීම තුළ ඔහුට වඩාත් අභිමත හා අනියම් ආකාරයෙන් ක්‍රියාකිරීමට අවස්ථාව හිමි වේ. ජනාධිපතිවරයා පාලනය කළ හැකි එක ම ක්‍රමවේදය වන්නේ ව්‍යවස්ථාවේ 38 (2) උප වගන්තිය අනුව දෝෂාභියෝගයක් ඉදිරිපත් කිරීම වුව ද පවතින විධිවිධාන හා ව්‍යවස්ථාදායකයේ සංයුතිය කිසිසේත් ඒ සඳහා පහසුකම් නොසපය යි.

## පර්යේෂණ ගැටලුව

මෙම අධ්‍යයනය මගින් දේශපාලන - සංස්කෘතික ප්‍රවේශය යටතේ ලංකාවේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය ආශ්‍රිත ව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය ලබා ඇති ප්‍රගතිය ප්‍රධාන පර්යේෂණ ප්‍රශ්න තුනක් යටතේ පරීක්ෂා කෙරේ. පළමු ව, වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ තත්ත්වය හා බලතල වර්ධනය වීම සම්බන්ධ ව බලපා ඇති විධිමත් හා අවිධිමත් විධිවිධාන හා අවස්ථා මොනවා ද? දෙවනු ව, 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, ව්‍යවස්ථාදායකය හා විධායකය අතර බලතල කෙසේ සංවරණය කර ඇති ද? සහ අවසාන වශයෙන් ලාංකේය දේශපාලනයෙහි 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ස්ථාපිත ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රධාන බාධාකාරී සාධකය කුමක් ද? යන්න අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය.

## පර්යේෂණ අරමුණු

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ජනාධිපතිවරයාගේ තත්ත්වය හා බලතල ආශ්‍රිත ව 19


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ප්‍රකාශිත තුලනය සහ එය මෙරට ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනය සඳහා සිදුකර ඇති දායකත්වය දේශපාලන සංස්කෘතික ප්‍රවේශයකින් පරීක්ෂා කිරීම යි. ඒ අනුව මෙම අධ්‍යයනයේ උප අරමුණු තුනකි.

(අ) ජනාධිපතිවරයාගේ තත්ත්වය හා බලතල වර්ධනය විම සඳහා බලපා ඇති විධිමත් හා අවිධිමත් විධිවිධාන හා අවස්ථා මොනවා ද යන්න පරීක්ෂා කිරීම.
(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් ව්‍යවස්ථාදායකය හා විධායකය අතර නිර්මාණය කර ඇති සංවරණයේ ස්වාභාවය හඳුනා ගැනීම.
(ඇ) දහනම වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉදිරිපත් කර ඇති ප්‍රතිසංස්කරණ, ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය සඳහා කෙසේ ඉවහල් වන්නේ ද යන්න හඳුනා ගැනීම.

## පර්යේෂණයේ වැදගත්කම

මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා වර්ධන ඉතිහාසය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සඳහා ඍජු දායකත්වයක් සපයන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ විශේෂ අවධානයක් යොමුකර ඇත. ඒ අතරින් දහනම වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීම සහ එය ව්‍යවස්ථාදායකය හා විධායකය අතර බල හවුල්කාරීත්වයක් නිර්මාණය කර ඇති ආකාරය අධ්‍යයනය කෙරේ. එමගින් දේශපාලන-පරිපාලන ක්‍රියාවලිය අපක්ෂපාතී හා වගවීමෙන් යුතු ව කටයුතු කිරීමෙන් දැනට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට එල්ල වී ඇති ප්‍රධාන බාධාවන් මගහැර ගැනීමට හැකියාව ලැබේ. එමගින් ජනවාර්ගික ජාතිකවාදී ආශාවන් පිටුදැකීමටත්, සංවර්ධනයේ අසමතුළිතතා මගහරවා ගැනීමටත් මෙන් ම ජාතිය ගොඩනැගීමේ ක්‍රියාවලිය සඳහාත් එක ලෙස ඉවහල් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය සඳහා ව්‍යවස්ථා-මානවවංශ විශ්ලේෂණය (Constitutional Ethnography) භාවිත කර ඇත. සමාන්‍යයෙන් ව්‍යවස්ථා අධ්‍යයනයන් සඳහා මානවවංශ විශ්ලේෂණයන් යොදා ගනු නොලැබුව ද දේශපාලන චර්යාව හා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන අනන්‍ය ලෙස සහසම්බන්ධ වන බව මිනිසා සහ ඔහුගේ දේශපාලන නැඹුරුව දෙස බැලීමේ දී පැහැදිලිව පෙනීයයි. මානවවංශ අධ්‍යයනයන්වල දී පර්යේෂකයන් මානව ක්‍රියාකාරකම් හා ඒවායේ අර්ථ පිළිබඳ සැලකිලිමත් වන අතර ඉන්පසු ඒවායේ නියෝජනය සහ යථාර්ථය අතර සබඳතාව පිළිබඳ අවධානය යොමු කරයි. මෙහි දී එම අදහස් කාලයත් සමග පුරුදු බවට ද ඒවා පසුකාලීන ව ආයතන බවට ද පත්වේ. මානවවංශ විශ්ලේෂකයෙකු මෙම දීර්ඝ ක්‍රියාවලිය ලේඛනගත කරන අතර එමගින් පුද්ගල චර්යාව හා ව්‍යවස්ථාමය බැඳීම් නැතහොත් ආයතනික රාමුව පිළිබඳ නිශ්චිත නිගමන වෙත පැමිණීමට හැකියාව ලැබේ. මෙම අධ්‍යයනය මගින් ලංකාවේ නෛතික-දේශපාලන සැකැස්ම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සඳහා බලපා ඇති ආකාරය ද්විතීයික-ගුණාත්මක පර්යේෂණ විධික්‍රම යටතේ ව්‍යවස්ථා-මානවවංශ විශ්ලේෂණය පදනම් කරගෙන සිදුකර ඇත.

## දත්ත විශ්ලේෂණය

ලංකාවේ ව්‍යවස්ථා වර්ධන ඉතිහාසයෙහි ජනාධිපතිවරයාගේ බලතල සංවරණය කිරීම සඳහා දීර්ඝකාලීන ප්‍රයත්න නොමැති වුව ද 2000 දශකයේ සිට ආරම්භ වන සිවිල්-දේශපාලන ව්‍යාපාරය මගින් ගනු ලැබූ ප්‍රශංසනීය උත්සාහයන් කිහිපයක් මෙහි දී සඳහන් කළ හැකි ය. ඒ අනුව පළමු වැදගත් උත්සාහය ලෙස 2001 වර්ෂයේ දී සම්මත කරන ලද 17 වන ව්‍යවස්ථා සංශෝධනය දැක්විය හැකි ය. එමගින් ව්‍යවස්ථාවේ 41 (අ) 1 උප වගන්තිය සංශෝධනය කරමින් සාමාජිකයන් දස දෙනෙකුගෙන් යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් පිහිටුවීම මගින් සියලු ස්වාධීන කොමිෂන් සභා සහ පරිපාලන තනතුරු සඳහා පුද්ගලයන් පත්කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වුව ද ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දීමෙන් දශකයකට පසු ව ද ඒ කෙරෙහි එල්ල වූ දැඩි විවේචන හා දේශපාලන බලපෙරළිය හේතු කොට ගෙන එය ක්‍රියාත්මක වූයේ නැත.

දාහත්වන ව්‍යවස්ථා සංශෝධනයට එරෙහි ව එල්ල වූ බරපතල විවේචනය වූයේ එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පවතින අසමතුළිත සංයුතිය යි. එනම් ව්‍යවස්ථාවේ 41 (අ) 1 (ඊ) උප වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ දෙවැනි සාමාජිකයා ලෙස පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයට හෝ ප්‍රධාන විපක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායම්වලට අයත් නොවන සුළු ජාතික නියෝජිතයෙකු එම පක්ෂ අතර එකඟතාව මත පත්කිරීමට යෝජනා කරනු ලැබිණ. නමුත් මෙම විධිවිධානය සම්බන්ධයෙන් එල්ල වූ ප්‍රධාන විවේචනය වූයේ ජනවාර්ගික වශයෙන් හා දේශපාලන පක්ෂ අතර පවතින ප්‍රබල බෙදීම් හේතු කොට ගෙන මෙම සුළු ජාතික ඡන්දය ස්වාධීන කොමිෂන් සභා සහ ප්‍රධාන පරිපාලන තනතුරු පත්කිරීම සම්බන්ධ ව තීරණාත්මක විය හැකි බවත්, එය දිවයිනේ ජනවාර්ගික-ආගමික සහජීවනයට හානිකර විය හැකි බවත් ය (Gunasekara and Anedo, 2018: 11). එවකට දිවයිනේ උතුරු-නැගෙනහිර පැවති සිවිල් යුද්ධය හා සිංහල-බෞද්ධ ජාතිකවාදී ව්‍යාපාරය හේතු කොට ගෙන මෙම මතවාදයට විශාල පිළිගැනීමක් ලැබුණු අතර ප්‍රතිඵලය වූයේ ජනාධිපතිවරයාගේ බලතල සංවරණය කිරීම පිළිබඳ 17 වන සංශෝධනයේ උත්සාහය මුලුමනින් ම නොසලකා හැරීම යි.

එල්.ටී.ටී.ඊ සංවිධානය 2009 වර්ෂයේ යුධමය වශයෙන් පරාජයට පත්කිරීමත් සමඟ මේ දක්වා සැලකිය යුතු ලෙස යටපත් ව පැවති සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදයේ ශීඝ්‍ර වර්ධනයක් දැකිය හැකි ය. මේ පසුබිම තුළ 17 වන සංශෝධනය අත්හිටුවමින් 18 වන ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් වන අතර එමගින් සිදුවන්නේ මුල් ව්‍යවස්ථාව ද ඉක්මවා යන ආකාරයට ජනාධිපතිවරයාගේ බලතල ඉහළ නංවාගැනීම යි. ඒ අනුව ව්‍යවස්ථාවේ 41 (අ) 1 වගන්තිය මගින් සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුතු පාර්ලිමේන්තු සභාවක් පිහිටුවන අතර එහි අනුමැතියට යටත් ව ස්වාධීන කොමිෂන් සභා සහ ප්‍රධාන පරිපාලන තනතුරු සඳහා පුද්ගලයන් නම්


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කිරීම සිදුවේ. පාර්ලිමේන්තු සභාවේ සාමාජික සංයුතියේ බහුතරය ජනාධිපතිවරයාට අභිමත ආකාරයෙන් පත් කර ගැනීමට මෙවර සමත් වන අතර එම තත්ත්වය තුළ අදාළ කොමිෂන් සභා සහ ප්‍රධාන තනතුරුවල ස්වාධීනභාවය පිළිබඳ බරපතල විවේචන එල්ලවිය. දහඅටවන සංශෝධනය මගින් තවදුරටත් ජනාධිපතිවරයාගේ තත්ත්වය ශක්තිමත් කරමින් 31(2) ආ උප වගන්තිය මගින් මෙතෙක් ජනාධිපති තනතුර පිළිබඳ වාර දෙකේ සීමාව ඉවත්කොට, අභිමත ඕනෑ ම වාර ගණනක් ධුරය දැරීමට අවස්ථාව ලබා දෙන ලදී. කෙසේ වුව ද ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතුය යන මූලධර්මය ක්‍රියාවට නැගීම සඳහා 32(3) උප වගන්තිය මගින් යටත්පිරිසයෙන් මාස තුනකට වරක් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට පැමිණිය යුතු ය යන වගන්තිය ඇතුළත් කර ඇත. එසේ වුව ද ජනාධිපතිවරයා තවදුරටත් පාර්ලිමේන්තුවේ සාමාජිකයෙකු නොවන බැවින් ද ඔහුගෙන් ප්‍රශ්න ඇසීම පිළිබඳ සම්ප්‍රදායක් පාර්ලිමේන්තුවේ නැති බැවින් ද මෙම විධිවිධාන හුදු චාරිත්‍රානුකූල ඒවා මිස ප්‍රායෝගික ඒවා නොවේ.

දහනමවන ව්‍යවස්ථා සංශෝධනය මෙරට විධායක හා ව්‍යවස්ථාදායක ආයතනවල බලතල අතර පැහැදිලි සංවරණයක් පැවතිය යුතු ය යන දීර්ඝකාලීන සිවිල්-දේශපාලන ව්‍යාපාරවල ඉල්ලීමක් පරිසමාප්තියට පත්වීමක් ලෙස දැක්විය හැකි ය. වර්ෂ 2015 පැවති ආණ්ඩුව ජනාධිපතිවරණයෙන් පරාජයට පත්වීමත් සමඟ සාම්ප්‍රදායික දේශපාලන ප්‍රභූ පැලැන්තියේ සහ සිවිල් සමාජ ව්‍යාපාරයේ පූර්ණ අනුග්‍රහය යටතේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය ඉදිරියට පැමිණෙයි. මේ අතරින් සිවිල් සමාජ ව්‍යාපාරයට සාම්ප්‍රදායික මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයේ අනුග්‍රහය එතරම් නොලැබුණ ද සමාජ මාධ්‍ය හරහා පොදුජනතාව වෙත සමීප වීමට එයට හැකි වූ අතර සාම්ප්‍රදායික දේශපාලන ප්‍රභූ පැලැන්තිය ඇතුළු දේශපාලන පක්ෂ හා කණ්ඩායම් ප්‍රජාතන්ත්‍රවාදී ඇගයුම් හා ප්‍රතිසංස්කරණ වෙත වඩාත් නැඹුරු අදහස් ඉදිරිපත් කරනු දැකිය හැකි විය. කෙසේ වුව ද ලාංකාවේ සාම්ප්‍රදායික දේශපාලන ප්‍රභූ පැලැන්තියේ හෝ සිවිල් සමාජ ව්‍යාපාරය හෝ බලාපොරොත්තු වූ අරමුණු 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉටු නොවූ බව පසුකාලීන ව සිදුකරන ලද බොහෝ විශ්ලේෂණයන් මගින් පෙන්වා දී ඇත. එයට හේතුව එම සංශෝධනය මගින් තාක්ෂණික වශයෙන් පැවැති ව්‍යවස්ථාවේ ගැටලු විසඳීමට හෝ සංස්කෘතික වශයෙන් ලාංකේය සමාජය අවබෝධ කර ගැනීමට හෝ අසමත් වීම යි.

19 වන ව්‍යවස්ථා සංශෝධනයේ මූලික අරමුණ වන්නේ ජනාධිපතිවරයාගේ තත්ත්වය හා බලතල ප්‍රජාතන්ත්‍රවාදී රාමුවකට ගෙන ඒම වන අතර ඒ සඳහා විධායක හා ව්‍යවස්ථාදායකය අතර සමතුලනයක් ඇති කිරීම සඳහා බලතුලන මූලධර්මය හඳුන්වා දීමට උත්සාහ කර ඇත. ඒ අනුව 19 වන සංශෝධනයේ 31(3) ආ මගින් ජනාධිපතිවරයාගේ ධුර කාලය වසර පහ දක්වා අඩු කර 31(2) මගින් එය උපරිම වාරගණන දෙකකට සීමා කරනු ලැබිණ. ව්‍යවස්ථාවේ 41 අ (1) මගින් 17 වන සංශෝධනයට සමාන ව යමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ඇති කර ස්වාධීන කොමිෂන් සභා නවයක් සහ ප්‍රධාන පරිපාලන තනතුරු හතක් සඳහා පුද්ගලයන් පත්කිරීම සභාවේ අනුමැතියට යටත් ව ජනාධිපතිවරයා විසින් පත්කිරීමට ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වුව ද 19 වන සංශෝධනයේ කැපීපෙනෙන දුර්වලතාවක් වන්නේ ඉතා සංකීර්ණ හා අවිනිශ්චිත ප්‍රතිපාදන ගණනාවක් දක්නට ලැබීමත්, ඒවා පිළිබඳ විවිධ පාර්ශවයන් එකිනෙකට වෙනස් අර්ථකථන ඉදිරිපත් කිරීමත් ය. ඒ අතර 45 වන වගන්තියේ (4) සහ (5) උප වගන්ති මගින් කියැවෙන ජාතික ආණ්ඩුව පිළිබඳ අදහස 42(4), 43(1), 44(1) (2), 45(1), 46(2) සහ 48(1) යන උප වගන්තිවල දැක්වෙන ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර සබඳතාව සහ 33(2), 62(2) සහ 70(1) යන උප වගන්තිවලින් කියැවෙන පාර්ලිමේන්තුවේ වාර සීමාවන් පිළිබඳ විධිවිධාන දැක්විය හැකි ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2018 නොවැම්බර් මාසයේ ජනාධිපතිවරයා විසින් දේශපාලන ප්‍රතිවිරෝධතා මත හිටපු අගමැතිවරයා ඉවත්කොට, නව අගමැතිවරයෙක් පත්කිරීමත් සමඟ ව්‍යවස්ථා අර්බුධයක් ඇතිවිය. අවසානයේ ශ්‍රේෂ්ඨාධිකරණය මගින් එම පත්කිරීම ව්‍යවස්ථානුකූල නොවන බව ප්‍රකාශ කළ අතර ඒ අනුව 19 වන සංශෝධනයේ විධිවිධාන ප්‍රකාර ව හිටපු අගමැතිවරයාට තවදුරටත් ධුරය සඳහා සුදුසුකම් හිමි විය.

ව්‍යවස්ථාවේ 41 (අ) 1 උප වගන්තිය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත වන අතර එයට අග්‍රාමාත්‍යවරයා, කතානායකවරයා, විපක්ෂනායකවරයා සහ ජනාධිපතිවරයා විසින් නම් කරන එක් තැනැත්තෙකු, අග්‍රාමාත්‍යවරයාගේ සහ විපක්ෂනායකවරයාගේ නිර්දේශ මත ජනාධිපති විසින් පත් කරන පුද්ගලයන් පස් දෙනෙකු (එයින් දෙදෙනෙකු පාර්ලිමේන්තුවේ සමාජිකයන් විය යුතු ය) සහ අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ නොවන පාර්ලිමේන්තුවේ බහුතරයේ එකඟත්වය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු අයත් වේ. ව්‍යවස්ථාවේ 41 ඉ (3) අනුව සභාවේ සණපූර්ණය පහක් වන අතර 41 (අ) 8 අනුව වසර තුනක නිලකාලයක් සඳහා සමාජිකයන් පත් කෙරේ. ඔවුහු 19 වන සංශෝධනයේ පළමු උපලේඛනයේ දැක්වෙන ස්වාධීන කොමිෂන් සභා නවයක් එනම් (අ) මැතිවරණ කොමිෂන් සභාව, (ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව, (ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව, (ඈ) විගණන සේවා කොමිෂන් සභාව, (ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, (ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව, (උ) මුදල් කොමිෂන් සභාව, (ඌ) සීමා නිර්ණය කොමිෂන් සභාව, (එ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ දෙවන උපලේඛනයේ දැක්වෙන ප්‍රධාන අධිකරණ හා පරිපාලන තනතුරු සඳහා එනම් (අ) අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, (ආ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්, (ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන් සහ (අ) නීතිපතිවරයා, (ආ) විගණකාධිපතිවරයා, (ඇ) පොලිස්පතිවරයා, (ඈ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්), (ඉ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා ආදී


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

තනතුරුවලට සුදුසු පුද්ගලයන් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ජනාධිපතිවරයා විසින් නිලවශයෙන් පත්කිරීම සිදු කෙරේ.

දහනව වන ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ලංකාවේ දේශපාලන-පරිපාලන තීරණ ගැනීමේ ප්‍රධාන බාධාවන් පිටුදැකීම සඳහා ඉදිරිපත් කළ හැකි ඉතා ප්‍රශස්ත විසඳුමක් ලෙස පෙන්වා දිය හැකි ය. එයට හේතුව දේශපාලන සංස්කෘතිය තුළ තාර්කික තීරණ නිර්මාණය සඳහා බාධාකාරී වන ප්‍රධාන සාධක ලෙස ඉහතින් ද පෙන්වා දුන් පවුල්වාදය, ගජමිතුරු ක්‍රමය හා සහචරවාදය පදනම් කරගෙන සිදුකරනු ලබන දේශපාලන අනුග්‍රාහකත්වය පිටුදැකීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තීරණාත්මක කාර්යභාරයක් ඉටුකිරීම යි. මෙම ප්‍රතිසංස්කරණය 2015 මැයි හඳුන්වා දීමෙන් අනතුරු ව ගත වූ මුල් මාස කිහිපය ඇතුළත ස්වාධීන කොමිෂන් සභා සහ අධිකරණ හා පරිපාලන තනතුරු සඳහා පත්කරන ලද පුද්ගලයන් සහ ඔවුන්ගේ තීරණ පිළිබඳ මහජනතාව අතර සැලකිය යුතු පිළිගැනීමක් ලැබුණ ද ප්‍රධාන පක්ෂ දෙකක් වටා ගොඩනැගුණු ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර සහමතිකතාව දිගින් දිගට ම පිරිහෙමින් පැවතුණි. මෙහි දී ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද අගමැතිවරයා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ ස්වාධීන කොමිෂන් සභා ඇතුළු අධිකරණ හා පරිපාලන තන්ත්‍රය තම බලසීමාවට පරිබාහිර ව හා ප්‍රතිරෝධී ව හැසිරෙන්නේය යන අදහස වඩා ප්‍රචලිත විය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් ස්වාධීන කොමිෂන් සභා, අධිකරණ හා පරිපාලන තනතුරු සඳහා පත්කරන ලද පුද්ගලයන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් දෙස බැලූ විට ඒවා මීට පෙර එම තනතුරු සඳහා පත් කළ අයගේ සුදුසුකම්වලට වඩා ඉහළ මට්ටමක පවතින බව පැහැදිලි කරුණකි. එසේ ම මේ ආකාරයෙන් පත් කළ ස්වාධීන කොමිෂන් සභා, අධිකරණ හා පරිපාලන තනතුරුවල ක්‍රියාකාරකම් පිළිබඳ දේශීය සහ ජාත්‍යන්තර සිවිල්, රාජ්‍ය මෙන් ම රාජ්‍ය නොවන සංවිධානවල පූර්ණ නිරීක්ෂණයක් පැවති අතර එම බලතල අවභාවිත කළ බවට මේ දක්වාත්, නිරීක්ෂණය වී නැත. මීට අමතර ව සමස්තයක් ලෙස රාජ්‍ය සේවය තුළ දේශපාලනීකරණ මට්ටම සැලකිය යුතු ලෙස පහළ ගොස් තිබුණු අතර ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ක්‍රියාකාරීත්වයට අමතර ව සිවිල් සමාජ ව්‍යාපාරයේ කැපීපෙනෙන දායකත්වයක් ලැබුණි. මේ පසුබිමෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ලංකාවේ දේශපාලන-පරිපාලන තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි තෙවන විධායකයක් වශයෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකරමින් තිබුණි.

## නිගමනය

ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 2015 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපති ධුරයේ පුළුල් බලතල සංවරණය කොට, ව්‍යවස්ථාදායකය සමඟ කිසියම් සමතුලනයක් ඇති කරමින් එක්තරා සමගාමී තත්ත්වයක් ඇතිකිරීමට අරමුණු කරනු ලැබිණ. දේශපාලන සංස්කෘතිය හා ව්‍යවස්ථානුකූලවාදය පැවතිය යුතු අනන්‍ය සබඳතාව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සම්බන්ධ ව ඉතා වැදගත් ලෙස අවධාරණය වන පසුබිමක මෙම අධ්‍යයනය මගින් ඒ හා සම්බන්ධ ප්‍රධාන නිගමන තුනක් ඉදිරිපත් කර ඇත.

1. සමානුපාතික නියෝජන ක්‍රමය සහ මහජන මතය ජනාධිපතිවරයාගේ අභිමතානුසාරී බලතල පාලනය කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ ද ඔහු තවදුරටත් රාජ්‍ය නායකයා, ආණ්ඩුවේ නායකයා සහ අමාත්‍ය මණ්ඩලයේ නායකයා වශයෙන් විධිමත් ව ද පාර්ලිමේන්තුවේ බහුතර බලය හිමි පක්ෂයේ හෝ කණ්ඩායමේ නායකයා වශයෙන් අවිධිමත් ව ද ව්‍යවස්ථාදායකයට වගකිවයුතු නමුත්, ඍජු ව වග නොකියන වගකීම් විරහිත බලයක් භුක්ති විඳියි. මේ පසුබිමෙහි ව්‍යවස්ථාදායකය, විධායක තීරණ අනුමත කරන සහයක ආයතනයක් වී ඇති අතර එය ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය සඳහා අතිශය බාධාවක් ලෙස සැලකෙන අධිපතිධාරී දේශපාලන සංස්කෘතියකට අවශ්‍ය ඉඩකඩ විවර කර ඇත.

2. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉදිරිපත් කරන ලද ජනාධිපතිවරයාගේ නිල කාලය වසර පහකට අඩු කිරීම හා ධුර කාලය වාර දෙකකට සීමා කිරීම මෙන් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් ස්වාධීන කොමිෂන් සභා සහ ප්‍රධාන අධිකරණ හා පරිපාලන තනතුරු සඳහා ප්‍රශස්ත පුද්ගලයන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම මගින් ව්‍යවස්ථාදායකය හා ජනාධිපතිවරයාගේ විධායක බලතල අතර එක්තරා සංවරණයක් ඇතිකිරීමටත්, දේශපාලන සංස්කෘතිය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සඳහා මූලික බධාවන් ලෙස සැලකිය හැකි පවුල්වාදය, ගජමිතුරු ක්‍රමය හා සහචරවාදය පිටුදැකීම සඳහා සාධනීය උත්සාහයක් ගෙන තිබේ. කෙසේ වුව ද 19 වන සංශෝධනය සැලකිය යුතු පරිදි සංකීර්ණතා සහ සමහර නිවැරදි නොවන එළඹුම් මත සම්පාදනය වී තිබේ. ඒ අතර ජාතික ආණ්ඩුව පිළිබඳ සංකල්පය, ජනාධිපති-අගමැති සබඳතාව සහ පාර්ලිමේන්තුවේ නිලකාලය ආදිය ප්‍රධාන වශයෙන් දැක්විය හැකි ය.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය හා ක්‍රියාකාරීත්වය දෙස බලන විට පෙනීයන්නේ එය සාපේක්ෂ වශයෙන් යෝග්‍ය සමාජිකත්වයක් හරහා දේශපාලන-පරිපාලන තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති බව යි. ඒ අනුව ව්‍යවස්ථා සභාවේ සංයුතිය හෝ ක්‍රියාකාරකම් හේතු කොට ගෙන විධායකය හා ව්‍යවස්ථාදායකය අතර බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නෛතික සංකීරණතාවක් ඇත යන්න සාවද්‍ය මතයකි. එහෙත් මෙරට දේශපාලන සංස්කෘතියෙහි ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව අතර බලතල හවුල්කාරීත්වයක් සම්බන්ධයෙන් තවදුරටත් සහමතිකතාවක් වර්ධනය වී නැති අතර එවැනි එකඟතාවයක් ව්‍යවස්ථා ප්‍රතිපාදනවල ප්‍රතිඵලයක් ලෙස නොව දේශපාලන ඇගයුම් හා ආචාරධාර්මික පදනමක් මගින් පමණක් ගොඩනැගිය හැකි ය.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**පරිශීලිත මූලාශ්‍රය**


Almond, G. A. Powell, G. B. Strom, K. and Dalton, R.J (2000). *Comparative Politics Today, A World View*. 7th ed., New York, Longman.

Cottier, T., and Hertig, M. (2003). The Prospect of 21st Century Constitutionalism, In A. V. Bogdandy and R. Wolfrum (Eds.), *Max Planck Year Book of United Nation's Law*. Vol. 7, Netherlands, Kovinklijke Brill N. V.

Fernando, L. (2016). *Issues of New Constitution Making in Sri Lanka, Towards Ethnic Reconciliation*, Charleston, Create Space.

Fellman, D. (1974). Constitutionalism, In P. P. Wiener (Ed.), *Dictionary of the History of ideas*, *Studies of Selected Pivotal Ideas*, Vol. 1

Gunasekara, R. and Anedo O. A. A. (2018) *Political Culture and politico-bureaucracy, Politico-administrative Dichotomy and Politicization of Public Administration in Sri Lanka*. Nigeria, Ideal International Journal of Igboscholars Forum 5 (No. 1) 44-71.

International Encyclopaedia of the Social Sciences (IESS), New York, Macmillen, 1968, Vol. 12

Jupp, J. (1978). *Sri Lanka Third World Democracy*, London, Frank Cass.

Priyantha, I. R. Dickwella, W. K. R. & Gunasekara, R. (2019). Public Administration in Sri Lanka, An Analysis of Evolution, Trends and Challenges in Personnel Management. In I. Jamil, T.N Dhakal and N.R Paudel (Eds.), *Civil Service Management and Administrative Systems in South Asia*. Switzerland: Palgrave Macmillan.

Scheppele, K. L. (2004). Constitutional Ethnography, An Introduction, Law and Society Review, Vol. 38 (November, 2004)

Uyangoda, J. (2009). From Civil War to Political Uncertainties, *Asian Survey*, Vol. 50, No. 1 (January/February 2010)

Wijeweera, B. S. (1988). *A Colonial Administrative System in Transition, The Experience of Sri Lanka*. Colombo, Marga Publications.




© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දොළොස්වන කලාපය 2021 දෙසැම්බර්
පිටු 72-83
ISSN 1800-1459 eISSN 2386-2041
© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සපත්නීරෝෂය : ජාතක කතා කිහිපයක් ඇසුරෙන් බෞද්ධ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්

# (Sapathniroshaya: A Buddhist Psychological Study based on Selected Jathaka Stories)

ආචාර්ය ලතා ගුරුසිංහ

සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
latha@sinh.cmb.ac.lk

## සාරසංක්ෂේපය

ජාතක නමින් කථා පන්තියක් නම් කිරීම බුද්ධ කාලයේ ම හෝ තදාසන්න පසු කාලයේ දී හෝ සිදුවූවක් ලෙස පිළිගත හැකි ය. බුද්ධ වචනය පිළිබඳ පැරණි ම බෙදුමක් වන නවාංග සත්ථු ශාසනයේ සත්වැනි අංගයට ජාතක අයත් වේ. එමෙන් ම බුද්ධ වචනය ත්‍රිපිටක පාලියට බෙදා දක්වීමේ දී සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායාන්තරගත ග්‍රන්ථ පසළොසකින් එකක් ලෙස ජාතක ගැනේ. සංස්කෘත බෞද්ධ සම්ප්‍රදායන්හි දක්වෙන ද්වාදසංග ශාස්තෘ ශාසනයට ද ජාතක ඇතුළත් වේ. මේ අනුව ථේරවාදී බෞද්ධ සම්ප්‍රදාය අවශේෂ බෞද්ධ සම්ප්‍රදායනුත් ජාතක යන්න බුද්ධ වචනයේ කොටසක් ලෙස පිළිගෙන ඇත. ජාතක යන්නෙහි තේරුම උපත යන්නයි. එහි දී විශේෂයෙන් බුදුරජාණන්වහන්සේගේ පෙර ආත්ම පිළිබඳ කෙරෙන ප්‍රකාශනයක් ලෙස මෙය හඳුනාගත හැකි ය. මේ නිසා ම භාග්‍යවතුන්වහන්සේගේ උත්පත්ති කතා පිළිබඳ සඳහන් වන වෘත්තාන්ත හෙවත් පූර්ව චරිත කතාව ජාතක කතා ලෙස හැඳින්වේ. මෙම කතා සමූහය බුදුන්වහන්සේ විසින් ම තමන් වහන්සේගේ පෙර ජාතින් ලෝක සත්ත්වයාට වැඩ පිණිස ඒ ඒ සුදුසු අවස්ථාවල දේශනා කළ ඒවා බව බෞද්ධයන්ගේ පිළිගැනීම වේ. පන්සිය පනස් ජාතක පොතෙහි වස්තු විෂය විග්‍රහ කර බලන විට පැහැදිලි වන කරුණක් නම් මනුෂ්‍යයාගේ හැඟීම් හා හැසිරීම් මනා කොට සියුම් ව විග්‍රහ කිරීමට ජාතක කතාකරුවා කොතරම් දක්ෂ වී ඇත්ද යන්නයි. බෞද්ධ සංස්කෘතියෙහි මූලධර්මයක් වන මානව භක්තියත්, මනුෂ්‍යයාගේ සුන්දර පක්ෂයත්, අසුන්දර පක්ෂයත්, ගූඪ හැසිරීම්, භයංකර මනෝභාව ජාතක කතාවලට විෂය වී ඇත. මිනිස් සිතේ සැඟව පවත්නා ගූඪ චෛතසික ධර්ම, මනෝ ව්‍යාධි චිත්ත චෛතසික තත්ත්වයන් බොහෝ ජාතක කතාවල දැකිය හැකි ය. මේ නිසා ජාතක කතා පොත බුදු දහමෙහි පවත්නා මානව හිතවාදය ප්‍රකට කරන මනෝවිද්‍යාත්මක එළඹුම් සහිත ප්‍රධාන ගද්‍ය කාව්‍යයක් බවට පත් වේ. ස්ත්‍රිය සහ ස්ත්‍රීත්වය සම්බන්ධ ව ජාතක කතාකරුවාගේ එළඹුම් සංකීර්ණ ය. ස්ත්‍රී වර්ගයේ නුගුණ ගැන කියවෙන ජාතක කතා විශාල ප්‍රමාණයක් මෙන් ම ගුණ ගැන කියවෙන කතා ද අහඹු ලෙස දැකිය හැකි ය. මේ සියලු ම කරුණු පිරික්සා බලා මනස පූර්වාංග කොට ඇති පුද්ගලයාගේ මානසික ව්‍යාධි බෞද්ධ මනෝවිද්‍යාත්මක දෘෂ්ටියකින් විමසා බැලේ.

**කේන්ද්‍රීය වචන**: ජාතක පොත, සපත්නීරෝෂය, බෞද්ධ මනෝවිද්‍යාව, ස්ත්‍රීත්වය, මානසික රෝග

The rise of a series of stories called "Jathaka" has taken place during the Buddha's era or soon after the parinirvana of Lord Buddha. Jathalka is included in the 7th section of *NavaangaSaththuSasana*. *KhuddakaNikaya* in the *SuthraPitaka* contains 15 books (sections) and the Jathaka are considered as one of them. Jathaka stories are also included in *DvadashangaShasthruSasana* which comes in the tradition of Sanskrit – Buddhism. Accordingly, Theravada Buddhist tradition and other traditions have considered Jathaka as a part of Lord Buddha's preaching. The meaning of Jathaka is birth. In this context, Jathaka are related to Lord Buddha's previous births. It is considered that this series of stories have been preached by Lord Buddha himself for the betterment of his followers. It can be noticed that the composers of these Jathaka stories have observed and analyzed the mindset and behaviors of individuals deeply. Various complications in the human mind are depicted in many Jathaka stories. Therefore, Jathaka stories can be identified as a series of stories that reveal humanity in a psychological aspect. Jathaka story composers' views on women are complicated. There are a lot of stories that criticize womanhood but there are few which depict its values. This study aims to observe Jathaka stories in a psychological aspect.

**Key Words**: *JathakaPotha*, *SapathNiroshaya*, Buddhist psychology, Feminine, Psychological diseases

## හැඳින්වීම

ජාතක යනු උපත හෙවත් පෙර සිරිතයි. උපත පෙර විසූ කඳ පිළිවෙළ යනු එහි අර්ථයයි. ඒ අරුත වෙසෙසා දක්වතොත් තිලෝගුරු බුදුහිමියන්ගේ පෙර විසූ කඳ පිළිවෙළ කියවෙන පෙර සිරිත නැතහොත් එතුමන්ගේ පූර්ව ජාති ප්‍රකාශ වන වෘත්තාන්ත ජාතක කතා නම් වේ. සිංහල ගද්‍ය සාහිත්‍යයේ ප්‍රමාණයෙන් ඉතා විශාල රචනය සිංහල ජාතක පොතයි. එය පාලි ජාතකට්ඨකතාවේ සිංහල පරිවර්තනයකි.

සියලු ධර්මයන්ට පූර්වයෙන් පවත්නා ධර්මයක් වන මනස පූර්වාංගම කොට සත්ත්වයින්ගේ කායික, මානසික දුක්ඛදෝමනස්සයන් සියල්ල ඉක්මවා ප්‍රසන්න වූ සන්සුන් මනසක් ගොඩනගා ගැනීම සඳහා උපනිශ්‍රය වන ජීවය හා ලෝකය පිළිබඳ දැක්මක් ජාතක කතා පොත තුළ දැකිය හැකි ය. සත්ත්වයින්ගේ සියලු ගැටලු පැනනගිනුයේ මනස මූලික කොටගෙන බැවින් විවාහ ජීවිතය තුළ ස්ත්‍රියක දුක්විඳින මානසික ව්‍යාධියක් විෂය කරගත් ජාතක කථා ත්‍රිත්වයක් මෙම පර්යේෂණය සඳහා ප්‍රස්තුත කරගෙන ඇත. බුදු දහම හේතුඵලවාද මෙන් ම මනෝමූලික ඉගැන්වීමකි, දර්ශනයකි, ප්‍රතිපදාවකි.

බුදු දහමෙහි මානසික රෝග ප්‍රධාන අංශ දෙකක් යටතේ සාකච්ඡා කෙරේ. බෞද්ධ දර්ශනය සම්පූර්ණයෙන් ම 'චිත්තය හෙවත් සිත පදනම් වූ දර්ශනයකි. එහි මූල සාධකය මනස ය. සත්ත්වයා සසර උපදින්නේත්, සසර සැරිසරන්නේත්, සසරින් මිදෙන්නේත් මනස මුල් කරගෙන බැවිනි. බෞද්ධ මනෝවිද්‍යාවේ ද විඥ්ඤාණයෙන් තොර ව ක්‍රියාකාරිත්වය පිළිබඳ සාකච්ඡා කළ නොහැකි බව පෙන්වා දෙයි.

> ''මේ අනුව මිනිසාගේ සිතෙහි හෝ චිත්තවේගවල හෝ චෛතසිකවල හෝ කායික වාචසික ක්‍රියාකාරකම්වල ඇතිවන අසාමාන්‍යතාව හෝ මානසික ඌනතාව හෝ මානසික පරිහානිය හෝ මානසික අපොහොසත්භාවය හෝ කායික මානසික සංවර්ධනාත්මක පැවැත්මට බාධා පමුණුවන ස්වභාවය හෝ පීඩාවට, කලකිරීමට, දුකට, භ්‍රාන්තියට හෝ වෙනත් මානසික ආබාධිත්වයකට පත් කරවන ස්වභාවය මනෝ රෝග හෝ මානසික ගැටලු ලෙස සරලව හඳුනාගත හැකිය'' (සිරිසුගත හිමි, 2018 : 437-438).

## සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණය සඳහා ඇසුරු කළ පොත්පත් අතර **ජාතක පොත් වහන්සේ** ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත කෙරිණ. ජාතක පොත ආශ්‍රිත විචාරාත්මක රචනාවක් වන ආනන්ද කුලසූරියගේ **සිංහල සාහිත්‍යය 4** කෘතිය මෙම අධ්‍යයනයේ දී වඩාත් වැදගත් විය. විශේෂයෙන් පන්සිය පනස් ජාතක පොතෙහි වස්තු විග්‍රහයෙහි ''ගැහැනුන්ගේ නුගුණ ගැන කියවෙන කතා,'' පරිච්ඡේදය මාතෘකාව සඳහා තරමක් අදාළ විය. ඒ හැර පාතේගම ඥානාරාම හිමිගේ **ජාතක සාහිත්‍ය විමර්ශනය**, මාර්ටින් වික්‍රමසිංහගේ **ජාතක කථා විමසුම,** නිවන්දම ධර්මකීර්ති හිමිගේ **සිංහල සාහිත්‍යයේ ස්වර්ණ යුගය** ද, D.V.J Harischandra's **Psychiatric Aspects of Jataka Stories** ඇසුරු කර ගැණින. බෞද්ධ මනෝවිද්‍යාත්මක පදනම පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා ධර්මසේන හෙට්ටිආරච්චිගේ **බෞද්ධ මනෝවිද්‍යා ප්‍රවේශය**, සරත් චන්ද්‍රසේකරගේ **ප්‍රායෝගික බෞද්ධ මනෝවිද්‍යාව** පිටුබලයක් සැපයී ය. බටහිර මනෝවිද්‍යාත්මක සිද්ධාන්තයන්ට වහල් නොවී බුදු දහමට ආවේණික වූ මනෝවිද්‍යාත්මක පදනමක පිහිටා සාකච්ඡා කිරීමට මෙම කතුවරුන්ට හැකි වී ඇත. ඒ හැර බෞද්ධ මනෝවිද්‍යාවේ පදනම පුද්ගල ස්වභාවය විවරණය කිරීම බව මොව්හු අවධාරණය කරති.

## පර්යේෂණ ගැටලුව

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ දී අපේක්ෂා කරනුයේ ස්ත්‍රීත්වය හා සම්බන්ධිත මනෝමය ව්‍යාධියක් ජාතක පොත ඇසුරෙන් සාකච්ඡා කිරීමට ය. ජාතක පොතේ අන්තර්ගත සම්බුලා ජාතකය, අයෝඝර ජාතකය, කුණාල ජාතකය මෙම අධ්‍යයනය සඳහා ප්‍රස්තුත කර ගැනේ. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වනුයේ ජාතක කතාවල අන්තර්ගත සපත්නීරෝෂය **(Sexual Jealous)** ස්ත්‍රී මනෝභාව පිළිබඳ බෞද්ධ විද්‍යාත්මක ප්‍රකාශනයක් ලෙස විග්‍රහ කළ හැකි ද? යන්නයි. එහි දී ජාතක පොතෙහි නිරූපිත ස්ත්‍රීත්වය පිළිබඳ පොදු විග්‍රහයක් සරල ව ඉදිරිපත් කරන අතර ම ස්ත්‍රිය මුහුණ දෙන කායික, මානසික පීඩාව මත පදනම් ව ඇය දහමෙහි ස්ථානගත කර ඇති ආකාරයත් සාකච්ඡා කෙරේ.

''ස්ත්‍රීන්ගේ දුර්වලකම් ගැන කියවෙන කතා රැසින් කිහිපයක් එක පෙළට එයි. එනම් අසාතමන්ත ය, අන්ධභූත ය (පාළි-අණ්ඩභූත), තක්ක යැ, දුරාජාන යැ, අනභිරත යැ, මුදු ලක්ඛණ යැ (අංක 66-66) යන ජාතක වෙයි. ආදී මිනිසුන් ස්ත්‍රීන් කෙරේ දුටු ප්‍රධාන දෝෂ කවරේ දැයි මේ කතාවලින් හෙළි වෙයි. ස්ත්‍රීහු සැප දුරු කොට දුක් එළවන වස්තූහු ය. ඔහු අසත්පුරුෂයෝ ය, ලාමකයෝ ය, ස්ත්‍රිය රැක ගන්නට නොහැකි ය, චණ්ඩය, පරුෂය. තව ද ඕ දුස්සීලය, පචකම්හි හැසිරෙන සුලු ය, මිත්‍රද්‍රෝහීය, ගංගා මාවත් සේ සියලු සත්ත්වයන්හට සාධාරණය එනම් පොදු ය. මේ ස්ත්‍රිය ගැන ජාතක කතාකරුවන් ඇතැම් විට සිතූ සැටිය'' (කුලසූරිය, 1997 : 212).

## පර්යේෂණ අරමුණු

මෙම ශාස්ත්‍රීය පර්යේෂණයේ අරමුණ වනුයේ ස්ත්‍රිය විවාහ ජීවිතයේ දී විඳින මානසික පීඩනයක් වන සපත්නීරෝෂය බෞද්ධ මනෝවිද්‍යාත්මක දෘෂ්ටියකින් විග්‍රහ කිරීමයි. සපත්නිය (එක ම පුරුෂයාගේ භාර්යාවන්) කිහිප දෙනෙකු අතර එක් එක් භාර්යාව තුළ ඇතිවන කෝපය සපත්නීරෝෂය ලෙස ශ්‍රී සුමංගල ශබ්දකෝෂය අර්ථ දක්වයි. ඒ අනුව සපත්නීරෝෂය පිළිබඳ සඳහන් වන ජාතක කතා ත්‍රිත්වයක් වන සම්බුලා ජාතකය, අයෝඝර ජාතකය, කුණාල ජාතකය සාකච්ඡාවට භාජනය කෙරේ. ස්ත්‍රීත්වය පිළිබඳ ව බෞද්ධ විවරණය සැබෑ ලෙසින් ම අවබෝධ කර ගත හැකි වනුයේ මුල් බුදුසමය සමඟ සියුම්ව අධ්‍යයනය කිරීමෙනි. ඒ සඳහා


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රවේශයක් ගැනීම ද මෙම පර්යේෂණ මාතෘකාවේ තවත් අරමුණක් විය.

බුදු දහමට අනුව මිනිසා යනු ස්කන්ධ, ආයතන ධාතුන්ගේ ක්‍රියාකාරිත්වයේ එකතුවකි. ඒ අනුව ප්‍රධාන වශයෙන් රෝග දෙයාකාර වේ. අංගුත්තර නිකායේ රෝග සූත්‍රයේ සඳහන් වන අන්දමට කායික හා මානසික වශයෙන් රෝග දෙවර්ගයකි. සත්ත්වයාට මානසික රෝග ඇතිවීම සඳහා බලපාන ප්‍රධාන හේතු තුනකි. එනම් ලෝභ, ද්වේෂ සහ මෝහයි. මෙහි දී ලෝභය සියල්ලට ම ප්‍රධාන වේ. එහි ආශාව, රාගය, කාමය ආදී ගුණාංග රාශියක් අන්තර්ගත වේ. ඒවා තුළින් පුද්ගලයාගේ මනස පුබුදු කරවා වෙහෙසට පත් කරයි. ඒ අනුව රුචි දෙය නොලැබීම, අකමැති දෙය ලැබීම හමුවේ තරහව, වෛරය, ආවේගය වැනි දේ ඇති වේ. එය ද්වේශයේ ලක්ෂණයකි. එයට අදාළ ප්‍රතිචාර වනුයේ මෝහය හා අවිද්‍යාවයි. පසිඳුරන්ට අදාළ ව ඒවායෙහි තෘප්ත අතෘප්තභාවය පදනම් කොට ගෙන විවිධ කායික, මානසික පීඩාවන්ට ලක් වන බව බුදු සමය පෙන්වා දෙයි.

මේ අනුව පුද්ගලයාට බාහිර හා අභ්‍යන්තර ව ඇතිවන විවිධ කායික, මානසික අතෘප්තිකරභාවයේ ප්‍රධාන ප්‍රේරකය තෘෂ්ණාව බව පැහැදිලි ය. මේ නිසා තෘෂ්ණාව (කෙලෙස්) හේතු කොට ගෙන ආර්ථික, සාමාජික, ආගමික, දේශපාලනික ගැටලු මෙන් ම පවුල, විවාහය, ලිංගිකත්වය, පෞරුෂය අන්තර්ගත ප්‍රශ්න ද උද්ගත වේ.

පුද්ගල මනස තුළ යම් උච්චාවචන ඇති කරන මානසික තත්ත්ව චිත්තවේග නම් වේ. අකුසල චිත්තවේග ක්‍රියාත්මක වන නීවරණ ධර්ම පහක් බුදු දහමේ හඳුන්වා දෙයි. එනම් කාමච්ඡන්ද (කාමයන් පිළිබඳ ආශාව), ව්‍යාපාද (තරහ), ථීනමිද්ධ (සිතේ සහ සිතුවිලිවල අලස ස්වභාවය), උද්ධච්ච කුක්කුච්ච (සිතේ නොසන්සුන් හා තැවීම් ස්වභාවය), විචිකිච්ඡා (සිතේ සැකමුසු ස්වභාවය) පංච නීවරණ ධර්ම වේ. පිරිසිදු සිත පිරිසිදු ජල භාජනයකට උපමා කොට නීවරණ ධර්ම එම ජලය අපැහැදිලිතාවට පත් කරන දෙයට උපමා කොට ඇත. කාමච්ඡන්ද වර්ණවත් කළ ජලයටත්, ව්‍යාපාද රත් කළ බුබුලු දමන ජලයටත්, ථීන මිද්ධ පාසි දියසෙවෙල බැඳුණු ජලයටත්, උද්ධච්ච කුක්කුච්ච සුළඟින් කැලඹුණු ජලයටත්, විචිකිච්ඡා අඳුරේ තැබූ ජලයටත් සමාන කර ඇත. මෙම නීවරණ ධර්ම නිසා යථාර්ථය දැකිය නොහැකි වීම නිසා ප්‍රඥාව පහළ වීමට බාධා ඇති වේ.

### පර්යේෂණ වැදගත්කම

බුදු දහමෙහි පුද්ගලයාගේ මනස පිළිබඳ ව ඉදිරිපත් කෙරෙන දාර්ශනික ප්‍රස්තුත අප්‍රමාණ ය. පන්සිය පනස් ජාතක පොත පුරා ම දැකිය හැක්කේ ද ස්ත්‍රී පුරුෂ ප්‍රජාවන්ගේ ඇවතුම් පැවතුම් හා බැඳුණු සංකීර්ණ කායික මානසික සංසිද්ධීන් ය. විශේෂයෙන් ම ස්ත්‍රීත්වය පිළිබඳ ජාතක කතාකරුගේ පසුගාමී ආකල්පය එහි අන්තර්ගත කතා මගින් මනාව ප්‍රත්‍යක්ෂ වේ. ජාතක කතාවල ස්ත්‍රීත්වය සම්බන්ධව විවිධ පර්යේෂණ සිදු කර තිබුණ ද සපත්නිරෝෂය පිළිබඳ ව මෙතෙක් සාකච්ඡා සිදු වී නැත. ජාතක කතා ත්‍රිත්වයක් ඇසුරෙන් වඩාත් පුළුල් සාකච්ඡාවක් සිදු කිරීමට හැකි වීමෙන් මෙම පර්යේෂණයේ වැදගත්කම තවදුරටත් තහවුරු වන බව සඳහන් කළ යුතු ය.

> ''පන්සිය පනස් ගණනක් වූ ජාතක කතාවලින් අඩුගානේ පන්සියයකට වඩා කතාවලින් කාන්තාව හෙළා දැකීම කාන්තාවගේ දුර්ගුණ ඉස්මතු කිරීමෙන් ජාතක කතා කතුවරුන්ගේ කාන්තාව පිළිබඳ ආකල්පය මොනවට ඉස්මතු වේ. ජාතක කතා ඉතිහාසයේ සඳහන් වන පරිදි ගැහැනියක් පිරිමියෙකු පොළඹවන මායම් විධි හතළිහක් වේ. මේ තුළින් ජාතක කථාකරුවන්ගේ කාන්තාවාදී ස්ථාවරය තවදුරටත් හෙළි වේ'' (අබේපාල, 2014 : 36).

ස්ත්‍රියගේ චපල බව, වෙනස්වන සුළු බව, වංකකම, කාමුකත්වය, ස්වාමියාට ද්‍රෝහී වීම මතු කරන ජාතක කතාකරුවා පුරුෂ පාර්ශ්වයේ නොමනා ක්‍රියාකලාප හමුවේ පීඩා විඳින ස්ත්‍රිය පිළිබඳ ව විෂය කර ගත් නිර්මාණ ද අහඹු ලෙස ඉදිරිපත් කර ඇත. බන්ධන මොක්ඛ, සමුග්ග, කුණාල වැනි ජාතක කතාවල සහකරු/සහකාරිය පිළිබඳ ව ලිංගික ඊර්ෂ්‍යාව මෙහි දී තේමා කරගෙන ඇත. ලිංගික සබඳතාවල දී පවත්නා විශේෂ තත්ත්වයක් ලෙස මෙම ලිංගික ඊර්ෂ්‍යාව හැඳින්විය හැකි ය. ස්ත්‍රිය තම ස්වාමියා පිළිබඳ ව ඇති කර ගන්නා ලිංගික අවිශ්වාසය නිසා මානසික අසහනයට පත්වන ආකාරයත්, එනිසා ම අසහනය, කලකිරීම, මානසික ආතතිය, කායික රෝගවලින් පීඩා විඳීමත් මෙම ජාතක කතාවලින් ඉස්මතු වේ.

සපත්නී

> ''භාර්යාවන් කිහිප දෙනෙකු ඇති පුරුෂයකුගේ එක් භාර්යාවක් හැතිරිය'' (විජයතුංග, 1984 : 1685).

> ''සපත්නි සමාන පුරුෂයකු ඇති ස්ත්‍රිය (එක් පුරුෂයකුට එක් භාර්යාවකට වඩා ඇති කළ ඒ භාර්යාවෝ සමාන පුරුෂයකු ඇත්තියෝ වෙති)'' (බුද්ධදත්ත හිමි, 1998 : 502).

> ''සපත්නී - ස්ත්‍රී සමාන වූ හිමියා ඇති ස්ත්‍රිය (එකම පිරිමියෙකුට බිරියන් දෙදෙනෙකු ඇති විට ඒ බිරියහට මේ නම යෙදේ)'' (අලගියවන්න, 2004 : 846).

> ''සපත්නි - අන්‍ය භාර්යාවන්ට ද සමාන වූ ස්වාමිපුරුෂයා ඇති භාර්යාව, එකම පුරුෂයාගේ භාර්යාවන් කිහිප දෙනෙකු අතර එක් එක් භාර්යාව''.

> ''සැතිරිය - රොෂ - සපත්නිය තුළ ඇතිවන කෝන්තිය'' (සෝරත හිමි, 1970 : 63).

**පර්යේෂණ ක්‍රමවේදය** ප්‍රධාන වශයෙන් ජාතක පොත සහ ත්‍රිපිටකය ඇසුරු කළ අතර, බෞද්ධ මනෝවිද්‍යාව සම්බන්ධ ව න්‍යායාත්මක කරුණු අධ්‍යයනය සඳහා ඒ ආශ්‍රිත පොතපත ද පරිශීලනය කෙරිණ. සපත්නිරෝෂය ප්‍රධාන වශයෙන් අන්තර්ගත ජාතක කතා තුනක් පමණක් පර්යේෂණය සඳහා පාදක කර ගැණින.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## ජාතක පොතෙහි නිරූපිත සපත්නීරෝෂය

### සම්බුලා ජාතකය

බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් මේ සම්බුලා ජාතකය කොසොල් රජහුගේ සහ අග මෙහෙසුන් මල්ලිකා දේවීන් අරභයා වදාළ සේක. මෙහි වර්තමාන කථාව කුම්මාසපිණ්ඩි ජාතකයෙහි විස්තර වශයෙන් ඇත. එක් දවසක් මල්ලිකා දේවි තොම භාග්‍යවත් බුදුරජාණන්වහන්සේට දුන් කොමු පිඬු තුනෙහි විපාකයෙන් එදවස් ම කොසොල් රජහට අග්‍රමහේසිකා ස්ථානයට පැමිණ උතුම් පඤ්ච කල්‍යාණයෙන් යුක්ත ව මහත් වූ ස්ථානෝචිත ප්‍රඥා ඇති බුදුන්ට උපස්ථාන කිරීමෙන් ද නිරන්තර ව තමාගේ වල්ලභයා කුල දේවතා කොට වසන්නී ය. එකල්හි මල්ලිකා දේවියගේ උතුම් ගුණ සියලු නුවර ප්‍රසිද්ධ විය. දම්සභා මණ්ඩපයට රැස් ව හුන් භික්ෂූන්වහන්සේලා මල්ලිකා දේවිය පිළිබඳ ප්‍රසාද සිතින් කරන ලද සාකච්ඡාවට බුදුන්වහන්සේ පිළිතුරු දෙමින් පවසන්නේ ඇය දූන් මතු පතිදේවතා කොට විසුවා නොව යටගිය දවස ද මෙලෙස ම කල්ගත කළ බවයි.

බරණැස් නුවර බඹදත් රජතුමාගේ පුත් සොත්ථිසේන නම් රජකුමරු වැඩි වයසට පැමිණි පසු යුවරජ තනතුරෙහි පිහිටුවා සම්බුලා රාජ කුමාරිකාව අගමෙහෙසුන් කොට පාවා දීමක් සිදු විය. විශිෂ්ට වූ ශරීර වර්ණ ඇති අන්ධකාරයට පහනක් වැනි ඔවුන් දෙදෙනා ප්‍රිය සංවාසයෙන් කලක් විසූ කල්හි සොත්ථිසේන යුවරජුට අසාධ්‍ය වූ කුෂ්ට රෝගයක් වැළඳුණි. දඹදිව ප්‍රසිද්ධ වෙදදුරන්ගෙන් බෙහෙත් පිළියම් කළ ද සුව නොවූ අතර ශරීරය පිළිකුල්සහගත විය. මෙබඳු ව්‍යාධියකින් පෙළෙන විට රාජ්‍යත්වය එලක් නැත යන අදහසින් සියලු සම්පත් හා අන්තඃපුර ස්ත්‍රීන් හැර වලට නික්මීමට රජතුමා තීරණය කරයි.

එකල්හි සම්බුලා දේවිය ද රජතුමා සමඟ වලට යාමට පිටත් වෙයි.

> ''එකල්හි රාජ කන්‍යා ද ඔහු පන්සලින් බැහැර නොයවා මිහිරි පලාපල ගෙනවුත් දී උපස්ථාන කරන්නී උදෑසනක් සේ නැගී සිට පන්සල ඇමද උණු පැන්, සිසිල් පැන් ආදිය ද දූහැටි දඬු ආදිය ද පිළියෙල කොට තබා වල්ලභයා නැගී සිටි කල්හි මූණ සෝධවා නොයෙක් ඖෂධ ජාතින් එක්කොට අඹරා තබා බෙහෙත් දියෙන් නාවා ආලේප කොට මධුර පලාපල ගෙනවුත් දී උපස්ථාන කරන්නී උදෑසනක් සේ කළමනාවන් කොට 'ස්වාමිපුත්‍රයාණන් වහන්ස කළමනා අත්පා මෙහෙවර මම කෙරෙමි. නුඹවහන්සේ කනස්සලු නූව මැනවැ'යි කියා පසඟ පිහිටුවැ වැඳ...'' (ජාතක පොත, 2005 : 1317).

සම්බුලා දේවිය එක් දිනයක කඳු ඇලියක නෑමට සූදානම් වනු දුටු දානව රාක්ෂයෙක් ඇගේ තුනුසිරියට වශී වී බලයෙන් තම භවනයට ගෙන යාමට උත්සාහ දරයි. එහි දී ඇයගේ ශීලානුභාවයෙන් හා පතිව්‍රතා ධර්මයේ අනුහසින් සක්දෙව් රජුගේ අවධානය යොමු වී ඇය බේරා ගනියි. වලට ගොස් ප්‍රමාද වී පැමිණීම නිසා සොත්ථිසේන රජතුමා ඇය පිළිබඳ සැක කරයි. එවිට සම්බුලා දේවිය තම පතිව්‍රතා ධර්මය සිහිකර තමාගේ වචනය සත්‍ය බවට දිවුරා ඒ පින් බලයෙන් ස්වාමියාගේ සියලු රෝග නිවාරණය වන ලෙස පවසා පැන් කලස රජුගේ හිස පුරා නාවයි. එහි දී ක්ෂණයකින් ඔහුගේ රෝගය සුව වෙයි.

සොත්ථිසේන රජතුමා සම්පූර්ණ සුවය ලබා නැවත රාජ්‍යත්වය ලබා ගත් පසු බිසව නොතකා සෙසු ස්ත්‍රීන් සමඟ සිත් අලවා කෙලිමින් අභිරමණය කරමින් ඇවිදියි. සම්බුලාවෝ ද තමන් කෙරෙහි කිසි විචාරයක් නැති හෙයින් දවසින් දවස ලැජ්ජාවෙන් හා සපත්නීරෝෂයෙන් දුර්වලව පඬුවන් සිරුර ඇති ව ඉපිලහුණු නහර බහනින් වෙළඳන ලද ශරීරයක් ඇති ව වාසය කරන්නාහ.

> ''මෙසේ මා කෙරෙහි පෙර සේ නොසිතන සේක. තවද ස්වර්ණ-කේසුරාභරණයන් දරන්නා වූ මනා වූ පැහැ ඇති දිව්‍යාප්සරාවන් හා සදෘශ වූ අනින්දිත වූ අංගප්‍රත්‍යයන් ඇති නොයෙකුත් සිය ගණන් ක්ෂත්‍රිය කන්‍යාවන් එක්ව යහන්පත් වූවාහු.
>
> එසේ හෙයින් රාජ තාපසයන්වහන්ස මේ සියලු රාජ සම්පත්තින් පිරුණු බරණැස් නුවරටත් වඩා වලම යහපතැයි සපත්නීරෝෂයෙන් කිව'' (පි. 1321).

සොත්ථිසේන රජතුමාගේ පියාණන් වන රාජ තාපසයන් හමුවේ සම්බුලා දේවිය තම පශ්චාත්තාපය ප්‍රකාශ කිරීමෙන් පසු ඒ පිළිබඳ ඔහු ප්‍රශ්න කරයි. රාජ තාපසතුමාගේ ප්‍රශ්න කිරීම් හා පැහැදිලි කිරීම් හමුවේ සොත්ථිසේන රජතුමාට යථාර්ථය පසක් වී ඇය නිසි තැන තබා ගෞරව කරයි. ඉන්ද්‍රිය ප්‍රීණනය පිළිබඳ බෞද්ධ ආකල්පය මනුෂ්‍ය වර්ගයාගේ දුක්සහගත අතෘප්තිමත් සසර ගමන පිළිබඳ කෙරෙන විස්තරය සමඟ ඉතා ගැඹුරින් මුල් බැසගෙන ඇත. මෙහි මනුෂ්‍ය වර්ගයාගේ අතෘප්තිමත්භාවය යැයි අදහස් කරනු ලැබුයේ බුදු සමයේ ඉගැන්වෙන දුකයි.

> ''මේ ජාතක කථාවෙන් කාන්තාවන්ගේ සහ පුරුෂයන්ගේ ලිංගිකාපේක්ෂාවන් සුදු සහ කළු වශයෙන් විස්තර වුවත්, සෑම විටම පතිවෘතා ධර්මය ස්ත්‍රියගේ යහපතට හා අභිවෘද්ධියට හේතු වන බව මෙම ජාතක කථාවෙන් පෙන්වා දෙයි'' (සේනාධීර, 2016 : 109).

### අයෝඝර ජාතකය

බුදුන්වහන්සේ ජේතවනාරාමයෙහි චතුර්විධ බ්‍රහ්ම විහරණයෙන් දවස් යවමින් වැඩ වසන සේක් මේ අයෝඝර ජාතකය වදාළ සේක. යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් දසරාජ ධර්මයෙන් රාජ්‍යය කෙරෙති. ඔවුන්ගේ අගමෙහෙසුන් බිසව් ද පිහිටි දරු ගැබ් ඇත්තාහු දසමස් ඇවෑමෙන් රන් රුවක් හා සමාන පුත් රුවනක් වැදූහ. ඒ බිසවුන්ට පූර්ව ජන්මයෙහි වල්ලභයක්හු නිසා වෛර බැඳි ස්ත්‍රියක් සපත්නීරෝෂයෙන් ප්‍රාර්ථනා කරන්නි වැදූ දරුවන් කම්මැයි ප්‍රාර්ථනා කළාය. ඒ ස්ත්‍රී ඈ කෙරෙහි ක්‍රෝධයෙන් ප්‍රාර්ථනා කොට යකින්නිව උපන්නීය. වෛර නොකළා වූ ස්ත්‍රී තොමෝ රජ්ජුරුවන්ට අගමෙහෙසුන්ව ඉපිද මේ පුත්‍රයා වැදූහ.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඒ යකින්නි කිසි අවසරයක් නොලබා භයානක වේශයෙන් අවුත් රජ ගෙට වැද බිසවුන් බලා සිටිය දී ම කුමාරයා රැගෙන ගොස් මරා කෑම සිදු විය. දෙවනවර ද මේ ආකාරයෙන් ම සිදු විය. තුන්වනවර මහජනයා රාජාංගනයට රැස් කරවා ''බිසවුන් වැදූ දරුවන් එක් යකින්නියක් කන්නිය කුමක් කරමෝදැයි'' විචාළේය. යකින්නියගෙන් දරුවන් බේරා ගැනීමට දේවියගේ හස්තපාදයෙහි තල්පතක් බැඳීමට හෝ යකඩ ගෙයක් සාදා ආරක්ෂා කිරීමටත් යෝජනා විය. ඒ අනුව බිත්ති, ස්ථම්භ සෝපාන සියල්ල යකඩින් සාදා දිලිසෙන ප්‍රදීපයන්ගෙන් ගේ වටා රන්, රිදී, මුතු දැල් ආදිය යෙදීමට තීරණය විය. එකල්හි රජ්ජුරුවෝ බිසවුන් ගර්භය මුහුකුරා ගිය බව දැන බිසවුන් ගෙයි ලා රැකවල් ලැවූහ. එවර ලැබුණු රන් රුවක් හා සමාන කුමරුට යකඩ ගෙයිහි දී උපන් හෙයින් අයෝඝර කුමාරයෝ යයි නම් තැබූහ.

මහා බෝධිසත්වයෝ ගෙයි දී ම වැඩී සියලු ශිල්ප ඉගෙන ශක්ති සම්පන්න ව හැදී වැඩුණු බැවින් රාජ්‍යත්වයට පැමිණවීමට රජතුමෝ තීරණය කළහ. එහෙත් රජතුමා රජකම අතහැර තපසට යාමට තීරණය කිරීමත් සමඟ උන්වහන්සේ  සමඟ බිසවිහු ද අන්තඃපුර ස්ත්‍රීහු ද යුවරජ, සෙනෙවිරජ ආදීහු ද බ්‍රාහ්මණ ගෘහපති ආදීහු ද සියල්ලෝ ම මහත් සම්පත් අලුයම දැමූ කෙළපිඬක් කොට නොසිතා හැර අයෝඝර කුමාරයන් හා නික්මුණහ.

එකල්හි දෙමව්පියන් දෙදෙන සුදොවුන් මහරජ හා මහාමායා දේවිය වන්නේය.

**කුණාල ජාතකය**

අලම්බුසා, නලිනී, කුණාල ජාතක කථා ස්ත්‍රීන්ගේ අසත්පුරුෂ ගති සොබා පැවසීමට ඇරුණු කථා ය. අලම්බුසා ජාතකය ඉසිසිඞ්ග තවුසාගේ කතාව තේමා කර ගත්තෙකි. ඉසිසිඞ්ග තාපසයා ගැන කියවෙන තවත් ජාතක කථාවකි නලිනී ජාතකය. නලිනී ජාතකය එක් වෘත්තාන්තයක් මැදි කොට ගෙන ස්ත්‍රියගේ දුර්ගුණ කියැවුණු කතාවක් නම් කුණාල ජාතකයයි. එය වෘත්තාන්ත රාශියක් එක්තැන් කිරීමෙන් නිමවුණු කතාවකි. මෙම ජාතකයේ වත්මන් කතාවේත්, අතීත කතාවේත් දෙකෙහි ම වෙනත් කතා කිහිපයක් කියවේ. වත්මන් කතාවේ පුවත් අතර එන්දන, දද්දභ, ලටුකික, වෘක්ෂධර්ම, වට්ටක යන ජාතක නමින් ඒවාහි සාරය දක්වා ඇත. අතීත කතාවෙහිත් කතා පහක් පමණ ඇත.

වත්මන් කතාවෙහි මුල් තැන ගන්නේ ශාක්‍ය කෝලිය වංශිකයන්ගේ ජලය බෙදා ගැනීම පිළිබඳ ගැටලුවයි. කසී රට බ්‍රහ්මදත්ත රජතුමා පිළිබඳ කතාව, එළකඩ පෙරවාගෙන සිල් රැකි තපස් විනිසකගේ කතාව, කොසොල් රජුගේ මව් බිසව හා පඤ්චාලචණ්ඩ බ්‍රාහ්මණ කුමරාගේ කතාව, බරණැස් නුවර කණ්ඩාරි රජුගේ කතාව අතුරු කතා කිහිපයකි. මෙම පර්යේෂණයට පාදක කර ගැනෙන්නේ පඤ්චපාපා නම් දිළිඳු කාන්තාවගේ කතාවයි.
බක නම් බරණැස් රජු අප්‍රසිද්ධ වේශයෙන් ගොස් ඒ නුවර විසූ පඤ්චපාපා නම් දිළිඳු කාන්තාව සමඟ සම්බන්ධ වූ ආකාරය මෙම කතාවට විෂය වේ. මෙම දිළිඳු දුව පසේ බුදුන් කෙනෙකුට කරන ලද පූජාවක් නිසා දිව පහස බඳු ශරීර පහස් ඇති වූවා ය. නමුත් නොකැමැත්තෙන් හා කෝපයෙන් පසේ බුදුන් දෙස බැලූ හෙයින් ඇයගේ මුහුණ, නැහැය, දෑස, දෑත, දෙපය යන පංච ස්ථානය විරූප වීම නිසා පඤ්චපාපා නම් විය.

රජතුමා නුවර පිරික්සමින් යන අවස්ථාවක පඤ්චපාපා දිවගොස් අත ඇල්ලීම නිසා එම දිව පහසට බැඳෙයි. රජ නිතර ම අප්‍රසිද්ධ වේශයෙන් ගොස් ඇය සමඟ කල් ගත කරයි. කලකට පසු ඇයගේ පියාට ලේ ග්‍රහණියක් ඇතිවෙයි. පඤ්චපාපා තමා සතු කර ගැනීමට සුදුසු අවස්ථාවක් බලා සිටි රජතුමා ඇයගේ පියාගේ රෝගයට පිළියම් ලෙස බත්මුල් දෙකක් ලබාදෙයි. ඉන් එක් බත් පතක ශිබා මාණික්‍යයක් දමා ඇය රජ මාළිගයට ගෙන ඒමට උපක්‍රම යොදයි. පසු ව පඤ්චපාපා බිසව අගමෙහෙසුන් තනතුරේ තැබූහ.

පඤ්චපාපා අගමෙහෙසිය වූ තැන් පටන් රජතුමා රාජකාරි කටයුතු මඟහැරීමත්, සොළොස් දහසක් බිසෝවරුන් කෙරෙහි එක් කෙනෙකුගේ මූණක් අනුරාගයෙන් නොබැලීමත් නිසා මහත් කලබලයක් ඇතිවේ. මේ නිසා සෙසු ස්ත්‍රීහු සපත්නීරෝෂයෙන් තොරතුරු පරීක්ෂා කළහ. පඤ්චපාපා බිසව රජුන් දෙදෙනෙකුට අගබිසොවුන් බවට අනාවැකි පළ විය.

ස්ත්‍රීන්ගෙන් අල්ලස් ගත් නිමිත්ත පාඨකයෝ නියම තතු සඟවා බොරු කියයි. පඤ්චපාපාගෙන් විපත් සිදු විය හැකි බැවින් ඉන් මිදීමට බිසොව නැවක ලා ගඟට පා කොට යවන ලෙසට උපදෙස් දෙයි. ඒ අනුව බිසොව පාවාරිය රජු සමීපයට පැමිණ ඇයගේ අත ඇල්ලූ පමණින් ශරීර පහසෙහි ඇලෙයි. ඉන් පසු වෙනත් ස්ත්‍රීන් කෙරෙහි නොබලයි. බක රජ මෙම පුවත් අසා සේනාව රැස් කරවා සටනට සැරසෙයි. පසු ව රජ දරුවන් දෙදෙනා ඔවුනොවුන් සමඟ සාකච්ඡා කර සතිය බැගින් එක් එක් රජ ළඟ ඇය නවත්වා ගැනීමේ ගිවිසුමට එකඟ වෙති. බිසෝ තෙම එක් ගෙයක සත් දවසක් හිඳ ඔරුවෙන් අනෙක් ගෙයට යන අතර ඔරු පදින පුද්ගලයා සමඟ පාප ක්‍රියාවේ යෙදෙන බව සඳහන් වේ.

ඇතැම් මිනිසුන් අවලක්ෂණ කාන්තාවන්ට ආලය කරන්නේ යටපත්ව පැවති ආසාවන් වෙනත් ස්වරූපයකින් පැමිණීම නිසා බව මාර්ටින් වික්‍රමසිංහ සඳහන් කරයි.

> ''බෞද්ධ චෛතසික විභාගය අනුව රාගයෙහි එක් අංගයක භයංකරත්වය කියනු සඳහා අර වඤ්චක ධර්මය මේ කතාවෙහි දී සංකේතයක් කරන ලද බව පෙනේ. අවලක්ෂණ ස්ත්‍රිය වුව ද ඈ රජුට ප්‍රිය වූයේ ඇගේ ස්පර්ශයෙන් ලත් මහත් ප්‍රීතිය නිසා ය. රාගය ස්පර්ශය ම මුල් කොට පහළ වූ සංකීර්ණ ධර්මයක් කොට බෞද්ධ මානසික විද්‍යාඥයන් සැලකූ බව එයින් හෙළි වේ'' (වික්‍රමසිංහ, 2015 : 57).

සම්බුලා ජාතකය, අයෝඝර ජාතකය, කුණාල ජාතකය යන කථා ත්‍රිත්වයෙහි ප්‍රධාන වශයෙන් මතු වන්නේ සැමියාගේ ආදරය, අවධානය, රාගය අනෙක් කාන්තාවන් කෙරෙහි යොමු වීම නිසා වේදනාවට, ද්වේෂයට පත්වන ගැහැනුන්ගේ මානසික තත්ත්වයයි. සම්බුලා දේවිය තම ස්වාමියාගේ නොසලකා හැරීම් හමුවේ සපත්නීරෝෂයෙන් පෙළී කායික ව මානසික ව දුබල වේ.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බුද්ධකාලීන සමාජ ආධිපත්‍යය තහවුරු කරගෙන සිටි බ්‍රාහ්මණ බල ඒකාධිකාරිත්වය ස්ත්‍රිය පිළිබඳ ව ගොඩනගා තිබූ සමාජ මතය වූයේ ඇය පහත්, නින්දිත සත්ත්ව කොට්ඨාසයක් ලෙසිනි. එමෙන් ම ඇය අභාග්‍යසම්පන්න, අතෘප්තිකර කාමාශා ඇති, වහා වරදේ බැඳෙන, දැඟිලි නුවණැති, චපල, විමුක්ති සාධනයට වරම් නැති, පාපකාරී සත්ත්ව කොට්ඨාසයකි. එමෙන් ම සුන්දර, මෘදු, නිහඬ, දුර්වල තැනැත්තියකි. ස්ත්‍රීත්වය විෂයයෙහි භාරතීයන්ගේ ඇගයුම් පරීක්ෂා කිරීමේ දී ජායා, පත්නී, භාර්යා, ගෘහණී, යහධර්මිණී වැනි පද භාවිත වී ඇති බව පෙනේ.

ජාතක පොතෙහි ස්ත්‍රිය පිළිබඳ ඇති ආකල්පය සරල ව විග්‍රහ කළ නොහැකි ය. ජාතක කථා අතුරින් ස්ත්‍රීත්වය කෙරෙහි අවධානය දැඩි ලෙස යොමු කරන කථා 87 ක් පමණ ගෙන බලන විට ඉන් 75 ක් පමණ අගුණ පක්ෂය සාකච්ඡා කරන බව පෙනේ. මෙහි දී ස්ත්‍රීත්වයට ආවේණික පොදු දුර්වලත්වය වශයෙන් ජාතක පොතෙහි වැඩි වශයෙන් සඳහන් කරන්නේ ඇයගේ කාමුකත්වයයි. සමිද්ධි ජාතකය, අසාතමන්ත ජාතකය, දූරාජාන ජාතකය, අන්ධභූත ජාතකය, උදඤ්චනි ජාතකය ඇයගේ කාමුකත්වය ප්‍රබල ව මතු කරයි.

කෝසිය, රාධ, සත්තුභත්ත, පදමානවක, වානම්භ, නච්ච, වලාහක, බිළාල, කරපත්ත, මහාපලෝභන, ගෘහපති, පඤ්චගරු වැනි ජාතක කථාවල ස්ත්‍රියගේ දුරාචාරී බව කියවේ. මත්ස්‍ය, තක්ක, අනභිරති, මුදුලක්ඛණ, බන්ධන මොක්ඛ, නලිනී, කුණාල, අසාතමන්ත, ගුම්බිය, පලාස, මහා මයූර, ස්වර්ණ මයූර, අන්ධභූත, කාක වැනි ජාතක කථාවල ස්ත්‍රිය පුරුෂයන් ක්ලේශ වසඟ කර ගන්නා ආකාරය විෂය කරගෙන ඇත. මේ ආකාරයට ස්ත්‍රියගේ අනුවණකම, විශ්වාස කළ නොහැකි බව, කපටි බව, තෘෂ්ණාධික බව වැනි විවිධ අංශ පිළිබඳ තේමා කරගෙන ඇත.

මෙම පර්යේෂණය සඳහා පාදක කරගත් කුණාල ජාතකයේ පඤ්චපාපාගේ කතාව විරූපී එහෙත් අතිශය ප්‍රසන්න කාමුක බවින් යුත් ස්පර්ශයක් නිසා රාජ්‍ය දෙකක ඇති වූ අරගලයක් විස්තර වේ. හදිසියේ ලද පහසින් ඈ කෙරෙහි බැඳුණු බක රජු ඇය අගමෙහෙසිය කර ගැනීමත්, අනෙක් අන්තඃපුර ස්ත්‍රීන් නොසලකා හැරීමත් නිසා ඇතිවන සපත්නීරෝෂය නිසා ඔවුහු නිමිත්ත පාඨකයන් ලවා රජතුමා නොමඟ යවති.

නිමිත්ත පාඨකයන්ගේ කීමට ඇය ගඟෙහි පා කර යැවීමත් පචාරිය රජ ඇය බේරාගෙන අගමෙහෙසිය කර ගැනීමත් නිසා යුධ තත්ත්වයක් ඇති වීම උත්ප්‍රාසාත්මක ය.

> ''මෙයින් ස්ත්‍රී දුර්ගුණයක් නොව ස්ත්‍රී ශරීරයෙහි ඇති පුරුෂයන් ප්‍රමෝදයට පත් කරන ස්පර්ශ සුඛය ගැන ම කියවේ. කතුවරයාට ද ඒ ගැන හැඟුණු නිසාදෝ දීර්ඝ කතාවේ අගට මෙබඳු වැකියක් යොදා පඤ්චපාපා කාමාශක්ත අනාචාරී ස්ත්‍රියක් බවට ඔප්පු කිරීමට උත්සාහයක යෙදේ'' (පෙරේරා, 2000 : 87).

අයෝඝර ජාතකයෙන් ද සාකච්ඡා වන්නේ සපත්නීරෝෂය නිසා සංසාරගතව වෛර බැඳ ගන්නා කාන්තාවකගේ විනාශකාරී හැසිරීමයි.

ස්ත්‍රිය පුරුෂයා කෙරෙහි ද පුරුෂයා ස්ත්‍රිය කෙරෙහි ද ආකර්ෂණය වීම සදාතනික යථාර්ථය යි. ලෝක සම්භවය පැහැදිලි කෙරෙන අග්ගඤ්ඤ සූත්‍රයේ ස්ත්‍රී පුරුෂ ආකර්ශනයත්, ස්ත්‍රී පුරුෂ සම්භෝගයත් ඒ ඔස්සේ කුටුම්භය ලොව පහළ වූ ආකාරයත් පැහැදිලි කෙරේ. ස්ත්‍රිය පුරුෂයා ද පුරුෂයා ස්ත්‍රිය ද ඇද බැඳ ගන්නා ආකාර අටක් බුදු දහමේ දක්වේ. සිනහවෙන්, කතාවෙන්, හැඬීමෙන්, ආකල්පයෙන්, තුටුපඬුරෙන්, ගායනයෙන්, ස්පර්ශයෙන් හා රූපයෙන් මෙම අංග අට වේ.

මහණෙනි ස්ත්‍රිය යන්නී ද සිටින්නී ද හුන්නී ද හොවින්නී ද සිනාසෙන්නී ද බණන්නී ද ගයන්නී ද හඬන්නී ද ඉදිමුනී ද මියගියා ද පුරුෂයා සිත්ගෙන සිටින්නී යයි ද බුදු දහමේ පෙන්වා දේ. කුණාල ජාතකය මෙම කරුණු සාක්ෂාත් කිරීම වඩා හොඳ නිදසුනකි.

විවිධ මානසික හේතු නිසා ශරීරයේ හට ගන්නා රෝගාබාධ පිළිබඳ ව ජාතක කථාවල තොරතුරු සඳහන් වේ. උම්මදන්ති ජාතකයේ රජතුමාට උම්මාදන්තිගේ ආදරය දිනාගත නොහැකි වූ විට රාජකාරී කටයුතුවලට උනන්දුව අඩුවීම, නිකරුනේ ඇවිදීම, යහනට වී සිටීම, නිදිවර්ජිත ව කල් යැවීම, ඇය ගැන සිහි කරමින් වැලපීම, මරණය ගැන කතා කිරීම වැනි රෝග ලක්ෂණ ඇති වූ බව පැවසේ. මෙය විශාදය **(Depression)** නමැති මානසික රෝගයේ ලක්ෂණ වේ.

අපගාමී ලිංගික චර්යා හා මනෝ ලිංගික ව්‍යාබාධ නූතන මනෝවිද්‍යාවේ සාකච්ඡා කෙරෙන තවත් මානසික රෝගයකි. බාහිය ජාතකය මෙයට මනා නිදසුනකි. කුණාල ජාතකයේ සමස්ත ජාතක කථා අධ්‍යයනය කරන විට අධික කාමය, ප්‍රදර්ශන කාමය, කණ්ඩායම් ලිංගිකත්වය වැනි අවස්ථා දැකිය හැකි ය. එසේ ම මානසික ඌනතාවන් පිළිබඳ ව සාකච්ඡා කෙරෙන ආචාරී ජාතකය ද මෙයට මනා නිදසුනකි.

ජාතක පොතට සමගාමී ව ස්ත්‍රීත්වයට බුදු සමයේ ලබා දී ඇති ස්ථානය සාකච්ඡා කිරීම ද වැදගත් වේ. ස්ත්‍රිය තරම් පුරුෂයා කුල්මත් කරන හා පුරුෂයා තරම් ස්ත්‍රිය කුල්මත් කරන වෙනත් දෙයක් නොමැති බව ඉත්ථිබන්ධන සූත්‍රයේ සඳහන් වේ. පුරුෂයකු ස්ත්‍රියකගේ ආකර්ෂණයට හේතු වන ආකාරය සංයුක්ත නිකායේ මාතුගාම සූත්‍රයෙන් පැහැදිලි කෙරේ. ස්ත්‍රී පුරුෂභාවය තීරණය වන ආකාරය සංයෝග විසංයෝග ධම්ම පරියාය සූත්‍රයෙන් විස්තර වී ඇත. ස්වාමි භාර්යා සම්බන්ධය සිඟාලෝවාද සූත්‍රයෙන් ද අඹු සැමි සබඳතාව සංවාස සූත්‍රයෙන් ද නිවසක ආර්ථික පැවැත්ම පිළිබඳ ව කුල සූත්‍රයෙන් හා උග්ගහ සූත්‍රයෙන් සාකච්ඡාවට ලක් වී ඇත. සමාජ ස්තරායනය පිළිබඳ කෙරෙන ශාස්ත්‍රීය අධ්‍යයනයක දී පැහැදිලි වන කරුණක් නම් ජාතක කථාවල මතු කෙරෙන ස්ත්‍රියගේ ලිංගිකත්වය පිළිබඳ උත්ප්‍රාසාත්මක ප්‍රකාශන බෞද්ධ මනෝවිද්‍යාත්මක එළඹුමකින් විශ්ලේෂණය කිරීමේ අවශ්‍යතාවයි.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

එක ම ස්වාමියකු යටතේ සමාන වරප්‍රසාද හා අයිතිවාසිකම් සහිත ව ජීවත්වන බිරින්දෑවරුන් සපත්නීන් ලෙස හැඳින්වේ. එහි දී සමාන බිරින්දෑවරුන් අතර තම ස්වාමියා සම්බන්ධ ව ඇතිවන ලිංගික ඊර්ෂ්‍යාව (Sexual Jealousy) එක්තරා මානසික ව්‍යාධියක් දක්වා වර්ධනය වේ. බටහිර මනෝවිද්‍යාවේ මෙම ලිංගික ඊර්ෂ්‍යාව **ඔතෙලො සින්ඩ්‍රෝම්** (Othello Syndrom) ලෙසින් හැඳින්වේ. අසනස ජාතකය හා චුල්ල ධර්මපාල ජාතකය මෙම ලිංගික ඊර්ෂ්‍යාවෙහි භයානක තත්ත්වය පැහැදිලි කරයි. කෙසේ වෙතත් ස්ත්‍රීන් තුළ ගොඩනැගෙන ලිංගික ඊර්ෂ්‍යාව හේතුවෙන් වෛරයට ලක් වන්නේ එම ස්ත්‍රී චරිතය ම වේ. සම්බුලා ජාතකයෙහි සම්බුලාව සපත්නීරෝෂය නිසා කෘෂ වී දුර්වර්ණ වී සංවේගාත්මක ස්වරූපයක් ප්‍රකාශ වීමෙන් පෙනෙන්නේ සපත්නීභාවය ස්ත්‍රියකට දුක ඇති කරවන්නක් බවයි.

ස්වකීය ස්වාමියාට දාව සපත්නියක් ගැබ් ගත් අවස්ථාවේ එම ගැබ විනාශ කිරීමට අනෙක් සපත්නිය ක්‍රියා කළ ආකාරය මගින් දකිය හැක්කේ ලිංගික ඊර්ෂ්‍යාවේ බලවත්කමයි. මෙම වෛරය සංසාරික වශයෙන් දීර්ඝ කාලයක් රැගෙන යාමට තරම් ප්‍රබල වූ ආකාරය මින් ප්‍රත්‍යක්ෂ වේ. අවසානයේ බුදුන්වහන්සේ සපත්නීගේ මෙම සංසාරික වෛරය නිමා කළ සේක. ප්‍රේතවත්ථුපාලියෙහි ආචාරවිද්‍යාත්මක තලයක පිහිටා සපත්නීරෝෂයෙහි දුර්විපාක විශ්ලේෂණය කර ඇත. මතු ආත්මභවයක දී යකිනියක වී ඉපිද අනෙක් සපත්නියගේ දරුවන් මරා අනුභව කිරීම මෙකී සපත්නීරෝෂය නිසා සිදු වූවක් බවට අයෝඝර ජාතකය මනා නිදසුනකි.

මෙම ජාතක කථා තුනෙහි එනම් සම්බුලා ජාතකය, කුණාල ජාතකය, අයෝඝර ජාතකය අන්තර්ගත සපත්නීරෝෂය මගින් හෙළි කෙරෙන්නේ ස්ත්‍රීත්වය පිළිබඳ එක්තරා මනෝවිද්‍යාත්මක ප්‍රකාශනයකි. පිළිබඳ බෞද්ධ විවරණය මනෝ විද්‍යාත්මක හා ජීව විද්‍යාත්මක පදනමක් යටතේ විග්‍රහ කළ ද ස්ත්‍රීභාවය පිළිබඳ බෞද්ධ අර්ථකථනය විග්‍රහ වන්නේ සමාජ විද්‍යාත්මක තලයක් මත පිහිටමිනි.

බුදු සමය වැඩි අවධානයක් යොමු කර ඇත්තේ අයහපත් චිත්තවේග දුරු කිරීමට ය. මේ අනුව දස්සනා (දර්ශනයෙන්), සංවරා (සංවරයෙන්), පටිසේවනා (ප්‍රතිසේවනයෙන්), අධිවාසනා (ඉවසීමෙන්), පරිවජ්ජනා (පරිවර්ජනයෙන්), විනෝදනා (මුදා හැරීමෙන්), භාවනා (භාවනාවෙන්) යන සත් වැදෑරුම් මනෝ චිකිත්සක න්‍යායන් පුද්ගල මනෝ සෞඛ්‍ය ප්‍රවර්ධනයට වඩාත් වැදගත් වේ.

බෞද්ධ ඉගැන්වීම් අනුව විවිධ චිකිත්සක ක්‍රම පැවතිය ද පිළියම් කරන ස්වභාවය ද වැදගත් ය. එනම් තාවකාලික පිළියම් යෙදීම (තදංගප්පහාණ) කාල සීමාවකට පමණක් පිළියම් යෙදීම (වික්ඛම්භණප්පහාණ), සහමුලින් ම විසඳීම (සමුච්ඡේදප්පහාණ) නම් වේ.

බෞද්ධ මනෝවිද්‍යාවෙන් පුද්ගලයාගේ මානසික ස්වභාවයන් විස්තර කිරීම පමණක් නොව ඔහුගේ යහපත සඳහා ඒවා මෙසේ විය යුතු යයි ද ඉගැන්වේ. සබ්බාසව සූත්‍රයේ දැක්වෙන ආසව නැති කිරීමේ මාර්ග හත මගින් මනෝ ව්‍යාධි නිවාරණයට පවත්නා අසහාය ශක්තිය හෙළි කෙරේ. මෙහි ආසව සඳහා විඝාත පරිළාහ යන විශේෂණ පදය යොදා ගෙන ඇත. ''හාත්පසින් දැවීම'' යනු මෙහි අර්ථයයි. මනෝවිද්‍යාවේ විස්තර කෙරෙන විවිධ මානසික ගතිලක්ෂණ මෙම ආසව තුළ අන්තර්ගත වේ. පුද්ගලයකු මානසික වශයෙන් රෝගී භාවයට, විකෘති භාවයට පත් වූ විට දැකිය හැකි සැකය, අවිනිශ්චිතභාවය, කාංසාව, මනෝ ග්‍රස්ති, කලකිරීම වැනි අයහපත් ගතිලක්ෂණ මෙම ආසව තුළ දැකිය හැකි ය. සම්බුලා ජාතකයේ සම්බුලා දේවියගේ මානසික පීඩනය, හැසිරීම්, බාහිර රූපකාය එයට මනාව සාක්ෂි දරයි.

> ''චින්තනය, තර්කනය, පරිකල්පනය, ස්මරණය, සංජානනය ආදී මානසික ලක්ෂණ හෝ හැකියාවන් රැසක එකතුවකි මනස යනු'' (මෛත්‍රීමූර්ති හිමි, 2007 : 65).

මානසික වශයෙන් ඇතිවන සංකූලතාවන් නිසා වැලඳෙන මනෝ කායික රෝග ද පුද්ගලයාට වැලඳෙන රෝගයකි. මානසික සංකූලතාව යනු සිත අවුල්සහගත තත්ත්වයට පත්වීම ය. ඉච්ඡාභංගත්වය හෙවත් බලාපොරොත්තු කඩවීම ඇතැම් කායික රෝගවලට හේතුකාරක වන බව අනාවරණය වී ඇත. සම්බුලා දේවියගේ චර්යා රටාවෙන් හෙළි කෙරෙන්නේ ඇය විඳි කායික, මානසික ගැටලුවයි. එක් අතකින් ස්වාමියා ඇයව නොතකා හැරීමත්, අනෙක් අතින් සපත්නීරෝෂයන් හේතු කොට මානසික ව හා කායික ව පීඩාවට පත් වීමත්, තාපසතුමාට දැන්වීමෙන් පසු ඔහුගේ මැදිහත්වීම නිසා රජතුමා තම වැරදි නිවැරදි කර ගැනීමත් සිදු වේ.

මිනිස් සිත පාලනය කරන මූලික ආවේග දෙකක් පිළිබඳ ව ධර්මයෙහි සඳහන් වේ. එනම් කාමය සහ කෝපයයි. බාහිර ලෝකය සම්බන්ධ ව මධ්‍යස්ථ චේතනාවන් මිනිස් සිතෙහි බලපැවැත්වීම දුෂ්කර ය. පුද්ගලයාගේ අරමුණු බොහෝ දුරට කාමයට හෙවත් ඇලීමට බර ය. නැතහොත් කෝපයට හෙවත් ගැටීමට බර ය. පුද්ගලයාගේ සිත තුළ අකමැත්තක්, රළු ස්වභාවයක්, පිළිකුලක් ඇති වන්නේ ගැටීම පදනම් කරගෙන ය. මෙම තත්ත්වය නොකඩවා පැවතීමෙන් වෛරයකට පෙරළේ. ඉන් පසු පළිගැනීමට පෙළඹේ. මෙසේ හේතුඵල ක්‍රමයට අනුව මෙම ක්‍රියා පරම්පරාව දිගින් දිගට ම ගමන් කරයි. කුණාල ජාතකය හා අයෝඝර ජාතකය මෙයට මනා නිදසුන් වේ.

මිනිස් මනසෙහි හැඟීම් ඇතිවීම සාමාන්‍ය තත්ත්වයකි. ක්ෂණිකව ඇතිවන හැඟීම් නිසා සමහර පුද්ගලයන් පිළිබඳ හැඟීම් ඇතිවන අතරම අප්‍රිය කරන පුද්ගලයකු දුටු විට කෝපය ඇති වීම ද එසේ ම ය.

> ''එකල බක නම් බරණැස් රජ්ජුරුවෝ රාත්‍රී භාගයෙහි අප්‍රසිද්ධ වේශයෙන් නුවර පරීක්ෂා කරනු පිණිස පිටත් වූහ. රජ්ජුරුවෝ ඇගේ ගෙදරට පැමිණියාහුය. ඒ පඤ්චපාපා නම් කුමාරිකා ද කෙළිමුලක් හා සමග කෙළින්නී රජ්ජුරුවන් නොදැන ගොස් අත ඇල්ලුව රජ්ජුරුවෝද හස්ත ස්පර්ශයෙන් දිව පහස් වැදගත් කෙනෙකුන් පරිද්දෙන් ස්වභාවයෙන්

 © 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සිටපිය නොහී පහයෙහි ඇලුණාහු විරූප වූත් ඈ අත අල්වා ගෙන ''තෙපි කාගේ දියණි කෙනෙක්දැයි'' විචාරා ''දොර වසන්නා වූ දුප්පත් කුලයෙක එකකිමි'' කී කල අස්වාමිකභාවය විචාරා නියම දැන ''මම තීට ස්වාමිපුරුෂයා වෙමියි ගොස් තීගේ දෙමව්පියන්ට තත් තත් වූ පරිද්දෙන් කියාලා'' යි කීහ'' (ජාතකපොත, 1498).

කුණාල ජාතකයේ අන්තඃපුර ස්ත්‍රීන්ට පඤ්චපාපා පිළිබඳ ඇතිවන සපත්නීරෝෂයත්, අයෝඝර ජාතකයේ පෙර ආත්මයක දී සපත්නීරෝෂය නිසා බද්ධ වෛරයෙන් යකිනියක ව ඉපිද පළිගැනීමත් මෙම කාරණය පැහැදිලි කරන්නකි. අකුසලසහගත චිත්තවේග පෝෂණය කෙරෙන්නේ වැරදි විතර්කනයෙන් බව බෞද්ධ මනෝවිද්‍යා සිද්ධාන්තයකි. විතර්කයන් සිය පාලනයට ගැනීමට නොහැකි වීම මිනිසාගේ මානසික ජීවිතයේ විශාලතම ගැටලුවයි. මජ්ඣිම නිකායේ විතක්කසණ්ඨාන සූත්‍රයේ මේ සඳහා ප්‍රායෝගික ක්‍රියාමාර්ග කිහිපයක් ඉදිරිපත් කර තිබේ.

සල්ලේඛ සූත්‍රයේ දැක්වෙන මානසික රෝග වන කිපෙන සුළු බව, බද්ධ වෛරය, ද්වේෂසහගත බව, කාමයෙහි වරදවා හැසිරීම මෙම ජාතක කථා දෙකෙහි ම දැකිය හැකිය. සල්ලේඛ සූත්‍රයෙහි ඉදිරිපත් කෙරෙන ක්ලේශධර්මයන්ට (කෙලෙස් එක් දහස් පන්සිය) විරුද්ධ වූ ප්‍රතිචාර දැක්වීම මගින් ද සහනය උදා වන බව බෞද්ධ උපදේශනයේ සඳහන් වේ. එහි දී සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාව මෙම මෙහෙයවීම සිදු වේ. මෙහි දී සීලය ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. එනම් අනුගමනය කළ යුතු පින් ඇති වන චාරිත්‍ර සීලය ද වැලකිය යුතු සීලය වන චාරිත්‍ර සීලය යි.

> ''සල්ලේඛ සූත්‍රයෙහි ද උපමාවක් දක්වමින් මේ කරුණු වඩා ප්‍රබල අයුරින් පෙන්වාදෙනු ලැබේ. මඩේ එරී සිටින පුද්ගලයෙකුට මඩේ එරී සිටින වෙනත් පුද්ගලයෙකු ගොඩ ගැනීමට නුපුළුවන. මඩෙන් ගොඩ වූවෙකුට නම් මඩේ එරී සිටින වෙනත් පුද්ගලයෙකු ගොඩ ගත හැකිය. එසේ වන්නේ ඔහු තද පොළවෙන් ස්ථාවරව පිහිටා සිටින හෙයිනි'' (හෙට්ටිආරච්චි, 2006 : 18).

කුණාල ජාතකයෙහි එක් පසෙකින් බක රජතුමා ද පාවාරිය රජතුමා ද විරූපී පඤ්චපාපා ලබා ගැනීම සඳහා සටනකට එළඹේ. අවසානයේ ඇයගේ දිව්‍යමය පහස ලබා ගැනීම සුහද ව සිදු කිරීමට රජවරු තීරණය කරති. මෙහි දී එක් පසකින් පඤ්චපාපා සහ අන්තඃපුර කාන්තාවන් ද අනෙක් පසින් රජවරු දෙදෙනා ද අතර සහසම්බන්ධතා මගින් හෙළි කරන්නේ දෙපසේ ම තණ්හාව, ලෝභය හා ද්වේෂයයි. මෙහි දී රාග චරිත, ද්වේෂ චරිත, මෝහ චරිත හඳුනාගත හැකි ය. කුණාල ජාතකයේ හමුවෙන රාග චරිත මෙන් ම අයෝඝර ජාතකයේ හමුවෙන ද්වේශ චරිතත් මෙහි දී නිදසුන් සහිත ව ඉදිරිපත් කළ හැකි ය. විසුද්ධිමග්ගයේ දැක්වෙන අන්දමට,

> ''පූර්ව ජන්මයෙහි එකිනෙකා සමඟ කලහ කොට කපා කොටා වෛර ක්‍රියා කළවුන් නිරයෙන් හෝ නාග යෝනිවලින් ආ ද්වේශ චරිතයෝ ය. ද්වේශය බහුල කොට පවතියි'' (ධර්මකීර්ති හිමි, 2017 : 60).

විසුද්ධි මග්ගයේ සඳහන් වන ආකාරයට මිනිසා තුළ කෙලෙස් බලපවත්වන ආකාර තුනකි. එනම් වීතික්කම (වචනයෙන්, ක්‍රියාවෙන් කෙලෙස් ප්‍රකාශයට පත්වීම), පරියුට්ඨාන (ප්‍රකාශයට පත් නොවුවද සිත යට පැවතීම), අනුසය (කෙලෙස් නිදා සිටීම) යන්නයි.

සල්ලේඛ සූත්‍රයෙහි දැක්වෙන මෙම මානසික රෝග 44 විග්‍රහාත්මක ව අධ්‍යයනය කරන විට ඉහත සඳහන් ජාතක කථාවල මෙම ලක්ෂණ කොතෙක් ගැලපේ දැයි පැහැදිලි ව හඳුනාගත හැකි ය. විතක්කසණ්ඨාන සූත්‍රයේ සඳහන් වන අන්දමට අකුසලසහගත චිත්තවේග බිහි කරන සුළු මානසික අරමුණුවලින් සිත බැහැර කොට වෙනත් අරමුණකට සිත යොමු කිරීම පළමු උපක්‍රමය වේ. මෙය සාර්ථක නොවුවහොත් පාප විතර්කවල ආදීනව සිහි නුවණින් මෙනෙහි කළ යුතු ය. තම සිත තුළ දිගින් දිගට ම වර්ධනය වන වෛරීසහගත සිතුවිලි උත්සන්න වීමෙන් සිදු විය හැකි උපද්‍රව සලකා බැලීම කළ යුතු ය. එසේ නැත්නම් ඒවා අමතක කර දැමීමට හෝ අත්දැකීම් මත පිහිටා තර්කානුකූල ව කටයුතු කළ යුතු ය. මෙබඳු විතර්ක ඇති විට තමාට සිදුවන වෙහෙසත් ඒවා නැති විට දැනෙන සැහැල්ලුවත් මෙනෙහි කළ යුතු ය. අවසානයේ සියල්ල ම අසාර්ථක වුවහොත් අකුසලසහගත දේ කෙසේ හෝ මැඩලිය යුතු ය. අයෝඝර ජාතකයේ යකින්නගේ හැසිරීම්වලින් පෙන්නුම් කෙරෙන්නේ සපත්නීරෝෂය නිසා යටපත් කර ගත නොහැකි වූ ආත්මගත ද්වේශයයි. මෙහි දී සිදු වනුයේ චිත්තවේග පාලනයයි. ද්වේශය නිසා දැඩි කෝපයත්, බද්ධ වෛරයත් පුද්ගලයාට බලපෑම් කරයි. සිතුවිලි ප්‍රකෝප කරවයි.

මජ්ඣිම නිකායේ මූල පණ්ණසකයට අයත් වත්ථූපම සූත්‍රයේ දැක්වෙන පරිදි සිත කෙලෙසන අකුසල සිතුවිලි 16 කි. අභිධ්‍යාව නම් වූ විෂම ලෝභය (අනුන්ගේ දේ තමාට ද ඇත්නම් යයි ආශා කිරීම), ව්‍යාපාදය (අනුන් නසනු කැමැත්ත), ක්‍රෝධ (තරහ), උපනාහය (බැඳ ගත් වෛරය) සල්ලේඛ සූත්‍රයේ විෂම චර්යාවලට සමාන වේ.

සල්ලේඛ සූත්‍රයෙහි බුදුන්වහන්සේ මහාචුන්ද ස්ථවිරයන් අමතා දේශනා කරන්නේ,

> ''චුන්දය මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් කාමයන්ගෙන් වෙන් ව අකුසල ධර්මයන්ගෙන් වෙන් ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි යන යම් කාරණයක් වේද, එය විද්‍යමාන වෙයි. ඔහට සල්ලේඛයෙන් (කෙලෙස් සිඳීමෙන්) යුක්ත ව වාසය කරමි'යි අධිමානය විය හැකි ය. චුන්දය, මේ ධ්‍යානයෝ ආර්ය විනයෙහි සල්ලේඛයෝ යයි කියනු නොලැබෙත්. මොහු ආර්ය ශාසනයෙහි ඉහාත්මභාව සුඛ විහරණයෝ කියනු ලැබෙත්'' (සල්ලේඛ සූත්‍රය, 95).

බෞද්ධ මනෝවිද්‍යාවේ ආකල්පය වනුයේ නිරෝගී මනසකට නිරෝගී කයක් ලැබෙන බවයි. සුසමාහිත අල්පශක්‍යතාව, අල්පේච්ඡතාව වැනි සංකල්පවල එම


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අදහස මනාව ගැබ් වේ. අංගුත්තර නිකායේ රෝග සූත්‍රයට අනුව මානසික රෝගයක් නොමැති ව මොහොතක් ගත කිරීම නිවන නොදුටු සැමට දුෂ්කර ය. පන්සිය පනස් ජාතක පොතේ දරිමුඛ ජාතකයෙහි දක්වෙන මනෝ රෝග වර්ගීකරණය ජාත්‍යන්තර මනෝරෝග වර්ගීකරණයට සමාන බව නූතන විද්වතුන්ගේ පිළිගැනීමයි. ජාත්‍යන්තර මනෝරෝග වර්ගීකරණය (International Classification of Diseases) ද මෙයට සමාන ය. කාම උන්මාදය, ක්‍රෝධ උන්මාදය, දර්ශන උන්මාදය, මෝහ උන්මාදය, යක්ෂ උන්මාදය, පිත උන්මාදය, සුරා උන්මාදය හා ව්‍යසන උන්මාදය මෙම මනෝ චිකිත්සක පිළිවෙළ අටයි.

මෙම ශාස්ත්‍රීය පර්යේෂණයට පාදක කර ගත් සම්බුලා ජාතකය, අයෝඝර ජාතකය, කුණාල ජාතකය යන කතාවල පොදුවේ දැකිය හැකි ස්ත්‍රීත්වය පිළිබඳ ජීවවිද්‍යාත්මක ආකල්පය උත්ප්‍රාසාත්මක ය. රාජ්‍යත්වය හා බැඳුණු බලය, පුරුෂ මූලිකත්වය, විවාහ සංස්ථාවේ පුරුෂ අධිකාරීත්වය ස්ත්‍රියට අත් කර දී ඇති මානසික සහනශීලී බව අවම කර ඇත. සිය සැමියාගේ කුෂ්ට රෝගය නිසා ඔහු සමඟ වලට වැද සියලු දුක් අනුභව කරන සම්බුලා දේවිය නැවත සුව ලබා මාළිගයට ගිය විට ප්‍රතික්ෂේප වීමට ලක් වේ. මේ අවස්ථාවේ ඇය කායිකව, මානසිකව විඳින පීඩනය ස්ත්‍රීත්වයට හිමි සංවේදී බව සටහන් කරයි. චිත්තවේග හසුරුවා ගැනීමට නොහැකි නිසා සිහි නුවණින් තොර බවක් ද මානසික කායික රෝගී බවක් ද ඇය ප්‍රකට කරයි.

අයෝඝර ජාතකයේ සපත්නීරෝෂයෙන් පීඩා විඳි කාන්තාවක් යකිනියක වී පසු ආත්මයක අනෙක් බිරිඳට උපදින දරුවන් මරා කෑමට පෙළඹෙයි. බුදු දහමට අනුව හැම ගැටුමකට ම පදනම මනෝවිද්‍යාත්මක ය. සෑම චර්යාවකට ම චින්තනය පූර්වාංගම වීම ඊට හේතුවයි. කුණාල ජාතකයේ විරූපී කාන්තාවක වන පඤ්චපාපා අගමෙහෙසිය කර ගැනීම නිසා අනෙක් කාන්තාවන් දක්වන විරෝධය, ද්වේශය ප්‍රකාශ වන්නේ නිමිති පාඨකයන් ලවා ඇයට එරෙහි ව ක්‍රියාමාර්ග ගැනීමෙනි.

මානසික රෝග පිළිබඳ බෞද්ධ වර්ගීකරණයේ දී සමස්ත සූත්‍ර සාහිත්‍ය පුරා විසිරී ව්‍යාප්ත ව ඇති මනෝ විකෘතිතා සහ අසාමාන්‍ය චර්යාවන් එක් එක් චරිතයන්ට සාපේක්ෂ ව අභිධර්ම පිටකයේ හා පුද්ගල ප්‍රඥප්තියේ සංග්‍රහ කොට තිබේ. ඊට අමතර ව අසාමාන්‍ය චර්යා සහ මනෝ විකෘතිතා පිළිබඳ අවධානය යොමු කරමින් මානසික රෝගී වර්ගීකරණයක් ඉදිරිපත් කරන වැදගත් ම සූත්‍රය වන්නේ සල්ලේඛ සූත්‍රයයි. ඊට අමතර ව බෞද්ධ මනෝ රෝග චිකිත්සාව හා සබැඳි ප්‍රතිකාරමය ප්‍රවේශ සබ්බාසව සූත්‍රයේ මනාව පැහැදිලි කර ඇත.

මෙම ජාතක කථා ත්‍රිත්වය බෞද්ධ මනෝවිද්‍යාත්මක දෘෂ්ටියෙන් සාකච්ඡා කරන විට පැහැදිලි වන්නේ සහත්නීරෝෂය එක්තරා ආකාරයක මානසික රෝගයක් ලෙස ක්‍රියාත්මක වූ ආකාරයයි. විශේෂයෙන් ම විවාහ ජීවිතයෙහි දී ස්ත්‍රිය අත්විඳි චිත්ත පීඩාවයි. චිත්ත පීඩා විෂයෙහි හේතු වන්නේ ලෝභ, දෝෂ, මෝහ යන මනෝභාව ත්‍රිත්වයයි. කාම, ගේධ, ඡන්ද, නන්දි, තණ්හා, ස්නේහ, පිපාස, අජ්ඣෝසාන ලෙසින් ලෝභ මනෝභාවය ක්‍රියාත්මක වේ. සෑම පුද්ගලයෙක් ම සැපට කැමතිය (සුඛ කාමානි භූතානි). මේ සඳහා පුද්ගලයා මෙහෙයවන මනෝභාවය කාම තණ්හා වේ. ඉන්ද්‍රිය සන්තර්පණය මෙහි ප්‍රධාන ම අපේක්ෂාවයි. මෙහි දී පුද්ගලයා තමාට එන බාධකවලට ප්‍රතිචාර දක්වන මනෝභාවය වන්නේ ද්වේෂයයි. තමා කැමති දේ අත්පත් කර ගැනීම උදෙසා කරන අරගලයේ දී ප්‍රභාස්වර සිත කිලිටි වේ. සිත පවතිනුයේ වෙනස්වීමට බඳුන් වෙමිනි. ඒ සිත ගොඩට දමූ මාලුවෙකු මෙන් නිතර සැලේ. එයට හේතුව ලෝභ, ද්වේශ, මෝහාදි අකුසල මූලයන් පෙරටු කර ගත් කෙලෙස් නිරාවරණය වූ මනසට ඇතුළු වන බැවිනි.

> ''තථාගත දේශනයෙහි වඩාත් අවධානයට යොමු වන්නේ සිත පිළිබඳ ව ය. සිත මොහොතින් මොහොත අරමුණෙන් අරමුණට වෙනස් වන සත්ත්වයා සතු සුවිශේෂ ශක්තියක් බව බුදුහු වදාළහ. සිත නිරන්තරයෙන් අරමුණු නිසා කිලිටට පත් වේ. කිලිටි සිත මිනිසාට අනර්ථයක්ම කරන්නේය'' (පඤ්ඤාලෝක හිමි, 2004 : 105).

නොපහන් වූ සිත කැළඹුණු දිය විලක් හා සමාන ය. දිය විල් තෙර ඇස ඇති පුරුෂයෙක් සිටිය ද ඔහු විලෙහි සිටින සිප්පි බෙල්ලන් සක් බෙල්ලන් හෝ මසු කැල හෝ දිය පතුලෙහි ඇති කැට කැබලිති නොදකින්නේ ය. මක් නිසාද යත් දිය නොපහන් බැවිනි. කැළඹිලි සිතින් යුත් පුද්ගලයා ද එසේ ය. මනස නිතර සැරිසැරීමට උත්සුක වන්නේ ලෝභ, ද්වේශ, මෝහාදි චෛතසිකයන් ඇසුරිනි. මෙය ජාතක කථාවල ද දැකිය හැකි සනාතන ධර්මයකි. ජාතක කථා සාහිත්‍යයේ අන්තර්ගත වන්නේ යහපත් හා අයහපත් ගතිවලින් යුත් ඉතා සංකීර්ණ කාන්තා චරිත වේ. සම්බුලා, සඳකිඳුරු, තක්කාරිය වැනි ජාතක කථාවලින් පතිව්‍රතාව ආරක්ෂා කරන ස්ත්‍රී චරිත ද ස්වර්ණහංස, නිග්‍රෝධම්භ වැනි කතාවලින් බෝසත් ගුණ සහිත ස්ත්‍රීන් ද කුස ජාතකය, උම්මග්ග ජාතකය වැනි කථාවල ක්‍රියාශීලී ස්ථානෝචිත ප්‍රඥාව සහිත ස්ත්‍රීන් ද හමුවේ. වෙස්සන්තර ජාතක කථාව දාරක ප්‍රේමයෙන් හදවත පිරී ගිය මවකගේ ශෝකාලාපය මතු වේ. අන්ධභූත, කණවේර, සිරි කාලකන්නි, කෝසිය, අසාතමන්ත වැනි ජාතක කථාවල ස්ත්‍රී චරිත දැඩි විවේචනයට හා දෝෂ දර්ශනයට ලක් වේ. මිනිස් සිත ක්‍රියාත්මක වන ගුඪ ආකාරය මේ බොහෝ ජාතක කථාවල මනාව ප්‍රකට කෙරේ.

මනස යනු කුමක්දැයි විග්‍රහ කිරීම දුෂ්කර කර්තව්‍යයකි. පංචස්කන්ධයන් අතර නාම ස්කන්ධයට ගැනෙන වේදනා (මනසේ පහළ වන හැඟීම්), සංඥා (අරමුණු හඳුනා ගැනීම්), සංඛාර (මානසික ශක්තීන්), විඤ්ඤාණ (දැනීම්) යන සතර මනස සහ මනසෙහි ඇති වන්නා වූ ගති ලෙස හැඳින්විය හැකි ය. මෙම ජාතක කථාවල ස්ත්‍රීන් මානසික ව පීඩාවෙන් පෙළීම (සපත්නීරෝෂයට හේතුව අල්වා ගැනීම නැතහොත් උපාදානයයි) මේ නිසා ඇති වන වෛරයයි. සියලු කරුණු මනස මුල් ව පවතී. බුදුරජාණන් වහන්සේ මනස උසස් ලෙස නිම කරන ලද චිත්‍රයකට සමාන කර ඇති බව දක්වේ. සෑම අවස්ථාවකදී ම මනස ලොව උසස් අයුරින් සකස් වූ කලා කෘතියකට වඩා නිර්මාණාත්මක ය. කලාත්මක ය. ලොව විද්‍යමාන


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වස්තූන් අතර මනස මෙන් විවිධ වූත් විචිත්‍ර වූත් වෙනත් වස්තුවක් නොමැත.

> ''රාග රක්ත වූ කෙලෙස් කසටින් පිරුණු චිත්ත පරිසරය වනාහි මනුෂ්‍ය වර්ගයාගේ දුක්ඛයට මඟ පාදන්නකි. එබැවින් බුදු දහමින් අනු දක්නේ පුද්ගලයාගේ මානසික පරිසරය තුළ පවතින ක්ලේශසහගත අකුසල තත්ත්වය මඟහරවා ගැනීමට උත්සුක වීම ය. ඒ සඳහා බුදු දහමින් නිර්දේශ කරනුයේ චිත්තවේග සංස්කරණයක පිළිවෙලකි. නූතන මනෝවිද්‍යාඥයින් නිර්දේශ කරන අන්දමට පුද්ගලයෙකු යම් ගැටලුවක් විසඳා ගැනීමේ හොඳ ම මානසික ප්‍රතිකර්මය වනුයේ එය ඇති වූ පරිසරය වෙනස් කළ යුතු වීම හෝ එම පරිසරයෙන් අදාළ පුද්ගලයා ඉවත්වීමය'' (ආරියරත්න, 2007 : 78).

සම්බුලා ජාතකයේ සම්බුලා දේවිය තමා විඳි කායික, මානසික පීඩාව සමනය කර ගත්ත ද අයෝඝර ජාතකයේ යකිනියත්, කුණාල ජාතකයේ පඤ්චපාපාත් සපත්නීරෝෂයේ පීඩාවෙන් දඬුවම් ලබති. අයෝඝර ජාතකයේ බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවට වෛර බැඳි ස්ත්‍රියක වන යකිනිය අවසානයේ විනාශ වන්නේ සසර ගමනේ ඇය අත් කර ගත් සැපයක් ලෙසිනි. කුණාල ජාතකයේ පඤ්චපාපා බක හා පාවාරිය යන රජවරු දෙදෙනා නිසා ම අවසානයේ කායික ව හා මානසික ව පීඩාවට ලක් වන්නේ ඇයගේ කාමාධික බව නිසා බව ජාතක කථාකරුවා සඳහන් කරයි. පුද්ගලයා සසර ගමන් කරන්නේ ඔහු විසින් රැස් කර ගත් හොඳ, නරක මානසික ස්වභාවයන් හේතුවෙනි. මෙම ලෝභ, ද්වේශ, මෝහ සංස්කාරයන් රැස් කර ගන්නේ මනසයි.

බුදු දහමේ නාම රූප යනුවෙන් විග්‍රහ වනුයේ සත්ත්වයාගේ කායික, මානසික පැවැත්මේ ස්වභාවය යි. චිත්ත චෛතසික ධර්ම සමූහයයි. එහි ශක්තිය අසීමිත ය. කය හා වචනය මෙහෙයවා ක්‍රියාත්මක කරන සියල්ලට මනස ප්‍රධාන වේ. බුදු වදනට අනුව සියලු ම ප්‍රතිපදා සත්ත්වයාගේ මනස පිළිබඳ පිළිවෙත වේ. එබැවින් සම්පූර්ණ බෞද්ධ දර්ශනය ම මනෝවිද්‍යාවක් බව පැහැදිලි ව හඳුනාගත හැකි ය. මනස මුල් කර ගත් මානසික රෝගවලට හඳුන්වාදිය හැකි යහපත් ප්‍රතිකර්ම හා මූලයන් සල්ලේඛ සූත්‍රයෙන් හා සබ්බාසව සූත්‍රයෙන් පැහැදිලි ව හඳුනාගත හැකි ය. කය හා මනස අතර පවත්නා සබඳතාව අභේද්‍යනීය වේ. ආධ්‍යාත්මික ලෝකය ජය ගැනීම සියලු ම පීඩාවලින් මිදීමේ එක ම ප්‍රතිකාරය වේ. එනිසා බුදු දහම ප්‍රජනනාත්මක හා චර්යාත්මක සංස්කරණයක් ඇති කර ගනිමින් අභ්‍යන්තර ලෝකය ජය ගැනීමට මඟ හෙළි කරයි. සබ්බාසව සූත්‍රයෙන් හෙළි කරන්නේ මෙම කාරණයයි.

ජාතක කථාවල මනෝ විද්‍යාත්මක ලක්ෂණ ද මනෝ චිකිත්සක ලක්ෂණ ද මනෝ ප්‍රතිකාර ද පැහැදිලි ව දැකිය හැකි ය. වෛද්‍ය ඩී.වී.ජේ. හරිශ්චන්ද්‍ර මහතාගේ **Psychiatric Aspects of Jataka Stories** කෘතියේ ජාතක කථාවල මනෝ විග්‍රහාත්මක එළඹුම් විග්‍රහාත්මක ව සාකච්ඡා කර ඇත. ජාතක කතාවල ඇති මනෝ රෝග බෙහෙවින් සංකීර්ණ ය. බන්ධනමොක්ඛ, සමුග්ග ජාතකයන්හි එන තම සහකරු / සහකාරිය පිළිබඳ ඊර්ෂ්‍යාව, උම්මග්ග, කුස, මට්ටකුණ්ඩලි ජාතක කථාවල එන සංවේදී හැසිරීම් ගුත්තිල ජාතකයෙහි ආත්ම අභිමානය ගිලිහී යාමෙන් සිය දිවි නසා ගැනීමේ හැඟීම් පහළ වීම, මට්ටකුණ්ඩලී ජාතකයේ වේදනාව පිළිබඳ රෝග ලක්ෂණ ද මානසික ඌන වර්ධන ලක්ෂණ අවරී, නන්ගුලීස ජාතකකථාවලින් ද පෙන්නුම් කෙරේ. ලිංගිකත්වය පිළිබඳ ප්‍රශ්න, ලිංගික අනන්‍යතාව බොහෝ ජාතකකථාවල මතු කර ඇත. අධික ලිංගික ආශාව කුණාල ජාතකයේ හඳුනාගත හැක. මේ ආකාරයෙන් විග්‍රහ කරන විට ජාතක කථා පොත මනුෂ්‍ය සමාජයේ සිතුම් පැතුම්, චර්යා රටා පිළිබඳ සංකීර්ණ මනෝ විග්‍රහයක් චිත්‍රණය කරන බව පෙනේ.

> ''බෞද්ධයන් විසින් ලෝකයට උරුම කර දෙන ලද ජාතක සාහිත්‍යය වූ කලී ප්‍රාග් බෞද්ධ යුගයේ මෙන් ම ඊට ආසන්න වකවානුවකත් උත්තර භාරතීය සමාජයේ දාර්ශනික, සාමාජික හෝ අධ්‍යාපනික ආදී විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ අධ්‍යයනයක් කිරීමට උපයෝගී කර ගත හැකි විශිෂ්ට සාහිත්‍යාංගයක් ලෙස සැලකිල්ලට පාත්‍ර වන බව විවාද රහිත ය. එමතු ද නොවේ මිනිස් සන්තානයෙහි සනාතන අරගලයක යෙදී සිටින විවිධ මනුෂ්‍ය අපේක්ෂාවන් හා ඒ අපේක්ෂා මගින් ක්‍රියාත්මක කෙරෙන මනුෂ්‍ය ක්‍රියාදාමයන්හි යථා ස්වභාවය පිළිබඳවත් ගැඹුරු උගැන්මක් ලැබිය හැකි කථා සංග්‍රහයක් ලෙස ජාතක සාහිත්‍යය සම්මානයට පාත්‍ර වූවකි'' (ඥානාරාම හිමි, 1996 : 72).

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ දී ජාතක කථා ත්‍රිත්වයක් ඇසුරෙන් ස්ත්‍රියගේ මානසික පීඩාකාරී අත්දැකීමක් වන සපත්නීරෝෂය පිළිබඳ සාකච්ඡා කිරීමට වැයමක් ගත් බව පැවසිය යුතු ය.

## සමාලෝචනය හා නිගමනය

''සපත්නීරෝෂය : ජාතක පොත ඇසුරෙන් බෞද්ධ මනෝ විද්‍යාත්මක අධ්‍යයනයක්'' මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ පසුබිම විය. එහි දී සපත්නීරෝෂය නම් සංකල්පයත්, ජාතක පොත හා බෞද්ධ මනෝ විද්‍යාව පිළිබඳවත් වෙන ම සාකච්ඡා කෙරිණ. අවසාන වශයෙන් මානසික රෝග පිළිබඳ ව සාකච්ඡා කෙරෙන සල්ලේඛ සූත්‍රයත්, මානසික ආතතිය නැති කිරීමේ මාර්ග පහදා දෙන සබ්බාසව සූත්‍රයත් විශ්ලේෂණාත්මක ව විමසා බැලිණ. ජාතක කථා තුනක් වන සම්බුලා ජාතකය, කුණාල ජාතකය හා අයෝඝර ජාතකය මත පදනම් ව මෙම අධ්‍යයනය සිදු කෙරිණ.

කුණාල ජාතකය ජාතක කථා පොතෙහි විශේෂයෙන් කැපී පෙනෙන්නේ එක කථාව තුළ කතා හතක් ම අන්තර්ගත කරගෙන තිබීමයි. මෙම ජාතක කථා හතෙන් හයක ම අන්තර්ගත වන්නේ ''ස්ත්‍රී ජාතීහු මුළු ලොව බඳන පිණිස මාරයා එලූ සොර මුලක් වැන්නාහ'' යනුවෙනි. කෙසේ වුව ද මෙම පර්යේෂණයට ඇසුරු කර ගත් ජාතක කථාවේ සාකච්ඡා වන්නේ ස්ත්‍රී දුර්ගුණයකට වඩා පුරුෂයන් ප්‍රමෝදයට පත් කරන ඇයගේ සුබ ස්පර්ශය ගැන ය.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ස්ත්‍රිය දුකට හේතුය, අසත්පුරුෂය, ළාමකය, කාමුකත්වයට සීමාවක් නැත, දුශ්චරිත සහිතය, ආරක්ෂා කළ නොහැකි ය, පරපුරුෂ සේවනයෙහි රුචිය, පුරුෂයා වසඟයට ගැනීමට නිතර මාන බලන්නීය, තවුසන්ගේ සීලය පවා බිඳ හෙලන්නීය, මායාකාරියක්ය යන පුරුෂ මූලික ආස්ථානයෙන් බැහැර ව ඇයගේ මනස පිළිබඳ විග්‍රහයක් මෙම අධ්‍යයනයේ දී සිදු කෙරිණ.

භාර්යාවන් කිහිප දෙනෙකු ඇති පුරුෂයකුගේ එක් භාර්යාවක් ලෙස අර්ථකථනය කර ඇති සපත්නී තුළ ඇතිවන ද්වේශය නම් මානසික තත්ත්වය මෙම සාකච්ඡාවට පදනම විය. සම්බුලා ජාතකය, කුණාල ජාතකය, අයෝඝර ජාතකය යන කථා තුනේ ම පුරුෂ ප්‍රජාව බහු භාර්යා සම්බන්ධය සහිත ය. එම නිසා ම රාජ්‍යයක අග්‍ර මහේසිකාව හා අන්තඃපුර ස්ත්‍රීන් අතර කායික, මානසික ගැටලු මතු වේ. ස්ත්‍රීත්වය හා පුරුෂත්වය යන වචන විරුද්ධ දෙපාර්ශවයකගේ හැසිරීම් හා පෞද්ගලික ස්වභාවය මතු කර පෙන්වන චිත්‍රයකි. ස්ත්‍රියට හා පුරුෂයාට සමාජය ලබා දී ඇති ස්ථානය නිසා මෙම තත්ත්වය තවදුරටත් සංකීර්ණ වේ. පුරුෂයා ස්වාධීන ශක්තිමත් තර්කාන්විත, ආධිපත්‍ය සහිත සත්ත්වයකු වන විට ස්ත්‍රිය දුර්වල, හැඟීම්බර, යටහත් පහත්, වංක සත්ත්වයෙකු බවට සමාජගත කර ඇත. ජීවවිද්‍යාත්මක ව මෙම දෙපාර්ශවයේ පවත්නා වෙනස්කම්, අවසානයේ සමාජ සංස්කෘතික නිර්මිතයක් බවට පත් වේ.

සම්බුලා ජාතකයේ සම්බුලා දේවිය තම සැමියා වෙනුවෙන් සියලු කැපවීම් කරන ගැහැනියකි. ඒ නිසාමදෝ ජාතක කථාකරුවා අවසානයේ ඇයට සාධාරණය ඉටු කරයි. කුණාල ජාතකයේ පඤ්චපාපා රාගාධික ගැහැනියක වීම නිසා ඇයට එහි ප්‍රතිඵලයක් ලෙස දඬුවම් ලැබීමට සිදු වේ. අයෝඝර ජාතකයේ යකින්නියට ද අවසානයේ දුක්සහගත ඉරණමකට මුහුණදීමට සිදු වේ.

අවසාන විග්‍රහයේ දී ජාතක පොතේ නිරූපිත ස්ත්‍රිය අත්විඳින මෙම සපත්නීරෝෂය මානසික පීඩාවක් ලෙස අර්ථ ගැන්විය හැකි ය. බෞද්ධ මනෝවිද්‍යාව මානසික රෝග සඳහා ප්‍රතිකාර කරන අතර ම මනෝ රෝග ඇතිවීම වලක්වා ගැනීම කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. සල්ලේඛ සූත්‍රයේ දැක්වෙන මානසික රෝග හතළිස් හතරෙහි සපත්නීරෝෂය හා සබැඳි රෝග ලක්ෂණ දැකිය හැකි ය. කෙළෙස්වලින් පෝෂණය වන අඛණ්ඩ මානසික ප්‍රවාහය සංසිඳුවීම සඳහා සබ්බාසව සූත්‍රයෙන් ඉදිරිපත් කෙරෙන සංකල්ප මනෝ චිකිත්සාව සඳහා බෙහෙවින් වැදගත් වේ. සැම බෞද්ධ මූලධර්මයක ම පවත්නේ චිකිත්සක නැඹුරුවකි. පුද්ගල මනස පිළිබඳ බෞද්ධ සම්ප්‍රදාය සතු පුළුල් හා ගැඹුරු පර්යේෂණාත්මක දැනුම භාවිත කළ යුතු ආකාරය සබ්බාසව සූත්‍රයෙන් විග්‍රහ කෙරේ. සබ්බාසව සූත්‍රය පුද්ගල පෞරුෂයේ ආශ්‍රව ලෙස හැඳින්වෙන අකුසල චිත්තවේග සම්බන්ධයෙන් යොදා ගත් නීවරණාත්මක ක්‍රමෝපාය විග්‍රහ කර ගැනීම අත්‍යවශ්‍ය වේ. සපත්නිරෝෂය බුදුදහමේ විග්‍රහ කෙරෙන ගැඹුරු මනෝ විග්‍රහාත්මක ප්‍රකාශනයක් ලෙස හැඳින්විය හැකි වුව ද ජාතක කතාකරුවා එය පටු සීමාවකට ලඝු කර ඇති බව පෙනේ. ස්ත්‍රීත්වය සම්බන්ධිත ජාතක කතාකරුවා හෙළන දෘෂ්ටිය විග්‍රහාත්මක හා බහුවිධ ප්‍රවේශයකින් අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවකි.

## පරිශීලිත මූලාශ්‍රය

### ප්‍රාථමික මූලාශ්‍රය

**සිතුවම් සහිත පන්සිය පණස් ජාතක පොත්වහන්සේ** (2005) කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

### ද්විතීයික මූලාශ්‍රය

අබේපාල, රෝලන්ඩ් (2014) **කාන්තා මනෝවිද්‍යාව හා කාන්තාවාදී උපදේශනය**, කොට්ටාව, සාර ප්‍රකාශන.

අස්සජි හිමි, ගන්තුනේ (සංස්) (බූ.ව.) **නිවන් මඟ සඟරාව**, බෞද්ධ මනෝ විද්‍යා අංකය, කොළඹ, රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය.

ආරියරත්න, ඉරෝමි (2007) **බෞද්ධ පාරිසරික දර්ශනය හා සදාචාරය**, කොළඹ, සමයවර්ධන ප්‍රකාශකයෝ.

කුලසූරිය, ආනන්ද (1997) **සිංහල සාහිත්‍යය 4**, බොරලැස්ගමුව, සී.ස. (පෞද්.) විසිදුනු ප්‍රකාශකයෝ.

ගුණතිලක, එච්. එම්. (සංස්.) (2012) නිවන් මඟ වෙසක් කලාපය, **චිත්ත විභාගය (ත්‍රිපිටකය හා විචාරවාද ඇසුරෙන්)**, බෞද්ධ සංගමය, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

චන්ද්‍රසේකර, සරත්. (2008) **ප්‍රායෝගික බෞද්ධ මනෝවිද්‍යාව**, කොළඹ, ඇස්. ගොඩගේ සහෝදරයෝ.

ජයතිලක, ඩී. බී. (1965) **සිංහල සාහිත්‍ය ලිපි**, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ඥානාරාම හිමි, පාතේගම (1996) **ජාතක සාහිත්‍ය විමර්ශනය**, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

තිලකරත්න, අසංග (2008) **මිනිස් ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය**, රාජගිරිය, කුරුළු පොත්.

ධම්මරතන හිමි, වැගන්තලාවේ (2019) **බෞද්ධ මනෝවිද්‍යා අධ්‍යයන ප්‍රවේශය**, පරගස්තොට, සහෘද ප්‍රකාශන.

ධර්මකීර්ති හිමි, නිවන්දම (2002) **සිංහල සාහිත්‍යයේ ස්වර්ණ යුගය**, දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පෙරේරා, ඉන්ද්‍රානි (2000) **කාන්තාව හා බුදුසමය**, කොළඹ, ඇස්. ගොඩගේ සහෝදරයෝ.


© 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පඤ්ඤාලෝක හිමි, මීගොඩ (2004) **බුදු දහම හා ලෞකික ජීවිතය**, කොළඹ, දයාවංශ ජයකොඩි සහ සමාගම.

මෛත්‍රිමූර්ති හිමි, කරගොඩ, උයන්ගොඩ (2007) **මනස පිළිබඳ බෞද්ධ විග්‍රහය**, කොළඹ, සමයවර්ධන පොත් ප්‍රකාශකයෝ.

වික්‍රමසිංහ, මාර්ටින්, (2015) **ජාතක කථා විමසුම**, රාජගිරිය, සරස (පෞද්.) සමාගම.

සේනාධීර, සිල්වි, සේනාධීර, එන්. ටී. එස්. ඒ. (2016) **කාන්තා අභිවෘද්ධිය සඳහා බුදු දහමින් ලබාගත හැකි මාර්ගෝපදේශ**, කොළඹ, ඇස්. ගොඩගේ සහෝදරයෝ.

සිරිසුගත හිමි, පැලවත්තේ (2018) මනෝරෝග හා හේතු පච්චය ධර්ම උපරතන හිමි, සෝරත හිමි (සංස්) කපුගම අත්ථදස්සි නායක ස්වාමීන්ද්‍ර අභිවන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, අම්බලන්තොට, නිග්‍රෝධ රාජාරාමය.

හෙට්ටිආරච්චි, ධර්මසේන (2006) **බෞද්ධ මනෝ විද්‍යා ප්‍රවේශය**, කොළඹ, දයාවංශ ජයකොඩි සහ සමාගම.

Harischandra, D.V.J, (1988) Psychiatric of Jataka Stories, Colombo; Vijitha yapa Publications.

**ශබ්දකෝෂ**

සංස්කෘත සිංහල ශබ්දකෝෂය (2004) අලගියවන්න, පුවසිති (සම්.) කොළඹ, සූරිය ප්‍රකාශකයෝ.

පාලි සිංහල අකාරාදිය (1998) බුද්ධදත්ත හිමි, පොල්වත්තේ දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය (1984) විජයතුංග හරිශ්චන්ද්‍ර. කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

ශ්‍රී සුමංගල ශබ්දකෝෂය (1970) සෝරත හිමි, වැලිවිටියේ ගල්කිස්ස, අභය ප්‍රකාශකයෝ.

 © 2021 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
# දොළොස්වන කලාපය - 2021 දෙසැම්බර්


| | |
|---|---|
| ශ්‍රී ලංකාවේ පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ දී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මුහුණ දෙන ගැටලු හා අභියෝග පිළිබඳ කරනු ලබන අධ්‍යයනයක්<br>**ඩී. එච්. ඒ. එස්. සෝමරත්න** | 1-15 |
| ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා අතරමැදි කලාපයේ සාම්ප්‍රදායික ගෙවතුවල භූමිකාව: බෙලිහුල්ඔය ප්‍රදේශය ආශ්‍රයෙන්<br>**ඩබ්ලිව්. එම්. ඩී. පී. කුමාරි සහ එම්. එස්. එම්. එල්. කරුණාරත්න** | 16-27 |
| ලේඛන හා භාෂණ සිංහලයෙහි භාවිත ක්‍රියා අනුසර්ගක පිළිබඳ ප්‍රතිරෝධාත්මක අධ්‍යයනයක්<br>**ඩබ්ලිව්. ඕ. තිලකරත්න සහ ආචාර්ය මොරකන්දේ අරියවංස හිමි** | 28-37 |
| ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි, විශ්වාස හා වත්පිළිවෙත් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (රත්නපුර දිස්ත්‍රික්කය ඇසුරිනි)<br>**තුෂාණි සංදීපනී මාටින් සහ ලක්මිණි ගමගේ** | 38-48 |
| 'තුන්දෙනෙක්' චිත්‍රපටයෙහි නිරූපිත සංහිඳියාව සහ ජාතික සමගිය යන සංකල්ප පිළිබඳ සිනමා න්‍යායාත්මක අධ්‍යයනයක්<br>**ආචාර්ය ප්‍රභා මනුරත්න** | 49-63 |
| ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය සහ ව්‍යවස්ථා වර්ධනය: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය<br>**රවීන්ද්‍ර ගුණසේකර** | 64-71 |
| සපත්නීරෝෂය: ජාතක කතා කිහිපයක් ඇසුරෙන් බෞද්ධ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්<br>**ආචාර්ය ලතා ගුරුසිංහ** | 72-83 |



ISSN 1800-1459
eISSN 2673-1177